199 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 199 - இல. 6
**Volume 199 - No. 6**

2011 මැයි 26 වන බ්‍රහස්පතින්දා
2011 மே 26, வியாழக்கிழமை
**Thursday, 26th May, 2011**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

මේජර් ජනරාල් මහින්ද හතුරුසිංහ "ටැමිල් මිරර්"වෙබ් අඩවිය සමඟ කළ සම්මුඛ සාකච්ඡාවේදී ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා සහ ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා පිළිබඳව කරන ලද සඳහන

කථානායකතුමාගේ සහතිකය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මුහුණ පා සිටින ගැටලු

**ශෝක ප්‍රකාශ:**

ගරු අමරනන්ද රත්නායක මහතා
ගරු එම්.එස්. අමරසිරි මහතා
ගරු ආචාර්ය නිශ්ශංක විජයරත්න මහතා

**වරප්‍රසාද:**

පාර්ලිමේන්තුවේ කටයුතු නිසි පරිදි විකාශනය නොවීම

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

ආචාර්ය මාලිනී ෆොන්සේකා පදනම (සංස්ථාගත කිරීමේ)- [ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා] - පළමුවන වර කියවන ලදී

**කල් තැබීමේ යෝජනාව:**

මැණික් ගැරීම සඳහා යොදා ගන්නා බැකෝ සහ සකර් යන්ත්‍ර භාවිතය නතර කිරීම

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු**

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

சிறப்புரிமை: மேஜர் ஜெனரல் மஹிந்த ஹத்துருசிங்ஹ "தமிழ் மிரர்" இணையச் செவ்வியில் மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன் மற்றும் மாண்புமிகு மாவை சேனாதிராஜா பற்றித் தெரிவித்த குறிப்பு

சபாநாயகரது சான்றுரை

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

பல்கலைக்கழக விரிவுரையாளர்கள் எதிர்நோக்கியுள்ள பிரச்சினைகள்

**அனுதாபத் தீர்மானம்:**

மாண்புமிகு அமரனந்த ரத்னாயக்க
மாண்புமிகு எம்.எஸ். அமரசிறி
மாண்புமிகு நிஸ்ஸங்க விஜயரத்ன

**சிறப்புரிமை:**

பாராளுமன்ற நடவடிக்கைகளை இருட்டடிப்புச்செய்தமை

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**

கலாநிதி மாலினி பொன்சேகா மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும] – முதன்முறை மதிப்பிடப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**

இரத்தினக்கல் அகழ்வில் பெகோ மற்றும் சக்கர் இயந்திரங்களின் பாவனையை நிறுத்துதல்

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்**

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Privilege: Reference to Hon. Mavai S. Senathirajah and Hon. Suresh Premachandran by Major General Mahinda Hathurusinghe at an interview with "Tamilmirror" Web Edition

Speaker's Certificate

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Problems faced by University Teachers

VOTE OF CONDOLENCE:

Hon. Amarananda Ratnayake
Hon. M.S. Amarasiri
Hon. (Dr.) Nissanka Wijeyeratne

PRIVILEGE :

Blackout of Parliamentary Proceedings

PRIVATE MEMBERS' BILLS:

(Dr.) Malani Fonseka Foundation (Incorporation) Bill - [The Hon. J.R.P. Sooriyapperuma] – Read the First time.

ADJOURNMENT MOTION:

Stoppage of Backhoes and Sucker Machines for Gem Mining

WRITTEN ANSWERS TO QUESTIONS

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2011 මැයි 26 වන බ්‍රහස්පතින්දා*
*2011 மே 26, வியாழக்கிழமை*
*Thursday, 26th May, 2011*

*අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා ] මූලාසනාරූඪ විය.*
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m., MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY ] in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I

### වරප්‍රසාද : මේජර් ජනරාල් මහින්ද හතුරුසිංහ "ටැමිල්මිරර්" වෙබ් අඩවිය සමඟ කළ සම්මුඛ සාකච්ඡාවේදී ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා සහ ගරු මාවෙයි සෝ.සේනාධිරාජා මහතා පිළිබඳව කරන ලද සඳහන

சிறப்புரிமை: மேஜர் ஜெனரல் மஹிந்த ஹத்துருசிங்ஹ "தமிழ் மிரர்" இணையச் செவ்வியில் மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன் மற்றும் மாண்புமிகு மாவை சேனாதிராஜா பற்றித் தெரிவித்த குறிப்பு

PRIVILEGE : REFERENCE TO HON. MAVAI S. SENATHIRAJAH AND HON. SURESH PREMACHANDRAN BY MAJOR GENERAL MAHINDA HATHURUSINGHE AT AN INTERVIEW WITH "TAMILMIRROR" WEB EDITION

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුරේෂ් කේ. ප්‍රේමචන්ද්‍රන් මහතා විසින් 2011 මැයි මස 03 වන දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

### II

### කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව,

ගරු කථානායකතුමා විසින්-

2011 මැයි මස 06 වැනි දින,
සංගණන (සංශෝධන) පනත් කෙටුම්පතෙහි ද,

2011 මැයි මස 25 වැනි දින,
මහේෂ්වරි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පතෙහි සහ
මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතෙහි ද,

සහතික සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, 2009-2010 වර්ෂය සඳහා ඩීඑෆ්සීසී බැංකුවේ විගණකවරුන්ගේ වාර්තාව හා ගිණුම් මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළයුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2010 වර්ෂය සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ කාර්ය සාධන වාර්තාව.- [ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

(1) 2008 වර්ෂය සඳහා ලංකා - ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(2) 2008 වර්ෂය සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ වාර්ෂික වාර්තාව

මෙම වාර්තා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළයුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(1) 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා; සහ

(2) 2008 සහ 2009 වර්ෂ සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තා.

මෙම වාර්තා ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2007 සහ 2008 වර්ෂ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් ජල සම්පාදන හා ජලාපවහන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(1) 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා; සහ

(2) 2009 වර්ෂය සඳහා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) දුම්මලසූරිය, සියඹලාගස්රුප්ප, අංක 494 හි පදිංචි ඒ. විජේසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කුලියාපිටිය, පිදුම, කරන්තිප්පල පාර හි පදිංචි පී.පී. දිනේෂ් අසංක මහතාගෙන් ලැබුණු පෙත්සම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා - පැමිණ නැත.

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) ගොතටුව, ගමගේ වත්ත, අංක 510 දරන ස්ථානයේ පදිංචි නාවුලගේ රංජිත් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මොරටුව, එගොඩ උයන, අංක 24 දරන ස්ථානයේ පදිංචි එම්.ජේ.එම්. පීරිස් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මොරටුව, උයන පටුමග, අංක 11/4 දරන ස්ථානයේ පදිංචි එෆ්.ඒ. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) මහරගම, පමුණුව, දේවාල පාර, අංක 60/23 දරන ස්ථානයේ පදිංචි ජේ.එච්. ගුණදාස මහතාගෙන් ලැබුණු පෙත්සම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු බන්දුල ගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා - පැමිණ නැත.

ගරු රිසාඩ් බදියුදීන් මහතා - පැමිණ නැත.

ගරු පාඨලී චම්පික රණවක මහතා - පැමිණ නැත.

ගරු ගුණරත්න වීරකෝන් මහතා - පැමිණ නැත.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாபிட்டிய - தொலைத் தொடர்புகள், தகவல் தொழில்நுட்பவியல் அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of Telecommunication and Information Technology)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගල් අතර, නාමල් සෙවණ අංක බී. 1/151 දරන ස්ථානයේ පදිංචි එච්.ජී. නන්දාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම රාජගිරිය, ඔබේසේකරපුර, අරුණෝදය මාවත අංක 66/2 දරන ස්ථානයේ පදිංචි එච්.ඒ. මානෙල් මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.

ගරු රොෂාන් රණසිංහ මහතා - පැමිණ නැත.

ගරු වසන්ත සේනානායක මහතා - පැමිණ නැත.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය - පැමිණ නැත.

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Speaker, I would like to raise an important matter. I was unable to bring this up in the House yesterday.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇහෙන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Please give the mike to the Hon. Ravi Karunanayake.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Speaker, I would like to raise a matter which refers to the very conduct of this House itself. I am referring to a news item published in "The Island" dated 12th May, 2011 which states, I quote:

> "Secretary General of Parliament says Rs.1.2 mn fine imposed on service provider"

Many have been asking us, "You all are basically talking about such matters in Parliament, but what is going on in Parliament itself ?"

This news items further states, I quote :

> "Vasu demands accountability …"

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Member, you have not brought this matter at the commencement - [*Interruption.*]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I am bringing this matter up as a matter of importance for the House.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Member, you have to first inform the Hon. Speaker, if you are to take up this type of matter. So, on the next date, you can -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Are you trying to conceal this matter?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

No, I am not trying to conceal it. The procedure is such that you have to inform the Hon. Speaker beforehand if you are to raise this type of matter in the House. Therefore, on the next occasion, you can inform him and take it up.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Even if it is a matter of importance regarding the House itself?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

This will not curtail your right to produce a document or take the issue up. But, the procedure is such that you have to first take it up with the Hon. Speaker and with his permission, you can raise it in the House. - [*Interruption.*] Thank you.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### රජයට අයත් ආයතන: ලාභ හෝ පාඩු
### அரசாங்கத்துக்குச் சொந்தமான நிறுவனங்கள்: இலாப நட்டம்
### GOVERNMENT-OWNED INSTITUTIONS : PROFIT OR LOSS

0430/'10

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) (i) රජයට අයත් සංස්ථා, මණ්ඩල යනාදී ආයතන සඳහා අද වන විට ආයෝජනය කර ඇති ප්‍රාග්ධන

ප්‍රමාණය සඳහන් කරමින්, එම සියලු ආයතනවල නම් කවරේද;

(ii) පසුගිය වර්ෂ තුනක කාලය තුළදී එකී ආයතනවල සේවය කළ පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජය සතු කොටස් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත (අ) (i) හි සඳහන් ආයතනවල පසුගිය වර්ෂය සඳහා එක් එක් ආයතනයේ ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) (අ) (i) හි සඳහන් මුළු ආයතන සංඛ්‍යාවෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා නොකරන සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ වාර්තා නොකිරීමට හේතුව කවරේද;

(iii) එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තිය උල්ලංඝනය කිරීමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரினைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத்திற்குச் சொந்தமான கூட்டுத் தாபனங்கள், சபைகள் போன்ற சகல நிறுவனங் களின் பெயர்களையும், அவை ஒவ்வொன்றிலும் இற்றைவரை முதலீடு செய்யப்பட்டுள்ள மூலதனத் துடன் வெவ்வேறாகவும்;

(ii) கடந்த மூன்று வருடங்களாக அத்தகைய நிறுவனங் களில் பணியாற்றிவரும் ஆட்களின் எண்ணிக்கை யினையும்;

(iii) அரசாங்கம் அந்நிறுவனங்களில் கொண்டுள்ள பங்கு களின் அளவினையும்;

(iv) மேலே(அ)(i) இலுள்ளவாறான நிறுவனங்களின் கடந்த வருடத்திற்கான இலாப, நட்டங்களை நிறுவன ரீதியில் வெவ்வேறாகவும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) (அ)(i) இலுள்ள நிறுவனங்களில், அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவுக்கோ அல்லது அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவுக்கோ அறிக்கையிடாத நிறுவனங்களின் எண்ணிக்கை யினையும்;

(ii) அறிக்கையிடாமைக்கான காரணத்தையும்;

(iii) இது அரசியலமைப்பின் பிரிவு 148 ஐ மீறுகின்ற ஒரு செயலா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state-

(i) the names of all the Government owned institutions such as Corporations and Boards with the capital invested to date per Institution;

(ii) the number of persons working in such Institutions for the last three years;

(iii) the amount of share ownership of the Institutions by the Government; and

(iv) the profit or loss per Institution for the last year as per (a)(i) above?

(b) Will he also state -

(i) the number of Institutions out of the total number as per (a)-i, which do not report to COPE or PAC;

(ii) the reasons for not reporting; and

(iii) whether it is a violation of Section 148 of the Constitution?

(c) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2007 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා රජය විසින් ආයෝජනය කර ඇති ප්‍රාග්ධනය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ඇති ආයතන නාම ලේඛනය ඇමුණුම 01හිද, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ඇති ආයතන නාම ලේඛනය ඇමුණුම 02හිද සඳහන් වේ.

(ii) 2007 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා එම ආයතනවල සේවය කළ සේවක සංඛ්‍යාව ඇමුණුම 01 සහ 02 හි සඳහන් වේ.

(iii) 2010 වර්ෂය අවසන් වන විට රජය සතු කොටස් ප්‍රමාණය ඇමුණුම් 01 සහ ඇමුණුම් 02හි සඳහන් වේ.

(iv) 2009 වර්ෂයේ ලබා ඇති ලාභය සහ පාඩුව ඇමුණුම 01 සහ ඇමුණුම 02හි සඳහන්වේ. ඇමුණුම් **සභාගත*** කරමි.

(ආ) (i) සියලුම රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා රජය සතු සමාගම් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත වාර්තා කරන අතර, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා කරනු ලැබේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

*** සභාමේසය මත තබන ලද ඇමුණුම්:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புக்கள் :*
*Annexes tabled:*

ඇමුණුම 01

රාජ්‍ය ව්‍යාපාර ලැයිස්තුව

| | ආයතනයේ නම | රජය සතු කොටස් ප්‍රමාණය | ලාභය/පාඩුව 2009 රු. මිලියන | 1 අද වන විට ප්‍රාග්ධන ආයෝජනය රු. මිලියන | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 2007 | 2008 | 2009 |
| 1 | කෘෂි හා ගොවිජන සේවා රක්ෂණ මණ්ඩලය | 100 | (613.5) | 124.1 | 452 | 417 | 390 |
| 2 | සී/ස ගුවන්තොටුපළ සහ ගුවන්සේවා සමාගම | 100 | 934.4 | 20.0 | 3,001 | 3,115 | 3183 |
| 3 | බී.සී.සී ලංකා සමාගම | 100 | (25.4) | 100.0 | 90 | 101 | 105 |
| 4 | ලංකා බැංකුව | 100 | 3,317.0 | 5,000.0 | 8253 | 7812 | 7538 |
| 5 | ආයෝජන මණ්ඩලය | 100 | 70.3 | 254.5 | 1154 | 1157 | 1162 |
| 6 | සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | 100 | (20.3) | 10.0 | 307 | 287 | 113 |
| 7 | ශ්‍රී ලංකා මහා බැංකුව | 100 | 33,638.6 | 131,699.8 | 1,131 | 1,306 | 1263 |
| 8 | මධ්‍යම ඉංජිනේරු සේවා කාර්යාංශය | 100 | 146.8 | 0.5 | 618 | 601 | 682 |
| 9 | ලංකා පිගන් සංස්ථාව | 100 | (63.0) | 25.5 | 756 | 710 | 644 |
| 10 | ලංකා විදුලිබල මණ්ඩලය | 100 | 1,146.0 | 73.5 | 14230 | 14230 | 15137 |
| 11 | ලංකා පොහොර සංස්ථාව | 100 | 63.0 | 2,497.0 | 490 | 393 | 455 |
| 12 | ලංකා ධීවර සංස්ථාව | 100 | (103.9) | 377.7 | 763 | 718 | 701 |
| 13 | ලංකා ධීවර වරාය සංස්ථාව | 100 | (182.6) | 997.1 | 710 | 769 | 779 |
| 14 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 100 | 12,342.0 | 1,000.0 | 2931 | 2931 | 2765 |
| 15 | සී/ස ලංකා නැව් සංස්ථාව | 100 | (34.9) | 50.0 | 145 | 147 | 233 |
| 16 | සී/ස සීතෝර් පදනම | 100 | (30.4) | 40.0 | 393 | 345 | 328 |
| 17 | සී/ස හලාවත වැවිලි සමාගම | 100 | 92.6 | 200.0 | 1025 | 1034 | 1026 |
| 18 | සිවිල් ගුවන් සේවා අධිකාරිය | 100 | 190.0 | 23.0 | 112 | 116 | 118 |
| 19 | සී/ස කොළඹ වාණිජ පොහොර සමාගම | 100 | 151.0 | 369.0 | 109 | 116 | 116 |
| 20 | ස්වාධීනතා කළමනාකරණ අධිකාරිය | 100 | (16.7) | 3.0 | 226 | 229 | 192 |
| 21 | සමුපකාර තොග වෙළඳ සංස්ථාව | 100 | (387.7) | 1.1 | 248 | 243 | 216 |
| 22 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 100 | 801.7 | 4.4 | 162 | 178 | 240 |
| 23 | දූරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය | 100 | 4.1 | 142.1 | 10 | 12 | 12 |
| 24 | සී/ස ඇල්කඩුව වැවිලි සමාගම | 100 | (63.7) | 180.0 | 2201 | 2152 | 2131 |
| 25 | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | 100 | 14,220.0 | 107,735.0 | 797 | 850 | 856 |
| 26 | සී/ස ගල්ඔය වැවිලි සමාගම | 51 | (211.5) | 516.0 | 91 | 264 | 345 |
| 27 | භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 100 | 385.0 | 98.0 | 173 | 220 | 230 |
| 28 | සී/ස හොටෙල් ඩිවලපර්ස් ලංකා සමාගම | 65 | (1,262.0) | 10,868.0 | 820 | 811 | 815 |
| 29 | ශ්‍රී ලංකා නිවාස සංවර්ධන හා මූල්‍ය බැංකු සංස්ථාව | 49 | 120.0 | 962.0 | 286 | 289 | 364 |
| 30 | ශ්‍රී ලංකා ස්වාධීන රූපවාහිනී සංස්ථාව | 100 | 186.0 | 95.0 | 512 | 509 | 583 |
| 31 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය | 100 | 2.9 | 6,019.0 | 48 | 64 | 79 |
| 32 | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය | 100 | (16.5) | 67.8 | 12 | 17 | 27 |
| 33 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 100 | (225.0) | 3,670.0 | 6491 | 6101 | 5957 |
| 34 | සී/ස කහටගහ මිනිරන් ලංකා සමාගම | 100 | 2.0 | 13.0 | 54 | 66 | 77 |
| 35 | සී/ස කළුබෝවිටියාන තේ කම්හල | 100 | 26.3 | 46.4 | 121 | 159 | 145 |
| 36 | සී/ස කුරුණෑගල වැවිලි සමාගම | 100 | 98.4 | 200.0 | 1095 | 1303 | 1300 |
| 37 | ලේඩි ලෝචර් ණය පදනම | 100 | 26.4 | 184.4 | 37 | 36 | 39 |
| 38 | ලක්දිව ඉංජිනියරින් සමාගම | 100 | (35.0) | 22.4 | 144 | 132 | 119 |
| 39 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | 100 | 22.6 | 1,964.0 | 422 | 417 | 420 |
| 40 | ඉඩම් මැනුම් සභාව | 100 | 1.7 | 1.0 | 4 | 5 | 4 |

| | ආයතනයේ නම | රජය සතු කොටස් ප්‍රමාණය | ලාභය/පාඩුව 2009 රු. මිලියන | 1 අද වන විට ප්‍රාග්ධන ආයෝජනය රු. මිලියන | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 2007 | 2008 | 2009 |
| 41 | ලංකා ෆැබ්රික්ස් ලිමිටඩ් | 93.33 | (40.5) | 2.3 | 8 | 8 | 8 |
| 42 | පී/ස ලංකා ලේලන්ඩ් | 100 | 14.8 | 9.0 | 3 | 3 | 3 |
| 43 | ලංකා ලොජිස්ටික් සමාගම | 100 | 0.6 | 0.002 | 18 | 26 | 23 |
| 44 | පී/ස ලංකා ඛනිජ වැලි සමාගම | 100 | 230.9 | 800.0 | 638 | 639 | 648 |
| 45 | ලංකා පොස්පේට් සමාගම | 100 | 61.4 | 72.5 | 306 | 315 | 294 |
| 46 | පී/ස ලංකා සළුසල | 100 | (21.2) | 300.0 | 313 | 288 | 264 |
| 47 | පී/ස ලංකා සතොස | 100 | 21.8 | 326.4 | 816 | 1200 | 1240 |
| 48 | ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව | 100 | 83.0 | 3,616.0 | 0 | 166 | 165 |
| 49 | පළාත් පාලන ණය හා සංවර්ධන පදනම | 100 | 13.6 | 158.3 | 26 | 24 | 25 |
| 50 | පී/ස මන්තායි සෝල්ට් සමාගම | 100 | 3.3 | 60.6 | 81 | 77 | 71 |
| 51 | පී/ස මිහින් ලංකා සමාගම | 100 | (1,300.5) | 250.0 | 72 | 238 | 154 |
| 52 | පී/ස මිල්කෝ සමාගම | 100 | 351.0 | 306.0 | 1483 | 1483 | 1490 |
| 53 | ජාතික සංවර්ධන භාර අරමුදල | 100 | 171.0 | 2,042.0 | 29 | 27 | 26 |
| 54 | ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය | 100 | (68.3) | 878.0 | 563 | 545 | 539 |
| 55 | ජාතික චිත්‍රපට සංස්ථාව | 100 | (74.1) | 10.0 | 212 | 201 | 193 |
| 56 | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 100 | (14.5) | 30.0 | 244 | 231 | 242 |
| 57 | ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය | 100 | 90.0 | 57.2 | 117 | 123 | 145 |
| 58 | ජාතික රක්ෂණ භාර අරමුදල | 100 | 3,331.0 | 9,443.7 | 29 | 51 | 122 |
| 59 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 100 | 171.0 | 132.0 | 2449 | 2617 | 2617 |
| 60 | ජාතික ලොතරැයි මණ්ඩලය | 100 | 80.0 | 1,677.0 | 287 | 282 | 278 |
| 61 | පී/ස ජාතික කඩදාසි සමාගම | 100 | (552.3) | 323.0 | 645 | 557 | 515 |
| 62 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 100 | 6,943.0 | 3.2 | 2867 | 2879 | 2915 |
| 63 | ජාතික ගමනාගමන වෛද්‍ය මණ්ඩලය | 100 | 63.0 | 62.0 | 147 | 233 | 193 |
| 64 | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 100 | (1,417.0) | 60.4 | 8819 | 9006 | 9025 |
| 65 | පී/ස නෝර්ත් සී සමාගම | 100 | (3.9) | 3.5 | 42 | 41 | 46 |
| 66 | පී/ස ඔසු ගොවි සමාගම [2] | 100 | (15.7) | 26.8 | 0 | 90 | 90 |
| 67 | වී අලෙවි මණ්ඩලය | 100 | 185.9 | 404.9 | 10 | 7 | 73 |
| 68 | තල් සංවර්ධන මණ්ඩලය | 100 | (9.6) | 148.3 | 198 | 207 | 201 |
| 69 | පී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම | 100 | 14.5 | 108.5 | 46 | 56 | 59 |
| 70 | මහජන බැංකුව | 100 | 6,075.7 | 7,202.0 | 9645 | 8416 | 8587 |
| 71 | පශ්චාත් කළමනාකරණ උපාධි ආයතනය | 100 | 8.8 | 149.7 | 21 | 26 | 26 |
| 72 | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම | 100 | 34.7 | 43.8 | 11 | 11 | 18 |
| 73 | රක්නා ආරක්ෂක ලංකා සමාගම | 100 | 71.0 | 5.0 | 670 | 1271 | 1879 |
| 74 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 78 | 938.0 | 846.2 | 1983 | 1935 | 1937 |
| 75 | විනිමය සුරැකුම් හුවමාරු කොමිසම | 100 | 1.6 | 10.7 | 48 | 60 | 64 |
| 76 | සෙලිසිනෝ රූපවාහිනී ආයතනය | 100 | 2.6 | 11.2 | 42 | 47 | 46 |
| 77 | පී/ස කුසලතා සංවර්ධන පදනම | 98 | 2.4 | 102.0 | 17 | 25 | 21 |
| 78 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 100 | (26.8) | 1,019.0 | 1553 | 1544 | 1475 |
| 79 | ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය | 100 | - | 20.8 | 9 | 8 | 8 |
| 80 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | 100 | 9.3 | 152.6 | 250 | 243 | 253 |
| 81 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | 100 | 38.3 | 1,441.0 | 1031 | 995 | 911 |

| | ආයතනයේ නම | රජය සතු කොටස් ප්‍රමාණය | ලාභය/පාඩුව 2009 රු. මිලියන | [1] අද වන විට ප්‍රාග්ධන ආයෝජනය රු. මිලියන | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 2007 | 2008 | 2009 |
| 82 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 100 | 490.5 | 2,925.9 | 647 | 810 | 809 |
| 83 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 100 | (11.7) | 244.3 | 172 | 199 | 198 |
| 84 | ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව | 100 | (79.4) | 967.0 | 89 | 81 | 75 |
| 85 | ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය | 100 | (3,825.0) | [3] 6317.5 | 37149 | 36043 | 35365 |
| 86 | ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 100 | 0.9 | 22.9 | 9 | 9 | 10 |
| 87 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ මණ්ඩලය | 100 | 109.6 | 30.0 | 55 | 50 | 44 |
| 88 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | 100 | (6.9) | 171.1 | 385 | 191 | 185 |
| 89 | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | 100 | 26.7 | 454.9 | 101 | 124 | 138 |
| 90 | ශ්‍රී ලංකා රක්ෂණ සමාගම | 100 | 732.0 | 6,000.0 | 2234 | 2019 | 2066 |
| 91 | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සමාගම | 100 | 127.8 | 1,000.0 | 1219 | 1093 | 1174 |
| 92 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 100 | 1,373.0 | 470.0 | 13667 | 13658 | 13670 |
| 93 | ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සමාගම | 100 | (1.7) | 78.0 | 51 | 54 | 44 |
| 94 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 100 | 4.7 | 1,691.4 | 978 | 970 | 923 |
| 95 | සී/ස ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව [4] | 100 | 238.9 | 458.5 | 0 | 41 | 45 |
| 96 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 100 | 34.1 | 4,285.0 | 6115 | 6201 | 5620 |
| 97 | ශ්‍රී ලංකා තේ මණ්ඩලය | 100 | 3,284.0 | 9,038.0 | 271 | 271 | 261 |
| 98 | ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 49.5 | 1,232.0 | 18,049.0 | 7014 | 6983 | 6551 |
| 99 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 100 | 60.6 | 1,636.0 | 151 | 167 | 164 |
| 100 | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 100 | 20.1 | 69.1 | 37 | 40 | 47 |
| 101 | සී/ස ශ්‍රී ලන්කන් ගුවන් සමාගම | 94.68 | (9,305.9) | 5,146.4 | 5272 | 5113 | 4837 |
| 102 | රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සංස්ථාව | 100 | 102.2 | 16.7 | 565 | 570 | 531 |
| 103 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 100 | 274.6 | 70.0 | 2,552 | 2,174 | 2203 |
| 104 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 100 | 91.0 | 889.8 | 339 | 330 | 320 |
| 105 | ශ්‍රී ලංකා ඖෂධ නීතිගත සංස්ථාව | 100 | 237.5 | 59.0 | 731 | 733 | 731 |
| 106 | ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව | 100 | 98.6 | 690.0 | 189 | 195 | 197 |
| 107 | රාජ්‍ය මුද්‍රණ සංස්ථාව | 100 | 3.6 | 1.8 | 588 | 539 | 606 |
| 108 | රාජ්‍ය දැව සංස්ථාව | 100 | 358.6 | 41.5 | 2634 | 2499 | 2413 |
| 109 | රාජ්‍ය වාණිජ තොග වෙළඳ සංස්ථාව | 100 | 14.1 | 100.0 | 9 | 9 | 9 |
| 110 | එස්.ටී.සී ජෙනරල් ට්‍රේඩින් සමාගම | 100 | 18.2 | 100.0 | 182 | 166 | 208 |
| 111 | උක් පර්යේෂණ ආයතනය | 100 | 25.0 | 145.3 | 232 | 193 | 219 |
| 112 | තේ ශක්ති පදනම | 100 | 19.0 | 679.8 | 739 | 858 | 794 |
| 113 | විදුලි සංදේශ නියාමන කොමිසම | 100 | 4,957.2 | 526.2 | 180 | 186 | 193 |
| 114 | තුරු සවිය පදනම | 100 | (0.8) | 27.0 | 21 | 19 | 19 |
| 115 | නාගරික සංවර්ධන අධිකාරිය | 100 | (232.0) | 100.0 | 1626 | 1720 | 1882 |
| 116 | සී/ස වෙස්ට් කෝස්ට් පෞද්ගලික සමාගම [5] | 58 | 803.0 | 1,240.0 | - | - | - |

1 31.12.2009 දිනට වූ ශේෂ පත්‍රයට අනුව

2 2008 වර්ෂයේදී ස්ථාපිත කර ඇත.

3 ගෙවූ ප්‍රාග්ධනය

4 2008 වර්ෂයේදී ස්ථාපිත කර ඇත

5 ලංකා විදුලිබල මණ්ඩලයේ "ලක්ධනවි" සේවකයන් මෙහි සේවය කරනු ලබයි.

ඇමුණුම 02

71.2

ව්‍යවස්ථාපිත මණ්ඩල ලැයිස්තුව

| | ආයතනයේ නම | රජය සතු කොටස් ප්‍රමාණය | ලාභය/(අලාභය) 2009 රු. මිලියන | 1 ළද වත්කම් ප්‍රාග්ධන ආයෝජනය රු. මිලියන | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 2007 | 2008 | 2009 |
| 1 | නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය | 100 | 6.2 | 105.0 | 70 | 75 | 80 |
| 2 | පරමාණුක ශක්ති අධිකාරිය | 100 | 0.8 | 193.6 | 72 | 71 | 73 |
| 3 | ආයුර්වේද වෛද්‍ය සභාව | 100 | (1.3) | 3.7 | 12 | 12 | 12 |
| 4 | බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලය | 100 | (10.0) | 83.0 | 76 | 89 | 89 |
| 5 | බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය | 100 | (8.0) | 687.0 | 106 | 117 | 117 |
| 6 | මධ්‍යම සංස්කෘතික අරමුදල | 100 | (99.9) | (21.5) | 2,448 | 2,135 | 2,010 |
| 7 | මධ්‍යම පරිසර අධිකාරිය | 100 | (12.7) | 411.2 | 664 | 679 | 679 |
| 8 | ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය | 100 | (0.8) | 895.8 | 249 | 249 | 244 |
| 9 | පොල් වගාකිරීමේ මණ්ඩලය | 100 | 56.1 | 985.3 | 670 | 644 | 606 |
| 10 | පොල් සංවර්ධන අධිකාරිය | 100 | (26.4) | 849.9 | 226 | 160 | 155 |
| 11 | පොල් පර්යේෂණ මණ්ඩලය | 100 | (45.8) | 2,041.0 | 310 | 289 | 305 |
| 12 | කොළඹ විශ්ව විද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය | 100 | 43.0 | 43.0 | 150 | 174 | 174 |
| 13 | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | 100 | 6.0 | 116.2 | 172 | 170 | 177 |
| 14 | නැගෙනහිර විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකා | 100 | (71.0) | 1,266.0 | 355 | 599 | 599 |
| 15 | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය | 100 | 5,473.0 | 775.1 | 343 | 285 | 276 |
| 16 | ගම්පහ වික්‍රමආරච්චි ආයුර්වේද විද්‍යායතනය | 100 | (7.1) | 126.9 | 162 | 120 | 130 |
| 17 | මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු කිරීමේ අභ්‍යාස ආයතනය | 100 | (62.0) | 37.5 | 40 | 33 | 39 |
| 18 | ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | 100 | 32.4 | 723.7 | 57 | 58 | 61 |
| 19 | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය | 100 | (3.6) | 109.5 | 174 | 152 | 154 |
| 20 | හෝමියෝපති වෛද්‍ය සභාව | 100 | 2.4 | 2.6 | 20 | 21 | 21 |
| 21 | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය | 100 | (8.2) | 608.0 | 582 | 537.00 | 605 |
| 22 | කාර්මික තාක්ෂණ ආයතනය - මොරටුව විශ්ව විද්‍යාලය | 100 | 35.3 | 738.6 | 341 | 347 | 345 |
| 23 | මූලික අධ්‍යයන ආයතනය | 100 | (37.0) | 126.0 | 96 | 78.00 | 99.00 |
| 24 | මානව සම්පත් අභිවර්ධන ආයතනය | 100 | 4.5 | 60.8 | 38 | 78 | 33 |
| 25 | ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය | 100 | 3.4 | 43.7 | 12 | 27 | 21 |
| 26 | ඉදිකිරීම්, අභ්‍යාස සහ සංවර්ධන ආයතනය | 100 | (63.0) | 724.0 | 268 | 262 | 269 |
| 27 | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය | 100 | (2.5) | 29.4 | 145 | 80 | 84 |
| 28 | ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය | 100 | 8.3 | 190.1 | 70 | 55 | 55 |
| 29 | කාර්මික තාක්ෂණ ආයතනය | 100 | (2.0) | 64.0 | 155 | 112 | 112 |
| 30 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 100 | (21,709.2) | 81,188.2 | 4767 | 4892 | 4864 |
| 31 | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | 100 | 1.8 | 23.6 | 82 | 91 | 91 |
| 32 | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 100 | (95.5) | 376.7 | 762 | 630 | 612 |
| 33 | ශ්‍රී ලංකා ජාතික ජලජ සංවර්ධන අධිකාරිය | 100 | 27.5 | 756.7 | 394 | 428 | 423 |
| 34 | ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ආයතනය | 100 | (30.0) | 1,322.3 | 309 | 301 | 298 |
| 35 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | 100 | 9.8 | 158.6 | 193 | 186 | 189 |
| 36 | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය | 100 | 212.0 | 72.0 | 7 | 14 | 14 |
| 37 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | 100 | 2.7 | 83.3 | 82 | 82 | 82 |
| 38 | ජාතික ශිල්ප සභාව | 100 | (1.9) | 36.0 | 61 | 53 | 51 |
| 39 | අන්තරායකර ඖෂධ පාලන ජාතික මණ්ඩලය | 100 | (4.3) | 38.8 | 118 | 129 | 127 |
| 40 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 100 | 0.2 | 32.5 | - | 79 | 79 |
| 41 | ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය | 100 | (21.7) | 356.4 | 317 | 312 | 302 |
| 42 | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 100 | 0.8 | 0.6 | 7 | 8 | 8 |
| 43 | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 100 | (495.7) | 6,443.3 | 2,328 | 2,223 | 2,085 |
| 44 | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | 100 | (0.6) | 2.8 | 11 | 13 | 13 |
| 45 | ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය | 100 | (19.2) | 100.1 | 179 | 159 | 202 |
| 46 | ජාතික අධ්‍යාපන ආයතනය | 100 | (26.1) | 917.8 | 440 | 505 | 388 |
| 47 | ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | 100 | (1.3) | 68.1 | 29 | 25 | 27 |
| 48 | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන ආයතනය | 100 | 1.0 | 112.5 | 304 | 172 | 173 |
| 49 | ජාතික සමූපකාර සංවර්ධන ආයතනය | 100 | (6.2) | 440.7 | 35 | 46 | 41 |
| 50 | භාෂා අධ්‍යාපන පුහුණුව පිළිබඳ ජාතික ආයතනය | 100 | (4.9) | 25.5 | 17 | 19 | 19 |
| 51 | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 100 | (9.4) | 27.5 | 78 | 78 | 78 |
| 52 | ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යායතනය | 100 | (2.2) | 7.8 | 8 | 14 | 8 |
| 53 | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | 100 | 3.1 | 135.3 | 203 | 150 | 147 |
| 54 | ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසන් සභාව | 100 | (1.7) | 4.0 | 15 | 16 | 15 |
| 55 | ජාතික විද්‍යා පදනම | 100 | (2.5) | 848.0 | 120 | 109 | 99 |
| 56 | ආබාධිත සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය | 100 | 1.8 | 3.9 | 23 | 21 | 23 |
| 57 | ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය | 100 | (16.2) | 11.2 | 92 | 80 | 88 |
| 58 | ජාතික ගමනාගමන කොමිසන් සභාව | 100 | (8.2) | 315.8 | 141 | 136 | 137 |

| | ආයතනයේ නම | රජය සතු කොටස් ප්‍රමාණය | ලාභය/(අලාභ) 2009 රු. මිලියන | 1 අද වන විට ප්‍රාග්ධන ආයෝජනය රු. මිලියන | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 2007 | 2008 | 2009 |
| 59 | ජාතික තරුණ සේවා සභාව | 100 | (1,509.3) | 491.2 | 1,426 | 1,542 | 1,494 |
| 60 | රාජ්‍ය භාෂා කොමිෂන් සභාව | 100 | 0.4 | 1.1 | 21 | 20 | 25 |
| 61 | ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය | 100 | (336.0) | 1,117.0 | 275 | 1,255 | 1,255 |
| 62 | බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය | 100 | 0.7 | 5.0 | 22 | 22 | 22 |
| 63 | කෘෂිකර්ම, පශ්චාත් උපාධි ආයතනය | 100 | 7.7 | 164.0 | 41 | 33 | 40 |
| 64 | පුරාවිද්‍යා, පශ්චාත් උපාධි ආයතනය | 100 | (0.7) | 423.0 | 29 | 31 | 33 |
| 65 | ඉංග්‍රීසි, පශ්චාත් උපාධි ආයතනය | 100 | (0.2) | 7.4 | 4 | 4 | 5 |
| 66 | පශ්චාත් වෛද්‍ය ආයතනය | 100 | 26.6 | 230.0 | 87 | 84 | 84 |
| 67 | පශ්චාත් විද්‍යා උපාධි ආයතනය | 100 | 5.9 | 194.3 | 22 | 15 | 17 |
| 68 | පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය | 100 | 2.9 | 153.8 | 93 | 88 | 104 |
| 69 | රජරට විශ්ව විද්‍යාලය | 100 | (118.0) | 1,168.0 | 385 | 786 | 786 |
| 70 | රණවිරු සේවා අධිකාරිය | 100 | (17.9) | 585.0 | 45 | 45 | 60 |
| 71 | නැතැත්තන් දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය | 100 | 12.5 | 1,158.6 | 74 | 75 | 62 |
| 72 | නැවත පදිංචි කිරීමේ අධිකාරිය | 100 | (0.1) | (11.0) | - | 18 | 18 |
| 73 | මාර්ග සංවර්ධන අධිකාරිය | 100 | (1.4) | (1.2) | 3,194 | 3,919 | 3,917 |
| 74 | ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය | 100 | 4.4 | 187.3 | 345 | 333 | 342 |
| 75 | ශ්‍රී ලංකා ගුනප් සංවර්ධන මණ්ඩලය | 100 | 3.9 | 20.1 | 7 | 7 | 7 |
| 76 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 100 | (2.8) | 22.4 | 25 | 23 | 24 |
| 77 | ශ්‍රී ලංකා ජාතික සාගින් නිවීමේ ව්‍යාපාර මණ්ඩලය | 100 | (2.3) | 17.5 | 22 | 29 | 18 |
| 78 | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | 100 | 0.6 | 6.2 | 14 | 14 | 14 |
| 79 | සබරගමුව විශ්ව විද්‍යාලය | 100 | (78.0) | 1,357.0 | 463 | 665 | 665 |
| 80 | ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය | 100 | (15,730.0) | 16,742.0 | 25,559 | 25,536 | 25,321 |
| 81 | ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 100 | (16.3) | 292.7 | 214 | 203 | 202 |
| 82 | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය | 100 | 0.5 | 31.0 | 38 | 42 | 43 |
| 83 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | 100 | (12.2) | 3.4 | 1,507 | 1,563 | 1,623 |
| 84 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 100 | 1.5 | 256.4 | 96 | 108 | 97 |
| 85 | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය | 100 | (2.1) | 63.4 | 140 | 127 | 130 |
| 86 | ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය | 100 | (54.0) | 1,088.0 | 305 | 410 | 410 |
| 87 | ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය | 100 | 0.1 | 119.8 | 288 | 283 | 276 |
| 88 | අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය | 100 | 0.6 | 4.5 | 11 | 13 | 14 |
| 89 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 100 | (11.3) | 154.4 | 113 | 108 | 109 |
| 90 | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 100 | (65.8) | 1.4 | 400 | 400 | 449 |
| 91 | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය 2 | | 103.0 | 373.4 | 245 | 248 | 251 |
| 92 | ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම | 100 | (23.0) | 21.4 | 20 | 20 | 15 |
| 93 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 100 | 49.9 | 372.6 | 288 | 284 | 290 |
| 94 | සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 100 | 14.6 | 138.7 | 51 | 59 | 61 |
| 95 | ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය 3 | 100 | (17.0) | 122.9 | - | - | 102 |
| 96 | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය | 100 | 23.2 | 4,100.6 | 263 | 241 | 237 |
| 97 | උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය | 100 | (2.9) | 69.5 | 144 | 136 | 134 |
| 98 | සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද විද්‍යාලය | 100 | (5.1) | 17.8 | 6 | 24 | 49 |
| 99 | ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය | 100 | (20.4) | 531.9 | 240 | 234 | 323 |
| 100 | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 100 | (28.4) | 498.3 | 455 | 441 | 442 |
| 101 | තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 100 | 1.0 | 25.3 | 55 | 60 | 60 |
| 102 | රෙදි පිළි පංගු මණ්ඩලය | 100 | 6.5 | 107.7 | 32 | 35 | 44 |
| 103 | ටවර් හෝල් රඟහල පදනම | 100 | 2.4 | 1,004.2 | 85 | 75 | 75 |
| 104 | උඩරට සංවර්ධන අධිකාරිය | 100 | 7.7 | 25.8 | 50 | 37 | 43 |
| 105 | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 100 | - | 43.0 | 231 | 257 | 257 |
| 106 | රුහුණු විශ්ව විද්‍යාලය | 100 | (227.0) | 3,887.0 | 1,412 | 1,670 | 1,670 |
| 107 | සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය | 100 | (8.0) | 672.0 | 126 | 406 | 406 |
| 108 | කොළඹ විශ්ව විද්‍යාලය | 100 | 124.0 | 1,741.0 | 1,502 | 1,991 | 1,991 |
| 109 | යාපනය විශ්ව විද්‍යාලය | 100 | (37.0) | 1,968.0 | 956 | 1,397 | 1,397 |
| 110 | කැලණිය විශ්ව විද්‍යාලය | 100 | (29.0) | 1,948.0 | 1,205 | 1,583 | 1,583 |
| 111 | මොරටුව විශ්ව විද්‍යාලය | 100 | (93.0) | 1,557.0 | 903 | 1,271 | 1,271 |
| 112 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | 100 | (170.0) | 1,883.0 | 2,645 | 3,789 | 3,789 |
| 113 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | 100 | (16.0) | 1,979.0 | 1,250 | 1,675 | 1,675 |
| 114 | වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය 4 | 100 | 1.0 | 112.5 | | | 24 |

| | ආයතනයේ නම | රජය සතු කොටස් ප්‍රමාණය | ලාභය/(අලාභය) 2009 රු. මිලියන | 1 ඇද වන විට ප්‍රාග්ධන ආයෝජනය රු. මිලියන | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 2007 | 2008 | 2009 |
| 115 | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය | 100 | (10.0) | 1,318.0 | 128 | 226 | 226 |
| 116 | ජලසම්පත් මණ්ඩලය | 100 | 0.3 | 154.3 | 243 | 251 | 244 |
| 117 | වයඹ විශ්ව විද්‍යාලය | 100 | (71.0) | 1,061.0 | 453 | 530 | 530 |
| 118 | විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලාව | 100 | (3.5) | 174.5 | 110 | 115 | 125 |

[1] 31/12/2009 දිනට වූ ශේෂ පත්‍රය අනුව.

[2] 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ස්ථාපිත කරන ලද කොටස් ප්‍රාග්ධනයක් නොමැති ඇපයෙන් සීමිත සමාගමකි. මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදල මඟින් මූලික මූල්‍ය දායකත්වය ලෙස රු. මිලියන 373.4 ක් ආයෝජනය කර ඇත.

3 රෙදිපිළි කර්මාන්ත පුහුණු ආයතනය සහ රෙදිපිළි පුහුණු හා සේවා මධ්‍යස්ථානය යන ආයතන දෙක ඒකාබද්ධ කොට 2009 අංක 12 දරණ පනත යටතේ ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය නමින් ආරම්භ කොට 2009 ජූනි 15 දින සිට මෙහෙයුම් කටයුතු කරගෙන යනු ලබයි.

[4] 2009 වර්ෂයේදී ස්ථාපිත කොට ඇත.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවන අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න ඉස්සරවෙලා මම මෙය අහනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, (ආ) (i) යටතේ ගරු ඇමතිතුමා කිව්වා සියලුම රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා රජය සතු සමාගම් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත වාර්තා කරන බව අමාත්‍යතුමනි, ඔබතුමාගේ උත්තරයෙන් කිව්වේ ඒක නේද?

SriLankan Airlines, Mihin Air, RDA, Cricket Board මේවා එන්නේ නැහැ. ඒකයි මම අහලා තිබුණේ, මොනවාද එන්නේ නැත්තේ කියන එක. ඔබතුමා කිව්වා ඒ ආයතන එනවායි කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නයේ (ආ)(i)හි සඳහන් වන්නේ මෙසේයි:

(අ) (i) හි සඳහන් මුළු ආයතන සංඛ්‍යාවෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා නොකරන සංඛ්‍යාව කොපමණද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වාර්තා නොකරන සංඛ්‍යාව තමයි ඉල්ලන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සියලු රාජ්‍ය සංස්ථාවන්, රජය සතු සමාගම් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත වාර්තා කරන අතර, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි ඇමතිතුමා. ඔහොම කිව්වාට Cricket Board එක, SriLankan Airlines මෙතෙක් කල් ඇවිල්ලා නැහැ. ඒකයි මම ඇහැව්වේ. ඔබතුමා කියනවා, එන්න ඕනෑයි කියලා. නමුත් ඇවිල්ලා නැහැ. ඒකයි පරස්පරය. පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න ඉස්සර වෙලා උත්තරයේ පැහැදිලි කර ගැනීමක් කරන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
2007 සහ 2009 අතර වර්ෂ ගැනයි මන්ත්‍රීතුමා අහන්නේ. ඒ පිළිබඳව තමයි පිළිතුර දීලා තිබෙන්නේ. මේ ප්‍රශ්නයෙන් අහන්නේ මේ ආයතන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට හෝ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට වාර්තා කරනවාද කියලායි. වාර්තා කරනවා. වෙන් වෙන් ආයතන ලෙසත්, ආයතනයක ආයෝජන ආයතනයක් ලෙසත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හෝ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කළ යුතුයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම පළමුවන අතුරු ප්‍රශ්නය අහන්නම්කෝ. ඇමතිතුමනි, මේ ආයතන, මේ සංස්ථා බහුතරයක් අලාභයට යැවෙන්නේ. ඔබතුමන්ලා ගිය සුමානයේ සංස්ථා සභාපතිවරුන්ට, අධ්‍යක්ෂවරුන්ට සහ board meetings වලට එන නියෝජිතයන්ට සියයට 200කින් පඩි වැඩි කරලා තිබෙනවා. ජනතාවට රුපියල් 2,500ක පඩි වැඩි කිරීමක් කරන්න පොරොන්දු වෙලා, ඒක ඉෂ්ට කරන්න බැරි අවස්ථාවක මේ සංස්ථා සභාපතිවරුන්ට සහ ආණ්ඩුවේ හෙංචයියලාට මෙහෙම දෙන එක සාධාරණද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක සම්පූර්ණයෙන් අලුත් ප්‍රශ්නයක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. අලුත් ප්‍රශ්නයක් නොවෙයි. මම මේ අහන්නේ ආයතන සම්බන්ධව. හරියටම අහලා තිබෙන්නේ සංස්ථා, දෙපාර්තමේන්තු සම්බන්ධයෙන්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Let the Hon. Minister answer.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ ආයතන සියල්ල පාඩු ලබනවාය කියලා ගරු මන්ත්‍රීතුමා නිගමනය කරන දේ වැරදියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම කිව්වේ ආයතන බහුතරයක් ගැනයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා සංඛ්‍යා ලේඛන හා වාර්තා කියෙව්වොත් ඒක පැහැදිලි වෙනවා ඇති.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකට උත්තරය ඔතැන තිබෙනවා නේ ඇමතිතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ ලේඛනය කියවලා බැලූ විට ඔබතුමා කියන බහුතරය පාඩු ලබනවාය කියන එක ඒ ගණයට වැටෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අදාළ නැති ප්‍රශ්නයක් අහන්නේ. වැටුප් වැඩි කිරීම ගැන හැම දාම කියනවා. රුපියල් 2,500 -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. මම කියන්නේ අපේ ජනතාවට පඩි වැඩි කරන්න කියන එකයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගරු ඇමතිතුමාට උත්තරය දෙන්න ඉඩ හරින්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැන් අපි සියලු වැටුප් ලබන අය ආදායම් බදුවලට අන්තර්ගත කර තිබෙනවා. මොන තරම් ඉදිරි පියවරක්ද? ඒක අගය කරන්නේ නැද්ද? මම එතුමාගේ ප්‍රශ්නයට ප්‍රශ්නයක් අහන්නේ. අදාළ නැති ප්‍රශ්නයක් ඇහුවාම මම අහන්නේ දැන් -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තවම පළමුවැනි අතුරු ප්‍රශ්නයේ ඉන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නයට උත්තර දී අවසන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නය පඩි වැඩි කරපු එක හරිද කියලායි. එතුමන්ලාම කියනවා පඩි වැඩි කරන්න කියලා. හැම දාම මෙතැනට ඇවිල්ලා කියනවා පඩි වැඩි කරන්න කියලා. සමහර කොටස්වල පඩි වැඩි වීම හරිද කියලායි අහන්නේ. අඩු වෙනවා, වැඩි වෙනවා, ඒ තිබෙන වැටුප් තලයන් අනුව හා ඒ ආයතනවල පිළිගැනීම අනුව. දැන් බලන්න, කථානායකතුමාගේ වැටුප, මහ ලේකම්තුමාගේ වැටුප හා සමාන වෙන්නේ නැහැ නේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඒ වැටුප් තලයන් වැඩි වෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවයි වැඩි වෙන්නේ, අනුපාතිකව. ඉතින් ඒක ගරු මන්ත්‍රීතුමා දන්නවා. දැන ගෙන තමයි ප්‍රශ්නය අහන්නේ, මේක ආණ්ඩුවේ ඕනෑකමට වැඩි කළාය කියා. නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ වැටුප් වැඩි වෙන ව්‍යවස්ථාවක් තිබෙනවා. ඒවායෙහිදී අනුගමනය කළ යුතු චක්‍රලේඛන තිබෙනවා. අපි ජනතාවගේ ආදායම් මාර්ග වැඩි කිරීමේ ක්‍රමවේදයන් කිහිපයක් අනුගමනය කළා. යම් ප්‍රමාණයකට බදු සහන දී තිබෙනවා. වෙනදාට වඩා බදු අඩු කරලා තිබෙනවා. සාමාන්‍ය සේවකයාට පවා ලබා දිය හැකි සහන දී තිබෙනවා. අර්ථ සාධක අරමුදල, ETF, gratuity ආදී මේවා ගැන හුභාක් කතා කරනවා. මේවාට දමලා තිබුණු බද්ද අපි අයින් කළා. පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් අපි ගෙනෙන්න යනවා. තමුන්නාන්සේලා ඒ ගැන සතුටක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වම් අතේ තිබෙන එක අරගෙන දකුණු අතට දෙන්න ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් ඕනෑ නැහැ. ඔබතුමන්ලා කෑ ගහන්න ඕනෑ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා ප්‍රශ්නයට පිළිතුරු දුන්නාද ගරු ඇමතිතුමනි?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පිළිතුරු දුන්නා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. ඇමතිතුමන්ලාගේ පඩිය ලක්ෂයකින් වැඩි කිරීමටත්, සභාපතිවරු, අධ්‍යක්ෂවරු ආදී 250ක් 300ක් වන සුළු කොටසකගේ පඩි වැඩි කිරීමටත් තිබෙන ආශාව ඇයි වැඩ කරන අහිංසක ජනතාව වෙනුවෙන් නැත්තේ? වැඩ කරන ජනතාවට රුපියල් 2,500 ලබා දෙන්නේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නය තමයි අපි අහන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අය වැය ලේඛනය ඉදිරිපත් කරපු අවස්ථාවේදී 1,600ක් දක්වා අලුත් ආදායම් මාර්ග වැඩ කරන ජනතාව සඳහා අපි ලබා දී තිබෙනවා.

තමුන්නාන්සේ කථා කරන්නේ සංඛ්‍යා ලේඛනයක් ගැනයි. තවත් ආදායම් මාර්ග වැඩි කර ගත හැකි ක්‍රමවේදයන් අය වැය ලේඛනයෙන් සකස් කරලා තිබෙනවා. තමුන්නාන්සේලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ, කථානායකතුමාගේ, නියෝජ්‍ය කථානායකතුමාගේ වැටුප් වැඩි වීමට විරුද්ධ නම් පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පත ආවාම එයට විරුද්ධව ඡන්දය දෙන්න. තමුන්නාන්සේලා පක්ෂව ඡන්දය දීලා අද මෙහෙම අහන එක සාධාරණ නැහැ. ඔබතුමන්ලාත් මේකේ හවුල්කාරයෝ. ඔබතුමන්ලා හවුල්කාරයෝ වෙන්න කැමැති නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුකාරවරුන්ට ගෞරවයක් ඇතිව ස්වාධීනව ඔවුන් හොඳ වැටුප් තලයක පිහිටුවලා තියන්න අකමැති නම්, පාර්ලිමේන්තුවට ඒ යෝජනාවල් එන කොට විරුද්ධ වෙන්න. ඔබතුමන්ලා අහන්නේ මේ තෝරා ගත්ත- [බාධා කිරීමක්] දැන් විපක්ෂ නායකතුමාගේ වැටුප් වැඩි වීමට තමුන්නාන්සේලා වැඩි දෙනා විරුද්ධ වෙන එක පුදුමයක් නොවෙයි. ඒක යූඑන්පී එකේ සිරිතක්. එතුමා ගැන එච්චර සතුටක් නැහැ. ඒකයි. අපි සතුටුයි එතුමාට වාහන දෙනවා; අලුත් ගොඩනැඟිලි දෙනවා; ආරක්ෂාව දෙනවා; පිරිත් කියනවා; පින් දෙනවා. ඔක්කොම කර දෙනවා එතුමාට.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර අවසානද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ නම සඳහන් කරපු නිසා ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔව්. විපක්ෂ නායකතුමාට පැහැදිලි කිරීමට අවස්ථාව දෙන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මම ගත්තේ මොන්ටෙරෝ වාහනයක් විතරයි අවුරුදු ගණනාවකින් පස්සේ. අනික අගමැති වුණාමත් මම වැඩ කළේ මන්ත්‍රීවරයකුගේ පඩියෙන්. දැන් හරි මට ඒක කරන්න පුළුවන්. ඒත් අර 2,500 රජයේ සේවකයන්ට ලබා දෙන්න කියලා මම කියන්න කැමැතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා උත්තර දුන්නා නේ. [බාධා කිරීමක්] දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තුන්වැනි අතුරු ප්‍රශ්නය වශයෙන් අහන්නේ මේ ගැනයි. ශ්‍රීලන්කන් ආයතනය ගැන, මිහින් එයාර් ආයතනය ගැන, Road Development Authority එක ගැන, Sri Lanka Cricket ආයතනය ගැන, ඒ වාගේම මම දැන් ප්‍රශ්න කරලා ගරු නියෝජ්‍ය කථානායකතුමා අහන්න බැහැය කියපු ප්‍රශ්නය වන මේ පාර්ලිමේන්තුවේ ලක්ෂ 12ක වංචාවක් තිබෙනවා කියලා Secretary-General, ධම්මික කිතුල්ගොඩ මැතිතුමා කියන දේවල් ගැන අපි උත්තර දෙන්නේ කොහෙන් කරුණු ලබා ගෙනද කියන එක පිළිබඳව කරුණාකරලා අප දැනුවත් කරන්න පුළුවන්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එක් එක් ආයතන ගැනත්, එක එක අඩු පාඩු, වංචා ගැනත් තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න අහනවා. පාර්ලිමේන්තුවේ දී ඕනෑම අවස්ථාවක ප්‍රශ්නයක් අහන්න පුළුවන්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊළඟ ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ ප්‍රශ්නයට උත්තරය ලැබුණේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තරේ දුන්නා.

## නීරක්තියෙන් පෙළෙන ගර්භිණී මව්වරුන් : ක්‍රියාමාර්ග

குருதிச்சோகையினால் பாதிப்புறும் கர்ப்பிணித் தாய்மார்: நடவடிக்கை

PREGNANT MOTHERS SUFFERING FROM ANAEMIA : MEASURES TAKEN

1021/'10

7. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ නීරක්තියෙන් පෙළෙන බවට වාර්තා වී ඇති ගර්භිණී මව්වරුන්ගේ ප්‍රතිශතය කොපමණද;

(ii) ගර්භිණී මව්වරුන් අතර පවතින නීරක්තිය නැති කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) රජයේ එම ක්‍රියා මාර්ග ගර්භිණී මව්වරුන්ගේ නීරක්තිය අවම කිරීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්,ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டு இறுதியில் இலங்கையில் குருதிச் சோகையினால் பாதிக்கப்பட்டிருப்பதாக அறிக்கை யிடப்பட்டுள்ள கர்ப்பிணித் தாய்மார்களின் சதவீதம் எவ்வளவென்பதையும்;

(ii) கர்ப்பிணித் தாய்மார்கள் மத்தியில் நிலவுகின்ற குருதிச்சோகையை ஒழிப்பதற்காக அரசாங்கம் மேற்கொண்டுள்ள நடவடிக்கைகளையும்;

(iii) அரசாங்கத்தின் மேற்படி நடவடிக்கைகள் கர்ப் பிணித் தாய்மார்களின் குருதிச்சோகையைக் குறைப்பதற்குப் போதுமானதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state-

(i) the percentage of pregnant mothers in Sri Lanka reported to be suffering from anaemia, by the end of the year 2010;

(ii) the measures that have been taken by the Government to eradicate anaemia that prevails among pregnant mothers;

(iii) whether those measures taken by the Government are sufficient to minimize anaemia among pregnant mothers ?

(b) If not, why ?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) i. 16.7% යි.

ii.
- සෑම ගර්භිණී මවකටම සති 12න් පසුව හා ප්‍රසූතියෙන් මාස 6ක් දක්වා යකඩ, ෆෝලික් අම්ලය හා විටමින් "සී" පෙති ලබා දීම.
- සෑම ගර්භිණී මවකටම යකඩ බහුල ආහාර තම ආහාර වේලට එක්කර ගැනීම පිළිබඳ උපදෙස් දීම.
- ගර්භිණීභාවය ආරම්භයේදී හා සති 28දී හිමොග්ලොබින් ප්‍රමාණය නිර්ණය කිරීම හා නීරක්තියෙන් පෙළෙන බවට හඳුනා ගත් මවුවරුන් සඳහා නිසි ප්‍රතිකාර ලබා දීම.
- සෑම ගර්භිණී මවකටම සති 12න් පසුව පණු ප්‍රතිකාර ලබා දීම.
- මැලේරියාව සෑදීමේ අවධානම ඇති මව්වරුන්ට මැලේරියා ප්‍රාරක්ෂණ ලබා දීම.
- මැලේරියාව වැළඳුණු මව්වරුන් සඳහා නිසි ප්‍රතිකාර ලබා දීම.
- සෑම ගර්භිණී මවකටම මාතෘ සායනයේදී ත්‍රිපෝෂ පැකට් 2 බැගින් මාසිකව ලබා දීම.
- නීරක්තියේ රෝග ලක්ෂණ පිළිබඳ මාතෘ සායනයේදී හා පවුල් සෞඛ්‍ය සේවිකාව හා ගෘහ පිවිසුම්වලදී නිරතුරු පරීක්ෂා කිරීම.

(iii) ඔව්.

(ආ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න අහනවාද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අතුරු ප්‍රශ්න තුනක් තිබෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේදී සඳහන් කළා නීරක්තිය සඳහා තිරසාර විසඳුමක් ලබා දීම සඳහා නිරන්තර රුධිර පරීක්ෂණ සිදු වනවාය කියලා. ඇත්ත වශයෙන්ම හීමෝග්ලෝබින් සඳහා වූ රුධිර පරීක්ෂණ බහුතරයක් සිදු වන්නේ ගර්භිණී මව්වරුන්ගේ පෞද්ගලික වියදමින්. අපේ රටේ තිබෙනවා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස 325ක්. ඔබතුමාගෙන් මම අහන්න කැමැතියි, එක කොට්ඨාසයකට එක බැගින් රුධිර පරීක්ෂණ ඒකක පිහිටුවලා ගර්භිණී මව්වරුන්ට නොමිලේ හීමෝග්ලෝබින් සඳහා වූ රුධිර පරීක්ෂණ සිදු කරන්න ඔබතුමන්ලාගේ සැලැස්මක් තිබෙනවාද කියලා?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාතෘ සායන සඳහා පැමිණෙන කිසිදු මවකගෙන් මුදල් අය කිරීමක් කරන්නේ නැහැ. මොකද, නිදහස් සෞඛ්‍ය සේවාවක් තිබෙන්නේ. ඔවුන් අදාළ - ආසන්නයේ පවතින- සෞඛ්‍ය ආයතනවලට, එහෙම නැත්නම් රෝහල්වලට යවා ඒ රෝහල්වල තිබෙන පරීක්ෂණාගාරවලින් තමයි ඒ කටයුතු කරන්නේ. මොකද, ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරි කාර්යාලයේ සියලු පහසුකමක්ම නැහැ.අදාළ රෝහල් තුළ labs තිබෙනවා. ඒවාට යොමු කර මේ පරීක්ෂණ කටයුතු කරනවා. මුදල් අය කිරීමක් ගැන නම්-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 2.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දෙවන අතුරු ප්‍රශ්නයට පෙර මා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා මේ කාරණය ගැන. ඇත්ත වශයෙන්ම මේ රටේ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගර්භිණී මව්වරුන් සියයට 90ට වැඩි ප්‍රමාණයක් ඒ රුධිර පරීක්ෂණ කටයුතු කර ගන්නේ පෞද්ගලික රුධිර පරීක්ෂණ ආයතනවලින්. ඔබතුමා මා අහපු ප්‍රශ්නයට නිවැරදි පිළිතුරක් ලබා දෙන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන්නේ නිදහස් සෞඛ්‍ය ප්‍රතිපත්තියක්. කිසිම රාජ්‍ය ආයතනයකින් මුදල් අය කර සෞඛ්‍ය සේවයක් ලබා දෙන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, මා ඇහුවේ රුධිර පරීක්ෂණ ගැන.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔව්. මව්වරුන්ගේ ඒ අදාළ පරීක්ෂණ සියල්ලම ඒ ආයතනවලින් කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා වග කීමෙන්ද ඒක කියන්නේ? [බාධා කිරීමක්] හරි. හරි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමාගේ පිළිතුරේ සඳහන් කළා, යකඩ පෙති ලබා දීමක් සිදු වනවා කියලා. ඇත්ත වශයෙන්ම මේ යකඩ පෙති ලබා දීමේදී ඉල්ලුමට සරිලන සැපයුමක් නැහැ. යකඩ පෙතිවල ඌනතාවක් තිබෙනවා. ඒකට ප්‍රධානතම හේතුව තමයි මේ යකඩ පෙති නිෂ්පාදනය කරන්නට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවට හැකියාවක් නැතිකම. බොහෝ යකඩ පෙති ගෙන්වන්නේ පිට රටින්. ඒ නිසා ඔබතුමන්ලාගේ සැලැස්මක් තිබෙනවාද මේ නීරක්තියට විසඳුමක් සඳහා ලබා දෙන යකඩ පෙති නිෂ්පාදනය කිරීම අපේ රටේ ක්‍රියාත්මක කරන්නට?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි යකඩ පෙති විතරක් නොවෙයි, අවශ්‍ය සියලුම බෙහෙත් ද්‍රව්‍ය, පෙති ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කරනවා. යම්කිසි හිඟතාවක් තිබුණොත්, ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ නිෂ්පාදනවලට අමතරව අඩු දේවල් තිබෙනවා නම් හෝ අමාත්‍යාංශය යටතේ නිෂ්පාදනය කරන්නේ නැති දේවල් තිබෙනවා නම් ඒවා අපේ අමාත්‍යාංශය හරහා ගෙන්වන්නට කටයුතු කර තිබෙනවා. ඒවා මව්වරුන්ට හිඟයක් නැතිව ලබා දෙන්නට අපි අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. යකඩ අඩුවක් නැහැ. තමුන්නාන්සේ යකඩ අඩුයි කියලා දක්වන්න හේතුව -යකඩ අඩු වුණාම ළමයි හම්බ වන්නේ නැහැ. ඒ වාගේ දේවල් වෙනවා ඉතින්. යකඩ වැඩි කරන්න-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අතුරු ප්‍රශ්නයක් නොවෙයි. මම බොහොම වග කීමෙන් මේ ප්‍රශ්න අහන්නේ. යකඩ පෙති නිෂ්පාදනයක් අපේ රටේ සිදු වන්නේ නැහැ. පිට රටින් ගෙන්වන්නේ. ඉතින් ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඇහුවේ ඒ සම්බන්ධයෙන් ඔබතුමාගෙන් ප්‍රශ්නයක්.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒක නොවෙයි මට තිබෙන ප්‍රශ්නය ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ මව්වරුන් සම්බන්ධයෙන් අදාළ ප්‍රතිකාර අදාළ සෞඛ්‍ය වෛද්‍ය ඒකකය තුළින් ලබා දෙනවාද කියන එකයි ප්‍රශ්නය. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමන්ලා හරහා ඒ කටයුතු කරලා තිබෙනවා. එතුමා යකඩ පෙති නිෂ්පාදනය සම්බන්ධයෙන් වෙනම ප්‍රශ්නයක් ඇහුවොත් උත්තර දෙන්න පුළුවන්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තර දුන්නා. දැන් තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙකයි. විශේෂයෙන්ම නීරක්තිය වළක්වා ලීමට බොහෝ දෙනා සඳහන් කරන විසඳුම තමයි ප්‍රධාන ආහාර වර්ග යකඩවලින් සබල කිරීම. ඉංග්‍රීසියෙන් කියන්නේ "staple food fortification with iron" කියලා. නමුත් මෙවන් වැඩසටහනක් අද ජාතික ප්‍රතිපත්තියට ඇතුළත් වෙලා නැහැ. ඔබතුමා දන්නවා හොඳාකාරවම පසු ගිය කාලයේ මේ රටේ අයඩීන් ඌනතාව තිබෙන කොට ලුණු අයඩීන්කරණය ජාතික ප්‍රතිපත්තියක් වුණ බව. ඒ වාගේම එය රටේ නීතියක් බවට පත් වුණා. ඒ නිසා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ප්‍රධාන ආහාර යකඩවලින් සබල කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නට ඔබතුමන්ලාට සැලැස්මක් තිබෙනවාද කියලා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි මෙතුමා කියන විධියට යකඩ කන්න දෙන්න, එහෙම දෙයක් කරන්න නොවෙයි ඕනෑ. අපේ පෝෂණ වැඩසටහන්වලට මව්වරුන් යොමු කෙරෙනවා. එහිදී ඒ උපදේශන සියල්ල ලබා දෙනවා. එහෙම නැතිව යකඩ අඩුයි කියලා යකඩ කන්න කියන එක නොවෙයි අවශ්‍ය. ජාතික ප්‍රතිපත්තියක් තිබෙනවා. ඒ ප්‍රතිපත්තිය තුළ මේ කටයුත්ත

ක්‍රියාත්මක කරන්නේ සුදුසුකම් ලද වෛද්‍යවරුන්. මාතෘ සෞඛ්‍ය සම්බන්ධයෙන් ඉතාම ඉහළ තත්ත්වයක් තිබෙනවා. අපි මේක හැල්ලුවට ලක් කරන්නේ නැහැ. අපි අද සෞඛ්‍ය දර්ශක දිහා බැලුවොත්, මාතෘ මරණ අනුපාතය ලක්ෂයකට 33.5යි. අවුරුදු පහට අඩු මරණ අනුපාතය දාහට 12යි. ළදරු මරණ අනුපාතය දාහට දශම දහයයි දෙකයි. ප්‍රතිශක්තිකරණ ආවරණය සියයට 98ක්. එහෙම සෞඛ්‍ය තත්ත්වයක් තමයි මේ රටේ තිබෙන්නේ. මෙතුමන්ලා සමහර විට එකම දර්ශකයක් පෙන්වන්නේ. යකඩ අඩුකම, අඩු බර, නීරක්තිය යන මේ සියල්ලම මේ අවුරුදු 10ක කාලය තුළ යම් මට්ටමක තිබෙනවා. එය අඩු කිරීම සඳහා තමයි දැනටමත් ජාතික පෝෂණ වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේ. මම පැහැදිලිව කියනවා මේ වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශයට, ඇමතිතුමාට, වෛද්‍යවරුන්ට විතරක් පැවරෙන්නේ නැති බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වගකීම ප්‍රජාව සතුව තිබෙනවා. "පෝෂණය සැම වෙත-වගකීම ඔබ අත." විවිධ වැරැදි දේවල් වැරැදි ආකාරයට තිබෙනවා. "පීඩියාෂුවර්" කියන දැන්වීමක් මේ දිනවල රූපවාහිනියේ පෙන්වනවා තමුන්නාන්සේලාත් දකිනවා ඇති. ඒ ළදරුවා නැඟිටලා කථා කරනවා. මව් කිරි තුළ පෝෂණය තිබෙනවා. මව් කිරි තුළ තිබෙන අම්ලය තමයි මේ "පීඩියාෂුවර්" කියලා ලොකුවට දාලා පෙන්වන්නේ. මව් කිරි තුළ ඒ දේ තිබෙනවා. මෙවැනි දේවල්වලටවත් තහංචි පනවන්න ඕනෑ. දැන් මොහොතකට කලින් පෝෂණය සම්බන්ධයෙන් අපේ මාධ්‍ය සාකච්ඡාවක් තිබුණා. පෝෂණයට අවශ්‍ය යකඩ දෙනවා කියලා ඒකට යකඩ පෙත්තක් හදන්න ඕනෑ නැහැ. මාතෘ පෝෂණය සම්බන්ධයෙන්, ළදරු පෝෂණය සම්බන්ධයෙන් වැඩසටහනක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඉතින් ඒ වැඩසටහන ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ තුළින් මාතෘ මරණ, ළදරු මරණ අඩු තත්ත්වයට ගේන්නත් පුළුවන් වෙලා තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් යම් ප්‍රතිපත්තියකට අනුව වැඩ කටයුතු කරන්න ඕනෑ. ලෝක සෞඛ්‍ය සංවිධානය, ජාත්‍යන්තර ආයතන යන ඒ සියල්ලත් එක්ක තමයි මේ කටයුතු කරන්නේ. මේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් දෙන්නෙක් ඉන්නවා. ඔවුන් මේ රටේ වෛද්‍ය විද්‍යාලවලින් අධ්‍යාපනය ලැබූ අය; සුදුසුකම් තිබෙන කට්ටිය. ග්‍රාමීය මට්ටමේ ජීවත්වන මව්වරුන් වැඩිදුර ප්‍රතිකාර සඳහා සායනවලට යොමු කිරීමට දිසා රෝහල් සහ මූලික රෝහල් තිබෙනවා. එතකොට ඔවුන්ට ඒ සායනයේ දී ප්‍රතිකාර ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. ඒක ඉතා ඉහළ තත්ත්වයක්. බෙහෙත් පෙත්තක් නිෂ්පාදනය කිරීම තුළින් පමණක් නොවෙයි මෙය සිදු වෙන්නේ. එවැනි වැඩසටහනක් මවුවරුන් සඳහා ක්‍රියාත්මක වනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරි, බොහොම ස්තුතියි.

## මාතලේ-රත්තොට මාර්ගය සංවර්ධනය : විස්තර
## மாத்தளை - ரத்தோட்டை வீதி அபிவிருத்தி: விபரம்
## DEVELOPMENT OF MATALE-RATTOTA ROAD: DETAILS

1060/'11

8. **ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මාතලේ - රත්තොට මාර්ගය සංවර්ධනය කිරීම ආරම්භ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා මිනුම් කටයුතු අවසන් කර මාර්ග සැලසුම් සකස් කර තිබේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල කොපමණද;

(iii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මෙම මාර්ගය පුළුල් කිරීමේ කටයුතුවලදී,

(i) පවරා ගනු ලබන ඉඩම් ප්‍රමාණය හා කඩා ඉවත් කරනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉඩම් හා නිවාස අහිමි වන අයගේ නම් කවරේද;

(iii) ඉහත දේපළ පවරා ගැනීමට අදාළව ගැසට් නිවේදනයක් නිකුත් කර තිබේද;

(iv) ගැසට් නිවේදනයක් නිකුත් කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත මාර්ගය පුළුල් කිරීමේදී පවරා ගනු ලබන දේපළ වෙනුවෙන් වන්දි ලබා දෙන්නේද;

(ii) ඒ සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) එම වන්දි මුදල් ගෙවා නිම කරන දිනය කවරේද;

(iv) පවරා ගනු ලබන ඉඩම් සඳහා විකල්ප ඉඩම් ලබා දෙන්නේද;

(v) එසේ නම්, එම ඉඩම් ලබා දෙන ස්ථානය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தளை - ரத்தோட்டை வீதியை அபிவிருத்தி செய்தல் ஆரம்பிக்கப்பட்டுள்ளது என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வீதியை அபிவிருத்தி செய்வதற்கான நிலஅளவைப் பணிகள் பூர்த்தி செய்யப்பட்டு வீதி வரைபடங்கள் தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்திற்காக மதிப்பிடப்பட்டுள்ள தொகை யாதென்பதையும்;

(iii) அதற்கென ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இவ்வீதியை விஸ்தரிக்கின்ற பணியின்போது,

(i) சுவீகரிக்கப்படும் காணிகளின் பரப்பளவு மற்றும் உடைத்தகற்றப்படும் வீடுகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி காணிகள் மற்றும் வீடுகளை இழப்போரின் பெயர்களையும்;

(iii) மேற்படி ஆதனங்கள் சுவீகரிக்கப்படுகின்றமை தொடர்பில் வர்த்தமானி அறிவித்தலொன்று வெளியிடப்பட்டுள்ளதா என்பதையும்;

(iv) வர்த்தமானி அறிவித்தலொன்று வெளியிடப்படா விடின் அதற்கான காரணங்கள் யாவை யென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) (i) மேற்படி வீதியை விஸ்தரிக்கின்றபோது சுவீகரிக்கப் படும் ஆதனங்களுக்கு இழப்பீடு வழங்கப்படுமா என்பதையும்;

(ii) அதற்கென ஒதுக்கப்பட்டுள்ள பணத் தொகை யாதென்பதையும்;

(iii) குறித்த இழப்பீட்டுத்தொகை செலுத்தி முடிக்கப் படும் திகதி யாதென்பதையும்;

(iv) சுவீகரிக்கப்படும் காணிகளுக்காக மாற்றுக் காணிகள் வழங்கப்படுமா என்பதையும்;

(v) அவ்வாறாயின், குறித்த காணிகள் வழங்கப்படும் இடம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Is he aware that development of Matale-Rattota Road has been started?

(b) Will he state-

(i) whether surveying has been completed and road plans have been prepared to develop that road;

(ii) the estimated amount for that project; and

(iii) the amount that has been allocated for this work ?

(c) Will he inform this House-

(i) the extent of land taken over and the number of houses demolished and removed in the activities connected to widening this road;

(ii) the names of the persons who will lose those lands and houses;

(iii) whether a gazette notification has been issued with respect to the aforesaid taking over of property; and

(iv) if a gazette notification has not been issued, the reasons for that?

(d) Will he state-

(i) whether compensation is provided for the property taken over in widening the aforesaid road;

(ii) the amount allocated for that;

(iii) the date on which payment of such compensation will be completed;

(iv) whether alternative lands will be provided for those taken over; and

(v) if so, the location from where such lands will be provided?

(e) If not, why ?

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Deputy Minister of Ports and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) රුපියල් මිලියන 500යි.

(iii) 2011 වසර සඳහා රුපියල් මිලියන 20යි

(ඇ) (i) ඉඩම් පවරා ගැනීමක් හෝ නිවාස කඩා ඉවත් කිරීමක් සිදු නොකරයි.

(ii) අදාළ නැත.

(iii) අදාළ නැත.

(iv) ඉඩම් පවරා ගැනීමක් සිදු නොකරයි.

(ඈ) (i) නැත.

(ii) අදාළ නැත.

(iii) අදාළ නැත.

(iv) අදාළ නැත.

(v) අදාළ නැත.

(ඉ) පැන නොනඟී.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම මාර්ගය පුළුල් කර සකස් කිරීමේ දී මධ්‍ය රේඛාව - centre street line - වෙනස් වෙනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු මන්ත්‍රීතුමනි, දැනට තිබෙන මාර්ගයේ පළල සලකා බලා, ඒකේ පුළුල් කළ යුතු සංඛ්‍යාව සලකා බලා, ඒකේ මධ්‍ය ලක්ෂ්‍ය ලකුණු කරලා එතැන ඉඳලා යි දෙපැත්තට අදාළ ලකුණු කිරීම් කරන්නේ. මධ්‍ය ලක්ෂ්‍ය තෝරා ගන්නේ දැනට තිබෙන පාරේ පළලත්, පළල් කළ යුතු සංඛ්‍යාවත් එකට එකතු කරලා ඒ ලක්ෂ්‍ය අනුවයි තෝරා ගන්නේ.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

දැනට එහි වෙනස් වීමක් සිදු වෙනවාද ගරු නියෝජ්‍ය ඇමතිතුමනි? [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය ඇමතිතුමා, දැනට ඒකේ වෙනස් වීමක් වනවාද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

නැහැ. පළමුවන අතුරු ප්‍රශ්නයයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පළමුවන අතුරු ප්‍රශ්නය ඇහුවා නේ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
එතුමා පළමුවන අතුරු ප්‍රශ්නය ඇහුවා. ඕනෑ නම් අහන්න, ප්‍රශ්නයක් නැහැ.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
පළමුවන අතුරු ප්‍රශ්නයම තමයි මා අහන්නේ. මා ඇහුවේ, ඒකේ වෙනස් වීමක් සිදු වනවාද කියලායි.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
දැනට තිබෙන මාර්ගයට අමතරව මාර්ග රක්ෂිතයෙන් පළල් වීමක් සිදු වනවා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. ඒ පවරා ගනු ලබන ඉඩම් සහ කඩා ඉවත් කරන නිවාස තක්සේරු කර තිබෙනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පැහැදිලි කළා, කිසිම පවරා ගැනීමක් නැහැයි කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පවරා ගැනීමක් වන්නේ නැහැයි කියා එතුමා කිව්වා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
මා කළුතර ඉඳලා එතුමාගේ දිස්ත්‍රික්කයේ මේ පාරේ ගිහින් බලලාත් තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
එම ඉඩම් පවරා ගෙන තිබෙනවා නම් ඒවාට වන්දි මුදලක් ගෙවනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමා, මට ප්‍රශ්නය පැහැදිලි වුණේ නැහැ.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ඒ අයට වන්දි මුදලක් ගෙවනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
එය අදාළ වන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. පවරා ගැනීමක් කරලා නැහැ.

## "හෙළ තුරු වියන" වැඩසටහන: දේශීය ශාක විශේෂ
## ஹெலதுறு வியன நிகழ்ச்சித்திட்டம்:உள்நாட்டுத் தாவர இனங்கள்
## "HELATHURU VIYANA" PROGRAMME : INDIGENOUS SPECIES OF TREES

1090/'11

9. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(1) :

(අ) (i) හෙළතුරු වියන වැඩසටහන යටතේ මෙතෙක් යුකැලිප්ටස් (eucalyptus) සහ පයිනස් (pinus) වගාවන් ඉවත් කර දේශීය ශාක ස්ථාපිත කරන ලද භූමි ප්‍රමාණය අක්කර කොපමණද;

(ii) එම ප්‍රදේශවල වගා කිරීම සඳහා තෝරා ගන්නා ලද දේශීය ශාක විශේෂ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම දේශීය ශාක තෝරා ගැනීමේදී යුකැලිප්ටස් සහ පයිනස් වගා මඟින් ජාතික දැව ඉල්ලුම සපුරාලීමට ලබා දෙන දායකත්වය ඒ හා සමානව සම්පූර්ණ කළ හැකි ආකාරයේ දේශීය ශාක විශේෂ තෝරා ගැනීමට අවධානය ලබා දී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹெலதுறு வியன' நிகழ்ச்சித்திட்டத்தின் கீழ் இதுவரை யூகலிப்டஸ் மற்றும் பைனஸ் செய்கையை நீக்கிவிட்டு உள்நாட்டுத் தாவரங்கள் நடப்பட்டுள்ள நிலப்பரப்பு எத்தனை ஏக்கர் என்பதையும்;

(ii) அந்தப் பிரதேசங்களில் செய்கைக்காக தெரிவு செய்யப்பட்ட உள்நாட்டுத் தாவர இனங்கள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இந்த உள்நாட்டுத் தாவரங்களைத் தெரிவுசெய்யும்போது, யூகலிப்டஸ் மற்றும் பைனஸ் செய்கைமூலம் தேசிய மரத்தேவையைப் பூர்த்திசெய்ய வழங்கும் பங்களிப்புக்கு சமனான வகையில் பூர்த்திசெய்யக்கூடிய விதத்தில் உள்நாட்டுத் தாவரங்களைத் தெரிவுசெய்வதில் கவனம் செலுத்தப்பட்டுள்ளதா என்பதை அவர் குறிப்பிடுவாரா ?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the acreage of land in which eucalyptus and pinus plantations have been removed and indigenous species of trees have been planted in place of them by now under the "Helathuru Viyana" programme; and

(ii) the indigenous species of trees which have been selected to be planted in the aforesaid areas?

(b) Will he state whether attention has been paid to select indigenous species of trees which can provide the same contribution made by eucalyptus and pinus plantations to meet the national timber demand in selecting indigenous species of trees mentioned above?

(c) If not, why ?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா )
(The Hon. Anura Priyadharshana Yapa )

(අ) (i) හෙළ තුරු වියන වැඩසටහනට අදාළව යුකැලිප්ටස් (eucalyptus) සහ පයිනස් (pinus) වගාවන් ඉවත් කර දේශීය ශාක ස්ථාපිත කරන ලද භූමි ප්‍රමාණය හෙක්ටයාර් 241.4කි. (අක්කර 596.25කි.)

(ii) හොර, පෙලන්, ලුනුමිදෙල්ල, මැහෝගනී හා පිහිඹිය වගා කිරීම සඳහා තෝරා ගන්නා ලද දේශීය ශාක විශේෂ වේ.

(ආ) මේ සම්බන්ධයෙන් අවධානය යොමු වී තිබේ.

(ඇ) පැන නොනඟී.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, my first Supplementary Question is - I will ask them according to the Standing Orders - will the Hon. Minister explore the possibility of planting alternative trees in this area, preserving the watersheds of those mountains and the hilly places?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

Sir, that is the intention of the Ministry. We are taking all steps to preserve the watersheds in those areas. We have seen that in places where eucalyptus is grown, the watersheds have been affected. So, our intention is to remove the eucalyptus in a systematic manner to preserve the watersheds.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Then, the second Supplementary Question is, will you take steps to implement the provisions in the Declaration of the Nagoya Conference, which the Hon. Minister and myself attended in two sessions, in keeping with the Question I have raised, as far as the pinus and eucalyptus trees are concerned?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

Yes. We have taken notice of the problem and we will definitely take action on it. We have already earmarked in the plan how to cut the eucalyptus trees that have already been planted in various parts of the Island and definitely, those will be replaced by our own varieties.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, my third and final Supplementary Question is, in keeping with the national requirement or the need of the hour, when you uproot the eucalyptus and pinus trees, would vegetables be grown in those places for the benefit of the people of the country? - [*Interruption.*] Grass to feed you; grass to feed the

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

We will find it out, Sir.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Thank you. See how nicely the Hon. Minister answered.

## ජාතික ලොතරැයි මණ්ඩලය : ලාභ හෝ අලාභ
## தேசிய லொத்தர் சபை: இலாப நட்டம்
## NATIONAL LOTTERIES BOARD: PROFIT OR LOSS

0450/'10

10. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) පසුගිය වර්ෂ පහ සඳහා,

(i) ජාතික ලොතරැයි මණ්ඩලයේ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) එම එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට ඉහත ආයතනයේ ශේෂ පත්‍රයේ තත්ත්වය කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ පහ සඳහා වූ එක් එක් වර්ෂයේ මූල්‍ය වාර්තා සමඟ ලබා දුන් විගණන වාර්තා පිළිබඳව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ජාතික ලොතරැයි මණ්ඩලයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) පසුගිය වර්ෂ පහ සඳහා එක් එක් වර්ෂයේදී ජාතික ලොතරැයි මණ්ඩලය විසින් රජයට ලබා දී ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய லொத்தர் சபையின் கடந்த ஐந்து ஆண்டுகளுக்கான இலாப, நட்டத்தையும்;

(ii) ஒவ்வொரு ஆண்டினதும் டிசெம்பர் 31ஆம் திகதியன்றுள்ளவாறு மேற்படி நிறுவனத்தின் ஐந்தொகை நிலையையும்

அவர் வெவ்வேறாக குறிப்பிடுவாரா?

(ஆ) கடந்த ஐந்து வருடங்களாக ஒவ்வொரு ஆண்டு நிதி அறிக்கையிலும் வழங்கப்பட்ட கணக்காய்வு அறிக்கை குறித்து அவர் தனித்தனியாக தெரிவிப்பாரா?

(இ) (i) தேசிய லொத்தர் சபையில் பணியாற்றும் ஆட்களின் எண்ணிக்கையையும்,

(ii) கடந்த ஐந்து வருடங்களாக, தேசிய லொத்தர் சபையால் அரசாங்கத்திற்கு அனுப்பப்பட்ட பணத் தொகையை வருடாந்த அடிப்படையிலும் அவர் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state, separately, for last five years-

(i) the profit or loss of National Lotteries Board; and

(ii) the status of the Balance Sheet of the aforesaid institution as at 31st, December of each year?

(b) Will he inform this House of the audited report given in the financial report of each year, separately, for last five years?

(c) Will he state-

(i) the number of people working in the National Lotteries Board; and

(ii) the amount of money transferred to the Government by the National Lotteries Board for last five years on per year basis?

(d) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) වසර පහක කාලය තුළ ලාභය පහත සඳහන් පරිදි වේ.

| වසර | ලාභය රු. මිලියන |
|---|---|
| 2006 | 58.32 |
| 2007 | 70.67 |
| 2008 | 43.04 |
| 2009 | 45.51 |
| 2010 | 31.63 |

(ii)

ශේෂ පත්‍රයේ තත්ත්වය (රු. මිලියන)

| දෙසැම්බර් 31 දිනට | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| ජංගම නොවන වත්කම් | 383.84 | 411.07 | 175.18 | 207.75 | 1,192.32 |
| ජංගම වත්කම් | 2,318.95 | 2,215.79 | 2,172.03 | 1,989.67 | 1,974.60 |
| මුළු වත්කම් | 2,702.79 | 2,626.86 | 2,347.21 | 2,197.42 | 3,166.92 |
| **හිමිකම් සහ වගකීම්** | | | | | |
| සංචිත | 1,587.76 | 1,643.42 | 1,483.36 | 1,377.35 | 2,288.69 |
| ජංගම නොවන වගකීම් | 78.03 | 4 1.50 | 40.99 | 41.68 | 42.93 |
| ජංගම වගකීම් | 1,037.00 | 941.94 | 822.86 | 778.39 | 835.31 |
| මුළු හිමිකම් සහ වගකීම් | 2,702.79 | 2,626.86 | 2,347.21 | 2,197.42 | 3,166.93 |

(ආ)

| වසර | පාර්ලිමේන්තුවට වාර්තාව ඉදිරිපත් කළ දිනය |
|---|---|
| 2010 | වාර්තාව සකස් වෙමින් පවතී |
| 2009 | 2010 අගෝස්තු 17 |
| 2008 | 2009 සැප්තැම්බර් 14 |
| 2007 | 2008 අගෝස්තු 19 |
| 2006 | 2008 පෙබරවාරි 15 |
| 2005 | 2007 මාර්තු 28 |

* 2010 වාර්තාව සකස් වෙමින් පවතී. 2005 සිට 2009 වර්ෂවල පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය වාර්තා සමඟ විගණන වාර්තාද ඉහත සඳහන් දිනයන්හී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

(ඇ) (i) 2011.04.25 දිනට සේවක සංඛ්‍යාව

| | | |
|---|---|---|
| ස්ථිර සේවකයින් | - | 247 |
| කොන්ත්‍රාත් සේවකයින් | - | 36 |
| තාවකාලික සේවකයින් | - | 1 |
| මුළු සේවක සංඛ්‍යාව | - | 284 |

(ii) රජයට ලබා දී ඇති මුදල් ප්‍රමාණය පහත වගුවේ සඳහන් වේ.

| වසර | රු. මිලියන |
|---|---|
| 2006 | 845.91 |
| 2007 | 767.59 |
| 2008 | 898.28 |
| 2009 | 1,136.29 |
| 2010 | 1,173.46 |

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අතුරු ප්‍රශ්න ඇසීම අසාධාරණයි. නමුත් ඔය විස්තර තුළින් පිළිතුරු ලබා දෙන්න පුළුවන් නම් මගේ අතුරු ප්‍රශ්නවලටත් පිළිතුරු ලබා දෙන්න. රටේ ආර්ථික වර්ධන වේගය සම්බන්ධයෙන් බැලුවොත් මේ ආයතනය රටේ ආර්ථික වර්ධන වේගය සමඟම ඉදිරියට ගමන් කරලා නැහැ. ඒ වාගේම ලාභය අවුරුද්දෙන් අවුරුද්ද අඩු වෙලා තිබෙනවා කියන එක තමයි මට පැහැදිලි වුණේ. ඇයි එහෙම වෙන්නේ කියලා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් අපව දැනුවත් කරන්න පුළුවන්ද? එක පැත්තකින් ආදායම වැඩි වෙනවා, නමුත් ලාභය අඩු වෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා බලන පැතිකඩය යළිත් බලන ලෙස එතුමාට මම ආයාචනය කරන්න කැමැතියි. ඒ කියන්නේ ජාතික ලොතරැයි මණ්ඩලය විසින් රජයට ලබා දී ඇති මුදල් ප්‍රමාණය 2006 දී රුපියල් මිලියන 845යි, 2010 දී රුපියල් මිලියන 1,173යි. එතුමා පහත වැටීමක් ගැන කියන කතන්දරය සම්බන්ධයෙන්-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, ලාභය සම්බන්ධයෙන් කිව්වේ. ලාභය අඩු වෙලා තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ලාභය කථාව වාගේම රජයට දායක වනවා. රජයට දායකවීමෙන් රජය සංවර්ධනයට ආයෝජනය කරනවා. ඒකයි ලොතරැයියෙන් බලාපොරොත්තු වන්නේ. ඒ කටයුතු සිදු වෙමින් පවතිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් ශේෂ පත්‍රය දිහා බැලුවාම-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ලාභයේ අඩු වීම විශාල වෙනසකින් නැහැ. රුපියල් මිලියන 10ක අඩු වීමක්, වැඩි වීමක් පමණයි තිබෙන්නේ. ඔබතුමා ඉල්ලා සිටි විස්තර මා දැන් දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා ඒ ප්‍රශ්නය තමයි ඇහුවේ. සාමාන්‍යයෙන් ශේෂ පත්‍රයක් දෙස බැලුවාම, එහි ලාභ පාඩු ප්‍රකාශය දෙස බැලුවාම මේ තත්ත්වය හොඳින් පෙනෙනවා. මේ රටේ ආර්ථික වර්ධන වේගයක් ගැන කථා කරන අවස්ථාවේදී ආදායම ඒ කියන්නේ, ලාභය අඩු වීම තුළ ඇති වී තිබෙන ප්‍රශ්නයකුයි මා ඉදිරිපත් කළේ. ඒකට දෙන උත්තරය ආදායම් වැඩි වෙලා තිබෙනවාය කියන එක නොවෙයි. ආදායම් වැඩි වෙනවා වාගේම ඊට වැඩිය වියදම වැඩි වෙලා තිබෙනවා කියන එක ඔප්පු වෙලා තිබෙනවා. මා සරල ප්‍රශ්නයක් ඇහුවේ. නොදන්නවා නම් ඒකට මුදල් අමාත්‍යාංශයෙන් උත්තර දෙන එක ගැන ප්‍රශ්නයක් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දායක වීමත් සැලකිල්ලට ගන්න එපායැ ගරු මන්ත්‍රීතුමා. අපි කුමකටද මේ ආයතනය පිහිටුවලා තිබෙන්නේ කියන එක බලන්න ඕනෑ. මේ ආයතනය පිහිටුවා තිබෙන්නේ සංවර්ධන ලොතරැයියක් හැටියටයි. ඒ වාගේම ජාතික ලොතරැයියත් -මේ දෙකම- එහෙමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒවායේ මුදල් කුමකටද යොදවන්න ඕනෑ කියා බලන්න ඕනෑ. බැංකුවේ තියා ගෙන ඉන්න එකද, භාණ්ඩාගාරයට දායක වෙලා සංවර්ධනයට යෙදවීමද කරන්න ඕනෑ කියන එක බලන්න ඕනෑ. ඒ අතින් බලන කල රජයට ලබා දෙන මුදල් ප්‍රමාණය වාර්ෂිකව වැඩි වෙලා තිබෙනවා. ලාභය මිලියන 10ක-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අඩු වීමක් තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඉහළ හා පහළ අතර වෙනසකට පමණයි භාජනය වෙලා තිබෙන්නේ. ඒක විශාල දෙයක් නොවෙයි. රුපියල් මිලියන 10යි. ඔබතුමා පිළිගන්නවානේ ඒක ලොකු දෙයක් නොවෙයි කියලා. ඔබතුමා ව්‍යාපාරික පෙළැන්තියේ ඉතාමත් විශිෂ්ට කෙනෙක්. ගරු රවි කරුණානායක කියන්නේ ව්‍යාපාරික පෙළැන්තියේ-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ජාතික සංවිධායක.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ජාතික සංවිධායක ධුරයේ කිරුළ පැළැඳ තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
රුපියල් 10 රුපියල් 20ට වැඩි කරලාට පස්සේ ඒකෙන් තිබෙන ආදායමත් අඩු වෙලායි තිබෙන්නේ. ඒකයි ඔතැන-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please. අතුරු ප්‍රශ්න අංක 2.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දෙවැනි අතුරු ප්‍රශ්නය. කරුණාකර අපට කියන්න පුළුවන්ද ජාතික ලොතරැයි මණ්ඩලය තුළින් agentsලා කී දෙනෙක් පත් කරලා තිබෙනවාද කියන එක.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කවුද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Agentsලා කී දෙනෙක් පත් කරලා තිබෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ පිළිබඳව වෙනම ප්‍රශ්නයක් අහන්න වේවි. නියෝජිතයන් එක් කෙනෙක් නොවෙයි විශාල සංඛ්‍යාවක් සිටිනවා. ඒ පිළිබඳව වෙනම ප්‍රශ්නයක් ඇහුවොත් මම පිළිතුරු සපයන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 3.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා රජයට ලබා දීලා තිබෙනවා කියලා ආදායමක්. මේකෙන් කොතරම් ප්‍රමාණයක්ද බදු වශයෙන් ලබා දීලා තිබෙන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ප්‍රශ්නය අහලා නැහැ. බදු වශයෙන් වෙනම ලබා දී තිබෙන ප්‍රමාණය -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දීලා තිබෙන උත්තරයෙන් අහන්න පුළුවන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, නැහැ. දීලා තිබෙන උත්තරයෙන් බදු වශයෙන් දීලා තිබෙන ප්‍රමාණය කියන්න බැහැ. ඔබතුමා වෙනම ප්‍රශ්නයක් අහන්න. ඒකට පිළිතුරු දෙන්නම්.

## වන ජීවීන් සංරක්ෂණය කිරීම : ජාතික සැලැස්ම
## வன சீவராசிகளைப் பாதுகாத்தல்: தேசிய திட்டம்
## PROTECTION OF FAUNA : NATIONAL PLAN

1024/'10

**12. ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්තමානයේ අප රටේ වන ජීවීන් සංරක්ෂණය කිරීමේ ජාතික සැලැස්මක් තිබේද;

(ii) එසේ නම්, එය කාල වකවානු සහ ඉලක්ක සහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(iii) එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම උදෙසා ප්‍රමාණවත් සම්පත් අදාළ අමාත්‍යාංශය සතුව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது எமது நாட்டில் வன சீவராசிகளைப் பாதுகாப்பதற்கான தேசிய திட்டம் ஒன்று உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதனை காலவரையறைகள் மற்றும் இலக்குகள் சகிதம் அமுல்படுத்த நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iii) மேற்படி திட்டத்தை அமுல்படுத்தவதற்கு போதிய வளங்கள் சம்பந்தப்பட்ட அமைச்சிடம் உள்ளனவா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agrarian Services and Wildlife:

(a) Will he inform this House-

(i) whether there is a national plan to protect fauna in our country at present;

(ii) if so, whether action will be taken to implement it with set timeframes and targets;

(iii) whether the relevant ministry has adequate resources to implement the aforesaid plan ?

(b) If not, why?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**

(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)

(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)

(අ) (i) වන ජීවීන් සංරක්ෂණය කිරීමේ ජාතික සැලැස්මක් තිබේ.

වර්ෂ 2000 දී එළි දක්වන ලද ජාතික වනජීවී ප්‍රතිපත්තිය අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර ඇත. මෙම සංයුක්ත සැලැස්මේ හඳුනා ගන්නා ලද සංරක්ෂණ කාර්යයන් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජාතික උද්‍යාන හා වෙනත් වනජීවී රක්ෂිත කිහිපයක් සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කර ඇත. මෙම කළමනාකරණ සැලසුම්වල හඳුනා ගන්නා ලද එක් එක් ක්‍රියාකාරකම් සඳහා ඒකාබද්ධ අරමුදලෙන් ලැබෙන ප්‍රතිපාදන දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව යොදවා මෙම සැලසුම් ක්‍රියාත්මක කරනු ලැබේ.

(ii) කාල වකවානු සහ ඉලක්ක සහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

ජාතික වනජීවී ප්‍රතිපත්තිය අනුව පිළියෙල කරන ලද වනජීවී රක්ෂිත සඳහා කළමනාකරණ සැලසුම්වල හඳුනා ගන්නා ලද ක්‍රියාකාරකම් සඳහා නිශ්චිත කාල රාමු නිර්ණය කර ඇත. ඒකාබද්ධ අරමුදලෙන් ලැබෙන ප්‍රතිපාදන මෙම සැලසුම් ක්‍රියාත්ම කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සලැස්මට අනුව නිශ්චිත කාල රාමු සහිතව ක්‍රියාත්මක කරනු ලැබේ.

(iii) මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තු සතු කාර්ය මණ්ඩලය දැනට ප්‍රමාණවත් නොවන බැවින් එය වැඩි කර ගැනීමට සහ ඔවුන්ගේ ගැටලු විසඳීමට කටයුතු කරමින් පවතී. ප්‍රමාණවත් ප්‍රතිපාදන වාර්ෂික ඇස්තමේන්තු මඟින් වෙන් කර ඇත.

(ආ) අදාළ නැත.

**නියෝජ්‍ය කථානායකතුමා**

(பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Deputy Speaker)

අතුරු ප්‍රශ්න අංක 1.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**

(மாண்புமிகு சஜித் பிரேமதாஸ)

(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න තුනක් තිබෙනවා. ගරු ඇමතිතුමා, මම ඔබතුමාට සුබ පතනවා. සුබ පතන අතර, මාගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහනවා. මේ රටේ තිරසාර වනජීවී සංරක්ෂණ සැලැස්මක් ක්‍රියාත්මක කරන්නට නම් ක්ෂේත්‍රයේ නිලධාරින්ට හොඳ ධනාත්මක මානසිකත්වයක් තිබෙන්නට ඕනෑ කියා ඔබතුමා විශ්වාස කරනවා. නමුත් මම ඔබතුමාගෙන් පළමුවන අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ මෙයයි. 06/2006 චක්‍රලේඛනය -රාජ්‍ය සේවයේ වැටුප් විෂමතා ඉවත් කිරීමේ චක්‍රලේඛනය- සඳහා නිර්දේශ එවීමේදී වනජීවී දෙපාර්තමේන්තුව ප්‍රමාද වෙලායි ඒ නිර්දේශ යවා තිබෙන්නේ. ඒ නිසා සිදු වෙලා තිබෙන ප්‍රධාන ගැටලුව තමයි තනතුරුවල නම විතරයි තිබෙන්නේ කියන එක. නියමිත වැටුප් තලවල පිහිටුවලා නැහැ. මාණ්ඩලික, ද්විතීයික සහ ප්‍රාථමික කියා කාණ්ඩ තුනක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම උදාහරණයක් ගත්තොත් ප්‍රාථමික කාණ්ඩයේ කම්කරු තනතුර තිබෙනවා. නමුත් ඒ ප්‍රාථමික කාණ්ඩයට කම්කරු, නියාමක සහ අඩවි සහකාර කියන තුනම ඔබලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම නියාමක සහ අඩවි සහකාර කියන තනතුරු දෙක යන්න ඕනෑ බහු කාර්ය තාක්ෂණික නොවන තලයටයි. ඒ වාගේම අඩවි ආරක්ෂක II වන ශ්‍රේණිය සහ III වන ශ්‍රේණිය, තනි කාර්යයක් සඳහා වූ තාක්ෂණික නොවන නිලධාරි කාණ්ඩයේ තබා තිබෙනවා. නමුත් ඒවා බහුකාර්ය තාක්ෂණික නොවන තනතුරු. ඒ තලයේ තමයි පිහිටුවන්න ඕනෑ. මෙන්න මේ වාගේ බරපතළ විෂමතාවන් නිසා වනජීවී ක්ෂේත්‍රයේ නිලධාරින් ලොකු චිත්ත පීඩාවකට ලක් වෙලා සිටිනවා. ඒ අයගේ ලොකු මානසික කඩා වැටීමක් තිබෙනවා. මේ අඩු පාඩුව මඟ හරවා ගන්නට ඔබතුමා ගන්නාවූ පියවර මොකක්ද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**

(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)

(The Hon. S.M. Chandrasena)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැනුම් දෙන තුරු මා වෙත කවුරුවත් කරුණු ඉදිරිපත් කළේ නැහැ. මේ පිළිබඳව මම සොයලා බලන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**

(மாண்புமிகு சஜித் பிரேமதாஸ)

(The Hon. Sajith Premadasa)

සොයා බලා පියවරක් ගන්නවාද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**

(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)

(The Hon. S.M. Chandrasena)

මම සොයා බලන්නම්. ඒ පිළිබඳව මට තවම පැමිණිලි ලැබිලා නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**

(பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Deputy Speaker)

අතුරු ප්‍රශ්න අංක 2.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**

(மாண்புமிகு சஜித் பிரேமதாஸ)

(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙ වන අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු ඇමතිතුමනි, වනජීවී ක්ෂේත්‍රය තුළ බරපතළ සේවක හිඟයක් සහ සම්පත් හිඟයක් තිබෙනවා. ඔබතුමාගේ පිළිතුරෙන් මේක පිළිගත්තා. වනජීවී ක්ෂේත්‍රය පැය 24ටම සේවාවක් කරන ක්ෂේත්‍රයක්. වනෝද්‍යාන ගැන ඔබතුමා සඳහන් කළා. බංගලා භාරකරුවන්, කම්කරුවන්, නියාමකවරු ආදීන්ගේ ලොකු ඌනතාවක් තිබෙනවා. ඒ වාගේම මගේ දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙන යාල ජාතික වනෝද්‍යානය රටටම සම්පතක්. නමුත් මුළු ජාතික වනෝද්‍යානයටම තිබෙන්නේ එක වාහනයයි; එක කෲ කැබ් එකයි. ඒ, එල්ජී 8336 කියන කෲ කැබ් එක. වාහන දෙකක්ම වෙන්දේසියට දමා තිබෙනවා. 58-8038 ඩබල් කැබ් එකයි, 28-1403 බවුසරය. ඩිෆෙන්ඩර් ජීප් එකක් තිබුණා. මේ සම්පත් අවශ්‍යයි, සැබවින්ම වන සංරක්ෂණ සැලැස්මක් ක්‍රියාත්මක කරන්න. සේවක හිඟයටත්, සම්පත් හිඟයටත් ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය ගන්නාවූ පියවර මොකක්ද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**

(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)

(The Hon. S.M. Chandrasena)

දැනට සේවක හිඟය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන යොදා ගෙන යනවා. ඔබතුමා කිව්වා වාගේ වාහන තුන අලුත්වැඩියා කරලා පාවිච්චියට ගන්න ගියොත් විශාල වියදමක්

යනවා. ඒ නිසා අලුත් වාහන ලබා ගන්න අපි දැන් කටයුතු කර ගෙන යනවා. පරණ වාහන නඩත්තු කිරීම පාඩුයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙසේයි. අද රට පුරාවටම නොවිසඳුණු බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි අලි -මිනිස් ගැටුම. අලි- මිනිස් ගැටුම නිසා එක පැත්තකින් මිනිස් සම්පතත් තවත් පැත්තකින් වන සම්පතත් දැඩි ව්‍යසනයකට ලක් වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නයට යම්කිසි තිරසාර දීර්ඝ කාලීන විසඳුමක් ඔබතුමාවත් ක්‍රියාත්මක කරන්න. මොකද, මෙච්චර කල් පැවතුණු විසඳුම් සම්පූර්ණයෙන්ම අසාර්ථක විසඳුම් බවට පත් වෙලා තිබෙනවා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මා අවුරුදු 5ක තොරතුරු අරගෙන බැලුවා. මේ කාලවලදී මාධ්‍ය හරහා මේවා ඉස්මතු වෙලා තිබෙනවා. මොකද, රටේ ත්‍රස්තවාදය පැවැති කාලවලදී ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් තමයි මාධ්‍යවලින් ප්‍රචාරය වුණේ. අලි - මිනිස් ගැටුමේ විශාල වර්ධනයක් වෙලා නැහැ.

නමුත් අලි - මිනිස් ගැටුම නිසා දෙපැත්තෙන්ම -අලි සහ මිනිස්සු- විනාශ වන බව අපි දන්නවා. ඒ නිසා මේ වන විට අපි විශේෂ වැඩ පිළිවෙළවල් කිහිපයක් යොදා ගෙන තිබෙනවා. එකක් තමයි වෙහෙරගල අලි නැවතුම් ස්ථාන -රැඳවුම් ස්ථාන- හැටියට අක්කර 3,000ක් කොටු කරලා දරදඬු, ගෙවල් කඩන, වගා පාළු කරන අලින් රඳවන්න කටයුතු කිරීම.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොරොව්පතානේ නේද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
එකක් වෙහෙරගල. අනෙක හොරොව්පතානේ. මොකද, උතුරු නැගෙනහිරත්-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
වෙහෙරගල කියන්නේ ලුණුගම්වෙහෙර, වෙහෙරගල.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔව්. ලුණුගම්වෙහෙර, වෙහෙරගල. ඊළඟට ලබන අවුරුද්දේ මාදුරුඔය අක්කර 3,000ක් වෙන් කරනවා. මෑත කාලයේ අලි ඇතුන්ගේ ප්‍රමාණය හුඟාක් වැඩි වෙලා තිබෙනවා. 1993 අපි සාමාන්‍ය වශයෙන් සංගණනයක් කරලා තිබෙනවා. ඒ වෙලාවේ දී අලි 2,500කට 3,000කට ආසන්න ප්‍රමාණයක් ඉඳලා තිබෙනවා. දැන් අලි 5,500ක් 6,000ක් විතර ඉන්නවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, මම ඒකට පොඩ්ඩක් බාධා කරනවා. මේ වන තෙක් නියමානුකූල අලි සංගණනයක් සිදු වෙලා නැහැ. ඒ නිසා මම කියනවා මේ වසරේදීවත් ඒ සඳහා කටයුතු කරන්නය කියලා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
අපට ඒ සංගණනය කරන්න ලැබුණේ නැහැ. පසු ගිය කාලවල ත්‍රස්තවාදී ප්‍රශ්නය නිසා නිලධාරින්ට ඒ ප්‍රදේශවලට යන්න බැරි වෙලා තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කකුල් හතරේ අලි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඒ වාගේම නොයෙකුත් සංවර්ධන කටයුතු නිසා ඉඩම් අඩු වෙලා තිබෙනවා. එක් දහස්නවසිය තිස් ගණන්වල සියයට 40ක් කැලේ තිබිලා තිබෙනවා. ජනාවාස සියයට 60ක් පමණ තිබිලා තිබෙන්නේ. දැන් සියයට 21ක් පමණ තමයි කැලේ තිබෙන්නේ. ඉතිරි ඉඩම් ඔක්කොම ජනාවාස වෙලා. අලි වැඩි වෙලා තිබෙනවා. ඉඩම් අඩු වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අපි මේ රැඳවුම් මධ්‍යස්ථාන ඇති කරන්නේ. ඒ වාගේම අලින්ට ආහාර දෙන්න - කකුල් හතරේ අලින්ට- ලැහැස්ති කරලා තිබෙනවා. ඒ වාගේම මේ ළඟදී පොළොන්නරුව, ගිරිතලේ පුහුණු මධ්‍යස්ථානයේ වැඩ මුළුවකදී අපේ මාධ්‍යවේදීන් ඉදිරිපත් කළා, මේ "වල් අලියා" කියන එක හොඳ නැහැ, ඒක අලියාට කරන අගෞරවයක් කියලා. ඒ නිසා දැන් අපි "වන අලියා" කියලා පාවිච්චි කරන්නත් තීන්දු කරලා තිබෙනවා. ඒ අනුව අපි අලින්ට ලොකු ගෞරවයකුත් ලබලා දුන්නා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 13. [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩි පැහැදිලි කිරීමක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පොඩි පැහැදිලි කිරීමක් තිබෙනවා. මයික් එක දෙන්න. පැහැදිලි කිරීමක් තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පැහැදිලි කිරීමක් ද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
හොඳයි කියන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමාගෙන් මම දැන ගන්න කැමැතියි වල් අලියා වන අලියා ලෙස නම් කරනවා නම් වල් ඌරා වන ඌරා ලෙස නම් කරනවාද කියා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
නැහැ, නැහැ. අලියා-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 13.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අලියා කියන්නේ අපේ රටේ විතරක් නොවෙයි, ලෝකයේ ගොඩ බිම ඉන්න සද්දන්තම සත්වයා. ඒ අලියාට ගෞරවයක් දෙන්න ඕනෑ හින්දා "වන අලියා" කිව්වා. වල් ඌරාට එහෙම තැනක් නැහැ. ඒ නිසා ඌ වල් ඌරාමයි. "වල් අලියා", "වන අලියා" වුණා.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මේ දවස්වල සිරිකොතේ තිබෙනවා, පුදුම මිනිස් ගැටුමක්. [බාධා කිරීම්] ඉන්නකෝ. සිරිකොතේ මේ මිනිස් ගැටුමට මොනවා හෝ පිළියමක් තිබෙවාද කියලා දැන ගන්න අවශ්‍යයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මොහමඩ් අස්ලම් මහතා, 13 වන ප්‍රශ්නය.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිරිකොතේ ගංජා වවන්නේ නැහැ කියලා මම කියන්න කැමැතියි. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please![බාධා කිරීම්]Order, please! ප්‍රශ්න අංක 13, ගරු මොහමඩ් අස්ලම් මහතා. ප්‍රශ්නය අහනවාද? නැත. ප්‍රශ්න අංක 14.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, it is very clear according to the Standing Orders that any Member can ask only three Supplementary Questions. All the three Supplementary Questions were asked by the Hon. Sajith Premadasa. Therefore, the fourth Supplementary Question asked by the Hon. Anura Dissanayaka must be expunged. වල් ඌරු කථා කියනවා. ඒ නිසා ඒ කොටස අයින් කර ගන්න ඕනෑ. මුස්ලිම් ළමයිනුත් ඇවිල්ලා ඉන්නවා මේ සභාව බලන්න. ඌරු කථා මේ කියන්නේ. ඌරු කථාව හැන්සාඩ් වාර්තාවෙන් කපලා දමන්න ඕනෑ. [බාධා කිරීම්] කා ගැනද තමුන්නාන්සේ කියන්නේ? මොන ඌරා ගැනද තමුන්නාන්සේ කියන්නේ? තමුන්නාන්සේලා ඌරු කථා කියන්න එපා, මේ සභාවේ. ගැලරියේ මුස්ලිම් ළමයි ඇවිල්ලා ඉන්නවා. හොඳ නැහැ මේක.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! Hon. Member, the entire House was falling asleep; now they have awakened back again.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Thank you, Sir.

## සංවර්ධන ලොතරැයි මණ්ඩලය : ලාභ හෝ අලාභ
அபிவிருத்தி லொத்தர் சபை: இலாப, நட்டம்
DEVELOPMENT LOTTERIES BOARD : PROFIT OR LOSS

0451/'10

14. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) පසු ගිය වර්ෂ පහක කාලය තුළ,
  (i) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභය හෝ පාඩුව කොපමණද;
  (ii) එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට එම ආයතනයේ ශේෂ පත්‍රයේ තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ආ) පසු ගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තාවේ සඳහන් විගණන වාර්තා වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවය කරන සේවකයින් සංඛ්‍යාව කොපමණද;
  (ii) පසු ගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රජයට ලබා දුන් මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(ஆ) கடந்த ஐந்து வருடங்களுக்கான,

(i) அபிவிருத்தி லொத்தர் சபையின் இலாப, நட்டத்தையும்;

(ii) மேற்படி நிறுவனத்தின் ஒவ்வொரு வருடத்தினதும் டிசம்பர் 31 ஆம் திகதியன்றுள்ளவாறான ஐந் தொகை நிலைமையையும்

அவர் தனித்தனியாக தெரிவிப்பாரா?

(ஆ) ஒவ்வொரு வருடத்தின் நிதி அறிக்கையிலும் தரப்பட்ட கடந்த ஐந்து ஆண்டுகளுக்கான கணக்காய்வு அறிக்கைகளை வெவ்வேறாக சமர்ப்பிப்பாரா?

(இ) (i) அபிவிருத்தி லொத்தர் சபையில் வேலை செய்கின்றவர்களின் எண்ணிக்கையையும்;

(ii) கடந்த ஐந்து வருடங்களாக ஒவ்வொரு வருடமும் லொத்தர் சபையிடமிருந்து அரசாங்கத்திற்கு எவ்வளவு பணம் செலுத்தப்படாத என்பதை வருடாந்த அடிப்படையிலும்

அவர் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state separately for the last five years-

(i) the profit or loss of Development Lotteries Board ; and

(ii) the status of the Balance Sheet of the aforesaid institution as at 31, December of each year?

(b) Will he submit to this House the audited report given in the financial report of each year separately for last five years?

(c) Will he state-

(i) the number of people working in the Development Lotteries Board; and

(ii) the amount of money transferred to the Government by Development Lotteries Board for last five years on per year basis?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා. ගරු මන්ත්‍රීතුමා, මේ විස්තර එකින් එක කියවන්න ඕනෑද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

If you just go through the profits, that will be okay. අහන ප්‍රශ්නවලට ඔබතුමා දෙන පිළිතුර හරිද දන්නේ නැහැ නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

කාලය ටිකක් ගන්න ඕනෑ නේද? කාලය ටිකක් ගන්න එක හොඳයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අලි ගැන අහන කොට ඒ ප්‍රශ්න නැහැ නේද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

You want only the profits, is it?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I am sorry, Sir, there is a sound problem. You will have to get that rectified because otherwise there is no point in our meeting here. We cannot hear what you are saying.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

There are so many failures in the system including the electronic voting panel.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I know voting, sound, hearing -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Millions have been spent for it. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පිළිතුර කියවන්නම්.

(අ) (i) වසර පහක කාලය තුළ ලාභය පහත සඳහන් පරිදි වේ.

| වසර | ලාභය රු.මිලියන |
|---|---|
| 2006 | 914.82 |
| 2007 | 860.06 |
| 2008 | 731.22 |
| 2009 | 726.18 |
| 2010 | 1,081.82 |

(ii)

| | ශේෂ පත්‍රයේ තත්ත්වය (රු. මිලියන) | | | | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
| වත්කම් | | | | | |
| ජංගම නොවන වත්කම් | 642.91 | 660.86 | 633.16 | 478.49 | 459.51 |
| ජංගම වත්කම් | 697.84 | 693.70 | 567.46 | 369.98 | 433.14 |
| මුළු වත්කම් | 1,340.75 | 1,354.56 | 1,200.62 | 848.47 | 892.65 |
| | | | | | |
| හිමිකම් සහ වගකීම් | | | | | |
| සංචිත | 779.71 | 626.75 | 587.55 | 495.30 | 547.54 |
| ජංගම නොවන වගකීම් | 140.40 | 125.34 | 118.33 | 18.82 | 17.99 |
| ජංගම වගකීම් | 420.63 | 602.48 | 494.75 | 334.35 | 327.12 |
| මුළු හිමිකම් සහ වගකීම් | 1,340.75 | 1,354.56 | 1,200.62 | 848.47 | 892.65 |

(ආ)

| වර්ෂය | පාර්ලිමේන්තුවට වාර්තාව ඉදිරිපත් කළ දිනය |
|---|---|
| * 2010 | වාර්තාව සකස් වෙමින් පවතී |
| 2009 | 2010 සැප්තැම්බර් 27 |
| 2008 | 2009 දෙසැම්බර් 28 |
| 2007 | 2008 සැප්තැම්බර් 09 |
| 2006 | 2008 මැයි 21 |
| 2005 | 2007 පෙබරවාරි 09 |

* 2010 වාර්තාව සකස් වෙමින් පවතී, 2005 සිට 2009 වර්ෂවල පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය වාර්තා සමඟ විගණිත වාර්තාද ඉහත සඳහන් දිනයන් හි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

(ඇ) (i) 2011.04.25 දිනට සේවක සංඛ්‍යාව

| | | |
|---|---|---|
| ස්ථිර සේවකයින් | - | 130 |
| කොන්ත්‍රාත් සේවකයින් | - | 14 |
| තාවකාලික සේවකයින් | - | 74 |
| මුළු සේවක සංඛ්‍යාව | - | 218 |

(ii) රජයට ලබා දී ඇති මුදල් ප්‍රමාණය පහත වගුවේ සඳහන් වේ.

| වර්ෂය | රු. මිලියන |
|---|---|
| 2006 | 914.82 |
| 2007 | 860.06 |
| 2008 | 731.22 |
| 2009 | 726.18 |
| 2010 | 909.51 |

(ඈ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මීට පෙර දුන්නු උත්තරය අනුව ඔබතුමා කිව්වේ රජයට ආදායම වැඩි වුණාය කියලා නේ. මේ පිළිතුර අනුව 2006, 2007, 2008, 2009 ආදායම අඩු වෙලා තිබෙනවා.

රුපියල් මිලියන 914, 860, 731, 726 වශයෙන්. හැබැයි එක පැත්තකින් ලාභය වැඩි වෙලා තිබෙනවා. ඔබතුමා පළමු වැනි එකට දුන්නු උත්තරය අනුව මේක බැලුවොත් මේකට දෙන්න පුළුවන් උත්තරය මොකක්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

2010 දී ඔබතුමා කියන කාරණාව නිවැරදි වෙමින්, වැඩි වීමක් වෙමින් -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එහෙම නම් මම පළමුවැනි ප්‍රශ්නයේ අහපු එක ඔබතුමාගේ උත්තරය තුළින් දැන් නිවැරදි වෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැහැ, නැහැ. 2010 දී රජයට ලබා දී ඇති මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 909.51යි. 2010 දී ලාභය රුපියල් මිලියන 1081යි. ඉතින් ඒ අනුව ඒක වැඩි වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අවුරුදු හතරක් නැත්තටම නැති වෙලා එක අවුරුද්දක් වැඩි වෙලා තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා ඇති බැංකු කඩා වැටිලා මූල්‍ය ආයතන කඩා වැටිලා ලෝක ආර්ථිකයේ විවිධ ගැටලු ඇති වුණු බව. ඒ හරහා ආපු ගමනක් තිබෙනවා. ඒක කාටවත් නැහැ කියන්න බැහැ. කැමැති වුණත්, නැති වුණත් සත්‍යය එයයි. ඒ හරහා ආපු මූල්‍යමය ප්‍රශ්නත්, අලෙවියේදී ඇති වන ගැටලුත් මතු වෙනවා. ඒ නිසා අපි ඒ තත්ත්වයන් නිවැරදි කර ගනිමින් යළි විශාල ලාභයක් කරා ගමන් කර තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එවකට හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ආරම්භ කරන අවස්ථාවේදී එහි මූලික අදහස වුණේ, එදා ලලිත් ඇතුලත් මුදලි මැතිතුමා පටන් ගත්තු මහපොළ අරමුදලට සියයට 50ක දායකත්වයක් දෙන්න ඕනෑය කියන එකයි. ඒ මඟින් කොච්චර මුදලක් මහපොළ අරමුදලට ගිහින් තිබෙනවාද කියා අපි අහනවා. බලහත්කාරයෙන්ද, කැමැත්තෙන්ද මොන එකකින්ද දන්නේ නැහැ, අද අපේ එස්.බී. දිසානායක ඇමතිතුමා විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් කඳවුරු පුහුණුවකට කැඳවා තිබෙනවා. අද ඒකට රුපියල් 20,000ක් විතර සොයා ගන්න වී තිබෙනවා. ලලිත් ඇතුලත් මුදලි ඇමතිතුමා මේ කාලයේ සිටියා නම් ඒකත් සොයා දෙනවා. දැන් මේකෙන් කොච්චර මුදල් ප්‍රමාණයක් ලබා දී තිබෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා මහපොළ සංකල්පය ආරම්භ කරමින් ඉදිරියට තැබූ පියවර අපි කිසි කෙනෙක් අඩුවෙන් තක්සේරු කරන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
"විදෙස්ගත වී ලෝක පරිමාණයේ විශිෂ්ටයන් බවට පත් වී සිටින අපේ බුද්ධිමතුන්ගේ ආයෝජන, දැනුම හා සේවාවන් ලබා ගැනීමට ප්‍රතිබුද්ධි ගලනය සඳහා ක්‍රියාමාර්ගයක් හඳුන්වා දෙනු ඇත." යනුවෙන් මහින්ද චින්තනයේ සඳහන්ව තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවේ මෙම වැඩ පිළිවෙළ මත, චින්තන ප්‍රකාශ හාස්‍යයට ලක් වී ඇති අතර, තව දුරටත් එසේ වන්නේ නම් ලාංකීය අධ්‍යාපනය විනාශ මුඛයට තල්ලු වන බවත්, එය වැළැක්වීම වෙනුවෙන් මෙම ගරු සභාවේ අවධානය යොමු කළ බවත් පෙන්වා දීමට කැමැතියි. 2010 ජුලි මස 20 වන දින ගරු සභාවේ අවධානයට මෙම ගැටලුව ඉදිරිපත් කර සිටියදී මම කියා සිටියේ, "පොරොන්දු දේශපාලනය තුළ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් අතර මං කර, ඔවුන්ගේ සේවය පිළිබඳ අතෘප්තියක් ඇති නොකරන ලෙසය." එහිදී ගරු එස්.බී. දිසානායක අමාත්‍යතුමා ප්‍රකාශ කළා, අතිගරු ජනාධිපතිතුමා මෙම ආචාර්යවරුන්ගේ ප්‍රශ්නයට වරක් නොව දෙවරක්ම ඇහුම් කන් දුන්න බවත්, රුපියල් 20,750ක මූලික වැටුපක සිටින ආධුනික පහළ ශ්‍රේණියේ කථිකාචාර්යවරයාගේ වැටුප රුපියල් 72,000ටත්, රුපියල් 57,755ක මූලික වැටුපක සිටින ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයාගේ වැටුප රුපියල් ලක්ෂ 2ටත් ගෙන යා යුතු බවත් එය එතුමා පිළිගන්නා බවත්." මම හිතන හැටියට ගරු ඇමතිතුමාට මතක ඇති මෙම ගරු සභාවේදී එසේ කී බව. මෙලෙස බොරු පොරොන්දු ලබා දී රටේ බුද්ධිමත් ශ්‍රම සම්පත රැවටීම අප පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා.

මේ මොහොත වන විට විශ්වවිද්‍යාල ආචාර්යවරු වෘත්තීය ක්‍රියාමාර්ගවලට පෙළැඹී සිටින අතර ඒ බව අප කවුරුත් දන්නවා. මෙම තත්ත්වයට පත් වීමට පෙර විශ්වවිද්‍යාල ආචාර්යවරු 2008 සිට සාකච්ඡා කර ආණ්ඩුව විසින් ලබා දුන් පොරොන්දු ඉටු නොකිරීම නිසා ඇති වූ තත්ත්වයක් තමයි මේ අද ඇති වී තිබෙන්නේ. නමුත් විශ්වවිද්‍යාල ආචාර්යවරු ආණ්ඩුවට කොපමණ අවස්ථා ලබා දුන්නද, ආණ්ඩුව ඒවා තණ සතයකට ගණන් නොගන්නා බව අප දනිමු. ඔවුන්ගේ මෙම වෘත්තීය ක්‍රියාමාර්ගය සාධාරණ බව ඔප්පු කිරීමට මම පහත කරුණු ඉදිරිපත් කරන්න කැමැතියි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

1. ආචාර්යවරුන්ගේ වැටුප් වැඩි කිරීමට අදාළ යෝජනාවලියක් ආචාර්යවරුන්ගේ වෘත්තීය සමිති සම්මේලනය විසින් 2007 වසරේ ඔක්තෝබර් මස 16 වන දා ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත ලිඛිතව දැනුම් දුන්නා.

2. 2008 ජනවාරි මාසයේ 31 වන දින ගරු ජනාධිපතිතුමා සමඟ අරලියගහ මන්දිරයේදී මේ පිළිබඳව සාකච්ඡා කර යම් යම් එකඟතාවන්ට පැමිණුනා.

3. 2008 වසරේදී ආචාර්යවරුන්ගේ වැටුප් ව්‍යුහයන් සංශෝධනය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කමිටුවක් පත් කළා. වැටුප් සම්බන්ධයෙන් කළ දීර්ඝ අධ්‍යයනයකින් පසුව එම වසරේ අගෝස්තු මාසයේ 8 වන දා එම කමිටුව සිය නිර්දේශ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළා. එහි සඳහන් වූයේ ආචාර්යවරුන්ගේ වැටුප් හා දීමනා සාධාරණ තලයක පිහිටුවා නොමැති බවයි. කොමිෂන් සභාවේ කමිටුව විසිනුත් එය පිළිගනු ලැබුවා. ආචාර්යවරුන්ට සමාන සුදුසුකම් සහිත රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශ සේවකයන්ට වැඩි වැටුපක් ලැබෙන බවද සඳහන් වුණා. එමෙන්ම ඒ හා සමාන මට්ටමකට ආචාර්යවරුන්ගේ වැටුප් හා දීමනා ඉහළ නැංවිය යුතු යයි කමිටුව නිර්දේශ කර තිබුණා.

4. 2008 සැප්තැම්බර් මස 8 වන දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේද අනුමතිය ඇතිව නව වැටුප් ව්‍යුහයක් ඇතුළත් යෝජනා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට ඉදිරිපත් කළා. එම වැටුප් යෝජනා කිසිදු සැලකිල්ලකට මේ වන විටත් භාජන වී නැහැ.

5. 2009 මාර්තු මස 24 වන දින විශ්වවිද්‍යාල ආචාර්ය, විධායක, කාර්මික සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල

වැටුප් සංශෝධන පිළිබඳව යෝජනා එතැන් සිට මසක් තුළ ඉදිරිපත් කරන බව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව ලිඛිතව දැනුම් දී තිබුණා.

6. 2009 දෙසැම්බර් මස 9 වන දා ජනාධිපතිවරණ පවත්වන වකවානුවේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති සාකච්ඡාවේදී ද මෙම වැටුප් පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡාවට බඳුන් වුණා.

7. 2010 ජුලි මස 20 වන දින මවිසින් මෙම සභා ගැබ තුළ නැඟූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු එස්. බී. දිසානායක මැතිතුමා වැටුප් වැඩි වීමක් අවශ්‍ය බවත්, එළැඹෙන අය වැයේදී එවැනි වැටුප් වැඩි වීමක් ලබා දෙන්නත් එකඟතාවක් පළ කළා.

8. 2010 සැප්තැම්බර් මස 04 වන දා ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වෘත්තීය සම්මේලනයට වැටුප් වැඩි වීම සාධාරණීකරණය කරමින් ලිපියක් එවා තිබුණා.

9. 2010 සැප්තැම්බර් මාසයේ 05 වන දා ආචාර්යවරුන්ගේ වෘත්තීය සමිති සම්මේලනය වැටුප් යෝජනාවලියක් නැවතත් ආණ්ඩුවට ඉදිරිපත් කරනු ලැබුවා.

අවස්ථා ගණනාවකදීම මෙවැනි සාකච්ඡා හා ක්‍රියාමාර්ගවලට ආචාර්යවරුන්ගේ සංගමය එළැඹිලා තිබුණා.

දැන් මේ ප්‍රශ්නය ඉතාම බරපතළ තත්ත්වයකට පත් වෙමිනුයි තිබෙන්නේ. මේ වන විට විශ්වවිද්‍යාල අධ්‍යාපනය විශාල බලපෑමකට ලක් වී තිබෙනවා. මේ වනවිට ඔවුන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග ලෙස අංශ ප්‍රධාන, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක, ශිෂ්‍ය උපදේශක, පාඨමාලා සම්බන්ධීකාරක වැනි ස්වේච්ඡා පරිපාලන තනතුරුවලින් ඉවත්ව තිබෙනවා.

ආචාර්යවරුන්ගෙන් සියයට 90ක් පමණ එකඟතාව පළ කර එම තනතුරුවලින් ඉවත් වීමෙන් පෙනී යන්නේ ආණ්ඩුව අය වැයෙන් කළ යෝජනා බහුතරයක් ආචාර්යවරුන් අනුමත නොකරන බවයි. අංශ ප්‍රධානින් 318 දෙනාගෙන් 278 දෙනෙකුම තනතුරු අත් හැරලා තිබෙනවා. 2010 ජුලි මස 20 වැනි දා අප ප්‍රකාශ කළේ, මෙම ප්‍රශ්නය නොවිසඳුණොත් විශ්වවිද්‍යාල පද්ධතිය බිඳ වැටීම දක්වා ඉදිරියට යා හැකි බවයි. අද එය ඔප්පු වී තිබෙනවා. විශ්වවිද්‍යාල ගණනාවකම අද අවශ්‍ය දේශන පැවැත්වෙන්නේ නැහැ. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මුහුණ පා තිබෙන මෙම බරපතළ ගැටලුව හා විශ්වවිද්‍යාල සිසුන් පත් වී ඇති අපහසුතාව මෙම ගරු සභාවේ අවධානයට

[ගරු අනුර දිසානායක මහතා]

යොමු කරන අතර පහත සඳහන් ප්‍රශ්නවලට ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාගෙන් පිළිතුරු අපේක්ෂා කරනවා.

1. 2011.05.25 වැනි දින එනම් ඊයේ සවස 4ට පමණ ජනාධිපතිතුමා සමඟ සාකච්ඡාවක් පැවැත්වූවේද? පැවැත්වූයේ නම් එහි ප්‍රතිඵල කවරේද?

2. එහිදී ආචාර්යවරුන්ගේ වැටුප් වැඩි වීමක් අවශ්‍ය බව ප්‍රතිපත්තියක් ලෙස පිළිගනු ලැබුවේද?

3. එම වැටුප් වැඩි වීමේ ප්‍රමාණය කවරේද?

4. එය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ කවර කාල වකවානුවකද?

උක්ත ප්‍රශ්න පිළිබඳව ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා මෙම ගරු සභාව දැනුවත් කරනු ඇතැයි බලාපොරොත්තු වනවා. එමෙන්ම විශ්වවිද්‍යාල අධ්‍යාපනය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යෑමට බාධාවක්ව පවතින මෙම ප්‍රශ්න විසඳීම කෙරෙහි මෙම ගරු සභාවේ දැඩි අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතියි.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ මේ කරුණු මතු කිරීම පිළිබඳව අපේ අනුර කුමාර දිසානායක මැතිතුමාට මගේ ස්තුතිය පළ කරන්න කැමැතියි. එතුමා මේ කියපු කාරණා සමහර ඒවා සත්‍යයයි. සමහර කරුණු නිවැරැදි නැහැ; ඒවා සත්‍යයෙන් තොරයි.

එතුමා අහපු මුල් ප්‍රශ්න තුනට මුලින්ම උත්තර දෙන්නම්. ඔව්, ජනාධිපතිතුමා ඊයේ හම්බ වුණා. නැවත නිලධාරින් සමඟ සාකච්ඡාවක් තුන්වැනි දා පවත්වන්න තීන්දු කළා. එහිදී ආචාර්යවරුන්ගේ වැටුප් වැඩි වීමක් අවශ්‍ය බව ප්‍රතිපත්තියක් ලෙස පිළිගත්තා. තුන්වැනි ප්‍රශ්නය වශයෙන් එතුමා ඇහුවේ එම වැටුප් වැඩි වීමේ ප්‍රමාණය කවරේද යන්නයි. ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් මම විස්තර කියන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය ලේඛනයෙන් රජයේ සේවකයන් සියලු දෙනාට සියයට පහකින් පඩි වැඩි කරද්දී, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ට සියයට 36.25කින් වැඩි කළේ ඒ වැඩි කිරීම කළ යුතු බව පිළිගනිමින් ඒ ක්‍රියාදාමයේ පළමුවැනි පියවර හැටියටයි.

ඊළඟට මා කියන්න කැමැතියි තනතුරුවලින් අයින් වෙලා තිබෙන්නේ මේ ආචාර්යවරුන්ගෙන් සියයට 35ක් පමණක් බව. මා ඔබතුමාට උදාහරණයක් හැටියට කිව්වොත්,-[බාධා කිරීමක්] ඔහොම ඉන්න මා කියන්නම්. උදාහරණයක් හැටියට කිව්වොත්, නිරිතදිග විශ්වවිද්‍යාලයේ එක්කෙනෙක්වත් ඉල්ලා අස් වෙලා නැහැ. ඒ වාගේම කිසිම වෛද්‍ය පීඨයක අයෙක් ඉල්ලා අස් වෙලා නැහැ. ගණන් හදලා බලන්න ඔබතුමා. ආයුර්වේද මණ්ඩපයේ අය ඉල්ලා අස් වුණා. පහුවදා ඒ සියලු දෙනාම ඉල්ලා අස් වීමේ ලියුම් ඉල්ලා අස් කර ගත්තා. සබරගමුව විශ්වවිද්‍යාලයේ සියයට 90ක් වැඩ කරනවා. ඒ වාගේම ත්‍රිකුණාමලය මණ්ඩපයේ කිසි කෙනෙක් ඉල්ලා අස් වුණේ නැහැ. මම පිළිගන්නවා පේරාදෙණිය සහ රුහුණ විශ්වවිද්‍යාලවල මේ ප්‍රමාණය සියයට 50ට වැඩිය ඉහළට ගිහින් තිබෙන බව. අනෙක් තැන්වල එහෙම නැහැ. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරපු විධියටම මෙතැන ගැටලුවක් තිබෙනවා, ප්‍රශ්නයක් තිබෙනවා කියන එක අපි පිළිගන්වා. මා ඒ ගැන කරුණු කියන්න කැමැතියි.

ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා, රජයේ අනෙකුත් නිලධාරින්ට දෙන වැටුප් හා බලන කොට විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප ඉතා අඩු වැටුපක් කියලා. ඒක එහෙම නොවෙයි. අපේ රටේ රාජ්‍ය සේවයේ ඉන්න, භාණ්ඩාගාරයෙන් වැටුප් ලබන ආයතනවල ඉහළම නිලධාරියා කවුද? අමාත්‍යාංශයක ලේකම්වරයා. ඒ වාගේමයි ජනාධිපති ලේකම්වරයා. මේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ වැටුප තිබෙන්නේ රුපියල් 45,000යි 55,000යි අතර. රජයේ සියලුම නිලධාරින්ගේ වැටුප තිබෙන්නේ රුපියල් 45,000යි 55,000යි අතර. හැබැයි අපේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකුගේ වැටුප රුපියල් 80,000න් ඉහළ. මා ගණන් සේරම හරියට කියනවා. වෙනත් විධියකට කිව්වොත් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ වැටුප මෙන් දෙගුණයකටත් වඩා,-[බාධා කිරීමක්] මම ගණන් කියනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

දීමනාත් එක්කද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ඔව්, ඔව්. දීමනාත් එක්ක තමයි. අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ වැටුප මෙන් දෙගුණයකටත් වඩා වැඩිපුර මුදලක් විශ්වවිද්‍යාල ආචාර්ය, මහාචාර්යවරුන්ට ලැබෙනවා.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා ආචාර්යවරුන්ගේ වැටුප රුපියල් 72,000ක්, රුපියල් 2,00,000ක් දක්වා වැඩි කළ යුතු යැයි මා පිළිගත් බව. මා අදත් ඉන්නේ එතැන. ඊටත් එහා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා හැම වෙලේම කියන්නේ අප මේ රටේ උගතුන්, බුද්ධිමතුන්, ආචාර්ය මහාචාර්යවරුන් හා විද්‍යාඥයන් තියා ගෙන නිදහස් අධ්‍යාපනය පුළුල් කරමින්, නිදහස් අධ්‍යාපනය ලබන දරුවන්ගේ පහසුකම් පුළුල් කරමින්, විශ්වවිද්‍යාලයට ලබා ගන්නා වූ ළමයින් ප්‍රමාණය පුළුල් කරමින් මේ විශ්වවිද්‍යාල ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒමටත්, මේ විශ්වවිද්‍යාල ශක්තිමත් කිරීමටත් කටයුතු කළ යුතු බවයි.

විශ්වවිද්‍යාලවලට ආදායම් ඉපදවිය හැකි මාර්ග විශාල ගණනක් තිබෙනවා. මේ සැරේ සියයට 5ක් විදේශ දරුවන් ගන්න කියලා අපි කිව්වා. එහෙම කිව්වේ දේශීයව බඳවා ගන්නා දරුවන් අඩු කරන්න නොවෙයි. විශ්වවිද්‍යාලයකට ජාත්‍යන්තර තලයේ ඉහළට එන්න බැහැ ඒ විශ්වවිද්‍යාලයේ විදේශ දරුවන් නැත්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා ශිෂ්‍යත්ව 100ක් දුන්නා. අපි ඒක මේ අවට තිබෙන සියලුම රටවලට දෙනවා. ඒ දරුවන්ට මෙහේට ඇවිල්ලා අපේ විශ්වවිද්‍යාලවලට ඇතුළු වෙන්න පුළුවන්. ඒ ගමන්ම සියයට 5ක් විදේශීය දරුවන් මේ විශ්වවිද්‍යාලවලට ගන්න කියලා අපි ඉඩ දීලා තිබෙනවා. මීට අමතරව අපි විවිධ පරීක්ෂණ ව්‍යාපෘති ආරම්භ කරන්න විශ්වවිද්‍යාලවලට ඉඩ දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප පෞද්ගලික අංශයට සහන දීලා තිබෙනවා. පෞද්ගලික අංශය විශ්වවිද්‍යාලයක දෙපාර්තමේන්තුවක්, මහාචාර්යවරයකු, ආචාර්යවරයකු පාවිච්චි කරලා කිසියම් පර්යේෂණයක් කළොත් -කෘෂිකාර්මික පර්යේෂණයක් කියලා හිතන්න- ඔහු ඒකට රුපියල් ලක්ෂ 100ක් වියදම් කළොත් ඔහුට රුපියල් ලක්ෂ 200ක සම්පූර්ණ බදු සහනයක් දෙනවා. එහෙම උනන්දු කළේ, විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය හා පර්යේෂණ එකට කෙරෙන්නේ නැතිව විශ්වවිද්‍යාල ඉහළ තලයකට ගෙනෙන්න බැරි නිසා.

මීළඟ කාරණය තමයි, විශ්වවිද්‍යාලවලට අනුබද්ධ උපාධි ආයතන හදා ගන්න පුළුවන් වීම. අද විශ්වවිද්‍යාල ඔහේ අයාලේ ගුණයෙන්, තත්ත්වයෙන් ඉතා පහළ බාහිර උපාධි පාඨමාලා

දෙනවා වෙනුවට, විශ්වවිද්‍යාලවලට අනුබද්ධ ආයතන - මේ දැන් කර ගෙන යන ආයතන - තමන්ගේම අනුබද්ධ ආයතන කර ගෙන, තමන්ගේ අධීක්ෂණය යටතේ තමන්ගේම පාඨමාලාවන් දීලා, තමන්ම ගිහින් ඒකේ උගන්වලා ඒ තුළින් ඒ දරුවන්ට හොඳ උපාධියක් දෙන්න පුළුවන්. ඒක ලෝකයේ කරනවා. ඒක කරන්න පුළුවන්. ඒකෙන් විශාල ආදායම් ගන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ විශ්වවිද්‍යාලවලට උපදේශන සේවාවන් දෙන්නට පුළුවන්. ඊළඟට පශ්චාත් උපාධි පාඨමාලා ආයතන පටන් අරගෙන, ඒවාට දේශීය හා විදේශීය දරුවන් බඳවා ගෙන, ඒවායේ උගන්වලා ආදායම් ලබා ගන්න පුළුවන්. අද අපේ ආචාර්යවරයෙක් පශ්චාත් උපාධි ආයතනයක උගන්වනකොට පැයකට රුපියල් 2,000-3,500 අතර මුදලක් ගන්නවා. ඒක හොඳයි. එහෙම ගන්න පුළුවන්. විදේශ දරුවන් ඇතුළත් කර ගෙන මේක දියුණු කර ගෙන යන්න පුළුවන්. සියයට 100ක් භාණ්ඩාගාරයෙන් යැපෙන තත්ත්වයෙන් අද මේ විශ්වවිද්‍යාල මිදෙන්නට ඕනෑ කාලය ඇවිත් තිබෙනවා. ලෝකයේ විශ්වවිද්‍යාලවල දෙපාර්තමේන්තු, පීඨ ආයතන එහෙම භාණ්ඩාගාරයෙන් යැපෙන්නේ නැහැ. ඒවා මුදල් හම්බ කරනවා. ඒ මුදල් හම්බ කරලා තමන්ගේ දරුවන්ටත් සල්ලි දෙනවා. නිදහස් අධ්‍යාපනය ලබන දරුවන්ට මහපොළ ශිෂ්‍යත්ව ආධාර මදි නම්, ඒ අයටත් උදවු කරන්න පුළුවන්. එහෙම කරන ආයතන, දෙපාර්තමේන්තු අපේ රටේ විශ්වවිද්‍යාලවලම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාල සියල්ලම පරිගණක ගත කරන්න පසුගිය දවස්වල අපි ගිවිසුමක් අත්සන් කළා, කටුබැද්දේ පරිගණක විද්‍යා පීඨයත් එක්ක. රුපියල් මිලියන 140යි. අපි කීයක් ගෙවුවාද? රුපියල් මිලියන 16ක් ගෙව්වා. ඒවා ඒ ආචාර්යවරුන්ට යන්නේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පරිගණකගත කරන්න කොළඹ විශ්වවිද්‍යාලයත් එක්ක අපි ගිවිසුමක් ගැහුවා. රුපියල් මිලියන 20ක් දුන්නා. ඒ සියල්ලම එම ආචාර්යවරුන්ට ලැබෙන්නේ. ඒක හොඳයි. එහෙම ගන්න ඕනෑ. චීන දරුවෝ, ජපන් දරුවෝ, ඉන්දියානු දරුවෝ, වියට්නාමයේ දරුවෝ විශාල වශයෙන් තිබෙන මේ ඉංග්‍රීසි වාතාවරණය තුළ අපේ විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්න එන්න කැමැත්තෙන් ඉන්නවා. අපිත් එක්ක ගිවිසුම් අත්සන් කරලා තිබෙන විදේශ විශ්වවිද්‍යාල සියලු දෙනාම අපිට කියන්නේ, සියයට 80ක් පිටින් ගෙනෙන්න ඉඩ දෙන්න කියලායි. අපි ඒ අයගෙන් ඉල්ලනවා, අපේ දරුවන් සියයට 20ක් නොමිලේ ඇතුළත් කර ගන්න කියලා. අදත් මනිපාල් විශ්වවිද්‍යාලයේ උප කුලපතිතුමා ලංකාවේ ඉන්නවා. ඒ අය කියන්නේ, "හරි, ඔබලාගේ සියයට 20 අපි නොමිලේ ඇතුළත් කර ගන්නම්. අපිට ඉතිරි සියයට 80 පිටින් ගෙනෙන්න දෙන්න." කියන එකයි. ඒක අපේ විශ්වවිද්‍යාලවලත් යම් කිසි තරමකට කරන්න පුළුවන්. ඒකෙන් අපේ විශ්වවිද්‍යාලවලට ගන්න ළමයින් ප්‍රමාණය වැඩි කරන්න පුළුවන්. පහසුකම් වැඩි කරන්න පුළුවන්. ඒ නිසා ඒකට තමයි අපි උත්සාහ කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට අනෙකුත් රජයේ සේවකයන්ට නැති වරප්‍රසාද තිබෙනවා. අපේ රටේ වයස අවුරුදු 65 දක්වා සේවය කරන්න පුළුවන් වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට විතරයි. ඊට අමතරව වයස අවුරුදු 65 දක්වා සේවය කරන තව එකම එක රජයේ සේවක පිරිසක් ඉන්නවා. ඒ තමයි විශ්වවිද්‍යාල ආචාර්යවරු. සියලුම විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට වයස අවුරුදු 65 දක්වා සේවය කරන්න පුළුවන්.

දෙවන කාරණය මේකයි. මේක අමතක කරන්න එපා. අපේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට සප්ත වාර්ෂික නිවාඩු දෙනවා. නිවාඩු දුන්නාම ඔවුන් මොකද කරන්නේ? ඔබතුමාට මා කියන්නම්. පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් නිවාඩු අරගෙන වයඹ විශ්වවිද්‍යාලයේ උගන්වනවා. එතකොට පඩි දෙකම ගන්නවා. ඒකේ කිසි වරදක් නැහැ. ඒක හොඳයි. විදේශ විශ්වවිද්‍යාලවලට යන්න පුළුවන් සමහර මහාචාර්යවරු කොළඹ විශ්වවිද්‍යාලයෙන් සප්ත වාර්ෂික නිවාඩු අරගෙන විදේශ විශ්වවිද්‍යාලවලට යනවා. ඒ විශ්වවිද්‍යාලවල අවුරුද්දක් හෝ අවුරුදු එකහමාරක් සේවය කරලා විශාල මුදලක් හම්බ කර ගෙන එනවා. ඒක හොඳයි. හැබැයි මේවා අපි කියන්න ඕනෑ.

මීට අමතරව මේ ආචාර්යවරු, මහාචාර්යවරු විභාග කටයුතු කරනවා. විශේෂයෙන් පාසල් විභාග කටයුතු කළාම රුපියල් ලක්ෂයක්, ලක්ෂ දෙකක්, ලක්ෂ තුනක්, ලක්ෂ හතරක් මුදල් එකතු කර ගන්න ආචාර්යවරු, මහාචාර්යවරු ඉන්නවා. මේ ආචාර්යවරු, මහාචාර්යවරු බාහිර උපාධි පන්ති කරනවා. මා කියන්නේ නැහැ, ඒක නරකයි කියලා. ඒක හොඳයි. හැබැයි ඒවායින් මුදල් එකතු කර ගන්නවා. මේ අය පශ්චාත් උපාධි පාඨමාලා පවත්වනවා. ඒවා දැන ගන්න ඕනෑ. උසස් පෙළ පන්ති පවත්වා රුපියල් ලක්ෂ ගණන් හම්බ කරන අයත් ඉන්නවා. මේ සියල්ලම මා කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආචාර්යවරුන්ගේ වැටුප් වැඩි නොකළ යුතුයි කියන කාරණයට නොවෙයි. වැටුප් වැඩි කරන්න ඕනෑ. එම නිසා තමයි අතිගරු ජනාධිපතිතුමා මේ අය වැයෙන් අනිකුත් සියලු රජයේ සේවකයන්ට සියයට 5කින් වැටුප් වැඩි කරන කොට විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට මෙතෙක් කල් ලැබුණු සියයට 25 අධ්‍යයන දීමනාව තව සියයට 25කින් වැඩි කළේ. එම නිසා ඔවුන්ගේ දීමනාවට තව සියයට 6.25ක් අලුතින් එකතු වුණා. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, සියයට 20ක් ආචාර්යවරු කිසිම පරීක්ෂණයක් කරන්නේ නැහැ. සමහර ආචාර්යවරු නම් ලියා තිබෙනවා. ඒ අයට දීමනා දෙනවා. විශ්වවිද්‍යාල ආචාර්ය සංගමයම තමයි අපට කිව්වේ, ඒ අයට වැටුප් වැඩි කරන කොට ඒක research allowance එකක් කරන්න යි කියලා. අපි research allowance එකක් කළා. "මා මෙන්න මේ පොත් කියවමින්, මෙන්න මේ පරීක්ෂණ අධ්‍යයනය මේ අවුරුද්දේ කරනවා"යි කියා පිටුවකින් දෙකකින් ලිව්වාම ඒ අයට මුළු අවුරුද්දේම සියයට 25 ගන්න පුළුවන්. මන්ත්‍රීතුමනි, කොළඹ විශ්වවිද්‍යාලයේ සියයට 80ක් ආචාර්යවරු එහෙම අරගෙන තිබෙනවා. ඒ වාගේම නොකඩවාම පොත් මුද්‍රණය කරන, නොකඩවාම උසස් මට්ටමේ පර්යේෂණ, නිබන්ධන ප්‍රකාශයට පත් කරන අයට මොකක්වත් නැතුව මේ සියයට 25 ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ සේවය ගැන දැන් මා කියන්නම්. මේ අය වැයෙන් අමාත්‍යාංශ ලේකම්වරයාට පඩි වැඩි වෙලා තිබෙන්නේ, රුපියල් 2,800යි. මේක තමයි වැඩි වී තිබෙන මුදල. දැන් මා කියන්නම්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප් වැඩි වීම ගැන. ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු පහළම -ආරම්භක- වැටුප් තලයේ ඉන්නවා නම් ඔහුට මේ අය වැයෙන් වැඩි වුණා, රුපියල් 21, 536.19ක්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒක ඔහුගේ වැටුප් පතට වැඩි වීමක් නොවෙයි. ඔහු පර්යේෂණ කරනවා නම් නිබන්ධනයක් ඉදිරිපත් කරනවා නම් ඔහුට සියයට 25ක දීමනාවක් හම්බ වෙනවා. ඇත්තටම ඒ සියයට 25 ඔහුගේ පර්යේෂණ කටයුතු සඳහා වියදම් වෙනවා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආචාර්යවරුන්ට මහාචාර්යවරුන්ට ගරු කිරීමක් හැටියටයි මා මෙය කියන්නේ. විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකුට මහාචාර්යවරයෙකුට මාසයකට නිල වශයෙන් එක දේශනයක් තිබ්බත් ප්‍රමාණවත්ය කියන එක තමයි නීතිය. එහෙම කරලා තියෙන්නේ ඒ අයට පර්යේෂණ කරන්න. අපේ මහාචාර්යවරු අපේ ආචාර්යවරු සියයට 80ක්

[ගරු එස්.බී. දිසානායක මහතා]

නොකඩවාම පර්යේෂණ කරනවා; නොකඩවාම නිබන්ධන කරනවා; නොකඩවාම පොත්පත් ප්‍රකාශයට පත් කරනවා. ඒ අයට අපි සියයට 25ක් දෙනවා. ඒ සල්ලි ඔවුන්ගේ අතට දෙනවා. ඒක දුන්නේ නැතත් ඒ අය ඒවා කරනවා. ඒ අයගේ පඩියට අපි සියයට 25ක් දෙනවා. ඒ අනුව පහළ වැටුප් තලයේ සිටින ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකුට රුපියල් 21,536.19ක් වැඩි වෙනවා. ඉහළ වැටුප් තලයේ සිටින ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකුට රුපියල් 25,124.94ක් වැඩි වෙනවා. පහළ වැටුප් තලයේ සිටින professor කෙනෙකුට -සාමාන්‍ය මහාචාර්යවරයෙකුට- රුපියල් 19,053.06ක් වැඩි වෙනවා. ඉහළ වැටුප් තලයේ සිටින professor කෙනෙකුට රුපියල් 23,058.69ක් වැඩි වෙනවා. පහළ වැටුප් තලයේ සිටින associate professor කෙනෙකුට -නියෝජ්‍ය මහාචාර්යවරයෙකුට- රුපියල් 17,220.63ක් වැඩි වෙනවා. ඉහළ වැටුප් තලයේ සිටින associate professor කෙනෙකුට රුපියල් 21,171.88ක් වැඩි වෙනවා. පහළ වැටුප් තලයේ සිටින ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුට රුපියල් 16,060.63ක් වැඩි වෙනවා. ඉහළ වැටුප් තලයේ සිටින lecturer කෙනෙකුට රුපියල් 18,090.63ක් වැඩි වෙනවා. පහළ වැටුප් තලයේ සිටින Grade II ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුට -senior lecturer Grade II- රුපියල් 14,248.13ක් වැඩි වෙනවා. ඉහළ වැටුප් තලයේ සිටින Grade II ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුට -senior lecturer Grade II- රුපියල් 17,039.38ක් වැඩි වෙනවා. පහළ වැටුප් තලයේ සිටින lecturer කෙනෙකුට -සාමාන්‍ය කථිකාචාර්යවරයෙකුට- රුපියල් 12,725.63ක් වැඩි වෙනවා. ඉහළ වැටුප් තලයේ සිටින lecturer කෙනෙකුට රුපියල් 13,994.38ක් වැඩි වෙනවා. පහළ වැටුප් තලයේ සිටින ආධුනික කථිකාචාර්යවරයෙකුට -probation කථිකාචාර්යවරයෙකුට- රුපියල් 10,351.25ක් වැඩි වෙනවා. ඉහළ වැටුප් තලයේ සිටින ආධුනික කථිකාචාර්යවරයෙකුට රුපියල් 12,471.88ක් වැඩි වෙනවා.

මම මේ කියන කාරණය ගැන ඔබතුමන්ලා හිතලා බලන්න. පසු ගිය අය වැය ලේඛනයෙන් රජයේ සේවකයන්ට වැටුප් වැඩි කළේ නැහැ. ඒ අයටත් සියයට 5ක දීමනාවක් දුන්නා. ඒ දෙන ගමන් මේ ආචාර්යවරුන්ට සියයට 36.25ක් දුන්නා. මෙතැන විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ට ප්‍රශ්නයක් තිබෙනවාය කියලා ඔබතුමාම කිව්වා, මහින්ද චින්තන ඉදිරි දැක්ම කියලා. ඒක පිළිඅරගනිමින් අනෙක් අයට වඩා විශාල වැටුප් වැඩි වීමක් දීලා මේ ක්‍රියාදාමය ආරම්භ කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එකපාරටම සියයට 140කින් පඩි වැඩි කරන්න අපට පුළුවන්ද? එතකොට රටේ රජයේ සේවය කරන අනෙක් නිලධාරින් නිකම් ඉඳීවිද? එහෙම සියයට 140කින් පඩි වැඩි කරන්න පුළුවන්ද? අමතක කරන්න එපා, මේ මහාචාර්යවරු කථිකාචාර්යවරු වෙනත් වරප්‍රසාදත් ලබන බව. මේ අය මුදල් උපයනවා. පශ්චාත් උපාධි පාඨමාලාවල උගන්වනකොට ඒ අයට ගෙවනවා. පැයකට රුපියල් 3,700ක් ගෙවන තැන් තිබෙනවා; පැයකට රුපියල් 2,000ක් ගෙවන තැන් තිබෙනවා. මේ අය උපාධි පාඨමාලා කරනකොට මේ අයට ගෙවනවා. මේ අය බාහිර උපාධි පාඨමාලා කරනකොට මේ අයට ගෙවනවා. අඩුම ගානේ පැයකට රුපියල් 1,000ක්වත් ගෙවනවා. මේ අය sabbatical leave ගියාම හම්බ වෙනවා. මේක කාටවත් නැති එකක්. මේ අය විදේශ විශ්වවිද්‍යාලයකට ගියොත් රුපියල්වලින් බැලුවොත් ලක්ෂ පහක් හයක් හම්බ කරනවා. ඒක හොඳයි. මේ අය විභාග කටයුතු කරපුවාම ඒ හැම එක්කෙනෙක්ම රුපියල් ලක්ෂයක් හමාරක් හම්බ කර ගන්නවා. ඒක නිසා මේ වෙලාවේ මේක හොඳට මෙහෙයවනවා. එහෙම මෙහෙයවන්න පටන් ගත්ත අය දන්නවා, මේ ඉල්ලීම් දෙන්න බැහැයි කියලා: ඒ නිසා අර්බුදයක් හදන්න පුළුවන් කියලා. මම කියන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අය වැයෙන් පස්සේ මේ ආචාර්යවරුන්ගේ සංගමයේ වාර්තාව මා ළඟ තිබෙනවා. මේ වාර්තාව අත්සන් කර තිබෙන්නේ Prof. Lalitha S. Fernando. මේ වාර්තාවේ කියා තිබෙන දේ බලන්න. "Address by the outgoing president" ඒ කාලය අවසන් වෙලා යන එක්කෙනා. එම වාර්තාවේ සඳහන් වන්නේ මෙන්න මෙහෙමයි:

"6. Address by the Outgoing President

> The outgoing president Prof. Sampath Amaratunge stated that he enjoyed serving to the Federation and he served to the FUTA to the best that he could do. He thanked all the Ex-Co members who supported him for smooth functioning of FUTA.
>
> Special thank was given to Dr.G.W.A.R. Fernando for his excellent service as the Secretary/FUTA. He has given thanked to Prof. Sudantha Liyanage, Dr. S.R.D. Rosa and Dr. Mahim Mendis. He explained the difficulties he faced during the discussions of the salary issue and given special tribute to Mr. S.B. Dissanayake/Minister of Higher Education, Dr. Sunil Jayantha Navaratne/Secretary, Ministry of Higher Education, Mr. Lalith Weeratunga/Secretary to H.E. the President, and Mahinda Rajapaksa, H.E to the President, ."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියෙව්වේ මේ වැටුප් වැඩි කළාට පස්සේ FUTA එකේ තිබුණු වාර්ෂික සම්මේලනයේ - සියලු දෙනා එන එකම රැස්වීමේ, සියලු කථිකාචාර්යවරුන්ගේ සම්මේලනයේ- වාර්තාව. මේ සම්මේලනයෙන් පස්සේ නිලධාරි මණ්ඩලයේ පොඩි වෙනසක් වුණා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සම්පත් හිටියේ UGC එකේ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

අපි පත් කර ගත්තා. ඔව්. එච්චරකට ඒ මනුස්සයා මේ වෙනුවෙන් වැඩ කළා. හැබැයි මේ සම්පත්ට ස්තුති කරන්නේ අපි නොවෙයි. මේ සම්මේලනයේ වාර්තාවයි. සම්පත් මේ වෙනුවෙන් අපිත් එක්ක සිය වතාවකට වැඩිය කථා කළා. ජනාධිපතිතුමා එක්ක කථා කළා. මුදල් අමාත්‍යාංශයේ ලේකම් එක්ක කථා කළා. ජනාධිපති ලේකම් එක්ක කථා කළා. අපිත් එක්ක දහ පහළොස් වතාවක් කතා කළා. Salaries and Cadre Commission එක්ක හත් අට වතාවක් කථා කළා. මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ කමිටුවත් එක්ක කථා කළා. නැවත නැවත මුදල් අමාත්‍යාංශයේ ලේකම් එක්ක කථා කරලා ඔහු ශක්තිමත් වුණා, සියයට පහක් රජයේ නිලධාරින්ට දෙන කොට විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට 36.25ක් ගන්න. ඊට පස්සේ මේ නිලධාරි මණ්ඩලයේ වෙනසක් වුණාම එක පාරටම සියයට 140ක් ඉල්ලා ගෙන ආවා. මම කියන්නේ නැහැ, ඒත් මේකට මම විරුද්ධයි කියලා. නැහැ, අපට 140 නොවෙයි 240කට මේ විශ්වවිද්‍යාලයන්ගේ ආචාර්ය වැටුප ගෙන යන්න පුළුවන්. අපි විශ්වවිද්‍යාල හදමු; මේ විශ්වවිද්‍යාල ගොඩ නඟමු; මේ විශ්වවිද්‍යාලවලින් ආදායම් හදමු; ඒකෙන් අපේ දරුවන්ට වැඩි පහසුකම් දෙමු; වැඩියෙන් ශිෂ්‍යයෝ ගනිමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ රටට රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල ගෙනැල්ලා රජයේ විශ්වවිද්‍යාලවලට අබ මල් රේණුවකින්වත් තර්ජනයක් වෙන්න ඉඩ තියන්නේ නැහැ. ඒක මතක තබා ගන්න. රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවලට අපි කියන පළමුවැනි දේ තමයි සියයට විස්සක් අපට දියන්, නොමිලේ කියලා. ඒ ඇයි? 22,000ක් ගන්න එක 32,000 කර ගන්න. ලබන අවුරුද්දේ අපේ දරුවන්ට මනිපාල් විශ්වවිද්‍යාලයට ඉල්ලන්න පුළුවන් වෙයි. Buckinghamshire New University එකට, University of Tokyo එකටත් ඉල්ලන්න පුළුවන් වෙයි. මේ අපේ Z-Score එක යටතේ ඒ විශ්වවිද්‍යාලවලට ඉල්ලන්න පුළුවන් වෙයි. අපේ දරුවෝ ඒ තැන්වලට ගිහිල්ලා ඒ නිදහස් අධ්‍යාපනය

ගන්නවා. SLIIT එකටත් ගන්නවා, මාලබේ වෛද්‍ය විද්‍යාලයටත් ලබන සැරේ සියයට 20ක් අපි නොමිලේ දමනවා. දැන් මාලබේ වෛද්‍ය විද්‍යාලයේ ඉගෙන ගන්නා දරුවෙකුට අවුරුදු 5 යනකොට ඒ සඳහා රුපියල් ලක්ෂ 55ක් වැය වනවා. ඒක ලෝකයේ අනෙක් විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය සඳහා වැය වන ගණනුත් එක්ක බැලුවාම ලාභයි. හැබැයි අපි ලබන සැරේ සියයට 20ක් ඒකට දමනවා, අපේ දරුවෝ; අපේ දරුවෝ දමනවා, නිකම්. SLIIT එකේ ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකුට අවුරුද්දකට රුපියල් 90,000ක් විතර වැය වනවා. ඒක රජය වියදම් කරලා හදපු, නමුත් පෞද්ගලික විශ්වවිද්‍යාලයක්. හැබැයි අපි ලබන සැරේ ඒකටත් අපේ දරුවෝ සියයට 20ක් දමනවා.

අපි නිදහස් අධ්‍යාපනය අපි ශක්තිමත් කරනවා; තව පුළුල් කරනවා; ඒකේ පදනම් පවුරු ලොකු කරනවා. හැබැයි අමතක කරන්න එපා, අපි මේ 22,000ක් ගන්නේ 150,000ක් උසස් අධ්‍යාපනය ඉල්ලද්දියි කියලා. 150,000ක් ඉල්ලුම් පත්‍ර එවලා අපට විශ්වවිද්‍යාල අධ්‍යාපනයක්; උසස් අධ්‍යාපනයක් දෙන්න කියලා හඬා වැටෙද්දී මේකෙන් සල්ලි තිබෙන අය හත්, අට දාහක් පිට රට යනවා. මිලියන 30,000ක් විතර හැම අවුරුද්දේම පිට රට යනවා. පිට රට යන්න බැරි තව දරුවන් 25කට, 30කට අඩු මුදලකට මේ රටේ විශ්වවිද්‍යාල පහසුකම් ලැබේවි. සියයට 20 ශිෂ්‍යත්වය යටතේ ඒ දරුවන්ට ඒකට යන්න පුළුවන් වෙයි. එතකොට මේ දරුවෝ වැඩි දෙනෙකුගේ පිට රට යාම නවතියි.

ඔබතුමා මේ ප්‍රශ්නය මතු කරපු එක ගැන මම ඉතාම කැමැතියි. මේ ආචාර්යවරුන්ගේ වැටුප් වැඩි කළ යුතුයි කියන එක ප්‍රතිපත්තියක් හැටියට අපි පිළිගන්නවා. නමුත් මේ ක්‍රියාදාමය අපි ආරම්භ කළා. මේක එක රැයකින්, එක budget එකකින් කරන්න බැහැ. නමුත් මේ තත්ත්වය අපි ක්‍රමානුකූලව ඉස්සරහට ගෙනෙනවා. අපට ඕනෑකම තිබෙන්නේ අපේ ප්‍රධාන විශ්වවිද්‍යාල හත, අටක්වත් ජාත්‍යන්තර තලයේ පළමුවැනි 1,000 හෝ පළමුවැනි 2,000 අතරට ගෙනෙන්නයි. අද අපි පහළ මට්ටමකයි ඉන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ඉලක්කය කරා අපි නිවැරැදිව යනවා කියන එක මම කියන්න කැමැතියි.

ඊළඟට, අපේ ශිෂ්‍යයන්ගේ විශේෂ පුහුණු වීම පිළිබඳවත් තව වචනයක් කියන්න මම කැමැතියි. මේක හමුදා පුහුණුවක් නොවෙයි. මේ යුද හමුදා කඳවුරු, පොලිස් කඳවුරු, නාවික හමුදා කඳවුරු, ගුවන් හමුදා කඳවුරු මේ පුහුණුව සඳහා අපි ගත්තේ 10,000ක් පුහුණු කරන්න පුළුවන් වෙන තැනක් නැති නිසායි. වෙන කිසිම තැනක් නැහැ. විශ්වවිද්‍යාලයට මේ අය කෙළින්ම යැව්වාම මොකද වෙන්නේ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, ඒ සඳහා අවශ්‍ය නම් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන තිබුණා. මම ඔබතුමාට දැන් කථා කරපු අත් දැකීමක් කියන්නම්.

ත්‍රිකුණාමලයේ හතරේ කණුව ආසන්නයේ හමුදා බැරැක්කයක දරුවෝ තියා ගෙන ඉන්නවා. ගැහැනු ළමයි ඉන්නේ එතැනයි. ඒ ගැහැනු ළමයින්ගේ තාත්තලා අඬ අඬා කිව්වා. එතැන දෙන ආහාර ඒ අයට කන්න බැහැ; එතැන නිදිය ගන්න බැහැ; ආරක්ෂාව නැහැ කියලා ඒ දරුවෝ වැලපෙනවා කියලා ඒ අම්මලා තාත්තලා කියනවා. මම ඉතා වග කීමෙන් කියන්නේ. ඔබතුමාට අවශ්‍ය නම් මම ඒ දෙමවුපියන් මුණ ගස්වන්නම්. මුණ ගස්සවලා සහතික කරලා කියන්නම්. ඒ දරුවෝ අඬනවා. දරුවෝ වෙනුවෙන් දෙමවුපියන් අඬනවා. එහෙම තත්ත්වයක් තිබෙනවා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

අපි හැම කඳවුරකම ඒ දෙමව්පියන්ගෙන් කැමැති දෙන්නකුට තුන් දෙනකුට ඉන්න ඉඩ දුන්නා. අපි ඉන්න ඉඩ දෙන්නම් කිව්වා. ඔබතුමා දන්නවාද, මේ දරුවෝ කියනවා, "නැහැ, නැහැ අම්මලා, තාත්තලා නවත්වන්න ඕනෑ නැහැ"යි කියලා. ඒ අය ඉතා සතුටින් ඉන්නේ. ඉතා සතුටින් ඉන්නේ. "නැහැ, නැහැ අම්මලා, තාත්තලා ඕනෑ නැහැ" කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම ගියාම මේ ළමයි හය වුණා තමයි.

මේ ළමයි විශ්වවිද්‍යාලයට ගියාම මොකද කරන්නේ? ඉස්සෙල්ලාම කරන්නේ කලිසම ගලවන එක නේ; ඇඳ යටට දාන එක නේ; සුමාන දෙකක් පස්ස පැත්ත හෝදන්න දෙන්නේ නැති එක නේ. දැන් කවුද මේවා කරන්නේ? අනුරාධපුර භික්ෂු විද්‍යාලයේ අලුත ගිය හාමුදුරුගොල්ලන්ට සති දෙකක් පිටුපස්ස හෝදන්න දෙන්නේ නැහැ. ඒක බලා ගෙන ඉන්න හැම toilet එකේම දොරේ හිලක් ගහලා. මේක නේ තත්ත්වය. මේක නේ තත්ත්වය. මට දැන් මන්ත්‍රීවරයෙක් ලියුමක් ගෙනත් දුන්නා. මොකක්ද ඒකේ තිබෙන්නේ? සබරගමුව දරුවාගේ තත්ත්වය භයානකයි. තමව කථා කරන්න බැහැ. ඒ, සබරගමුවේ. අපි ගිය අවුරුද්දේ මේ නවක වධය සියයට 80ක් නැවැත්වූවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට කියන්නට කැමැතියි, ලබන වසරේ කිසිම විශ්වවිද්‍යාලයක, කිසිම විධියකින්, කිසිම දරුවෙකුට, කිසිම නවක වධයක් දෙන්න දෙන්නේ නැහැ කියලා. නවක වදය දෙන සියලු දෙනා අස් කරලා, විශ්වවිද්‍යාල වහලා හරි අපි ඒක නවත්වනවා. මේ දරුවන්ට මෙහෙම වධ දෙන්න ඉඩ දෙන්න බැහැ. මේක අමානුෂික වධයක්. මේ දරුවන්ට ඉංග්‍රීසි පන්ති යන්න දෙන්නේ නැහැ. මේ දරුවන්ට ඉංග්‍රීසියෙන් කථා කරන්න ඉඩ දෙන්නේ නැහැ. පුස්තකාලයට ගිහිල්ලා පැය දෙකකට වඩා හිටියොත් නින්ජා ගහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

කවුද ඒක කරන්නේ?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ශිෂ්‍යයෝ ඉතාම සුළු පිරිසක්. ඉතාම සුළු පිරිසක්, ශිෂ්‍යයෝ. මම නම් කරන්නේ නැහැ, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඉන්න නිසා. මම නම් කරන්නේ නැහැ. ඉතාම සුළු ශිෂ්‍යයෝ පිරිසක් මේක කරන්නේ. අපි සබරගමුව විශ්වවිද්‍යාලය වහලා, පන්ති තහනම් කරලා, ආපහු ඒ ළමයින්ට සමාව දීලා ඇරියා. ඔබතුමාට කියන්න ඊයේ ගැහැනු ළමයි දෙන්නෙක් ඉංග්‍රීසියෙන් කථා කර කර යන කොට පිටු පස්සෙන් ගිහිල්ලා "තොපි මීට පස්සේ මේක ඇතුළේ ඉංග්‍රීසියෙන් කථා කළොත් මරණවා" කියලා භය කරලා තිබෙනවා. අද ඒකට පොලිස් පරීක්ෂණයක් යනවා. මම කිව්වා වහාම පොලිස් පරීක්ෂණයක් කරන්න කියලා. ඒවා කරන්නේ ඇයි? සබරගමුවේ සියලුම පාඨමාලා යන්නේ ඉංග්‍රීසියෙන්. අපේ වග කීමක් තිබෙනවා මේ අවුරුද්දේ ගන්න දරුවෝ එළියට දාන කොට ඉංග්‍රීසි භාෂාව සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම අතින් ඉතාම ඉහළ -කිසිම අඩුවක් නැති- දරුවෙක් එළියට දාන්න. ඒ ඉලක්කයට යන්න ඕනෑ. ඒ ඉලක්කයට යන්න නම් මේ දරුවෝ හදන්න ඕනෑ. මේ දරුවෝ විශ්වවිද්‍යාලයට එන කොට මේ දරුවන්ට මානසික ප්‍රශ්න තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, මම විශ්වවිද්‍යාලවල සියලුම ක්‍රීඩා අධ්‍යක්ෂවරු ගෙන්වලා ඇහුවා, සාමාන්‍යයෙන් දරුවන්ගෙන් කී දෙනෙක් පිට්ටනියට එනවාද කියලා. සියයට 7ට අඩුයි. මේක ප්‍රශ්නයක් නොවෙයිද? Gym එකට යන්නේ නැහැ. ටේබල් ටෙනිස් ටිකක් ගහන්නේ නැහැ. වොලිබෝල් ටිකක් ගහන්නේ

[ගරු එස්. බී. දිසානායක මහතා]

නැහැ. Ground එකට බැහැලා ටිකක් jog කරන්නේ නැහැ. මේ දරුවන්ගේ ශාරීරික යෝග්‍යතාව පිළිබඳව ගැටලුවක් නැද්ද? ඔබතුමා මේ විශ්වවිද්‍යාල දරුවෙකුගේ කාමරයකට ගිහිල්ලා බලන්න. ඒක පිස්සන් කොටුවක්. අවුරුදු 17,18,19 වයසේ දරුවන්ට කාමරය පිළිවෙළකට තියා ගන්න; ජීවිතයේ වෙලාවට වැඩ කරන්න; වෙලාවට නැඟිටින්න; ශාරීරික ව්‍යායාම ටිකක් කරන්න; මනසේ යෝග්‍යතාව කෙළින් තියා ගන්න විද්‍යාත්මක පුහුණුවක් දෙන්න ඕනෑ. මේ පන්ති හමුදා කඳවුරුවල තියන්නේ වෛද්‍යවරු. අධ්‍යාපන මනෝ විද්‍යාඥයන් මේ පන්ති කරන්නේ. අප යටතේම තිබෙන ආරක්ෂක විශ්වවිද්‍යාලයේ අය ව්‍යායාම ටික කරවනවා ඇති. මේ දරුවන්ට කෑම බීම සම්බන්ධව පොඩි ප්‍රශ්න තියෙන්න පුළුවන්. කාමරයේ ඇඳක ප්‍රශ්නයක් තියෙන්න පුළුවන්. හැබැයි, මේ දරුවෝ ඉතාම සතුටින් අලුත් -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔබතුමාගේ පාඨමාලාවට ඒක ඇතුළත් නම් කමක් නැහැ. ඉතා වග කීමෙන් කියනවා, ඒ දරුවන් ලවා හමුදා කඳවුර පුරා තිබෙන වැසිකිළි හෝදවලා තිබෙන බව.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

හමුදා කඳවුරේ ඒවා නොවෙයි, ඒ කට්ටියගේ ඒවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන් ගිය වැසිකිළිය තමුන් හෝදා ගන්න ඕනෑ. ඇත්තටම අපේ සමහර දරුවෝ ඒක කරන්න දන්නේ නැහැ. [බාධා කිරීමක්] නවක වදය දෙන කොට වැසිකිළි වතුර පොවනවා. [බාධා කිරීමක්] තමුන් වැසිකිළියට ගියාම වැසිකිළිය ලස්සනට හෝදලා එළියට බහින්න ඕනෑ. තමුන් -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔබතුමාගේ පාඨමාලාවට ඒ දරුවන් ලවා වැසිකිළිය සේදීම ඇතුළත් නම් ප්‍රශ්නයක් නැහැ. මට දැන ගන්න ඕනෑ, ඔබතුමාගේ පාඨමාලාවට ඒ දරුවන් ලවා වැසිකිළි සේදීම ඇතුළත්ද කියායි. ඔබතුමා ඒක කියනවා නම් -

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

තමුන් යන වැසිකිළිය. වරද්දා ගන්න එපා. තමුන් ඉන්න පරිසරය පිරිසිදුව තබා ගන්න ඕනෑ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔබතුමාගේ අවබෝධයෙන් තොරව නම් ඒ වැසිකිළි සෝදන්නේ, එතකොට ප්‍රශ්නයක්. ඔබතුමාගේ අවබෝධයට යටත්ව නම් වැසිකිළි සෝදන්නේ, එතකොට ප්‍රශ්නයක් නැහැ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

මේ දරුවෝ තමන් ඉන්න තැන අතුගානවා. කවදාවත් ඉදලක් අල්ලපු නැති දරුවෝ එතැන ඉන්නවා. හැබැයි, මේ දරුවෝ එතැනදී තමන් ඉන්න තැන ශුද්ධ කර ගන්නවා. තමුන්ගේ ඇඳ හරියට පිළිවෙළකට හදා ගන්නවා. හරියට වෙලාවට නැඟිටිනවා. හරියට වෙලාවට පිට්ටනියට බහිනවා. මෙහෙම කරන්නේ මේ දරුවාගේ මානසික ඒකාග්‍රතාව හා ශාරීරික යෝග්‍යතාව හදන්න. මෙතැන වෙන කිසිම දෙයක් නැහැ. ඒ නිසා -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉතාම කෙටියෙන් කියන්න. කාලය හරස් වනවා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

මම ඉවර කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු ඇමතිතුමනි, දැන් විශ්වවිද්‍යාලයට ඇතුළත් වන්න මේ පාඨමාලාව හැදෑරීම අනිවාර්ය කර තිබෙනවාද? ඒ කියන්නේ පාඨමාලාවට ගියේ නැති ළමයෙක් විශ්වවිද්‍යාලයට නොගන්න තීරණයක් අරගෙන තිබෙනවාද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ඔබතුමා ඔය ප්‍රශ්නයට මගෙන් උත්තර ඉල්ලන්න එපා. [බාධා කිරීමක්] මා කියන්නම්. ඕකට හරියට උත්තරයක් නොදෙන්න හේතුවක් තිබෙනවා. හේතුව මොකක්ද? මා කිව්වොත් අනිවාර්ය නැහැ කියලා, SMS යවනවා. "තෝ, පාඨමාලාවට ගියොත්, විශ්වවිද්‍යාලයට ආවොත් මරනවා" කියා. එහෙම SMS යවනවා. අපි මේ දරුවන්ට කියන්නේ මේක මෙතැනින් එහාට තිබෙන ඊළඟ පාඨමාලාවේ කොටසක් කියායි. දරුවෙක් අසනීප වෙනවා කියා හිතමු. කම්මුල්ගාය හැදුණු දරුවකුට මේ පාඨමාලාවට යන්න බැහැ. හැබැයි, ඒ දරුවාට විශ්වවිද්‍යාලයට එන්න බැරිකමක් නැහැ. ඒ එක්කම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දරුවා ගමට ගියාම මොකද කරන්නේ? අපි මාස තුනක් ගමේ මධ්‍යස්ථාන 300කදී ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය උගන්වනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒක අවුරුදු 15ක් තිස්සේ කියනවා නේ. මා අහන්නේ මේකයි. මේ පාඨමාලාවට ගියේ නැති දරුවෙක් මේ පාඨමාලාවට ගියේ නැහැ කියා විශ්වවිද්‍යාලයෙන් ඉවත් කරන්න ගරු ඇමතිතුමා තීරණය කර තිබෙනවාද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

දැන් මා ඔබතුමාට කිව්වා -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඇයි, කෙළින් උත්තරයක් දෙන්න බැරි? ඇමතිතුමා කෙළින් උත්තරයක් දෙන්න. මොකද, ළමයි භය කරලා-

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

මේ උත්තරය තමයි දෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා උත්තර දුන්නා නේද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ. උත්තර දීලා නැහැ. ළමයි කැමැති නැහැ. මේකට ආවේ නැත්නම් විශ්වවිද්‍යාලයට ඇතුළත් වන්න බැහැ කියා ළමයි භය කරලා. ඒක තමයි ඇත්ත. ඇමතිතුමා මගේ මිත්‍රයා. ඒක තමයි ඇත්ත. ඒකට ඔබතුමාට උත්තරයක් දෙන්න බැහැ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
මට කමක් නැහැ. ඔබතුමා ඔහොම කියන එක ගැන මට පොඩි දුකක් තිබෙනවා. අවංකව කියනවා නම් මේ දරුවෝ ඉතා කැමැත්තෙන් මේකට එන්නේ. මේ දරුවන් වෙනුවෙන් ඊළඟට ගමේ තියෙන මාස තුනේ පාඨමාලාවේ කොටසක් මේක. මේ දරුවෝ සියලු දෙනා ඉතාම කැමැත්තෙන් එන්නේ. එහෙම නැතුව බලෙන් නොවෙයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හිටපු ගරු මන්ත්‍රීවරු තුන් දෙනෙකුගේම ශෝක ප්‍රකාශ යෝජනා අදට නියමිතව තිබෙනවා. ඒ පවුල්වල උදවියත් මේ ගරු සභාවේ ගැලරියේ අසුන් ගෙන සිටිනවා. [බාධා කිරීමක්] ඉතාම කෙටියෙන් කියන්න.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව අපි උපකුලපතිවරයෙකු සමඟ කථා කරන්න පටන් ගත්තේ මීට අවුරුද්දකට කලින්. මේ පිළිබඳව විශේෂඥයන් එක්ක කථා කරන්න පටන් ගත්තේ මීට අවුරුද්දකට කලින්. අපි මේ පිළිබඳව කමිටු හැදුවේ මීට අවුරුද්දකට කලින්. මේ දරුවෝ එතැනින් ගමට ගිහින් ගමේ මාස තුනේ පාඨමාලාව ඉවර වන විට ඇමෙරිකානු ශිෂ්‍යත්ව 10,000ක් හම්බ වනවා, Distance English Education එකෙන්.

මේ සියල්ල කළේ අවුරුද්දක කාලයක ඉඳලායි. මේකේ කිසි හදිස්සියක් නැහැ. හැබැයි, මේ වතාවේ එක දිනයකදී සියලු විශ්වවිද්‍යාල පටන් ගන්න යනවා.

අපි මේක පටන් ගන්න යන කොට ඉක්මනින් ප්‍රතිඵල ලබා ගැනීම ප්‍රශ්නයක් වනවා. අපි මාස හයක් තිස්සේ අධ්‍යාපන අමාත්‍යාංශය හා විභාග දෙපාර්තමේන්තුවත් එක්ක කථා කරලා තමයි සති දෙකකට කලින් ප්‍රතිඵල ගත්තේ. එහෙම ගත්තත් ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම ගත්තාට recorrection දමන දරුවෝ සියයට 3ක් ඉන්නවා. ඒක එන තෙක් හරියටම මේ අයගේ Z-Score එක කියන්න බැහැ. හෙට තමයි ඒක කියන්නේ. ඒ නිසා මේ කාල වකවානුවේ පොඩි හිර වීමක් තිබෙනවා. නමුත් මේක ඉතා සැලසුම් සහගතව කරපු දෙයක් බව කියන්න ඕනෑ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන්, අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අමරනන්ද රත්නායක මැතිතුමා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව.

කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු අල්හාජ් ඒ.එච්.එම් අස්වර් මහතාගේ නම යෝජනා කරන්න.

**ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Human Resources)
මේ අවස්ථාවේ ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනය ගත යුතුයයි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

## ශෝක ප්‍රකාශය : ගරු අමරනන්ද රත්නායක මහතා
## அனுதாபப் பிரேரணை : மாண்புமிகு அமரானந்த ரத்னாயக்க
## VOTE OF CONDOLENCE : HON. AMARANANDA RATNAYAKE

[අ.භා. 2.51]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදුල්ල දිස්ත්‍රික්කයට අයත් පස්සර මැතිවරණ කොට්ඨාසයේ පොදු මහජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කරන ලද පරිණත දේශපාලනඥයකු වූ අමරනන්ද රත්නායක මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේ දී ගරු සභාවට ඉදිරිපත් කරනවා.

පස්සර, බිබිලේගම, ලුනුගල ආදී විදුහල් ගණනාවක විදුහල්පති ධුරය දැරූ එම්.බී. රත්නායක මහතාගේ සහ එලිනෝර් සොෆායා රත්නායක ගරු මාතාවගේ පවුලේ -අට දෙනකුගෙන් යුත් පවුලේ- පස් වැනියා වශයෙන් 1922 සැප්තැම්බර් මස 22 වැනි දින අමරනන්ද රත්නායක මහතා මෙලොව එළිය දුටුවේය. බිබිලේගම මූලික පාසලෙන් ඉගෙනුම ලැබීම ආරම්භ කළ අමරනන්ද මහතා ඉන් අනතුරුව බදුල්ල ධර්මදූත විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබුවේය. කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් වැඩිදුර ඉගෙනීම් කටයුතු කළ එතුමා යළිත් බදුල්ල ඌව විද්‍යාලයට ඇතුළත් විය.

බණ්ඩාරවෙල මේරි ට්‍රීෂා සිල්වා මෙනෙවිය සමඟ අතිනත ගත් රත්නායක මහතා එම විවාහයෙන් පුතුන් පස් දෙනකුත්, දියණියන් දෙදෙනකුත් මෙලොවට දායාද කළේය. ඒ පිරිමි දරුවන් පස්

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

දෙනාගෙන් තිදෙනෙක් ඉංජිනේරුවන් වන අතර, දෙදෙනකු උපාධිධාරින්ය. දියණියන් දෙදෙනා ගුරුවරියන් වූ අතර ඒ සියලු දෙනාම විවාහ වී වාසනාවන්ත දිවි පෙවෙත් ගත කරති. එම දරුවන් යහපත් දරුවන් කිරීමේ දී රත්නායක මහත්මියගේ කැපවීම සියලු මවුවරුන්ට ආදර්ශයකි. එක් දියණියකගේ ස්වාමි පුරුෂයා මේ වන විට සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන් කටයුතු කරයි.

පාසල් අධ්‍යාපනයෙන් අනතුරුව 1941 සහ 1942 වසරවල බදුල්ල කලං වතුයායේ සහ හාලිඇල රොක්කතැන්න වතුයායේ සේවය කළ රත්නායක මහතා දෙවන ලෝක සංග්‍රාමය පැවැති අවස්ථාවේ දී 1943 සිට 1946 දක්වා බ්‍රිතාන්‍ය රාජකීය හමුදාවට බැඳී පලස්තීනය, සිරියාව, ඉතාලිය, ඊජිප්තුව ආදී රටවල යුද සෙබළකු වශයෙන් සේවයේ යෙදී ඇත.

1947 වසරේදී රජයේ ලිපිකාර සේවයට අනුයුක්තව බදුල්ල හා කලුතර කච්චේරිවල ලිපිකරුවකු වශයෙන් කටයුතු කළ එතුමා තවදුරටත් රජයේ සේවයේ යෙදෙමින් රජයේ ගබඩා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා බදුල්ල මැතිවරණ කාර්යාලය වැනි ආයතනවලද 1959 දක්වා සේවයේ නිරත විය.

ඉන් අනතුරුව ක්‍රියාකාරි දේශපාලනයට පිවිසෙමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැඳුණු රත්නායක මහතා, සාහසිකයකුගේ වෙඩි පහරින් අවසන් හුස්ම හෙලූ ගරු අග්‍රාමාත්‍ය ඇස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ අභාවය නිසා හිස් වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය භාර ගත් ගරු සිරිමාවෝ බණ්ඩරනායක මැතිනියට ශක්තියක් ලබා දෙමින් පස්සර ආසන සංවිධායකවරයා වශයෙන් විශාල වගකීම් භාරයක් සියතට ගත්තේය. තම පක්ෂයේ ජනසම්මතවාදී වූත්, ප්‍රගතිශීලී වූත්, මධ්‍යස්ථ මාවත පදනම් කර ගත් දේශපාලන දර්ශනය පස්සර ප්‍රදේශයේ ජනතාව අතරට ගෙන යාම නිසා එම ප්‍රදේශය තුළින් ක්‍රියාකාරින් විශාල පිරිසක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක් කර ගැනීමටත්, එම ප්‍රදේශයේ පොදු ජනතාවට හිතවත්ව සංවිධාන කටයුතු කිරීමටත් එතුමාට හැකි විය.

පක්ෂය වෙනුවෙන් තම ශ්‍රමය, ධනය, කාලය හා බුද්ධිය කැප කරමින් 1960 මාර්තු මහ මැතිවරණයට පස්සර ආසනයෙන් තරග වැදුණද, ඡන්ද 70ක් අඩු වීමෙන් පරාජයට පත් වීමට එතුමාට සිදු විණි. යළි එම වසරේ ජූලි මස පැවැත් වුණු පාර්ලිමේන්තු මහ මැතිවරණයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යටතේ තරග කොට ජයග්‍රහණය ලද එතුමා මෙම උත්තරීතර සභාවට පස්සර මහජන නියෝජිතයා වශයෙන්පැමිණ අසුන් ගැනීමේ භාග්‍යය උදා කර ගත්තේය.

වසර ගණනාවක් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ යකඩ සපත්තුවට පෑගෙමින් සමාජයීය හා ආර්ථික වශයෙන් දැඩි පීඩාවකට පත්ව සිටි ඌවේ ජනතාව එම කම්පනයෙන් මුදා ගෙන ඔවුනට උසස් ජීවන තත්ත්වයක් ළඟා කර දීමේ අරමුණ ඇතුව එතැන් සිට මෙම සභා ගර්භය තුළ තම හඬ අවදි කළ එතුමා බදුල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයකු වශයෙන් කටයුතු කරමින් එම ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා දරන ලද උත්සාහය වැදගත්ය; ආදර්ශවත්ය.

මහජන මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කරමින් රත්නායක මහතා කළ උදාර සේවාවන් අතර බිබිලේගමට උප තැපැල් කාර්යාලයක් ලබා දීම, පස්සර සතොස වෙළෙඳ ආයතනය පිහිටුවීම, තොලෝබෝවත්ත ජයන්ති විද්‍යාලය රජයට පවරා ගනිමින් එහි දියුණුව සඳහා කටයුතු යෙදීම, මැටිගහතැන්න - ලුනුගල යා කරමින් සහ වැල්ගොල්ල- පස්සර යා කරමින් මාවත් ඉදි කිරීම, පස්සර මුස්ලිම් විද්‍යාලය ආරම්භ කිරීම ප්‍රධාන තැනක් ගනියි. ඊට අමතරව පස්සර නගරය සඳහා ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයක් පිහිටුවමින් ඒ සඳහා තම නිවස ලබා දීමත්, පස්සර මහා විද්‍යාලයට ශ්‍රවණාගාරයක් ලබා දීමත් ඒ පොදු ජන සේවාවේ සදානුස්මරණීය සටහන් අතරට පත්ව ඇත.

එම කාල සීමාව තුළදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝජිතයකු වශයෙන් ජපානයේ පැවැති සම්මන්ත්‍රණයකට ද සහභාගි වූ එතුමා ආගමික වශයෙන්ද ප්‍රදේශය හා බැඳී සිටියේය. ඒ බව පස්සර, බිබිලේගම, ලුනුගල, ඇකිරිය, කහටරුප්ප ආදී විහාරස්ථාන හා සම්බන්ධ වෙමින් ඒවායේ උන්නතිය වෙනුවෙන් කැප වීමෙන් කරන ලද මහඟු සේවාවෙන් පෙනී යයි.

පස්සර මැතිවරණ කොට්ඨාසයේ ජනතාව අතරින් විශාල පිරිසක් ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයන් වුවද, ඔවුනගේ මනාපය මහ මැතිවරණයේදී තමන් වෙත ලබා ගැනීමට එතුමා තුළ පැවති විශ්වාසවන්තභාවය හා මහත්මා දේශපාලනය බොහෝ සෙයින් ඉවහල් වුණි. තමන් වෙත ඡන්දය ලබා දුන් ජනතාවගේ අවශ්‍යතා, වගකීම් හා යුතුකම් ජාති භේදයකින් තොරව උපරිම ශක්තියෙන් ඉටු කළ නිහතමානී ගතිගුණවලින් පිරිපුන්ව සිටි එතුමා සැබෑ මානව හිතවාදියකු බව අපි ගෞරවයෙන් සටහන් කරමු.

මේ අතර 1964 දෙසැම්බර් මස තුන්වැනි දා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වාර්තාගත සුවිශේෂී සිදුවීමක් විය. ඒ, ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමියගේ රජයේ රාජාසන කථාව එක් ඡන්දයකින් පරාජයට පත්වීමයි. එම පරාජයට හේතුව එවකට පස්සර මැතිවරණ කොට්ඨාසය නියෝජනය කළ අමරනන්ද රත්නායක මහතා පාර්ලිමේන්තුව වෙත ප්‍රමාද වී පැමිණීම බවට සමහරු චෝදනා කළහ. එහෙත් එතුමාගේ පැමිණීම ප්‍රමාද වීමට හේතු වූයේ තමන් ගමන් කළ වාහනයේ ටයරයක හුළං යාම නිසා බවත්, එය කිසිසේත්ම කඩාකප්පල්කාරී ක්‍රියාවක් නොවන බවත් ඒ පිළිබඳව පැවැති විනය පරීක්ෂණයේදී රත්නායක මහතාට පෙන්වා දීමට හැකි විය. මේ සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එතුමා වෙත නිකුත් කරන ලද ලිපියෙන් එතුමාගේ නිවැරදිභාවය වඩාත් තහවුරු වෙයි.

මේ අවස්ථාවේදී මගේ යුතුකමක් තිබෙනවා, ඒ ලිපිය මේ ශෝක යෝජනාවේ අන්තර්ගත කිරීම සඳහා කියවන්නට. එහි මෙසේ සඳහන් වනවා:

"1964 දෙසැම්බර් 17,
කොළඹදී.

ප්‍රිය රත්නායක මහතාණෙනි,

1964 දෙසැම්බර් 3 වැනි දින රාජාසන කථාව පිළිබඳ ඡන්ද විමසන අවස්ථාවේ ඔබ නොපැමිණියේ නොවැළැක්විය හැකි හේතුවක් නිසා බවත්, රජයේ සාමාජිකයෙකු වශයෙන් ඔබේ යුතුකම තිබූ පරිදි එම අවස්ථාවට පැමිණීමට ඔබ උත්සාහ දරා ඇති බවත්, ඔබ ඉදිරිපත් කර ඇති ලිපියෙන් පක්ෂ නායිකාව වශයෙන් සෑහීමකට පත් වූයෙමි. මහජනයා හමුවේ ඔබේ තත්ත්වය රැක ගැනීම සඳහා මෙම ලිපිය ඔබ කැමති අයුරකින් යොදා ගැනීමේ වරදක් නැත.

මෙයට හිතවත්,
සිරිමා ආර්.ඩී. බණ්ඩාරනායක
අග්‍රාමාත්‍යවරිය"

ඉන් අනතුරුව 1965 වසරේ පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා ඉදිරිපත් වුවද ඉතා සුළු ඡන්ද ගණනකින් පරාජයට පත් වූ රත්නායක මහතා සෑම විටෙකම ප්‍රදේශයේ උන්නතිය වෙනුවෙන් හා පක්ෂයේ අභිවෘද්ධිය වෙනුවෙන් තම යුතුකම් නොපිරිහෙළා ඉටු කළේය. 2000 වසරේදී ඌව පළාත් ආණ්ඩුකාරවරයා වශයෙන් කටයුතු කළ අභාවප්‍රාප්ත එම්.එස්. අමරසිරි නමැති කෘත හස්ත දේශපාලනඥයාගේ සම්බන්ධීකරණ ලේකම් වශයෙන්ද ක්‍රියා කිරීමට එතුමාට අවසන් කාලයේදී

අවස්ථාව උදා වුණි. කෙටි කාලයක් සුළු අසනීප ගතියකින් පෙළෙමින් සිටි අමරනන්ද රත්නායක මහතා වසර අසූ හතරක් ආයු වළඳා 2006 දෙසැම්බර් මස තුන්වැනි දින පස්සර ප්‍රදේශයේ පොදු මහ ජනතාවගේ දෙනෙතට කඳුළක් එක් කරමින් සඳහටම දෙඇස් පියා ගත්තේය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොදු මහ ජනතාවගේ යහපත වෙනුවෙන් සිය ජීවිත කාලයම කැප කරමින් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ පස්සර හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අමරනන්ද රත්නායක මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් මෙම පාර්ලිමේන්තුවේ ශෝකය මෙයින් ප්‍රකාශ කරන අතර, එතුමාගේ දයාබර භාර්යාව ඇතුළු පවුලේ ඥාතීන් වෙත අප සැමගේ ශෝකය දන්වා යවන ලෙස යෝජනා කර සිටිමි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු විරුද්ධ පක්ෂයේ නායකතුමා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
හරින් ප්‍රනාන්දු මැතිතුමා කථා කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එහෙම නම් හරින් ප්‍රනාන්දු මැතිතුමා කථා කරන්න.

[අ.භා. 3.01]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අමරනන්ද රත්නායක මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාවට එක් වීමට අවස්ථාව ලැබීම ගැන මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වනවා.

පස්සර, බිබිලේගම ප්‍රාථමික විද්‍යාලයේ ප්‍රධානාචාර්ය ධුරය දරන ලද ලුනුගල මැදිවෙල එළමල්පොත උපත ලද ආර්.එම්.බණ්ඩාර ප්‍රධානාචාර්යතුමාගේ සහ එම මැතිනියගේ පුත්‍රයෙකු ලෙස අමරනන්ද රත්නායක මහතා උපත ලබා ඇත. පස්සර, බිබිලේගම පාසලෙන් මූලික අධ්‍යාපනය ලබා ගත් අමරනන්ද රත්නායක මහතා පසුව බදුල්ල ධර්මදූත විද්‍යාලේත්, කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේත් අධ්‍යාපනය ලබා ඇත. උසස් අධ්‍යාපනයෙන් පසුව යුද හමුදාව හා බැඳුණු ඒ මහතා වසර 4ක් පමණ දෙවන ලෝක සංග්‍රාමයේ රාජකීය යුද හමුදාවේ සාජන්වරයෙකු ලෙස විදේශගතව සිට ලංකාවට පැමිණ රජයේ සේවයට සම්බන්ධව කටයුතු කර ඇත. ගම්බද අහිංසක අසරණ අය වෙනුවෙන් කළ අමිල සේවාව වෙනුවෙන් ජනාදරයට පත් අමරනන්ද රත්නායක මහතා 1960 මැතිවරණයේදී පස්සර ආසනයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කොට සිරිමාවෝ බණ්ඩාරනායක රජයේ පස්සර මන්ත්‍රීවරයා ලෙස පස්සරට විශාල සේවාවක් ඉටු කර ඇත. 1960 දී එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයකු වූ එස්.ඒ. පීරිස් මහතාට වඩා වැඩි ඡන්ද 325ක පමණ ප්‍රමාණයකින් එතුමා පරාජයට පත් කර ඇති අතර, 1965 මහ මැතිවරණයේදී එතුමා පරාජය වුණේ ඡන්ද 325ක් වැනි සුළු ප්‍රමාණයකිනි. එතුමාගේ ආදරණීය බිරිඳ විශ්‍රාමික විද්‍යාල්පතිනියකි. නම එම්.ටී. රත්නායක මහත්මියයි. දරුවන් ගත් කල, එතුමාට දරුවන් හත් දෙනෙකු සිටී. ඒ පිරිමි දරුවන් පස් දෙනෙකු හා ගැහැනු දරුවන් දෙදෙනෙකු වශයෙනි. පළමු පුතා නාවික ඉංජිනේරුවරයෙකි. දෙවැනි පුතා ඉංජිනේරුවරයෙකි. විද්‍යාවේදී උපාධිධරයකු වූ තුන්වැනි පුතා සමාගම් සභාපතිවරයෙකි. හතරවැනි පුතාද ඉංජිනේරුවරයෙකි. පස්වැනි පුතා සමාගම් ක්ෂේත්‍ර නිලධාරියෙකි. ගැහැනු දරුවන් දෙදෙනා ගුරුවරියන් ලෙස සේවය කරයි. මේ සියලු දෙනාම විවාහයෙන් පසු අදටත් දූ දරුවන් සමඟ ජීවත් වෙති. සිය විවාහක 50වැනි රජත සංවත්සරය සැමරීමෙන් පසු එතුමා හදිසියේ රෝගාතුර වුණි. අමරනන්ද රත්නායක මැතිතුමා රුහුන් සහිත දුරකථන සම්බන්ධතා ලබා දෙමින් ඇත පිටිසර ගමක් වූ කහටරුප්ප ගම සංවර්ධනය කළ අතර තැපැල් හා විදුලි සන්දේශ පහසුකම් ද ලබා දී ඇත. සෑම රජයේ නිවාඩු දිනයකම ගමින් ගමට ගොස් අවශ්‍ය චරිත සහතික, වාර්තා සියලු දෙනාට ලබා දුන්නේය. දින පතා දුම්රියෙන් පාර්ලිමේන්තුවට පැමිණි එතුමා රාත්‍රී ගමනෙන් පසු නිවසට ආ විට සියලු දෙනාම දන්නා පරිදි නිවහනේ නිදා ගන්නට හැම දාම යොදා ගත්තේ තමන්ගේ සාලයේ තිබුණු පුටුවමය. 1964 දී ශ්‍රී ලංකා පරිපාලන සේවා විභාගය සමත් වූ -ලංකාවේ කීර්තිමත් දිසාපතිවරයෙකු වූ- පිහිල්ලේගෙදර මැතිතුමාව කොත්මලේ සිට පස්සරට කැඳවාවිත්, තම මහ ගෙදර උප දිසාපති කාර්යාලයක් බවට පත් කරමින් පස්සර පළමු උප දිසාපති කාර්යාලය ද මෙතුමා විසින් විවෘත කරන ලදී. දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවලට මන්ත්‍රීවරයෙකු වශයෙන් වාහන පහසුකම් ඉල්ලා සටන් කරන ලදී. මෙතුමා භාෂා ත්‍රිත්වයෙන්ම ඉතාමත්ම හොඳ ප්‍රගුණත්වයක් දක්වපු මන්ත්‍රීවරයෙකි; ඒ වාගේම දක්ෂ ක්‍රීඩකයෙකි. 1960-64 කාලය තුළදී එතුමාගෙන් පස්සර ආසනයට රුපියල් කෝටියකට අධික වටිනාකමකින් යුත් මහජන සේවාවක් සිදුව ඇත. අධ්‍යාපන අංශය, සෞඛ්‍ය අංශය, මංමාවත්, ගමනාගමනය, ප්‍රවාහන පද්ධතිය, කර්මාන්ත, ගම් සභා සඳහා කරන ලද සේවාවන්, ඉඩම් බෙදා දීම, වාරිමාර්ග යෝජනා ක්‍රම, තැපැල් සේවා, සමාජ සේවා කටයුතු ආදී වශයෙන් සෑම ක්ෂේත්‍රයකටම විශාල සේවාවක් සිදු කරන ලදී.

මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුත්තේ අධ්‍යාපනය වෙනුවෙන් දක්වන ලද දායකත්වයයි. පස්සර ප්‍රදේශයේ දූ දරුවන්ගේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා නව පාසල් බිහි කිරීම, ඒ වාගේම විද්‍යාල මහා විද්‍යාල බවට පත් කිරීම, විද්‍යාගාර ඉදි කිරීම, පුස්තකාල ඇති කිරීම, විද්‍යාලවල යටිතල පහසුකම් ඇති කිරීම ඒ අතරින් සුවිශේෂ වේ.

පස්සරට ආදායම් පාලන නිලධාරි කාර්යාලයක් ලබා දීම, පස්සර සතොස වෙළෙඳ සැලක් ඉදි කිරීම, ලුණුගලට උප දිසාපති කාර්යාලයක් යෝජනා කිරීම, පස්සර බස් ඩිපෝවක් ඉදි කිරීම සහ තානායමක් ඉදි කිරීම ද එතුමාගෙන් සිදු වුණු සේවාවන් අතර වේ. බිබිලේගම මාතෘ නිවාසය, ලුණුගල වැවේතැන්න රෝහල, කහටරුප්ප රෝහල, ආගරතැන්න රෝහල පිළිබඳව එතුමා තමයි මුලින්ම යෝජනා ඉදිරිපත් කළේ. ඉතා දුෂ්කර ගම්මාන සඳහා මංමාවත් ඉදි කිරීම සම්බන්ධයෙන් 1960-65 යුගයේදී අමරනන්ද රත්නායක මහතාගෙන් සිදු වුණු සේවාව අතිවිශාලයි.

දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කිව්වා වාගේ අමරනන්ද රත්නායක මැතිතුමා ගැන ආන්දෝලනයට තුඩු දුන් කාරණයක් තමයි 1964 දෙසැම්බර් මස තුන්වැනි දා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමියගේ රජයේ රාජාසන කථාව සම්බන්ධයෙන් පැවැති ඡන්ද විමසීමේ අවස්ථාවට එතුමා නොපැමිණීම. එතුමා පිළිබඳව ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා බොහොම හොඳින් කරුණු පැහැදිලි කරලා දුන්නා සේම, ඒ පවුලට සම්බන්ධතාවක් තිබෙන පුද්ගලයකු හැටියට මමත් කියනවා, එතුමා කළ සේවාව සදා අමරණීයයි කියලා. එතුමාගේ පවුලේ සියලු දෙනාම අද මේ අවස්ථාවට සහභාගි වී සිටිනවා. ඒ සියලු දෙනාම වෙනුවෙන් එතුමා කරපු සේවාව අගය කරන අතර එතුමාට නිවන් සුව අත් වේවා'යි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 3.07]

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ශෝක යෝජනාව ගෙන එන්නේ මීට වසර ගණනාවකට පෙර ඌන සංවර්ධිත ප්‍රදේශයක් හැටියට සැලකුණු ඌව පළාතේ, ඉහළ කඳුකරයේ, පස්සර ප්‍රදේශයේ සංවර්ධනයට දැවැන්ත සේවාවක් ඉටු කළ, මේ රටේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් වසර හතර හමාරකට ආසන්න කාලයක් රටට සේවය කොට අප අතරින් වෙන් වූ අමරනන්ද රත්නායක ගරු හිටපු මන්ත්‍රීතුමාගේ අභාවය පිළිබඳවයි.

විශේෂයෙන්ම අපේ ගරු අමාත්‍ය, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමා එතුමා සම්බන්ධයෙන් දීර්ඝ විවරණයක් කළා. ඒ වාගේම රත්නායක මහතා කළ සේවය සම්බන්ධයෙන් බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරයකු හැටියට හරින් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා කරුණු කාරණා රාශියක් ඉදිරිපත් කළා.

මට මතකයි, එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරන වකවානුවේදී මගේ වැඩිමහල් සහෝදරිය ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වුණා. ශිෂ්‍යත්වය සමත් වෙලා ඒ කාලයේ ඌව පළාතේ පිළිගත් විද්‍යාලයක් හැටියට තිබුණු පස්සර මධ්‍ය මහා විද්‍යාලයට තමයි අධ්‍යාපනය ලබන්න ගියේ. ඉන්පසුව තමයි විශ්ව විද්‍යාලයට තේරුණේ. සම්මන්ත්‍රණ ශාලා ආදිය ලබා දෙමින් ඒ පස්සර මධ්‍ය මහා විද්‍යාලය දියුණු කරන්නටත් එතුමා ඉමහත් සේවාවක් ඉටු කළ බව ඒ කාලයේදී අපට නිරන්තරයෙන්ම අහන්න ලැබුණා.

විශේෂයෙන්ම මට මතකයි එතුමා පෞද්ගලිකව දැන හඳුනාගත් ආකාරය. එතුමාගේ එක් දියණියක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සරත් චන්ද්‍රසිරි විතාන මැතිතුමා සමඟ විවාහ වෙලා ඉන්නවා. එතුමා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හැටියට කාලයක් කටයුතු කළා. ඒ අවස්ථාවේ ඒ දියණියත්, ඒ ලේකම්තුමාත්, අමරනන්ද රත්නායක මැතිතුමාත් පෞද්ගලිකව දැන හඳුනා ගෙන කථා කරන්න අපට අවස්ථාව ලැබුණා. එදා එතුමා පාර්ලිමේන්තුවේ කටයුතු කෙරුණු ආකාරය, පැරණි පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ -දැන් ජනාධිපති ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ- ගත කළ ආකාරය, ඒ කාලයේ දැන් වාගේ වාහන නොතිබුණු නිසා රාත්‍රී දුම්රියෙන් කොළඹට ඇවිල්ලා කොහොමද ඒ කටයුතු කළේ ආදී වශයෙන් අපහසුතා මධ්‍යයේ කටයුතු කරපු ආකාරය ගැන එතුමා අපට කියා තිබෙනවා. ඒ කාලයේ ඉතා විනෝදයෙන්, ඒ කර්තව්‍යය ඉතා කැමැත්තෙන් කළ බවත් එතුමා හමු වුණු අවස්ථාවල අපට සඳහන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ශෝක යෝජනාවෙන් පස්සේ අපේ හිටපු අමාත්‍ය ගරු එම්.එස්. අමරසිරි මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව ඉදිරිපත් කරන්න නියමිතයි. ගරු එම්.එස්. අමරසිරි මැතිතුමා ඌව පළාතේ ආණ්ඩුකාරතුමා හැටියට කටයුතු කරපු වකවානුවේ අමරනන්ද රත්නායක මැතිතුමා එම්.එස්. අමරසිරි මැතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයකු හැටියට කටයුතු කළා. මා හිතන හැටියට හුඟක් අය ඒ ගැන දන්නේ නැතිව ඇති. ගරු එම්.එස්. අමරසිරි මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාවත්, එතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයකු හැටියට කටයුතු කළ අමරනන්ද රත්නායක මැතිතුමාගේ ශෝක යෝජනාවත් කියන යෝජනා දෙකම එකම දවසක -අද දිනයේ- තමයි අපිට ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

අපි දන්නවා අමරනන්ද රත්නායක මැතිතුමා ඒ අතිදුෂ්කර පළාතේ ප්‍රදේශයකට තම සේවය කළ බව. දීර්ඝ කාලයක සිට පස්සර ආසනය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් බිහි වුණේ නැහැ. අපි අසා ඇති ආකාරයට අමරනන්ද රත්නායක මැතිතුමා තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් සෘජුව, පක්ෂයට වග කියන මන්ත්‍රීවරයකු හැටියට හිටියේ. ඉන් පසුව -විශේෂයෙන්ම 1977න් පස්සේ- සමානුපාතික නියෝජන ක්‍රමයත් එක්ක පක්ෂයක් හැටියට අපට පස්සර වාගේ ප්‍රදේශයකට එහෙම නියෝජිතයෙක් ලැබුණේ නැහැ.

එතුමා කළ ඒ සේවාව සම්බන්ධව මේ අවස්ථාවේ කථා කරන කොට සිහිපත් කළා පස්සර උප දිසාපති කාර්යාලය පිහිටුවන්න එතුමා පුරෝගාමීව කටයුතු කළ බව. එපමණක් නොවෙයි, පස්සරට අමතරව ලුණුගලත් වෙනම කොට්ඨාසයක් හැටියට සකස් කරන්න ඕනෑය කියන අදහසත් දීර්ඝ කාලයක් තිස්සේ එතුමාගේ හිතේ තිබිලා තිබෙනවා. ඒ අවශ්‍යතාව ඉෂ්ට කරමින් අතිගරු ජනාධිපතිතුමාට, විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන ඇමතිතුමාට, ලුනුගලට වෙනම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් පමණක් නොවෙයි, වෙනම ප්‍රාදේශීය සභාවක් බිහි කරන්නත් මෑත භාගයේදී හැකියාව ලැබුණා. අමරනන්ද මැතිතුමා දුටු සිහිනය ඒ විධියට අද සැබෑ වෙලා තිබෙනවාය කියන එකත් විශේෂයෙන් මා මේ අවස්ථාවේ සිහිපත් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දීර්ඝව කාලය ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. පොදු මහජනතාවගේ යහපත වෙනුවෙන් කටයුතු කරපු එතුමාගේ පවුලේ දරුවන් කීප පොළකුත් මට හමු වෙලා තිබෙනවා. එතුමාගේ සහෝදර සහෝදරියන් සහ දූ දරුවන් ඇතුළු සියලු දෙනාටම මගේ පෞද්ගලික ශෝකයත්, ඌව වෙල්ලස්සේ ආදරණීය ජනතාවගේ ශෝකයත් පළ කරනවා. විශේෂයෙන්ම අපේ හිතවත් ඒ අතිරේක ලේකම්තුමා ඇතුළු ඒ පවුලේ සියලු දෙනාටමත් ශෝකය ප්‍රකාශ කරන්න මේ අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින්, අප අතරින් වෙන්ව ගිය අමරනන්ද රත්නායක මැතිතුමා ප්‍රාර්ථනා කළ පරිදි එතුමාට නිවන් සුව අත් වේවායි පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අමරනන්ද රත්නායක මැතිතුමාගේ ශෝක ප්‍රකාශ යෝජනාව වෙනුවෙන් අප කථා කරලා ඉවරයි. ඊළඟට ගරු එම්.එස්. අමරසිරි හිටපු ඇමතිතුමාගේ ශෝක ප්‍රකාශ යෝජනාව ආරම්භ කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

No, we have two other speakers. The Hon. Gamini Wijith Wijayamuni De Zoysa, please.

[අ.භා. 3.14 ]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප අතරින් සදහටම වෙන් වී අවසන් ගමන් ගොස් සිටින අමරනන්ද රත්නායක හිටපු මන්ත්‍රීතුමාගේ දේශපාලන ජීවිතය ඉතාම පෙරළිකාර දේශපාලන ජීවිතයක්. එතුමා මේ රටේ දේශපාලන වෙනස්කම් වෙනුවෙන් තීන්දු තීරණ ගත්ත කෙනෙක්. එහි හොඳ නරක කෙසේ වෙතත්, එතුමා මේ සමාජයේ යම් වෙනස්කම් බලාපොරොත්තු වෙච්ච කෙනෙක්. එතුමාගේ පියා විදුහල්පතිවරයෙක්. ඒ වාගේම මවත් ගුරු වෘත්තියේ නියැළුණු කෙනෙක්. මේ දෙපළ දීර්ඝ කාලයක් පස්සර ආසනයේ විවිධ පාසල්වල සේවය කරන විට, මා හිතන හැටියට ගරු අමරනන්ද රත්නායක මැතිතුමාත් මේ හැම පාසලකම ඉගෙනීම කරන්නට ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ ජීවිතය ගොඩාක් අත් දැකීම් තිබෙන ඒ වාගේම දැන උගත්කම්වලින් පරිපූර්ණ ජීවිතයක් බවට පත් වෙලා තිබුණා. මොකද, එතුමා වෘත්තීයමය වශයෙන් "කලන්" වතුයායේ සේවය කරලා තිබෙනවා. ඒ වාගේම දෙවන ලෝක යුද්ධ සමයේදී බ්‍රිතාන්‍ය රාජකීය හමුදාවට බැඳිලා පලස්තීනය, සිරියාව, ඉතාලිය, ඊජිප්තුව ආදී රටවල සේවය කරලා තිබෙනවා. ඒ වාගේම රජයේ විවිධ කාර්යාලවල; බදුල්ල, කළුතර ආදි ප්‍රදේශවල 1947 සිට 1959 දක්වා ලිපිකාර සේවයේ කටයුතු කරලා තිබෙනවා. මෙතුමා බොහොම පරිණත බුද්ධියකින් හා සමාජ අත් දැකීම්වලින් පිරිපුන්, ප්‍රදේශයට ආදරය කරපු දේශපාලන නායකයෙක් බව අපට පෙනෙනවා. විශේෂයෙන්ම පස්සර මුස්ලිම් විද්‍යාලය ආරම්භ කිරීම, ඒ වාගේම වැල්ගොල්ල පාර සෑදීම ආදී වශයෙන් බලන විට එතුමා ග්‍රාමීය ජනතාවගේ විවිධ අවශ්‍යතා වෙනුවෙන් කැප වුණු නායකයෙක්. මට මතකයි, මම ප්‍රධාන ඇමතිවරයා හැටියට ඉන්න කාලයේ තමයි එතුමා අවසන් ගමන් ගියේ. ඒ අවස්ථාවට මමත් සහභාගි වුණා. ඒ වාගේම අපේ පළාත් සභාවේ විපක්ෂ මන්ත්‍රීවරයෙකු වශයෙන් සිටි වින්සන්ට් ඩයස් මහතාගේ ළඟම ඥාතියෙක්. ඒ දේශපාලන පවුල් දෙක අතර බොහොම කිට්ටු සහ සම්බන්ධතාවක් තිබුණා. ඒ වාගේම අපේ මොනරාගල දිස්ත්‍රික්කයේ සේවය කරපු තණමල්විල ප්‍රාදේශීය ලේකම්තුමා එතුමාගේ බෑනනුවන්. එතුමා මේ වාගේ ලොකු පවුල් පසුබිමක් තිබෙන ඌව පළාතේ විශාල පවුල් පරාසයකට නෑකම්, උරුමකම් කියන ඉතාම දක්ෂ හොඳ දේශපාලනඥයෙක්. එතුමාගේ අවසාන කාලයේ ආණ්ඩුකාරතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක් හැටියට කටයුතු කළා. මම හිතන්නේ වෘත්තියක් අවශ්‍ය නිසා නොවෙයි, තමන්ගේ සැදෑ සමයේ යම් කිසි කාර්යයක නියැළිය යුතු නිසා හිටපු ආණ්ඩුකාර එම්.එස්. අමරසිරි මැතිතුමා යටතේ එතුමා සේවය කළා.

විශේෂයෙන්ම කාලය අවසන් වී ගෙන යන මොහොතේ මම මූලාසනයෙන් ඉල්ලීමක් කරලා මේ අවස්ථාව ලබා ගත්තේ, අවසන් ගමන් ගිය, ඌව පළාතේ අපේ දේශපාලන නායකයකුට අවසාන ගෞරව දැක්වීමට අවස්ථාවක් ලබා ගැනීමේ වුවමනාවෙන්මයි. එතුමාගේ පවුලේ සියලු දෙනාට මගේත්, මගේ පවුලේත්, ඒ වාගේම ඌව පළාතේ ජනතාවගේත් ශෝකය ප්‍රකාශ කරමින්, එතුමාට අමා මහ නිවන් සුව අත් වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නවතිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට වෛද්‍ය රෝහණ පුෂ්ප කුමාර මහතා.

[අ.භා. 3.19 ]

**ගරු වෛද්‍ය රෝහණ පුෂ්ප කුමාර මහතා**

(மாண்புமிகு வைத்திய கலாநிதி ரோஹண புஷ்பகுமார)

(The Hon. (Dr.) Rohana Pushpa Kumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදුල්ල දිස්ත්‍රික්කයෙන් බිහි වුණු අවංක මානව හිතවාදී ඒ වාගේම බොහොම සංවේදී නායකයෙක්, මන්ත්‍රීවරයෙක් වන පස්සර හිටපු මන්ත්‍රී අමරනන්ද රත්නායක මැතිතුමා ගැන බදුල්ල දිස්ත්‍රික්කයේ නවක මන්ත්‍රීවරයකු විධියට මට අද සිහිපත් කරන්න ලැබීම පිළිබඳව මම එක පැත්තකින් සන්තෝෂ වෙනවා. විශේෂයෙන් මම එහෙම කියන්නේ ඌව පළාතේ අධ්‍යාපනඥයෙක් -අධ්‍යාපන නිලධාරියෙකු- වන මගේ තාත්තාගේ සමකාලීන මිතුරෙකු විධියට වාගේම පවුලේ හිතවතෙක් විධියට එම මන්ත්‍රීතුමා මම හඳුනා ගන්නේ මගේ ළමා වියේදීයි. අපි පාසල් කාලයේදී අපේ නිවසට ආ ගිය දේශපාලන නායකයෙකු වූ එතුමා මේ රටේ සමාජය වෙනුවෙන් කරන මෙහෙවර පිළිබඳව බොහොම ආඩම්බරයෙන් තමයි මගේ පියා ඇතුළු සමාජශීලි අයත් එක්ක කථා බහ කළේ. ඒ එක්කම මට මතක් වෙනවා, පවුලේ ඥාතිවරයෙකු හැටියට එතුමා සමඟ තිබෙන සම්බන්ධතාවය වාගේම, මම වෛද්‍යවරයෙක් විධියට පත් වුණාට පස්සේ එතුමාගේ අසනීප කටයුතුවලදීත් මට දායකත්වය ලබා දෙන්න ලැබුණ බව.

අමරනන්ද රත්නායක මහතා 2000 වසරේ සිට ඌව පළාත් ආණ්ඩුකාරතුමාගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස කටයුතු කළා. ඒ කාලයේ මට පළාත් සභාව තුළින් ඌව පළාතට විශාල සේවයක් කරන්න එතුමාගෙන් ශක්තිය, ධෛර්ය ලැබුණාය කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. අප පවුලේත්, මගේත් සමීපතම වැඩිහිටියෙක් වූ එතුමා ප්‍රියසම්භාෂණ, උත්සවවලදී හා පවුලේ වැදගත් කටයුතුවලදී අප සමඟ නිරන්තරයෙන්ම එකතු වුණ මිතුරෙක් විධියට කටයුතු කළා. මගේ පියා නක්ෂත්‍ර හා අනාවැකි ප්‍රකාශ කිරීමේ හැකියාවක් තිබෙන කෙනෙක්. සමාජයට මහත් මෙහෙවරක් කරන්න එතුමා ඒ දැනුමත් ප්‍රයෝජනයට ගත්තා කියලා මම මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ එතුමාගේ නාමය පිළිබඳව. එතුමා උපන් දවසේ එතුමාට නොමැරෙන නමක් විධියට එතුමාගේ දෙමව්පියන් නමක් තැබුවා කියන එක තමයි මට මේ අවස්ථාවේදී මතක් කරන්න වෙන්නේ. "අමරනන්ද"; අමරනන්ද යනු නොමැකෙන නාමයයි. ඒ එතුමාගේ නමයි. එතුමා පස්සර, බිබිලේගම ආදී විදුහල් ගණනාවකම ප්‍රධානාචාර්ය ධුරය දැරුව රත්නායක මුදියන්සේලාගේ බණ්ඩාර ප්‍රධානාචාර්යතුමා සහ එම මැතිනියගේ පුතෙකු විධියට ඒ ප්‍රදේශයේ ජනතාවට මහත් මෙහෙවරක් කරපු, උසස් අධ්‍යාපනය ලබපු පුද්ගලයෙකු විධියට මේ සමාජයේ යථායාර්ථය හඳුනා ගෙන සැබෑ දේශපාලනඥයකු විධියට කටයුතු කළාය කියන එක මම මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම එතුමා යුද හමුදාවට බැඳිලා කටයුතු කිරීම තුළින් මම ඒ පවුල තුළ විශේෂ දෙයක් දකිනවා. මොකද, යුද හමුදාවට බැඳුණායින් පස්සේ තමන්ගේ දින චර්යාව නියමිත ආකාරයට සකස් කර ගන්න ලොකු පිටුවහලක් ඒ තුළින් එනවා. ඒ දේ අද තමන්ගේ දරුවන්ටත් -ඊ ළඟ පරම්පරාවට- ලබා දීලා තිබෙනවා. මම හිතනවා එතුමා එක දෙයක් හැරෙන්නට දේශපාලනඥයෙක් විධියට කිසිම ලාභ ප්‍රයෝජනයක් ගත්තේ නැති පුද්ගලයෙක් කියලා. එතුමාට සන්තෝෂ වෙන්න පුළුවන් ඒ ලබා ගත්ත එකම දේ තමයි තමන්ට හොඳ බිරිඳක් ලැබුණා වාගේම මේ රටට වැඩදායි දරු කැළක් බිහි කරන්න එතුමාට ඒ ආශිර්වාදය ලැබීම. මම හිතන්නේ කලින් කථා කළ කථිකයන් ඒ පිරිමි දරුවන් පස් දෙනා පිළිබඳවත්, ගැහැනු දරුවන් දෙදෙනා පිළිබඳවත් සඳහන් කළා. ඔවුන් තමන්ගේ පියා වෙනුවෙන්, පියාගේ අඩි පාරේ ගමන් කරමින් මේ සමාජයට මෙහෙවරක් කරනවාය කියන එක කිට්ටුවෙන් ආශ්‍රය කරන පුද්ගලයෝ විධියට

[ගරු වෛද්‍ය රෝහණ පුෂ්ප කුමාර මහතා]

අපි කවුරුත් දන්නවා. ඒ වාගේම මම මතක් කරන්න ඕනෑ අද දිනයේත්, හෙට දවසේත් අපි ඒ ගෙදරට ගියාම ඒ මැණියන් එදා පියාණන් සමඟ සිටිය කාලයේ වාගේම ගෙදරට එන ඕනෑම පුද්ගලයෙකුට පුද සත්කාර කරන්න, ආදරය කරන්න, ඒ දේශපාලන අතීතය නැවතත් මතක් කරමින් ඒ තුළින් සමාජයට ලබැදියාව තබා ගන්න තවමත් කටයුතු කරනවා කියන එක.

අමරනන්ද රත්නායක මැතිතුමා ඉතාමත් දක්ෂ දේශපාලනඥයෙක්. පස්සර ප්‍රදේශයේ ජීවත් වන කොට විශේෂයෙන්ම දේශපාලනඥයෙක් වුණාම දමිළ ජනතාවත් එක්ක ගැටෙන්න ඕනෑ. පස්සර ප්‍රදේශයේ ජනතාවගෙන් සියයට 60කට වැඩි ප්‍රමාණයක් ඉන්නේ දමිළ ජනතාව. මම හිතන්නේ එතුමා ළඟ ඒ දක්ෂතාව තිබුණා. එතුමාට සිංහල, දමිළ හා ඉංග්‍රීසි ලිවීමේ හා කියැවීමේ හැකියාව තිබුණා. ඒ නිසා ඒ අහිංසක ජනතාවත් එක්ක ඔවුන්ගේ ඕනෑ එපාකම් පිළිබඳව කථා කරලා, ඔවුන්ගේ ප්‍රශ්න විසඳන්න පුළුවන් හැකියාවක් එතුමාට තිබුණා.

අපි දේශපාලනයේ නවකයෝ විධියට ඉන්න කොට එතුමා ජනතාවට කොතරම් සබැදියාවක් තිබුණාද කියලා මට මතකයි. විශේෂයෙන්ම මම මේ කාරණය මතක් කරන්න ඕනෑ. එතුමා හමු වෙන්න දිනපතාම වාගේ නොයෙක් නොයෙක් පුද්ගලයින් එනවා. එතුමාට දිනක් උදරාබාධයක් තිබුණා. එතුමාට වැසිකිළියට යන්න අවශ්‍යතාවක් තිබුණා. ඒ නිසා එතුමා වැසිකිළියට ගිහින් ඇවිත් ඊළඟට නැවත වැසිකිළියට යන්න තිබෙන පැයක වාගේ කාලය ඇතුළත ඒ ආපු පුද්ගලයෙකුගේ වැඩ කටයුත්තක් වෙනුවෙන් ඒ පුද්ගලයාත් එක්ක කච්චේරියට ගිහිල්ලා ඒ පුද්ගලයාගේ අවශ්‍යතාව ඉෂ්ට කරපු කෙනෙක්. ඒ වාගේ අසනීප තත්ත්වයෙන් හිටියත් සැබෑ දේශපාලනඥයෙක් විධියට මේ සමාජයේ මිනිසුන්ගේ බලාපොරොත්තු, ඔවුන්ගේ අවශ්‍යතාවන් ඉෂ්ට කරන්න කටයුතු කළාය කියන එක මම මතක් කරන්න ඕනෑ. මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් මම මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු අමරනන්ද මහතා තම මහ ගෙදර උප දිසාපති කාර්යාලයක් බවට පත් කිරීමට කටයුතු කළා. ලංකාවේ කීර්තිමත් බදුල්ල දිසාපතිවරයෙක් වුණු පිහිල්ලේගෙදර මැතිතුමා 1964 දී ශ්‍රී ලංකා පරිපාලන සේවා විභාගයෙන් සමත්ව තේරී සිටියා. කොත්මලේ සිට පස්සර දක්වා එතුමාව කැඳවා ගෙන ඇවිත් පස්සර පළමු උප දිසාපති කාර්යාලය විවෘත කිරීමට කටයුතු කළා. මා කලින් සඳහන් කළ පරිදි පස්සර ජනතාවට අවශ්‍ය සෞඛ්‍යය, මං මාවත් ඒ වාගේම එදිනෙදා ජීවිතයට අවශ්‍ය පහසුකම් ලබා දෙන්නට එදා සටන් කළ අවංක දේශපාලනඥයකු විධියට එතුමාව සිහිපත් කිරීම අපේ යුතුකමක් කොට සලකනවා. එවැනි දේශපාලනඥයෝ බොහොම දුර්ලභයි. එවැනි දේශපාලනඥයකු අප අතරින් වියෝවීම අපට කනගාටුදායක තත්ත්වයක් බව මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කථාව පටන් ගත්තේ දෙසැම්බර් මාසයේ 3 වන දා ගැන කියමින්; ඒ දවස එතුමාගේ ජීවිතයේ වැදගත් දවසක්ය කියමින්. 1964 දෙසැම්බර් 3 වන දා ශ්‍රී ලංකාව පාර්ලිමේන්තුවට වැදගත් දවසක් වුණා. මා එතුමාට "තාත්තා" කියායි කථා කරන්නේ. ඒ "තාත්තා" නිරන්තරයෙන්ම අප දේශපාලනය කරන්න ගිහින් කථා කරන වෙලාවලදී මේ දිනය ගැන මතක් කරනවා. එය එතුමාට ජීවිතයේ සරදමක් වන්නට ඇති. ඒ "තාත්තා " - මේ ගරු මන්ත්‍රීතුමා- මිය ගියේත් දෙසැම්බර් 3 වන දා වාගේ දවසක. එම නිසා තමන්ගේ හදවතේ තිබුණු වේදනාව එතැනින් නිම කර ගන්නට එතුමාට හැකියාව ඇති වන්නට ඇත කියා මා හිතනවා. මා කලින් කිව්වා වාගේ එතුමාට එදා මුහුණ පාන්න වූ සිද්ධිය පිළිබඳව ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමිය නිකුත් කළ ලිපියේ පිටපතක් මා හැන්සාඩ් ගත කිරීම සඳහා **සභාගත*** කරනවා. ඒ එක්කම එතුමා පස්සර ආසනයට කළ සේවාව අළලා සකස් කළ මැතිවරණ ප්‍රකාශනය සභාගත කරනවා. එය එතුමාට කරන ගෞරවයක් ලෙස මා සලකනවා. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියට එතුමාගේ අත් අකුරින් ලියූ "Appointment of Organiser S.L.F.P. Passara Electorate" කියන ලිපියත්, "අතේ සතේ නැතිව ඡන්දය ජයගත් මන්ත්‍රීවරයෙක්" කියන ලිපියත්, "මට හුළං කියලා නමකුත් පට බැඳුණා" කියන ලිපියත්, "කණ්ණාඩිය ළඟට ගිහින් කතා කරන්න පුරුදු වුණා" කියන ලිපියත්, "ඡන්ද 64කින් මං පරාදයි" කියන ලිපියත් යනුවෙන් එතුමා වෙනුවෙන් රචිත "ලංකාදීප" පුවත් පතේ පළ වූ ලිපි මා **සභාගත**** කරනවා. ඒ වාගේම "The unsung parliamentarians"යනුවෙන් " ද අයිලන් "පුවත් පතේ සඳහන් වූ ලිපියත්, "COALITION CLOSES ITS RANKS" යනුවෙන් "ඩේලිමිරර් " පුවත්පතේ සඳහන් ලිපියත් **සභාගත**** කරනවා

අවසාන වශයෙන්, ඒ පවුලේ සියලු දෙනාටම අපේ ශෝකය ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මා නවතිනවා.

**** සභාමේසය මත තබන ලද ලිපිය:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட கடிதம் :*
** Letter tabled:*


ලංකා අගමැති

1964 දෙසැම්බර 17 වන දින
කොළඹ දී ය.

ප්‍රිය රත්නායක මහතාණෙනි,

1964 දෙසැම්බර 3 වන දින රාජාසන කථාව පිළිබඳ ඡන්දය විමසන අවස්ථාවෙහි පාර්ලිමේන්තුවට [illegible] නොපැමිණිම ගැන ඔබ විසින් නිදහසට දක්වා ඇති කරුණු දුටුවෙමි. ඒ ගැන මහා සේ සළකා බැලූ මම, ඔබ නොපැමිණිමයේ නොවැලැක්විය හැකි හේතූන් නිසා බවත්, රජයේ සාමාජිකයකු වශයෙන් ඔබේ යුතුකම ව තිබූ පරිදි එම අවස්ථාවට පැමිණිමට ඔබ උත්සාහයක් ද දරා ඇති බවත්, ඔබ ඉදිරිපත් කර ඇති ලිපියෙන් පක්ෂ නායිකාව වශයෙන් සෑහීමකට පත්වුයෙමි. මහජනයා හමුවෙහි ඔබේ තත්වය රැකගැනීම සඳහා මෙම ලිපිය ඔබ කැමති අයුරකින් යොදා ගැනීමෙහි වරදක් නැත.

මෙයට,
හිතවත්,
සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක.
අ ග්‍රා මා ත්‍ය ව රි ය.

පස්සර පාර්ලිමේන්තු මන්ත්‍රී
අමරනන්ද රත්නායක මහතා.

---

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි. බොහොම ස්තුතියි. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අමරනන්ද රත්නායක මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් මම ද ඒ සමඟ එකතු වීමට කැමැත්තෙමි.

අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපත් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට මම නියෝග කරමි.

Order, please! We would next take up the Vote of Condolence on the late Hon. M.S. Amarasiri. The Chief Government Whip, Hon. Dinesh Gunawardena to start the Debate.

## ශෝක ප්‍රකාශය : ගරු එම්.එස්. අමරසිරි මහතා
## அனுதாபத் தீர்மானம் : மாண்புமிகு எம்.எஸ்.அமரசிறி
## VOTE OF CONDOLENCE : HON. M.S. AMARASIRI

[අ.භා. 3.29 ]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර ගණනාවක් හිනිදුම මැතිවරණ කොට්ඨාසයේ පොදු මහ ජනතාව නියෝජනය කරමින් ද, තවත් වසර ගණනාවක් ගාල්ල දිස්ත්‍රික් ජනතාව නියෝජනය කරමින් ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මෙන්ම අමාත්‍යවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ දකුණු පළාතේ හිටපු ප්‍රධාන අමාත්‍ය සහ ඌව පළාතේ හිටපු ආණ්ඩුකාර එම්.එස්.අමරසිරි මැතිතුමා 2007 ජනවාරි මස 07 වන දින අභාවප්‍රාප්ත වූයෙන් එතුමන් පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීමටයි මා මේ අවස්ථාවේදී නැඟී සිටින්නේ.

ගාල්ල දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුවේ මාපලගම, ඇකුමලේ විසූ මාතරගේ දොන් කොර්නේරිස් ද සිල්වා ගම්පතිතුමා සහ ඉලේසිංහ කංකානම්ගේ දෝන සිසිලියානා මැතිනියගේ පුත්‍ර රත්නයක් ලෙස 1925 සැප්තැම්බර් 05 වැනි දින මාතරගේ සිරිසේන අමරසිරි මහතා මෙලොව එළිය දුටුවේය. මාපලගම බෞද්ධ මිශ්‍ර පාඨශාලාවෙන් හා මලාමුරේ රජයේ පාසලින් මූලික අධ්‍යාපනයත්, ගාල්ලේ ඇලෝසියස් විද්‍යාලයෙන් ද්විතීයික අධ්‍යාපනයත් ලැබූ අරමසිරි මහතා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට ද පෙනී සිටියේ ය. ඉන් අනතුරුව විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර හා රාජ්‍ය පරිපාලන ප්‍රවේශ විභාගය ද, ලන්ඩන් වාණිජ ආයතනයෙන් අධිශිෂ්‍යත්ව ඩිප්ලෝමාව ද, දිල්ලි විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධිය ද, ලන්ඩනයේ රාජකීය ආර්ථික සංගමයේ අධිශිෂ්‍යත්ව ඩිප්ලෝමාව ද, කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ නීතිවේදී උපාධිය -නීති ප්‍රථම විභාගය- ආදී වශයෙන් අධ්‍යාපන සුදුසුකම් රාශියක් ලබා ගනිමින් තම දැනුම වඩා වර්ධනය කර ගැනීමට අමරසිරි මහතාට හැකි වුණා.

තරුණ වියේ සිටම එවකට පැවැති සුදු අධිරාජ්‍යවාදීන්ගේ පාලනයට එරෙහිව යමින් ලංකා සම සමාජ පක්ෂය හා එක්ව ජනතා අයිතිවාසිකම් රැක දීම සඳහාත්, රටේ නිදහස ලබා ගැනීම සඳහාත් අරගල කළ සටන්කාමියකු වූ එම්.එස්. අමරසිරි මහතා ගුරු වෘත්තියේ නියැළුණු දෝන එස්මි තෙවරප්පෙරුම මෙනෙවිය සමඟ 1959 වසරේදී අතිනත ගත්තා. එම විවාහය හේතුවෙන් එතුමා රටට දැයට වැඩදායී දූ පුතුන් තිදෙනකු මෙලොවට දායාද කළා. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ උපාලි අමරසිරි පුතණුවන් මේ අවස්ථාවේදී යළිත් ගෞරවයෙන් සිහිපත් කරන්නට අප කාටත් පුළුවන්. ඒ වාගේම වෛද්‍ය ඩොරින් සුනිමාලි අමරසිරි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආනන්ද අමරසිරි යන අනෙකුත් දූ පුතුන් ද අපි ගෞරවයෙන් සිහිපත් කරනවා.

අධ්‍යාපන කටයුතු අතරතුරදීම සමාජ සුභසාධන කටයුතුවලද නියැළුණු අමරසිරි මහතා 1949 වර්ෂයේදී මාපලගම ඇකුමලේ ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපතිවරයා වශයෙන් ජනතා මෙහෙවරට එක් වුණා. එමඟින් ගමේ ජනතාව හා අත් වැල් බැඳ ගනිමින් ක්‍රියාකාරී දේශපාලනයටද එක්ව ප්‍රදේශයේ ප්‍රශ්න රාශියක් විසඳා ලීමට සමත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1954 පැවැති ගම් සභා මැතිවරණයේදී ගාල්ල නාගොඩ ගම් කාර්ය සභාවට නියෝජිතයකු වශයෙන් තේරී පත් වුණා. ඉන් පසු එහි සභාපති තනතුරට පත් වූ එම්.එස්. අමරසිරි මහතා සුළු ගංවතුර තත්ත්වයක් යටතේ වුවද මාපලගම සිට උඩුගම දක්වා යට වෙමින් පැවැති මාර්ගය වෙනුවට නව මාවතක් සැලසුම් කළා. විදේශීය වතු සමාගමක් මඟින් පාලනය වූ කාබිල්වත්ත හරහා එම මාර්ගය ශ්‍රමදානයෙන් ඉදි කිරීමට යාමේදී වතු පාලකයන්ගේ විරෝධ පෑම මතු වූයෙන් එතුමාව රක්ෂිත බන්ධනාගාරයට නියම කළා. ජනතාව වෙනුවෙන් සේවය කිරීමට ගොස් සිරගත වූ අමරසිරි මහතා ඉන් පසු බට නොවී නිදහස් වී එළියට ආ සැණින් නැවතත් ගමේ අවශ්‍යතා සඳහා අධිෂ්ඨානයෙන් කැප වී කටයුතු කළා. 1960 මාර්තු මස පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේදී ගරු පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ නායකත්වයෙන් පිහිටුවා ගන්නා ලද මහජන එක්සත් පෙරමුණේ අපේක්ෂකයකු ලෙස ඉදිරිපත්ව හිනිදුම මහජන මන්ත්‍රීවරයා වශයෙන් මෙම උත්තරීතර සභාවට පළමු වරට පැමිණ අසුන් ගැනීමට එතුමා වාසනාවන්ත වූවා. එහෙත් එම වසරේ ජූලි මස පැවැති මැතිවරණයේදී ජයග්‍රහණය කරා එළඹීමට නොහැකි වුවද ඉන් පසු බට නොවුණු එතුමා 1961 සිට 1976 දක්වා කළුතර තොටමුණ විවිධ සේවා සමුපකාර සංගමයේ සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් විශාල සේවාවක් සමුපකාර ව්‍යාපාරයට ඉටු කළා. අමරසිරි මහතා යළිත් 1965 වර්ෂයේදී පවත්වන ලද මහා මැතිවරණයට එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකවරයකු වශයෙන් ඉදිරිපත් වී හිනිදුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙස දෙවැනි වරටත් මේ සභාවේ අසුන් ගත්තා. එම කාල සීමාව ඇතුළත තම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඉමහත් සේවාවක් සැලසීමට පුරෝගාමීව කටයුතු කළ අමරසිරි මහතා යළිත් 1977 පාර්ලිමේන්තු මහා මැතිවරණයෙන් හිනිදුම ආසනයේ පොදුජන නියෝජිතයා වශයෙන් අති විශිෂ්ට ජයක් ලබමින් මෙම උත්තරීතර සභාවට තුන්වැනි වරටත් පා නැඟුවා. ඒ අවස්ථාවේදී ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ රජය යටතේ නියෝජ්‍ය වෙළෙඳ හා නාවික අමාත්‍යවරයා වශයෙන් දිවුරුම් දුන් එතුමා දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා හා එක් වෙමින් වෙළෙඳ ක්ෂේත්‍රය තුළ කැපී පෙනෙන වෙනසක් ඇති කරලීමටත්, කොළඹ වරාය නවීකරණ කටයුතු සඳහා කැපවීමෙන් මහ පෙන්වීමටත් කටයුතු කළා.

නාගරික පාරිභෝගිකයන්ට මෙන්ම ගැමි පාරිභෝගිකයන්ට ද සාධාරණ මිලක් යටතේ භාණ්ඩ ලබා දීම සඳහා මහපොළ සංකල්පය සඳහා මූල බීජය වැටුණේ හිනිදුම ආසනයෙනි. ඊට කළගුණ සැලකීමක් වශයෙන් 1980 දී ප්‍රථම මහපොළ ගාල්ල, නියාගම විජිත මධ්‍ය මහා විද්‍යාලයේදී පවත්වනු ලැබිණි. ඊට සමගාමීව ප්‍රදේශයේ යටිතල පහසුකම් රැසක්ද සපුරා ලූ අමරසිරි මහතා 1984 දී වෙළෙඳ හා නාවික අමාත්‍යවරයා වශයෙන් දිවුරුම් දෙමින් රට වෙනුවෙන් තවත් විශාල වැඩ කොටසක් ඉටු කරලීමට පියවර ගත්තේය.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

හිනිදුම ආසනය තුළ ජනතාවට විදුලිය හා මාර්ග පහසුව ඇති කරලීම සඳහා කැප වුණු අමරසිරි මහතා කුඩා තේ වතු හිමියන්ගේ දළු සඳහා හොඳ මිලක් නොලැබුණු නිසා ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර යටතේ නෙළුව මැදගම, ඉංගල්ගොඩ, නාගොඩ, කුරුපනාව සල්විටිගල තේ කම්හල් හතරක් අරඹා පීඩා විඳි ජනතාවගේ විශාල ගැටලුවකට විසඳුමක් ලබා දුන්නා.

ශ්‍රී ලංකාව තුළ මධ්‍යගතව තිබූ පාලන තන්ත්‍රය විමධ්‍යගත කරමින් එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ඉදිරිපත් කළ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපිත කළ පළාත් සභා ක්‍රමය යටතේ පිහිටුවන ලද දකුණු පළාත් සභාවේ පළමුවැනි ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් 1988 දී වගකීම භාර ගත් එම්.එස්. අමරසිරි මහතා එමගින් දකුණු පළාතට දුන් අනුපමේය නායකත්වය අති ප්‍රබල තත්ත්වයක පැවතුණි. ඒ සමඟින් පළාත් සභාවේ නීතිය, සාමය, අධ්‍යාපන, ඉඩම් හා පළාත් පාලන අමාත්‍ය ධුරයේ ද කටයුතු ආවරණය කරමින් සිටියදී රට තුළ එවකට ඇවිළෙමින් තිබූ ත්‍රස්තවාදී ව්‍යාපාරය විසින් එතුමාගේ දයාබර භාර්යාව සාහසික අයුරින් 1989 ජුනි 07 වැනි දින ඝාතනය කරනු ලැබිණි. පෞද්ගලිකව සිදු වූ එවැනි ඉතා ශෝචනීය සිදුවීම් මධ්‍යයේත් ජනතාව වෙනුවෙන් යහපත් මානසික තත්ත්වයක් පවත්වා ගනිමින් 1993 දක්වාම එම තනතුරු මඟින් රුහුණේ නවෝදයක් ඇති කරලීම සඳහා එතුමා පුරෝගාමීව ක්‍රියා කළේය.

1993 වර්ෂයේදී පවත්වන ලද පළාත් සභා මැතිවරණයේදී දකුණු පළාත් සභාව සඳහා යළිත් තේරී පත් වුවද එක්සත් ජාතික පක්ෂයට සිය බලය තහවුරු කර ගැනීමට නොහැකි වීම මත අමරසිරි මහතාට එහි විපක්ෂ නායකත්වය භාර ගැනීමට සිදු විය. 1999 දක්වා එම තනතුරද දරමින් තම වගකීම නොපිරිහෙළා ඉටු කළ අමරසිරි මැතිතුමා තුළ පැවැති දේශපාලන පරිණතභාවය මැනවින් තේරුම් ගත් එවකට ජනාධිපති ධුරය හෙබවූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය විසින් 1999 නොවැම්බර් 01වැනි දා ඌව පළාතේ ආණ්ඩුකාර ධුරයට එතුමාව පත් කරන ලදී. 2003 වර්ෂය තෙක් එම උත්තරීතර තනතුර එතුමා විසින් හොබවනු ලැබිණි.

වත්මන් ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ ද ඉතා කිට්ටු සම්බන්ධතාවක් පැවැති අමරසිරි මැතිතුමා ස්වේච්ඡාවෙන්ම ජනාධිපති උපදේශකවරයකු වශයෙන් ද කටයුතු කළේ ය. කවර අන්දමේ රාජකාරි කටයුත්තක් තමන් වෙත පැවරුණ ද ඒ සියලු මෙහෙවර නිමවා ඉඩ ලද සැම අවස්ථාවකදීම පොත්පත් කියවීමේ නියැලුණු අමරසිරි මහතා වයස අවුරුදු 78දී අධිනීතිඥවරයකු වශයෙන්ද තම ජීවිතයේ තවත් පැතිකඩක් සම්පූර්ණ කර ගත්තේය.

ප්‍රදේශයේ විහාරස්ථාන ගණනාවක් සමඟම සමීප සම්බන්ධතාවක් පවත්වමින් එම ස්ථානවල අභිවෘද්ධිය සඳහාත්, බුද්ධ ශාසනයේ පුනරුදය සඳහාත් එතුමා ඉමහත් කැප කිරීමක් කළේය. බොහෝ පුර පසළොස්වක පොහෝ දිනයන්හි දී සීල සමාදානයේ යෙදෙමින් ආගමානුකූල ජීවිතයක් ගත කළ එම්.එස්. අමරසිරි නම් වූ මානව හිතවාදියා නිහතමානිත්වයේ ප්‍රතිමූර්තියක් විය. විවිධ තනතුරු හොබවමින් විදේශීය සමුළු රාශියකට ශ්‍රී ලංකා කණ්ඩායමේ නායකයා වශයෙන් සහභාගි වී එම සමුළු අමතමින් අපේ රටට ගෞරවයක් ලබා දීමට ද නිරතුරුවම කැපවීමෙන් එතුමා ඉටු කළ සේවාව අද දින ද අප ගෞරවයෙන් සිහිපත් කරනවා. ආදරණීය පියෙකු, ගැමි සුවඳ වහනය කළ මහත්මා දේශපාලනඥයකු, සමාජ සේවකයකු හා දුරදර්ශී නායකයකු වශයෙන් දකුණු සිරිලකටත්, මුළු මහත් සිරිලකටත් අඩසිය වසකට වැඩි කාලයක් අමරණීය සේවාවක් ඉටු කළ හිනිදුම නවෝදයේ පෙර ගමන්කරු වූ මාතරගේ දොන් සිරිසේන අමරසිරි සිල්වා මහතා වසර 80ක් ආයු වළඳා 2007 ජනවාරි මස 07 වැනි දින සමස්ත ශ්‍රී ලංකාවටම වේදනාවක් ගෙන දෙමින් සදහටම මෙලොවින් සමු ගත්තේය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවට අපි නවක මන්ත්‍රීවරුන් හැටියට පැමිණි අවස්ථාවේ දී මේ පාර්ලිමේන්තුවේ අමාත්‍ය ධුරයක් දැරූ එතුමා නිතර දෙවේලේ අප සමඟ සුහදව සාකච්ඡා කරමින් අපට ආශිර්වාද කළේය. ඒ වාගේම අපේ රටේ දේශපාලනයේ සටන්කාමී යුගයකට කර දුන් අමරසිරි මහතාගෙන් ඉටු වුණු සේවාව අතිමහත් ය. දේශපාලන මතවාද පසෙක ලා ජනතාව උදෙසා සැම විටම තම සේවය කැප කළ සැබෑ මානව හිතවාදියකු වූ එම්.එස්.අමරසිරි මහතාගේ අභාවය රුහුණු දේශයට පමණක් නොව, මුළු රටටම විශාල පාඩුවකි. ගිනියම් වූ මහ පොළොව සමඟින් පොර බදමින් ජීවත් වීම උදෙසා දහදිය මුගුරු හෙලූ ජන කොට්ඨාසයක් සුඛිත මුදිත කිරීමේ උදාර මෙහෙවරක යෙදුණු උදාර නායකයකු වූ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, එමෙන්ම අමාත්‍යවරයකු වශයෙන් මේ උත්තරීතර සභාව ශෝභාමත් කළ, දකුණු පළාතේ හිටපු ප්‍රධාන අමාත්‍ය, මධ්‍යම පළාතේ හිටපු ආණ්ඩුකාර, අධිනීතිඥ මාතරගේ දොන් සිරිසේන අමරසිරි සිල්වා මැතිතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනය කරන අතර මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාණන්ගේ ආදරණීය දරුවන් හා පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙස යෝජනා කරමි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට විරුද්ධ පක්ෂයේ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා.

[අ. භා. 3.42 ]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම ලංකාවේත්, පිට රටත් පාර්ලිමේන්තු සම්ප්‍රදායක් තමයි, පාර්ලිමේන්තුවේ සභිකයකුගේ මරණයෙන් පසුව ගරු සභාවට ශෝක ප්‍රකාශ යෝජනාවක් ගෙන ඒම. දැනට මේ ගරු සභාවේ සේවය කරන මන්ත්‍රීතුමන්ලා වාගේම කාලයක් සේවය කරලා මේ ගරු සභාවෙන් ඉවත්ව ගිය මන්ත්‍රීතුමන්ලාගේ අභාවයන් පිළිබඳවත් එලෙස කටයුතු කරනවා. එහෙත් අපට මෙතැන එක ප්‍රශ්නයක් තිබෙනවා. මන්ත්‍රීවරුන් 630ක් සිටින බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට කාලය තිබෙනවා, මන්ත්‍රීවරයකුගේ අභාවයෙන් මාසයක්, මාස දෙකක් යන්නට පෙර එතුමා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාවක් පාර්ලිමේන්තුවට ගෙනෙන්න. නමුත් අද අපි මේ ශෝක ප්‍රකාශ යෝජනා ගෙනත් තිබෙන්නේ එතුමන්ලාගේ අභාවයෙන් අවුරුදු ගණනාවක් ගත වුවාට පසුවයි. [බාධා කිරීමක්] අමරසිරි මැතිතුමාගේ අභාවය සිදු වුණේ 2007 වසරේ.

ඒ වාගේම තමයි නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාවත්. ඒ දෙදෙනාම මගේ කැබිනට් සගයන්. එතුමන්ලා පිළිබඳ ශෝක යෝජනා ගෙනෙන්න කාලයක් ගත වුණා. අපි මෙහෙම අවුරුදු දෙක, තුනකින් පසුව මේ ගරු සභාවට ශෝක යෝජනා ගෙනැල්ලා, ඒ වෙනුවෙන් එතුමන්ලාගේ ඥාතීන්ට මෙතැනට එන්නට කියනවා නම් ඒක මහා විහිළුවක්. අපේ යුතුකමක් වනවා, මේ ශෝක යෝජනා ඉක්මනින් ගරු සභාවට ගෙන ඒම. මින් පසුව ඕනෑම මන්ත්‍රීවරයකු, මේ ගරු සභාවේ සිටින මන්ත්‍රීවරයකු වන්නට පුළුවන්, නැත්නම් මේ ගරු සභාවේ සේවය කරලා ඉවත්ව ගිය මන්ත්‍රීවරයකු වන්නට පුළුවන්, එතුමාගේ මරණයෙන් පසුව සති

අටක් ඇතුළතවත් එතුමා පිළිබඳ ශෝක යෝජනාව මේ ගරු සභාවට ගෙනෙන්න කටයුතු කරන්න. සමහර විට අපට එය කෙටියෙන් කරන්නට සිදු වෙයි. එංගලන්ත පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව එක් පක්ෂයකින් එක් මන්ත්‍රීවරයකු පමණයි කථා කරන්නේ. එය කෙටියෙන් කළත් එම සේවය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වනවා. ඇත්ත වශයෙන්ම අපි මන්ත්‍රීවරයකුගේ අභාවයෙන් අවුරුදු දෙකකට පසුව එතුමා ගැන දවස් දෙකක් කථා කළත්, එතුමාගේ අභාවය නිසා වේදනාවට පත්ව සිටින අවස්ථාවේ දී කරන ශෝක ප්‍රකාශයට වඩා වෙනසක් තිබෙනවා. ඒ වේදනාවේ උණුසුමත් එක්ක ශෝක ප්‍රකාශය කිරීම අවශ්‍යයි. නැත්නම් අපේ කාර්යය හරියට ඉෂ්ට කිරීමක් වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද මේ ශෝක යෝජනා ගෙන ඒමට කල් ගත වී තිබෙනවා. අද දින මාගේ කැබිනට් සගයන් දෙදෙනෙක් පිළිබඳ ශෝක ප්‍රකාශ කරන්නට තිබෙනවා. අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා එම්.එස්. අමරසිරි සිල්වා මැතිතුමා ගැන දීර්ඝ විස්තරයක් කළා. ඊට පසුව එතුමා නිශ්ශංක විජයරත්න මැතිතුමා ගැනත් දීර්ඝ විස්තරයක් කරයි. ඒත් මා බැලුවේ, කාලය බේරා ගන්නත්, මට වෙනත් වැඩ කටයුත්තකට යන්න තිබෙන නිසාත් මේ අවස්ථාවේදී ඒ දෙදෙනා ගැනම සඳහන් කරන්නයි. ඇත්ත වශයෙන්ම 1977 දී අප තුන් දෙනාම පාර්ලිමේන්තුවට ඇතුළු වන විට අමරසිරි මැතිතුමා ඊට පෙර දෙ වරක් පාර්ලිමේන්තුවේ සිටියා. එදා එතුමාත්, මමත් නියෝජ්‍ය ඇමතිවරුන් හැටියට දිවුරුම් දුන්නා; නිශ්ශංක විජයරත්න මැතිතුමා ඇමතිවරයකු හැටියට දිවුරුම් දුන්නා. කාලයක් යන කොට මමත්, අමරසිරි මැතිතුමාත්, නිශ්ශංක විජයරත්න මැතිතුමා සමඟ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ඇමති මණ්ඩලයේ සාමාජිකයන් හැටියට ක්‍රියා කළා. එහෙම නම්, මා සමඟ සිටි සගයන් දෙදෙනකු පිළිබඳව තමයි අද කථා කරන්න තිබෙන්නේ.

අමරසිරි මැතිතුමා හිනිදුම ආසනයෙන් පාර්ලිමේන්තුවට ඇවිත්, සමුපකාර ව්‍යාපාරයට කරපු සේවය පිළිබඳව දීර්ඝ වශයෙන් මෙහිදී සඳහන් කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම එතුමා COPE එකේ හිටපු හොඳ සභාපතිවරයෙක්. ඒ වැඩ කටයුතු ඉතා හොඳින් කළා. මොකක්වත් සඟවන්න ගියේ නැහැ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට- COPE එකට- නිලධාරීන් කැඳෙව්වා. කාරක සභාවේ සාමාජිකයන් හැටියට විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් ස්වල්ප දෙනායි සිටියේ. ඒත් ඒ මන්ත්‍රීවරුන්ගේ හැම ඉල්ලීමකටම ඉඩ දුන්නා. ඇත්ත වශයෙන්ම ඒක එතුමාගේ එක වෙනසක්.

අනික් එක, අමරසිරි මැතිතුමාගේ තව එක විශේෂත්වයක් තිබුණා. අමරසිරි මැතිතුමා ඉගෙන ගන්න කැමැතියි. මා හිතන හැටියට පුතාගෙන් පස්සේ නීතිඥයකු වුණු පියකු හැටියට තමයි එම්.එස්. අමරසිරි මැතිතුමා ඉතිහාසගත වන්නේ. එම්.එස්. අමරසිරි මැතිතුමාගේත්, නිශ්ශංක විජයරත්න මැතිතුමාගේත් පුත්‍ර රත්නයන් මන්ත්‍රීවරුන් හැටියට මේ ගරු සභාව නියෝජනය කර තිබෙනවා. ඒකත් මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

අමරසිරි මැතිතුමා සේවයට කැප වුණා. අපි දන්නවා, අමරසිරි මැතිනියගේ සාතනය ගැන. අපි ඒ අවමංගල උත්සවයට සහභාගි වුණා. ඒත් එතුමා දේශපාලනය අත හැරියේ නැතුව පළමුවන වතාවට මහ ඇමතිවරයකු හැටියටත් ක්‍රියා කළා. ඉස්සෙල්ලා නියෝජ්‍ය වෙළඳ හා නාවුක ඇමතිවරයා හැටියටත් ඊට පසුව වෙළඳ හා නාවුක ඇමතිවරයා හැටියටත් කටයුතු කළා. විශේෂයෙන්ම ඒ ඇමති ධුර දෙක තුළින් එදා එතුමා හිනිදුම ආසනය දියුණු කරන්න කටයුතු කළා වාගේම, ගාල්ල දිස්ත්‍රික්කයේ දියුණුව වෙනුවෙනුත් අපේ රූපා කරුණාතිලක දිසා ඇමතිතුමා එක්ක විශාල සේවයක් ඉෂ්ට කරලා තිබෙනවා. එතුමා ගාල්ල දිස්ත්‍රික්කයට කරපු සේවය පිළිබඳව අපේ ගයන්ත කරුණාතිලක මැතිතුමාගේ කථාවේදී විශේෂයෙන්ම සඳහන් කරයි. එතුමා මහ ඇමති හැටියට ඉන්න විට ගාල්ල දිස්ත්‍රික්කය දියුණු කරන්න විශාල සේවයක් කළා. එදා අමාරු කාලයක්. ඇත්ත වශයෙන්ම පළාත් සභා ඡන්දයට එන්න කවුරුත් කැමැති නැහැ. එදා එම්.එස්. අමරසිරි මැතිතුමා ඇමතිකමත් අත හැරලා පළාත් සභාවට ඇවිල්ලා, එතුමාගේ භාර්යාවත් නැති කර ගෙන කරපු ඒ සේවය අපට අමතක කරන්න බැහැ. එදා සිට ඒ පළමුවන පළාත් සභා සාර්ථක කරන්න ඉතා මහන්සි වුණු පුද්ගලයෙක් තමයි එම්.එස්. අමරසිරි මැතිතුමා.

මා අමරසිරි මැතිතුමාව දැන ගත්තේ 1974 දීයි. ඒ කාලයේ එතුමා හිනිදුම සංවිධායක; මම තරුණ පෙරමුණේ භාණ්ඩාගාරික. ඊට පෙර 1965 මැතිවරණයේදී එතුමා මගේ පියා ගැන දැන ගෙන සිටියා. ඊට පස්සේ විටින් විට එතුමා අපේ ගෙදරට එනවා. ඒ එන්නේ මාව මුණ ගැහෙන්න විතරක් නොවෙයි. අපේ ගෙදරට ඇවිත් මගේ පියා එක්ක සාකච්ඡා කරනවා, එදා තිබුණු වෙළෙඳ ප්‍රශ්න ගැන, ජීවන වියදම පිළිබඳ ප්‍රශ්න ගැන. අපි එකට වැඩ කළා. ඒ ආණ්ඩුවට මුහුණ දෙන්න තිබුණු හැම අභියෝගයකටම අපි මුහුණ දුන්නා. මැතිවරණවලට මුහුණ දුන්නා. පසුව එතුමා ඌව පළාතේ ආණ්ඩුකාරවරයකු හැටියට පත් වෙලා ඌව පළාතට කරපු වැඩ කටයුතු ගැන මේ දෙ පැත්තේම -ආණ්ඩු පක්ෂයේත්, විරුද්ධ පක්ෂයේත්- මන්ත්‍රීවරු සඳහන් කරලා තිබෙනවා. එතුමා නැති වීම විශාල පාඩුවක්.

නිශ්ශංක විජයරත්න මැතිතුමා ගැන කථා කරන කොට එතුමා අධ්‍යාපන ඇමති වශයෙන් කරපු සේවය ගැන කියන්න ඕනෑ. අපි මෙහිදී මතක් කරන්න ඕනෑ, මේ රටට සංස්කෘතික ත්‍රිකෝණය ලබා දෙන්න ඇමතිවරයා හැටියට නිශ්ශංක විජයරත්න මැතිතුමා කටයුතු කළ ආකාරය ගැන. අද සීගිරිය ආරක්ෂා වනවා නම්, අනුරාධපුරය ආරක්ෂා වනවා නම්, මහනුවර ආරක්ෂා වනවා නම්, පොළොන්නරුව ආරක්ෂා වනවා නම්, ලක්ෂ ගණන් සංචාරකයන් මේ රටට එනවා නම්, ඒ සියල්ලම සිදු වන්නේ එදා නිශ්ශංක විජයරත්න මැතිතුමා ඇමති හැටියට සංස්කෘතික ත්‍රිකෝණය ආරක්ෂා කරන්න ගත්ත පියවර නිසායි.

මගේ පියා UNESCO කොමිසමේ සභාපති හැටියට සේවය කළා. මා දන්නවා, එම්බෝ මැතිතුමා UNESCO සංගමයේ මහ ලේකම් එක්ක මෙහාටත් පැමිණි බවත්, ඒ මුදල් ලබා ගෙන මෙතුමා විශාල සේවයක් කළ බවත්. නිශ්ශංක විජයරත්න මැතිතුමා අධිකරණ ඇමති හැටියට, අධ්‍යාපන ඇමති හැටියට කරපු සේවය ගැන අපට කථා කරන්න පුළුවන්. එතුමා අපේ උරුමය ආරක්ෂා කළා. එතුමා උරුමය දැන ගෙන සිටියා. දේශපාලනයේදී එතුමාට උරුමයක් තිබුණා. එතුමාගේ පියාත් කෑගල්ලේ මන්ත්‍රීවරයා හැටියට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ක්‍රියා කළා. එතුමාගේ භාර්යාව වන දුල්ලෑව මැතිනියත් අද ඇවිත් ඉන්නවා. ඒ එක්කම එදා දියවඩන නිලමේ හැටියට දළ දා මාළිගාව ආරක්ෂා කරන්න, දියවඩන නිලමේතුමාට නිල වශයෙන් ඒ නිල නිවාසය ලබා දෙන්න ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගෙන් එතුමා ඒ ආධාර උපකාර ගත්තා. ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමා දියවඩන නිලමේ තනතුරට පත් වුණු තරගය තමයි ලංකාවේ තිබුණු ප්‍රධානම තරගය. මම හිතන්නේ බොහෝ දෙනෙක් එතුමාට එදා උදව් කළාය කියලායි.

එතුමා ඊට ඉස්සෙල්ලා සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් හැටියට සේවය කළා. ඒ වාගේම ඊට ඉස්සෙල්ලා එතුමා විවිධ අමාත්‍යාංශවල අධ්‍යක්ෂ හැටියටත් වැඩ කටයුතු කළා. එදා එතුමා ආණ්ඩුව තරහා කර ගත් නිසා දේශපාලන ජීවිතයට ඇවිල්ලා දැදිගම ආසනය භාර අරගෙන එතුමා එක්ක වැඩ කටයුතු කරන්න මට අවස්ථාව ලැබුණා. මට එතුමා එක්ක ළඟින් වැඩ කටයුතු කරන්න, එතුමාගේ දැනුම ලබා ගන්න එහිදී අවස්ථාව ලැබුණා. අපේ පියා ඇතුළු පවුලේ අයත් එක්ක ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ තිබුණු සම්බන්ධය නිසා කාලයක් තිස්සේ තිස්ස විජයරත්න මැතිතුමාගේ අවවාද ලැබීම ගැනත් මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම ඉතා අමාරු අභියෝග

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ගණනාවක් උඩ අධ්‍යාපනය දියුණු කරන්න එතුමා ක්‍රියා කළා. ඒක අපි මතක තබා ගන්න ඕනෑ. පිරිවෙන් පනත ගෙනැල්ලා ඉදිරිපත් කළේ එතුමායි. ඒකත් මම සඳහන් කරනවා.

ඊ ළඟට, අපේ ගරු එම්.එස්. අමරසිරි මැතිතුමා ගැනත් සඳහන් කරන්න ඕනෑ. හිනිදුම ආසනයේ නියාගමින් තමයි එදා ලලිත් ඇතුළත්මුදලි මැතිතුමාගේ මහපොළ සංකල්පය ක්‍රියාත්මක කළේ. ඒ සංකල්පය ලලිත් ඇතුළත්මුදලි ඇමතිතුමාගේ. එහෙත් ඇත්ත වශයෙන්ම නියාගමදී ඒක ක්‍රියාත්මක කළේ, ඒක පෙන්වා දුන්නේ ගරු එම්.එස්. අමරසිරි මැතිතුමායි. ලලිත් ඇතුළත්මුදලි මැතිතුමාත්, අමරසිරි මැතිතුමාත් එකට එකතු වෙලා වැඩ කරපු නිසා තමයි මහපොළ ඇති වෙලා, එදා විශ්වවිද්‍යාලයට යන දරුවන්ට, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මුදල් දීලා ආධාර කරන්න පුළුවන් වුණේ. අද එහෙම නොවෙයි. අද විශ්වවිද්‍යාලයට යනවා නම්, පුහුණුවකට කියලා ඇඳුම් කට්ටලයක් අරගන්න රුපියල් 20,000ක් විතර යනවා. මේකද මේ රටේ තිබෙන නිදහස් අධ්‍යාපනය? මේක ගරු එම්.එස්. අමරසිරි මැතිතුමන්ලා ක්‍රියාත්මක කළ මහපොළ ශිෂ්‍යත්වය පාවාදීමක්. වෙන එකක් නොවෙයි. එතුමා අද ජීවතුන් අතර ඉන්නවා නම් මේවා හෙළා දකිනවා. මේකයි මම අහන්නේ. මට මතකයි එතුමා ඇවිල්ලා මගේ පියා එක්ක කථා කරනවා, කොහොමද බඩු මිල අඩු කරන්නේ, ලංකාවේ වගා කරන එළවලු විකුණන්නේ කොහොමද කියලා. විශේෂයෙන්ම ඒ අවස්ථාවේදී අළෙවි දෙපාර්තමේන්තුව දියුණු කරලා අළෙවි ශාඛා, ඒ වෙළෙඳ පොළවල් ඇති කරන්න පුළුවන් වුණා. අද මොකක්ද වෙන්නේ? අද මහා පුදුමයක් නේ වෙලා තිබෙන්නේ? එතුමා ජීවතුන් අතර සිටියා නම් හිනහා වෙයි. හමුදාව දමනවා එළවලු විකුණන්න; හමුදා කඳවුරු ඇතුළට ශිෂ්‍ය ශිෂ්‍යාවන් දමනවා. මොකක්ද මේකෙන් වෙන්නේ? අද අධ්‍යාපනයක් තිබෙනවාද? මම අහන්නේ ගරු එම්.එස්. අමරසිරි මැතිතුමා වාගේ අය මේ මහපොළ ක්‍රියාත්මක කළේ, අපේ ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමා රුහුණු විශ්වවිද්‍යාලය ආරම්භ කරන්න සහයෝගය දුන්නේ, මේ විශ්වවිද්‍යාල දියුණු කළේ අද ඒවා නැති කරන්නද?

මේ රටේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නවක වධය දෙන එක සියයට අසූවක් නැති කරලා තිබෙනවා කියලා අද අපට ඇමතිතුමා කිව්වා. එහෙනම් මොනවාටද මේ පුහුණුව දෙන්නේ? මේ නවක වධය නැති කරන්න කියලාද අද අපි මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අලුත් වධයක් දෙන්නේ? අපි හිතනවා නම් අද මේ රටේ නිදහස් අධ්‍යාපනය ගැන, අපි ඒ සඳහා කැප වෙලා ඉන්නවා නම් දැන් අපි මහපොළ විහිළුවක් බවට පත් කරනවා නේ. පුහුණුව සඳහා ඇඳුම් කට්ටලයට රුපියල් 20,000ක් විතර යනවා. ඊට පස්සේ මහපොළ දෙනවා ලු. මහපොළේ තේරුම මොකක්ද? මොකක් හරි පුහුණුවීමක් වුවමනා නම් ඒ සඳහා ඇයි පාසල් පාවිච්චි කරන්නේ නැත්තේ? අපේ ගරු එම්.එස්. අමරසිරි මැතිතුමානේ මහපොළ තියන්න වෙන තැනක් ඕනෑ නැහැ, නියාගම විද්‍යාලයේ තියන්න කියලායි පෙන්වූයේ. එදා ඉඳන් මේ ගැන ලලිත් ඇතුළත්මුදලි මැතිතුමා මටත් කථා කළා. ඊට ඉස්සෙල්ලා නිශ්ශංක විජයරත්න මැතිතුමාත් කථා කරලා තිබුණා. අපි ඔක්කොම එකතු වෙලා ඒ කටයුතු ඒ පාසල්වල කළා. මට මතකයි, මම යෞවන කටයුතු ඇමති වුණාම ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමා එවකට උසස් අධ්‍යාපන ඇමති වෙලා සිටියා. නවක වධය තිබෙනවා මොකක්ද කරන්න ඕනේ කියලා එතුමා මගෙන් ඇහුවා. ඒ කාලයේත් ඇවිල්ලා මේ ශිෂ්‍යයන් ගෙන ගිහිල්ලා මෙහෙම පුහුණුවක් දෙන්න කියලා අපට යෝජනා කළා. ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමා කිව්වා මේක පුහුණුවක් නොවෙයි, මේක වධයක්, ළමයින් දැන ගන්න ඕනෑ, ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැන ගන්න ඕනෑ කොහොමද පුහුණු වෙලා එන්නේ කියලා. විශ්වවිද්‍යාලය කියන්නේ හමුදා කඳවුරක් වාගේ පාලනය කරන තැනක් නොවෙයි කියලා නිශ්ශංක විජයරත්න මැතිතුමා කිව්වා. මමත් හිටියා ඒ සාකච්ඡාවේ. මමත් ඒකට එකඟ වුණා. ඇත්ත වශයෙන්ම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා හිනා වුණා. අඩි 10ක් උස තාප්පයක් නඟින්න ඕනෑ නම් විශ්වවිද්‍යාලයට යන්න උසස් පෙළ විභාගය පවත්වන්නේ ඇයි කියලා නිශ්ශංක විජයරත්න මැතිතුමා ඇහුවා. එහෙනම් NCGE විභාගය පවත්වන්න තිබුණානේ කිව්වා. එදා නිශ්ශංක විජයරත්න මැතිතුමා අධ්‍යාපන ඇමති වෙන කොට මේ රටේ දරුවකුගේ අවුරුදු 13ක අධ්‍යාපනය අවුරුදු 11කට අඩු කරලා තිබුණා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? එතුමා එදා ඇහුවා, අඩි 10ක් උස තාප්පයක්, බිත්තියක් නඟින්න නම් මොනවාටද මේ A/L විභාගය කරන්නේ කියලා. ඇයි මේ ළමයින්ව මේ තැන්වලට ගෙනෙන්නේ කියලා ඇහුවා. ඒ ප්‍රශ්න තමයි අද මේ ශෝක ප්‍රකාශ කරන අවස්ථාවේදීත් අද පවතින තත්ත්වය ගැන අපට අහන්න තිබෙන්නේ.

අද ඒ හමුදා කඳවුරුවල තිබෙන පහසුකම් ගැන කිව්වා. මට හමුදාවේ සාමාන්‍ය කෙනෙක් කථා කරලා කිව්වා, "සර් මගේ දුවට ඔය හමුදා කඳවුරේ ලබන්න තිබෙන දුක දිහා බලන්න" කියලා. සමහර අය වැසිකිළියට යන්න බයේ දවස් තුන හතරක් ඉන්නවා. අද අපි කථා කළා අමරානන්ද රත්නායක මැතිතුමා පැයෙන් පැයට වැසිකිළියට ගිය එක ගැන. මා අහනවා දවස් තුනක් වැසිකිළියට යන්නේ නැති ළමයි ඉන්නවාද කියලා. ඒ වාගේම දවස් තුනක් නාලා නැහැ.

අද අපි ශෝකය ප්‍රකාශ කරන්නේ ඇත්ත වශයෙන්ම අධ්‍යාපනයට සේවය කරපු පුද්ගලයන් දෙදෙනෙක් ගැනයි. [බාධා කිරීමක්] දැන් මා කියන්නම් වන්නිය පැත්තේ තිබෙන කඳවුරුවල වෙලා තිබෙන දේ ගැන. ලැයිස්තුව-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අහන්නේ කොහොමද මේක ගෙන යන්නේ කියන එකයි. අනික, ඔබතුමා මේ වෙලාවේ මූලාසනයට ආපු එක හොඳයි. ඇත්ත වශයෙන්ම අපි කරන මේ කථා දැන් පිට කරන්නේ නැහැ. Visuals of the demonstration that took place yesterday were not released. මා දන්නේ නැහැ අද කරන කථාවත් පිට කරනවාද කියලා; එහෙම නැත්නම් පටිගත කරනවාද කියලා. ඊයේ කථාවයි අද ඒවායි පිට කරන්න කියලා දැනුම් දෙනවා නම් හොඳයි.

මෙතැනදී අද අපි කථා කරන්නේ "මහපොළ" වෙනුවෙන් අපි එක්ක වැඩ කරපු අය ගැන. මා දන්නවා ගරු එම්.එස්. අමරසිරි මැතිතුමා මහපොළ සාර්ථක කරන්න ගත්ත පියවර ගැන. ඒ වාගේම මා දන්නවා ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමා නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් ගත්ත පියවර ගැන. අන්න එහෙම පුද්ගලයන් ගැනයි අද මේ කථා කරන්නේ. අඩු ගණනේ මේ ශෝක යෝජනා ඉදිරිපත් කරන්න තිබුණේ ගිය මාසයේ, ශිෂ්‍යයන්ට මේ වද දෙන්න ඉස්සෙල්ලා; මේ හානිය කරන්න ඉස්සෙල්ලා. මේ ගරු සභාවේ අද මේ ශෝක යෝජනා පවත්වන එකෙන් අවනම්බුවක් අපි කරන්නේ. ඒ ගැන අපේ කනගාටුව

ප්‍රකාශ කරනවා. අපේ අනෙක් ගරු මන්ත්‍රීවරුත් මේ ගැන කථා කරන්න ඉන්නවා.

ගරු එම්.එස්. අමරසිරි මැතිතුමාටත්, ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමාටත්, ගරු අමරනන්ද රත්නායක මැතිතුමාටත් - එතුමා මගේ පියාගේ හොඳ යාළුවෙක්- නිවන් සැප ලැබේවා කියා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරන ගමන් අපේ කනගාටුව එතුමන්ලාගේ පවුල්වල උදවියට දැනුම් දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

[අ. භා. 3.58 ]

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාල්ල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වාගේම දකුණු පළාතේ මහ ඇමතිවරයකු විධියට ඒ වාගේම ආණ්ඩුකාරවරයකු විධියට දැවැන්ත සේවාවක් ඉෂ්ට කරපු ශ්‍රේෂ්ඨ යුග පුරුෂයකුගේ අභාවය වෙනුවෙන් කෙරෙන ශෝක ප්‍රකාශ යෝජනාවට අදහස් දක්වන්න ලැබීම සම්බන්ධයෙන් මා සතුටු වෙනවා. විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධනයේ ආරම්භක පියවර තබමින් ගරු එම්.එස්. අමරසිරි මැතිතුමන් දැවැන්ත සේවාවක් ඉෂ්ට කළා. ඒ වාගේම අතිදුෂ්කර ප්‍රදේශයක් වුණු හිනිදුම් පත්තුවේ සංවර්ධනයට දැවැන්ත දායකත්වයක් ලබා දීලා, ඒ දායකත්වය හරහා හිනිදුම් පත්තුවේ ඒ අහිංසක දුක් විඳි ජනතාවට යහපත් ජීවන තත්ත්වයක් උදා කරන්න එම්.එස්. අමරසිරි කියන ඒ ශ්‍රේෂ්ඨ යුග පුරුෂයාණන්ට හැකියාවක් ලැබුණා.

එම්.එස්. අමරසිරි කියන ඒ නිහතමානී නායකයා පිළිබඳව අපි කුඩා කාලයේ, අපි පාසල් යන අවධියේ තමයි දැන ගත්තේ. අපි පාසල් යන අවධියේ අපේ මහ ඇමතිවරයා විධියට එතුමා කටයුතු කළා. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ අපි පාසල් යන කුඩා අවධියේ, -භීෂණ සමය පැවැතුණු 1987,1988 සහ 1989 යුගයේ එතුමා ඉතාම එඩිතර විධියට ගාල්ල දිස්ත්‍රික්කයේ තිබුණ දැවැන්ත භීම සමයට මුහුණ දීලා ඒ සේවාවන් ඉෂ්ට කළ බව. තමන්ගේ ආදරණීය බිරිඳට ත්‍රස්තවාදී ප්‍රහාර එල්ලව තිබියදීත් එතුමාණන් තමන්ගේ සේවාව නොපිරිහෙළා, නොපැකිළව දිගින් දිගටම ඉදිරියට කර ගෙන ගියා. අපි අහලා තිබෙන විධියට එතුමා "මල්ලියේ, බොලන්" කියලා ඕනෑම කෙනෙකුට බොහොම හිතවත් විධියට කථා කරලා, හදවතට බොහොම ළෙන්ගතු වෙලා, හැමෝගෙම ආදරය දිනා ගත්ත කෙනෙක්. පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව, -ආණ්ඩු පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව- දකුණු පළාත් සභාවේ සාමූහිකත්වය, ළබැඳියාව ගොඩ නැඟීමේ මූලික නායකත්වය දරපු පුද්ගලයා හැටියට එම්.එස්. අමරසිරි හිටපු මහ ඇමතිතුමාණන් අපි විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. අනෙක් පළාත් සභාවල වාගේ නොවෙයි දකුණු පළාත් සභාවේ දැවැන්ත සහයෝගයක් පවතිනවා. ඒ සහයෝගයේ ආරම්භකයා වුණේ එම්.එස්. අමරසිරි මැතිතුමායි. ඒ වාගේම එතුමාණන් දකුණු පළාතේ සංවර්ධනය වෙනුවෙන් මහ ඇමතිවරයා විධියට දීර්ඝ කාලයක් තමන්ගේ සේවාව ඉෂ්ට කළා. අපි විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. ගාල්ල දිස්ත්‍රික්කයේ දේශපාලනයේ තිබෙන නොයෙක් නොයෙක් හැල හැප්පීම් මැද්දේ, නොයෙක් නොයෙක් බාධක මධ්‍යයේ එතුමාණන් දැවැන්ත සේවාවක් ඉෂ්ට කළා. එතුමාණන්ගේ සේවාව රුස්සන්නේ නැති දේශපාලනඥයන් සමහර වෙලාවට එතුමාණන්ට නොයෙක් නොයෙක් අකරතැබ්බ, කරදර, අපහාස, නින්දා කරද්දී එතුමාණන් දැවැන්ත යුග පුරුෂයකු විධියට තමන්ගේ සේවාව ඉෂ්ට කර ගෙන ගියා. ජනතාව වෙනුවෙන් තමන්ගේ සේවාව නොපිරිහෙළා ඉටු කරන්න එතුමා දැරූ ඒ ව්‍යායාමය පිළිබඳව අපි මේ අවස්ථාවේදී සිහිපත් කරන්නට ඕනෑ. එතුමාණන් අපේ ගාල්ල දිස්ත්‍රික්කයට තවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු දායාද කළා. ඒ, උපාලි අමරසිරි කියන තමන්ගේ පුත්‍ර රත්නය. එතුමාටත් ගාල්ල දිස්ත්‍රික්කයට විශාල සේවාවක් කරන්න හැකියාව ලැබුණා. අපි මේ වෙලාවේ ඒ පිළිබඳවත් සිහිපත් කරන්න ඕනෑ.

එතුමා නිහතමානී පුරුෂයකු විධියට අද දේශපාලනඥයන්ට ආදර්ශයක් දුන්නා. එතුමාණන් උදාහරණයක් හැටියට අරගෙන හෙට දවසේ ගොඩ නැඟෙන අපි වාගේ තරුණ දේශපාලනඥයන්ට එතුමාණන්ගෙන් ගත හැකි ආදර්ශ බොහොමයක් තිබෙන බව මේ වෙලාවේ සඳහන් කරමින් එතුමාණන්ට නිවන් සුව අත් වේවායි පතනවා. එතුමාගේ පවුලේ සියලුම දෙනාට ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ ශෝකය, ප්‍රණාමය මේ අවස්ථාවේ විශේෂයෙන් පළ කර සිටිමින් මා නිහඬ වනවා.

[අ. භා. 4.02 ]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ හිටපු අමාත්‍ය හා පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.එස්. අමරසිරි මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාවට සම්බන්ධ වීමට ලැබීම ගැන මම සතුටු වනවා. එතුමාගේ අභාවය සිදු වුණ අවස්ථාවේදී විවිධ ප්‍රවෘත්ති පත්‍රවල එතුමා ගැන සඳහන් වුණේ මේ විධියටයි. 2007.01.10 වන දින "ලංකාදීප" පත්තරේ මෙහෙම සඳහන් වුණා:

"දකුණු සිරිලක ආලෝකවත් කළ මෑත කාලයෙහි බිහිවූ ශ්‍රේෂ්ඨ දේශපාලනඥයකු, මානව හිතවාදියෙකු, සමාජ සේවකයෙකු හා අභිමානවත් ගැමියෙකි."

එතුමා ගැන ඒ වෙලාවේ හැම පත්තරයකම සඳහන් වුණා. ඒ වෙලාවේ "දිනමිණ" පත්‍රයේ එතුමා ගැන පළ වුණේ, "දකුණු සිරිලක ආලෝකවත් කළ ශ්‍රේෂ්ඨ දේශපාලනඥයකු" හැටියටයි. ඒ සියල්ලම සත්‍යයි. මොකද, මම දන්නවා එතුමා 1960 දී මන්ත්‍රීවරයකු හැටියට පත් වෙලා, ඊට පසුව 1977 දීත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට පත් වෙලා, නියෝජ්‍ය වෙළඳ ඇමතිවරයා හැටියට ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා සමඟ කළ සේවාවන් පිළිබඳව. ඒ කටයුතු පිළිබඳව අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා දීර්ඝ ලෙස කථා කළා.

විශේෂයෙන්ම මම අමරසිරි මැතිතුමා ආශ්‍රය කළේ COPE කමිටුවේ සාමාජිකයකු හැටියටයි. එතුමා අවුරුදු පහක් අඛණ්ඩව මේ කොමිටියේ සභාපතිවරයා හැටියට හිටියා. මමත් ඒකේ සාමාජිකයකු හැටියට හිටියා. එතුමා ඒ කාර්යභාරය ඉතාම කැපවීමකින් ඉටු කළා. මම දන්නවා, එතුමා නියම වෙලාවට ඇවිල්ලා, නියම වෙලාවට කටයුතු අවසාන කරලා, නිලධාරින්ගේ ගරුත්වයත් ආරක්ෂා කර ගෙන, ආයතනවල දියුණුවට විශේෂයෙන්ම කටයුතු කළ සභාපතිවරයකු බව. මම දන්නේ නැහැ අද එවැනි තත්ත්වයක් තිබෙනවාද කියලා. අපට ලැබෙන පැමිණිලි අනුව ඒ ස්වාධීනත්වය අද ඒ කමිටුවල පවතිනවාද කියන එක අපට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

අමරසිරි මැතිතුමාගේ ඉතිහාස වාර්තාව දිහා බලපුවාම අපට පෙනෙන්නේ ඇත්ත වශයෙන්ම එතුමා ආදර්ශවත් දේශපාලනඥයකු, මන්ත්‍රීවරයකු, ඇමතිවරයකු හැටියට ඒ කාල පරිච්ඡේදයේ වැඩ කරලා තිබෙන බවයි. එහෙම නම් එතුමාගේ ගමන් මාර්ගය අනුගමනය කිරීම සියලු දේශපාලනඥයන්ට හොඳ ආදර්ශයක් කියන එක මම මතක් කරන්න කැමැතියි. එතුමාගේ පුත්‍ර රත්නය වන උපාලි අමරසිරි මැතිතුමන් අපිත් එක්ක

[ගරු ජෝන් අමරතුංග මහතා]

පාර්ලිමේන්තුවේ හිටියා. කාලාන්තරයක් ඉඳලා නිලතලත් දැරුවා. පසුව එතුමා දේශපාලන ක්ෂේත්‍රයෙන් ඉවත් වීම ගැන අපි කනගාටු වුණා.

තාත්තාගේ අඩි පාරේ ගමන් කරන්නට සුදුස්සෙක් හැටියට උපාලි අමරසිරි මැතිතුමා ඒ වෙලාවේ ගාලු දිස්ත්‍රික්කයේ පළමුවැනියා හැටියට තේරිලා මන්ත්‍රී ධුරය ලබා ගෙන අපේ කණ්ඩායමට එකතු වුණා. මේ අවස්ථාවේදී මා දීර්ඝ ලෙස කථා කරන්නේ නැහැ. එම්.එස්. අමරසිරි මැතිතුමා මහපොළ ශිෂ්‍යත්ව අරමුදල පිළිබඳව ඉටු කළ සේවාව අදත් මා අගය කරනවා. අපේ නායකතුමා ඒ ගැන සඳහන් කළා. මහපොළ සුවිශේෂ ආධාර නිසාම අධ්‍යාපනය ඉදිරියට ගෙන යන්න විශ්වවිද්‍යාල ශිෂ්‍ය පරපුරට අවස්ථාව ලැබෙනවා. නගරාසන්නව සිටින ජනතාවගේ වෙළහෙළෙඳාම් පහසුකම් පිටස්තර ගම්මානවලටත් ගෙන යන අරමුණ ඇතුව තමයි එතුමා කටයුතු කළේ. අන්න ඒ විධියේ උදාර අදහස් ඇතුව කටයුතු කළ ඇමතිවරයෙකුගේ අභාවය ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරන අතර අපේ කණ්ඩායමේ කනගාටුව ඒ පවුලේ සියලු දෙනාට මේ අවස්ථාවේදී පිළිගන්වමින් මා නිහඬ වනවා. ස්තුතියි.

[අ. භා. 4.06 ]

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභාවප්‍රාප්ත එම්.එස්. අමරසිරි මැතිතුමා ගැන කථා කරන විට විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණු කිහිපයක් තිබෙනවා. 1984 දී මගේ පියතුමාගේ අභාවයෙන් පසු පැවැති අතුරු මැතිවරණයෙන් මා පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. මා මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණාට පසු වැඩිහිටි මැති-ඇමතිවරු ගණනාවක් සමඟ ආශ්‍රය කරන්න අවස්ථාව ලැබුණා. මා මන්ත්‍රීවරයෙක් වන්න ඉස්සෙල්ලත් මට ඒ අවස්ථාව ලැබුණා. එම්.එස්. අමරසිරි කියන චරිතය ගැඹුරට හඳුනන ඉතාමත්ම අහිංසක නිහතමානී චරිතයක් කියන එක මා ප්‍රකාශ කරන්න ඕනෑ. එදා තරුණ අපි නවක මන්ත්‍රීවරු හැටියට සිටියදී එතුමා බොහෝ අවස්ථාවලදී උපදෙස් දුන්නා; උදව් උපකාර කළා. එතුමායි මගේ පියතුමායි 1977 ඉඳලා එකට ඇමති මණ්ඩලයේ වාඩි වෙලා හිටියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ශෝක ප්‍රකාශ කරද්දි පළමුවන වතාවට මා දැක්කා, විපක්ෂ නායකතුමා සම්ප්‍රදායෙන් බැහැරව ගරුත්වයෙන් තොර කථාවක් කළ බව. ඒ ගැන මා කනගාටු වනවා. මගේ මිත්‍ර ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමනි, ශෝක ප්‍රකාශ කරද්දි අපි ශෝක ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ ශෝක ප්‍රකාශය මාර්ගයෙන් අපි අමාත්‍යාංශ පිළිබඳව, තවත් ප්‍රශ්න පිළිබඳව කථා කරනවා නම් ඒක සම්ප්‍රදාය කඩ කිරීමක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බාධා කරන්නත් බැහැ.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

එකට අදාළව එක දෙයක් කියන්නද? [බාධා කිරීමක්] ඒකට අදාළ දෙයක් මා තමුන්නාන්සේට කියන්නම්. එහෙම නම් මේක අහගන්න. [බාධා කිරීමක්] මා අදාළ දෙයක් කියලා දෙන්නම්. එහෙම නම් අහගන්න. ඒකට අදාළ දේ මා කියා දෙන්නම්. අපි දෙදෙනාත් මේ පාර්ලිමේන්තුවේ එක්සත් ජාතික පක්ෂයේ හොඳට කාල් ගාපු උදවිය නේ. අපි ඒ රත්තරන් මනුෂ්‍යයාට පල නොකියා පළා බෙදපු ආකාරය මතකද? මේ රත්තරන් මනුෂ්‍යයාට එක්සත් ජාතික පක්ෂයේ හිටපු සද්දන්තයෝ පල නොකියා පළා බෙදපු ආකාරය මතකද? විපක්ෂ නායකතුමා කථා කරලා පැනලා ගියා. අන්න ඒකයි මා කිව්වේ. සම්ප්‍රදාය කඩ වුණත් ගරුත්වය ආරක්ෂා වන විධියට ශෝක ප්‍රකාශය කළා නම් කමක් නැහැ. අපි කථා කරන්නේ මේ රටේ හිටපු වැදගත් ඇමතිවරු -සද්දන්තයෝ- ගැන; අපිට ආශිර්වාදයක් ගන්න පුළුවන් නායකයෝ ගැන; මේ උත්තරීතර සභාවේදී මේ රට වෙනුවෙන් තමන්ගේ ජීවිත කැප කරපු උදවිය ගැන. එතුමා බොහොම සදාචාරසම්පන්නව කථා කළා නම් ඊට වැඩිය වැදගත් කියන එකයි මගේ අදහස වන්නේ. [බාධා කිරීමක්] ඊට වැඩිය හොඳයි, ගාමිණී ලොකුගේ ඇමතිතුමා කියන විධියට කථා නොකර හිටියා නම්. [බාධා කිරීමක්] හරියට හරි. එතුමා කථා කරලා පැනලා ගියා. අන්න ඒකයි ප්‍රශ්නය. [බාධා කිරීමක්] අර කොලු ගැටයෝ කියන ආකාරයට තියෙනවා නම් තවත් රාජකාරි- [බාධා කිරීමක්] පවුලේ උදවිය සිටියදී ශෝක ප්‍රකාශ කරන වැදගත් අවස්ථාවක මේ සභාවට වෙලා තිබෙන්නේ මොකක්ද? අපි ලජ්ජා වන්න ඕනෑ. විපක්ෂ නායකතුමා ඒ තත්ත්වයට මේ සභාව ගෙනාවා. අපි ඒ ගැන කනගාටු වනවා.

එම්.එස්. අමරසිරි මැතිතුමා ගැන කථා කරන්න ගොඩාක් දේවල් තිබෙනවා. ගොඩක් මැති-ඇමතිවරුන් කථා කරන්න බලා ගෙන ඉන්නවා. මට මතකයි, එදා එතුමාගේ ආදරණීය බිරිඳ ඝාතනය කළ ආකාරය. කවුද ඝාතනය කළේ? ජනතා විමුක්ති පෙරමුණ. හංගා හංගා කියන්න ඕනෑ නැහැ. අපි සියලු දෙනාම ඒ මළ ගෙදර ගියා. එම්.එස්. අමරසිරි මැතිතුමාව ඝාතනය කරන්න බැරි වුණු තැන ඝාතනය කළේ කවුද? එතුමාගේ ආදරණීය බිරිඳවයි. අපි දැක්කා, එදා එතුමා කම්පා වුණු ආකාරය. හැමදේකටම තමන් සමඟ හිටපු තමන්ගේ ආදරණීය බිරිඳව ඝාතනය කරපු වෙලාවේ එතුමා කම්පා වුණු ආකාරය අපි දැක්කා. එතුමා පළාත් සභාවේ මහ ඇමති වුණාට පස්සේ එතුමාගේ ආදරණීය පුත්‍රයා වන උපාලි අමරසිරි මැතිතුමාව ආශ්‍රය කරන්න අපට පුළුවන් වුණා. එතුමා මොන තරම් නිහතමානී චරිතයක්ද? මොන තරම් අවංක චරිතයක්ද? මොකක්ද, එතුමාට සිද්ධ වුණේ? එතුමා තමයි මම හිතන්නේ මේ පාර්ලිමේන්තුවේ නිවැරදිම තීන්දුව ගත්තු පුද්ගලයා. එතුමා දේශපාලනයෙන් සමු ගත්තා, එතැන ඉන්න බැරි හින්දා. මට කනගාටුයි, මේ අවස්ථාවේදී මටත් සිද්ධ වුණා, සම්ප්‍රදායෙන් බැහැරව යන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ හිනිදුම ආසනය නියෝජනය කළ එම්.එස්. අමරසිරි මැතිතුමා ගැන අපි කවුරුත් කථා කරන්නේ ඉතාමත්ම ගෞරවයෙන් සහ ආදරයෙන්. එදා අපි හැමටම උපදෙස් දුන්න ඒ වැඩිහිටි නායකයෝ අද අපට නැතිවීම ගැන අප කනගාටු වෙනවා. නමුත් ඒක තමයි ස්වභාව ධර්මයේ හැටි. මා කියන්න ඕනෑ, එම්.එස්. අමරසිරි මැතිතුමා මේ පාර්ලිමේන්තුවට කරපු සේවය ගැන. එතුමා පළාත් සභාවේ විපක්ෂ නායකයා හැටියට පත් වුණා. අවසානයේදී එතුමා අපේ පළාතේ -ඌව පළාතේ- ආණ්ඩුකාරවරයා හැටියට පත් වෙලා ආවා. එතුමා ආණ්ඩුකාරවරයා හැටියට ඌව පළාතට පත් වෙලා ආපු අවස්ථාවේත් වැඩිහිටියෙක් හැටියට එතුමාව ගිහිල්ලා මුණ ගැහෙන්න මට පුළුවන් වුණා. ඒ සෑම අවස්ථාවකම එතුමා අපට සැලකුවේ දරුවෝ හැටියටයි. එතුමා තුළ තිබුණු ඒ නිහතමානීකම මේ අවස්ථාවේ ඉතාමත්ම ගෞරවයෙන් සිහිපත් කළ යුතුයි; පැසසිය යුතුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ සහ අපේ පවුලේ උදවියගේ කනගාටුව අමරසිරි මැතිතුමාගේ පවුලේ උදවියට දැනුම් ලෙසට ඉල්ලා සිටින අතරම අපේ ආගම ධර්මය අනුව එතුමාට නිවන් සුව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

[අ. භා. 4.12 ]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් පළමුවෙන්ම මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මුළු මහත් ශ්‍රී ලංකාවට වසර 50කටත් වැඩි කාලයක් විශාල සේවාවක් ඉටු කළ අමරසිරි නම් ප්‍රඥාවන්ත දේශපාලනඥයා 1925 සැප්තැම්බර් මස 05 වන දින ගාල්ල දිස්ත්‍රික්කයේ ඇතුමලේ මාපලගමදී උපත ලැබුවා. එතුමාගේ පියා මාතරගේ දොන් කොර්නේරිස් ද සිල්වා ගම්පතිතුමා වන අතර මව ඉලේසිංහ කංකානම්ගේ දෝන සිසිලියානා මැතිනියයි. අමරසිරි මහතා කුඩා කල අධ්‍යාපනය ලැබුවේ මලාමුරේ රජයේ පාසලෙනුයි. ඊට පස්සේ ද්විතීය අධ්‍යාපනය සඳහා ගාල්ලේ ඇලෝසියස් විද්‍යාලයට ඇතුළු වුණා. කුඩා කල සිටම එතුමා සමාජ සේවය සඳහා ඇල්මකින් කටයුතු කළා. පාසල් සමයේදී විවිධ සමිති සමාගම්වලින් අත් දැකීම් ලද තරුණ අමරසිරි මහතා 1949 දී මාපලගම එතුමාගේ ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපතිවරයා වශයෙන් සිය සමාජ සේවා කටයුතු ආරම්භ කළා. ඉන්පසුව 1954 වර්ෂයේදී ගාල්ල ගඟබඩ පත්තුවේ නාගොඩ ගම්කාර්ය සභාවේ නියෝජිතයෙක් වශයෙන් තේරී පත් වූ එතුමා 1957 දක්වා එම ප්‍රදේශයට අතිවිශාල සේවාවක් කළා. ගමේ ඉපිද ගමේ හැදී වැඩී ගමේ මිනිසුන් සමඟ ජීවත් වූ එතුමා සමාජ සේවය නිසා ගමේ ජනතාවගේ විශාල ගෞරවයටත් ආදරයටත් ලක් වුණා. මීට ඉහත කළ කථාවලදී සඳහන් වුණා, එතුමා විදේශීය සමාගමකට අයත් වත්තක විකල්ප මාර්ගයක් සකස් කිරීමේ ශ්‍රමදානයකට සහභාගි වීමේදී සිරගත වෙච්ච ආකාරය. මා ඒ ගැන නැවතත් සඳහන් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

ගම්කාර්ය සභාවෙන් දේශපාලනය ආරම්භ කළ එතුමා 1960 මාර්තු මාසයේ පැවැති පාර්ලිමේන්තු මහ මැතිවරණයට මහජන එක්සත් පෙරමුණෙන් තරග කර හිනිදුම ආසනයේ මන්ත්‍රීවරයා වශයෙන් තේරී පත් වුණා. කෙටි කලක් එම මන්ත්‍රී ධුරය හෙබැවූ එතුමා 1965 දී පැවැති මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් හිනිදුම ආසනයට නැවතත් තේරී පත් වුණා. 1970 දී එක්සත් ජාතික පක්ෂයෙන් මහ මැතිවරණයට ඉදිරිපත් වුණත් ඒ අවස්ථාවේදී එතුමාට මන්ත්‍රීවරයෙක් වශයෙන් පත් වීමට අවස්ථාවක් ලැබුණේ නැහැ. නමුත් එයින් පසුබට නොවූ එම්.එස්.අමරසිරි මැතිතුමා ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය සඳහා සුවිශාල මෙහෙවරක් සිදු කළා. ග්‍රාමීය දුෂ්කර ප්‍රදේශයන්හි, විශේෂයෙන්ම පක්ෂය ශක්තිමත් කිරීම සඳහා එතුමා විශිෂ්ට සේවාවක් කළා. අමරසිරි මැතිතුමාගේ නොපසුබට උත්සාහය නිසා 1977 දී පැවැති පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී එතුමාට හිනිදුම ආසනයෙන් අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගන්න හැකි වුණා. ඒ අවස්ථාවේදී එතුමා රජයේ වෙළෙඳ හා නාවික නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් පත් වුණා. ඒ වාගේම දිවංගත ලලිත් ඇතුලත්මුදලි මහතාත් සමඟ එතුමාට නියෝජ්‍ය අමාත්‍යවරයෙක් වශයෙන් විශාල සේවාවක් කරන්න පුළුවන් වුණා. විපක්ෂ නායකතුමාගේ කථාවෙනුත්, ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කථාවෙනුත්, ගරු ලක්ෂමන් සෙනෙවිරත්න මැතිතුමාගේ කථාවෙනුත්, ගරු ජෝන් අමරතුංග මැතිතුමාගේ කථාවෙනුත් ඒ සම්බන්ධයෙන් විස්තර සඳහන් කළ නිසා ඒ ගැන දීර්ඝ ලෙස කථා කරන්නට මම බලාපොරොත්තු වන්නේ නැහැ.

1984 දී වෙළෙඳ හා නාවික ඇමති ලෙස කැබිනට් මණ්ඩලයට එකතු වුණ අමරසිරි මහතා වෙළෙඳ හා නාවික ක්ෂේත්‍රය තුළ එතුමාගේ සලකුණ ඉතාමත් විශිෂ්ට ලෙස සටහන් කළා. ඒ අවස්ථාවේ මම පෞද්ගලික අංශයේ සමාගම් කිහිපයකත්, වෙළෙඳ මන්ත්‍රණ සභා කිහිපයකත් සභාපතිත්වය දැරුවා. ඒ තනතුර නිසා මට අමරසිරි මැතිතුමා සමඟ ඉතාමත් කිට්ටු සම්බන්ධතාවක් ඇති කර ගන්නට පුළුවන්කම ලැබුණා. එතුමාගේ සහයෝගය අපට ලැබුණා. එතුමාගේ අවවාද, අනුශාසනා ලැබුණා. ඒ වාගේම අප කාගේත් අදහස් අර ගෙන වෙළෙඳ ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා විශාල සේවාවක් කරන්නට එතුමාට හැකි වූ බවත් මම මේ අවස්ථාවේ දී සඳහන් කරන්නට කැමැතියි.

මේ රට දරුණු අභියෝගවලට මුහුණ දුන් කාලයක තමයි මීගහතැන්න ප්‍රදේශයේ දී එතුමාගේ ආදරණීය බිරිඳ මරණයට පත් වුණේ. කොතරම් ගැටලු මධ්‍යයේ වුවත් ස්වකීය ආසනයේ ඡන්දදායකයන්ට ආදරය කළ ඔහු ඕනෑම සභාවකදී පුද්ගලයකුගේ නමින් ඇමතීමට තරම් මතක ශක්තියක්, නිහතමානීකමක් තිබුණු කෙනෙක්. මේක වර්තමාන දේශපාලනඥයන්ට හොඳ ආදර්ශයක් කියලා මම හිතනවා. 1999 නොවැම්බර් 01 වැනි දින චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමියගේ ආරාධනයෙන් ඌව ආණ්ඩුකාර තනතුරට පත් වූ එතුමා 2002 දක්වා එම සේවය නොපිරිහෙලා ඉටු කළා. එතුමාගේ වැඩිමහල් පුතු වන අධි නීතිඥ උපාලි අමරසිරි මහතා කලක් හමුදාවේ කොමිෂන් ලත් නිලධාරියකු වශයෙන් සේවය කළා. ඉන්පසුව ගාල්ල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් 1988 සිට 1994 දක්වා විශාල සේවාවක් කළා. බාල පුතු වන ආනන්ද අමරසිරි මහතා මොරටුව විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයකු වශයෙන් ද, එකම දියණිය සුනිමාලි අමරසිරි මහත්මිය මහරගම පිළිකා රෝහලේ වෛද්‍යවරියක වශයෙන් ද සේවය කරනවා. මාපලගම විපුලසාර නාහිමිපාණන් වහන්සේ, මාපලගම සිරි සුනන්ද හිමිපාණන් වහන්සේ, බද්දේගම විමලරතන නාහිමිපාණන් වහන්සේ , අකුරැටියේ අමරවංශ නාහිමිපාණන් වහන්සේ වැනි අති පූජනීය නාහිමිපාණන් වහන්සේලාගේ අවවාද අනුශාසනා ලබා ගත් අමරසිරි මහතා මානව හිතවාදියෙකු, ආදරණීය පියකු, හිතවත් ගැමියකු, මහත්මා දේශපාලනඥයකු වාගේම අභීත සෙන්පතියකු හා සමාජ සේවකයකු වශයෙන් ශ්‍රී ලංකාවට කරපු අමරණීය සේවය මේ අවස්ථාවේ මම සඳහන් කරනවා. මිය යන විට එතුමාගේ වයස අවුරුදු 82ක් වුවත්, අවසන් මොහොත දක්වාම ඉතා හොඳ, නිරෝගී සුවයෙන් සිටීමට ලැබීම ඔහු ලැබූ භාග්‍යයක් ලෙස සලකනවා. 2007 ජනවාරි මාසයේ 10 වැනි දා, බදාදා දිනයක අමරසිරි මැතිතුමා මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගණයේ දී අපේ හදවත් කම්පා කරවමින් අවසන් ගමන් ගියත්, අඩ සිය වසරකට වැඩි කාලයක් මේ රට වෙනුවෙන්, තමන්ගේ ජනතාව වෙනුවෙන් අමරණීය සේවාවක් කළ බව මේ අවස්ථාවේ සඳහන් කරන අතර, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙනුත්, අපේ පාර්ලිමේන්තු කණ්ඩායම වෙනුවෙනුත් අපගේ ශෝකය පවුලේ සියලු දෙනාටම පුද කරමින් එතුමාට නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාල වේලාව වෙන් කර ගන්නට නොලැබුණ නිසා ගරු අමරනන්ද රත්නායක මැතිතුමා ගැන කථා කරන්නට බැරි වුණා. මම මේ අවස්ථාවේ කථාවක් කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් එතුමා ගැන වචන කිහිපයක් සඳහන් කරන්නට මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

එතුමා විශාල සේවාවක් කරපු මහජන මන්ත්‍රීවරයෙක්. එතුමා මහජනතාව සමඟ කොයි තරම් කිට්ටුවෙන් වැඩ කළාද කියලා අපට මතකයි. මේ අවස්ථාවේ ඒ ගැනත් සඳහන් කරමින්, එතුමටත් නිවන් සුව ප්‍රාර්ථනා කරමින් එතුමාගේ පවුලේ සාමාජිකයන්ටත් මේ අවස්ථාවේ අපේ ශෝකය පුද කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු මහින්ද යාපා අබේවර්ධන ඇමතිතුමා.

[අ. භා. 4.19 ]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)

(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ දකුණු පළාතේ හිටපු ඉතාමත් දක්ෂ, ඉතාමත් ලෙන්ගතු මනුෂ්‍යයකු ගැන කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන මම මේ අවස්ථාවේ ස්තුතිවන්ත වනවා. ගරු එම්.එස්. අමරසිරි ඇමතිතුමා ගැන අපි දැන ගත්තේ අපට හිටපු ඉතාම වැදගත්, ජ්‍යෙෂ්ඨ දේශපාලඥයකු හැටියටයි. ඒ යුගයේ එතුමා අපි සියලු දෙනාටම නායකත්වය ලබා දුන්නා. ඒ හැම වෙලාවේම ඉතාමත් ලෙන්ගතුව, සහෝදරත්වයකින් තමයි එතුමා කටයුතු කළේ. එතුමාගේ මම දැකපු විශිෂ්ටතම සේවාව තමයි අද පවතින දකුණු පළාත් සභාව නිර්මාණය කිරීම. එතුමා තමයි ඒ නිර්මාණය කරපු පුද්ගලයා.

නීතියෙන් පළාත් සභාව ඇති කෙරුවාට, එහි නීති රීති සකස් කරලා, එහි පරිපාලනය විධිමත් කරලා, එහි කටයුතු කර ගෙන යන ආකාරය පිළිබඳ සම්පූර්ණ නිර්මාණය කිරීම අපේ එම්.එස්. අමරසිරි ඇමතිතුමාගේ දක්ෂතාව මත සිදු වුණු දෙයක් කියා මම හිතනවා. එතුමා මුලින් ආරම්භ කළ යම් යම් ක්‍රියාදාමයන් ඒ ආකාරයෙන්ම නිවැරදිව අදත් ක්‍රියාත්මක වනවා.

මට මතකයි, මම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට කටයුතු කරද්දි එතුමා අපේ විපක්ෂ නායකයා ලෙසට -ගරු නියෝජ්‍ය කථානායකතුමාටත් මතකද මම දන්නේ නැහැ.- විපක්ෂය මෙහෙය වූ හැටි. ඉතාමත් විනය ගරුකව, ඉතාමත් සාර්ථකව විපක්ෂය මෙහෙය වූ නායකයකු හැටියට මම එතුමාව එදා දැක්කා. එතුමා අනවශ්‍ය ප්‍රශ්න ඇති කළේ නැහැ. කථා කළ හැම දෙයක් පිළිබඳවම ඉතාමත්ම තර්කානුකූලව, නීත්‍යානුකූලව, සාමකාමීව හා ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කළා. ඒක මට කවදාවත් අමතක කරන්න බැහැ. ඒ වාගේ නායකයකු සමඟ වැඩ කරන්නට ලැබීම මම ලැබූ වාසනාවක් කියා මම හිතනවා. අපි එතුමාට ගරු කරන්නේ අපේ පළාතේ අපට හිටිය ඉතාමත් ශ්‍රේෂ්ඨ නායකයකු හැටියටයි. හැම වෙලාවේම එතුමා තුළ අප කෙරෙහි පුදුමාකාර ආදරයක් කරුණාවක් තිබුණා. ඒකට පක්ෂ භේදයක් තිබුණේ නැහැ; වෙනත් භේද එතුමා ළඟ තිබුණේ නැහැ. එතුමා හැම වෙලාවේම හැමෝටම "මල්ලී", නැත්නම් "සහෝදරයා" කියලා කථා කළා. ඒ වාගේම ඕනෑම දෙයකදී ඇහුම්කන් දීලා ඒ කටයුතු ඉතාමත් අවංකව ඉෂ්ට කළ කෙනකු හැටියටයි මම එතුමාව දකින්නේ.

පසු කාලයකදී දේශපාලන වශයෙන් එතුමාත් මමත් වෙනස් වුණා. නමුත් අවසානයේදී එතුමාත් අපත් සමඟ ආවා. එතුමාත් අපත් සමඟ එකතු වෙලා මේ අද අපි යන ගමනට එතුමාගේ සහයෝගය ලබා දුන්නා. මොකද, ඒක එහෙම වන්න හේතුව? එතුමා නිවැරදි ගමන් මඟ තෝරා ගැනීමේ පුදුමාකාර හැකියාවක් තිබුණු කෙනෙක්. නිවැරදිව කටයුතු කරන්න එතුමා හැම තිස්සේම උත්සාහ කළා. ඒ නිසා එතුමාගේ අභාවය අප ලැබූ විශාල පාඩුවක්. මුළු දකුණු පළාතටම තවමත් ඒ පාඩුව දැනෙනවා. දකුණේ ඉපදුණු නායකයෙක් හැටියට දකුණට අමිල සේවාවක් ඉටු කළ නායකයෙක් හැටියට, අදත් අපිට යමක් කථා කරන්නට ඉතුරු කරපු නායකයෙක් හැටියට ඒ ගෞරවය අපි එතුමට පුද කරනවා. ඒ වාගේම එතුමාගේ පවුලේ උදවියට එතුමාගේ අභාවය පිළිබඳ අපගේ ශෝකය පළ කරනවා.

එතුමා සමඟ මම බොහෝ කාලයක් එකට වැඩ කළා. දේශපාලන අදහස් අතින් අපි වෙනස් වුණත් එතුමාගේ සුහද බව, ලෙන්ගතුකම, හිතවත්කම, සහෝදරත්වය කවදාවත් නැති වුණේ නැහැ. හැම අවස්ථාවකදීම එතුමා අපත් සමඟ ඉතාමත් ළඟින් කටයුතු කළා. ඒ නිසා අපි එතුමාට ගරු කරනවා වාගේම එතුමා කෙරෙහි අපේ ඇති ආදරය, කරන ගෞරවය එන්න එන්නම වැඩි වනවා මිසක් අඩු වන්නේ නැහැ. ඒ වාගේ නායකයන් අද අපට හොයන්න නැහැ. ඒ වාගේ මහජනයාත් එක්ක, ඒ වාගේම තමන් සමඟ කටයුතු කරන උදවියත් සමඟ හිතවත්ව ආදරයෙන් කටයුතු කරන නායකයන් බිහි වන්නේ ඉතාමත් කලාතුරකින්. එහෙම බිහි වුණ නායකයකු හැටියට එතුමාව මම දකිනවා.

පළාත් සභාව තුළ එතුමා කරපු ඒ විශිෂ්ට සේවාව වාගේම පස්සේ කාලයේ ආණ්ඩුකාරවරයකු හැටියටත් ඒ සෑම කටයුත්තක්ම ඉතාමත්ම සාර්ථකව මෙහෙය වූවා. ඒ වාගේ ශ්‍රේෂ්ඨ නායකයකු නැති වීම අපට පාඩුවක්. එතුමාගේ අභාවය වෙනුවෙන් මේ සභාවේ ශෝකය වාගේම මාගේ පෞද්ගලික ශෝකයත් මේ අවස්ථාවේදී පළ කර සිටිනවා.

එම්. එස්. අමරසිරි මැතිතුමා ඉතාමත් හොඳ මහත්මයෙක්. එතුමා වාගේ මහත්මයකු තමයි එතුමාගේ පුතා උපාලි අමරසිරි මැතිතුමාත්. එතුමාවත් අපි ඉතාමත් ළඟින්, සහෝදරත්වයෙන් ඉතාමත් ලෙන්ගතුව ආශ්‍රය කරන කෙනෙක්. මේ හැම කාරණයක් දිහාම බැලුවාම එම්.එස්. අමරසිරි මැතිතුමා අපේම පවුලේ, අපේම කෙනකු හැටියටයි අපි දකින්නේ. ඒ නිසා මේ අවස්ථාවේදී අප සියලු දෙනාගේම ශෝකය එතුමාගේ පවුලේ අයට පළ කරමින් එතුමාට නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා.

[අ. භා.4.24 ]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**

(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)

(The Hon. Gamini Jayawickrama Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු ජීවිතයේදී මා දැක්ක මහා ශ්‍රේෂ්ඨ දේශපාලනඥයන් තුන් දෙනෙකුගේ අභාවය පිළිබඳ ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ, විශේෂයෙන්ම මා පළමුව දෙදෙනෙකු ගැන කථා කර පසුව තුන්වෙනියා ගැනත් වචනයක් දෙකක් කථා කරන්නට බලාපොරොත්තු වනවා.

පළමුව එම්.එස්. අමරසිරි මැතිතුමා පිළිබඳවයි. මම දකින මේ චරිතය මා සමඟ 1977 පාර්ලිමේන්තුවට පිවිසියා. එතුමා දේශපාලනයේ ජ්‍යෙෂ්ඨයෙක්; නාගොඩ ගම් සභාවේ මෙම්බර් මහත්තයෙක් විධියටත් හිටියා. එතුමා ගම් සභාවේ මෙම්බර් මහත්තයෙක් වුණේ 1954 දී. මම ගම් සභාවේ මෙම්බර් මහත්තයෙක් වුණේ 1968 දී. මට වඩා ජ්‍යෙෂ්ඨ කෙනෙක් එතුමා. එදා එතුමා තුළ තිබුණු වාමාංශික අදහස් තුළ රැඩිකල්වාදියෙක් ලෙස ඉතාමත්ම නිර්භීතව ජනතාවට සේවය කළ ජ්‍යෙෂ්ඨ කෙනෙක් විධියට එතුමා හැඳින්විය හැකියි. අද තිබෙන ක්‍රමයට වඩා එදා තිබුණු ගම් සභා ක්‍රමයේ ඉතාමත්ම පුළුල් අර්ථවත් වටිනාකමක් තිබුණා. ඒ ක්‍රමය තුළ තමා පත් කළ පළාතට මහා සේවයක් කිරීම නිසා "අපේ මෙම්බර් මහත්මයා" කියා තමයි ජනතාව ආමන්ත්‍රණය කරන්නේ. අද "අපේ මන්ත්‍රීතුමා" කියන වචනයක් කොයි පැත්තෙන්වත් ඇහෙන්නේ නැහැ. "අපේ මෙම්බර් මහත්මයා" කියන වචනය අහ ගන්න පුළුවන් විධියට අමරසිරි මැතිතුමා මහා සේවයක් කළා.

එදා විදේශිකයෝ ඇවිල්ලා ගමේ තිබුණු පාර අවහිර කරද්දී, ඉඩම් අරගෙන තේ, පොල්, රබර් වවද්දී, වැව හරහා පාරවල් හදද්දී එතුමා වතු පාලකයින් එක්ක, වතු අයිතිකාර විදේශ සමාගම් එක්ක තනිව සටන් කර ශ්‍රමදානයෙන් පාර හදලා හිරබතුත් කෑවා. ඒ වාගේ හිර බත් කාපු අය මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ කී දෙනාද? අවංකව එහෙම සේවය කරපු අය බොහොම අතළොස්සක් තමයි ඉන්නේ. එහෙම සේවය කරපු එතුමා

නාගොඩ ගම් සභාවේ සභාපතිවරයා ලෙස පත් වුණු වෙලාවේ එතුමාගේ විරුද්ධවාදීන් පිරිසක් එතුමා උස්සා ගෙන ගිහින් තිබෙනවා. අද කාලයේ විතරක් නොවෙයි, ඒ කාලයේත් උස්සා ගෙන යාම තිබිලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමා උස්සා ගෙන ගිහිල්ලා අනුරාධපුරයේ හංගලා ඉඳලා තමයි සභාව තියලා තියෙන්නේ. ඒ වාගේම එතුමා ගිනස් පොතට ගිය කෙනෙක්. සාමාන්‍යයෙන් අපි ඉතිහාසයේ දකින දෙයක් තමයි වම දකුණට හැරෙන එක. Steering එක දකුණට හැරෙනවා. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමාගේ පියාත් එහෙම ආවා. ඔබතුමාගේ පියාත් ශ්‍රේෂ්ඨ පියෙක්. මම එතුමාට බොහොම ගරු කරනවා. මම නාලන්දේ ඉන්න කාලයේ ඔබතුමාගේ පියාට අපේ බොහොම ගරුත්වයක් තිබුණා. ඔබතුමාගේ ඒ හඬ නැහැ. සිංහ හඬක් එතුමාට තිබුණේ. තමුන්නාන්සේගේ තිබෙන්නේ ඊට වඩා බොහොම low level හඬක්. එතුමා මහා පෞරුෂත්වයකින් හෙබි පුද්ගලයෙක්. එම්.එස්. අමරසිරි මහත්මයා නිශ්ශබ්ද විලියම් වාගේයි. ඔබතුමාගේ පියා ඒබ්‍රහම් ලින්කන් වාගේ නිශ්ශබ්දව වැඩ කරන, කථාව ටිකක් කරන මහත්මයෙක් විධියටයි මම දැක්කේ. එතුමා එදා සමාජ සේවය තුළින් දේශපාලන ජීවිතයට ඇවිල්ලා තිබෙනවා. දේශපාලන ජීවිතය වමෙන් පටන් ගෙන තිබෙනවා. ඔබතුමන්ලාගේ එදා තිබුණු පක්ෂයෙන් -මහජන එක්සත් පෙරමුණෙන්- ආපසු එක්සත් ජාතික පක්ෂයට ඇවිල්ලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට එක්සත් ජාතික පක්ෂයෙන් එතුමා ගමන ආරම්භ කළා.

එතුමා සාර්ථකව දීර්ඝ දේශපාලන ගමනක් ගියා. එතුමාගේ ඒ ගමන ගැන මට සඳහන් කරන්න පුළුවන්. මම දිසා ඇමතිවරයෙකු විධියට එදා පාර්ලිමේන්තුවේ එතුමාගේ සගයෙක් විධියට කටයුතු කළා. මට පෙනෙනවා, නළල රැලි දාලා නළුවෙකු වාගේ ගාමිණී ලොකුගේ මැතිතුමා බලා ගෙන ඉන්න ආකාරය. මුහුණ නිකම් පිම්බිලා ඇවිල්ලා වාගේ මට පෙනෙනවා. ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමාත් හොඳට අහගෙන ඉන්නවා. එතුමාගේ පියාත් ඒ කාලයේ හිටියා. මා දිසා ඇමති වෙලා සිටි කාලයේදී වෙච්ච රසවත් සිද්ධි රාශියක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් නාලන්දේ කෙනෙක්. මමත් නාලන්දේ කෙනෙක්. ඒ වාගේ මෙතැන තවත් සගයෝ ඉන්නවා. කල්ලිවලින් තමයි පවුලක් විනාශ වන්නේ. කල්ලිවලින් තමයි පුද්ගලයෙක් විනාශ වන්නේ. කල්ලි තමයි සෑම දෙයකම විනාශයට හේතු වන්නේ. පවුල්වාදයට, කල්ලිවාදයට, මතවාදයට ගියොත් ඒ ආයතනය හෝ පුද්ගලයා හෝ පවුල හෝ විනාශ වනවා. පක්ෂයත් විනාශ වනවා. ජේ.ආර්.ජයවර්ධන කියන මහා ශ්‍රේෂ්ඨයා මම මෙහිදී දැක්ක මහා පුරුකකත්. එතුමා තරම් දක්ෂයෙක් මම දේශපාලනයේ දැක්කේ නැහැ. වෙස් ලැල්ලේ ඉත්තෝ එහාට මෙහාට අදිනවා වාගේ හැම කෙනාගෙන්ම වැඩ ගැනීමේ දක්ෂකමක් එතුමාට තිබුණා. එතුමා හොඳම දක්ෂ පිරිසක් බිහි කර ගෙන හිටියා. මේ දක්ෂ පිරිස තුළ ගාමිණී දිසානායක මැතිතුමා, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා, අපේ රණසිංහ ප්‍රේමදාස මැතිතුමා සිටියා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා නිශ්ශබ්ද ගමනකයි ආවේ. දක්ෂ සෑම කෙනෙකුගෙන්ම වැඩ ගත්තා. අපේ දිවංගත ලලිත් ඇතුලත් මුදලි මැතිතුමා එදා වරාය හා නාවික ඇමති වෙද්දී නියෝජ්‍ය ඇමති වශයෙන් ආවේ එම්.එස්. අමරසිරි මැතිතුමායි. මම ඒ කාලයේ එතුමාට "අමරේ" කියායි කථා කළේ. මම බොහොම ගරු කරන කෙනෙක් තමයි එතුමා. මට මතකයි, මා දිසා ඇමති වෙලා සිටියදී දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා එතුමාගේ සංකල්පයක් හඳුන්වා දෙන්නට කුරුණෑගලට ආපු වෙලාවේ වෙච්ච සිද්ධියක්. දේශපාලකයෙක් වුණොත් දැන ගන්නම අවශ්‍ය දෙයක් තිබෙනවා. මොකක්ද? වෑ මෑ ගාලා යන දේශපාලනය කරන එක නොවෙයි, එහෙයියෝ වෙලා තව කෙනෙක් යන ගමනක යන එක නොවෙයි, තමන්ටත් සංකල්පයක් තිබෙන්න ඕනෑ. තමන්ගේ දේශපාලන සංකල්පයක් ක්‍රියාත්මක කරලා රටේ ජනතාවගේ සුබසිද්ධිය සඳහා සේවයක් කරලා ඒ තුළින් රටට යහපතක් වුණා නම් ඒක සදා අමරණීය සේවයක් වෙනවා. ඒ විතරක් නොවෙයි. ඒක තමයි "පින" කියන්නේ. එදා අපේ එක්සත් ජාතික පක්ෂය අවුරුදු 32ක මහවැලි සංකල්පය ගෙන එද්දී ගාමිණී දිසානායක මැතිතුමා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට කිව්වා, "මම අවුරුදු අටෙන් කරනවා"ය කියා. ඒක කළා. ඒක සංකල්පයක්. මහා ශ්‍රේෂ්ඨ සේවයක්. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා මහපොළ ශිෂ්‍යත්ව සංකල්පය ගෙනාවා. ඒකත් මහා ශ්‍රේෂ්ඨ සේවයක්. අද ගමේ අහිංසක පවුල්වලට ඒ මගින් මහා උදාර සේවයක් කෙරෙනවා. රණසිංහ ප්‍රේමදාස මැතිතුමා "ගම්උදාව" සංකල්පය ගෙනාවා. Tube wells කියන එකක් ගැන හිතුවේවත් නැති කාලයක, වියළි දේශගුණයක් තිබෙන අපේ පළාත්වලට, වන්නියේ ජනතාවට වතුර ටිකක් බොන්න ඒ මගින් අවස්ථාව සලසා දුන්නා. මේවා තමයි සංකල්ප කියන්නේ. දේශපාලන එහෙයියෙක් වෙන්නේ නැතුව, කැඩපතක් වාගේ තමන් කරපු සේවය තුළින් අලංකාර වෙනවා. මෙලොවදීත්, පරලොවදීත් ඒ පින අපට විපාක දෙනවා. තමන්ට පාරේ යන්න පුළුවන්කම තිබෙන්නේ ඒ නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ තරුණයෙක්. තමුන්නාන්සේත් නාලන්දයේ ආදි ශිෂ්‍යයෙක්. තරුණ පරපුරේ හුඟාක් අය මේ කතාව අහගෙන මෙතැන ඉන්නවා. ඇමතිවරයෙක් වෙලා ඒ පට්ටම තියා ගෙන ඉන්න එක නොවෙයි කරන්න ඕනෑ. ඒ පට්ටම බබළවන්න ඕනෑ. එම්.එස්.අමරසිරි මැතිතුමා එහෙම තමන්ගේ පට්ටම බබළවපු කෙනෙක්. කැඩපතක් වාගේ එතුමා ඒක බැබළෙව්වේ කොහොමද කියන කාරණය ගැන මම කතා කරනවා. ලලිත් ඇතුලත් මුදලි මැතිතුමාගේ මහපොළ සංකල්පයත් එවැනි දෙයක්. "කන්ටේනරය" කියන වචනය ඒ කාලයේ අහන්න ලැබිලාත් නැහැ. වරාය කියන වචනය තුළින් "කන්ටේනරය" ආදී අලුත් වචන ආවා. කවුද ඒ වාහනයේ රියැදුරු වුණේ? මේ වාහනය නමැති ලලිත් ඇතුලත්මුදලි සංකල්පයේ රියැදුරු වුණේ එම්.එස්. අමරසිරි මැතිතුමායි. එතුමා තමයි මේක දියත් කරලා ක්‍රියාත්මක කළේ. කොහොමද? මගේ අත් දැකීම්වලිනුයි මම මේ කතා කරන්නේ. මෙතුමා කුරුණෑගලට ආවා. එතකොට 'මහපොළ' කියන සංකල්පය ගැන ලලිත් ඇතුලත් මුදලි මැතිතුමා අපටවත් කියා දී තිබුණේ නැහැ. මේක හරි රසවත් සිද්ධියක්. මහපොළ උත්සවය තියන්නය කියා එතකොට කතා කළා. නිලධාරින් හිටියා, දිසා ඇමති හැටියට මමත් සිටියා, කොළඹින් ආපු නිලධාරින් හිටියා. මම අමරසිරි මැතිතුමාගෙන් ඇහුවා, ඇමතිතුමනි, අපේ ගම්වලත් පොළවල් තිබෙනවා, මොකක්ද මේ මහපොළ කියන්නේ, මේකට වෙන වචනයක් නැද්ද කියලා. එතකොට කණ්ඩායම් රුස්වීමකදීවත් ලලිත් ඇතුලත්මුදලි හිටපු ඇමතිතුමා අපට ඒ ගැන කියා තිබුණේ නැහැ. එක්තරා නිලධාරියෙක් ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාට ගිහින් කියා තිබුණා, මම ඒ සංකල්පයට විරුද්ධ කෙනෙක්ය කියා. ඒ විධියට මාවත් කල්ලියකට ගාව ගන්න හැදුවා. මම එක කල්ලියකවත් මිනිහෙක් නොවෙයි. මම කාගෙනුත් හොඳින් වැඩ ගත්තු කෙනෙක්. කාගෙනුත් වැඩ ගන්න එක තමයි දක්ෂකම කියන්නේ. ඉතින් මේකෙදි මාව හංවඩු ගහන්න හැදුවා. එහෙම කරලා මට ඒ අමාත්‍යාංශය නොදී ඉන්නය කියන නියෝගයකුත් ආවා. ඊළඟට සමාව ඉල්ලා කතා කළා, තර්ක කළා. මගෙන් වරදක් වුණාය, මම ඒක පිළිගන්නවාය කියා මම කෙළින්ම කතා කළා. මම කාගේවත් පන්දම්කාරයෙක් නොවෙයි, ජනතාව මාව පත් කරලා තිබෙන්නේ මගේ රාජකාරියේ වැඩ කරන්නයි කියලා මම කිව්වා. ඒක පිළිගත්තා. එම්.එස්. අමරසිරි මැතිතුමා මාව ආරක්ෂා කරන්න ලොකු තර්ක විතර්ක ගෙනැල්ලා තිබුණා. පරණ පාර්ලිමේන්තුවේදී දවසක් මා ළඟදි එතුමා ඇඬුවා. එතුමාගේ ඇස්වලින් කඳුළු ආවා. අඬලා එතුමා කිව්වා, "ජයේ බොරුවට ඔයාව හංවඩු ගහනවා" කියා. " මම කිව්වා, "හරි මම ගිහින් කෙළින්ම කතා කරන්නම්" කියා. එහෙම ගිහින් ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා හමු වුණා. එවැනි උණු වෙන හදවතක් තමයි එම්.එස්.අමරසිරි මැතිතුමාට තිබුණේ. කවුරු හරි ගැන කරුණාවන්ත හදවතක් ඇති වුණාම එතුමාට උහුලා ගන්න බැහැ.

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

ඇස්වලින් කඳුළු එනවා. අඬනවා. රැස්වීම්වලදීත් එහෙමයි. ඒ මොකද? චේතනාව නිසයි. "චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි" කියා තිබෙනවා නේ. උණු වෙන කරුණාවන්ත හදවතක් තිබුණු දේශපාලනයේ මහා උත්තමයෙක් විධියටයි ඒ උත්තමයාව මම සලකන්නේ. ඒ උත්තමයා ගැන මගේ හදවතින්මයි මම මේ කතා කරන්නේ. එදා ඒ විධියට සේවය කරපු ලලිත් ඇතුලත්මුදලි කියන්නේත් මහා ශ්‍රේෂ්ඨ දේශපාලනඥයෙක්. එතුමා තුළ සංකල්ප රාශියක් තිබුණා. ඒ වාගේම එතුමා ඒ සංකල්පවලට ගියා. මට මතකයි මම දිසා ඇමති වෙලා ඉද්දි World Bank එකේ Integrated Export Development Project එකේ ඉද්දි එතුමා Export Promotion Villages කියා ක්‍රමයක් ඇති කළා. ඒ කියන්නේ, EDB එකත් එක්ක එකතු වෙලා අත්කම් භාණ්ඩ හැදීමේ හා කෘෂිකර්ම නිෂ්පාදන ගම්මාන ඇති කරලා ඒ තුළින් අපනයන ගම්මාන බිහි කරලා එමඟින් ඒ නිෂ්පාදන මැද පෙරදිගට එහෙම යවන වැඩ පිළිවෙළක්. මම ඒකේ ප්‍රමුඛයෙක් වුණා. මම ඒකෙන් ප්‍රයෝජන ගත්තා. ඒක කළේ කොහොමද? අදත් දඹදෙණියේ අපනයන ගම්මාන තිබෙනවා. ඒවා ඉතාම සාර්ථකයි. ඒවායේ තේ කොළ පෙට්ටි එහෙම හදනවා. මම ගල්ගමුව ආසනයේ, රාජාංගනය වැනි තැන්වල අපනයන ගම්මාන ඇති කෙරුවා. කවුද මෙහිදී ඒ සංකල්පයේ නියමුවාගේ රියැදුරු -මඟ පෙන්වන්නා- ලෙස කටයුතු කළේ? ගරු එම්.එස්. අමරසිරි මැතිතුමායි. එතුමා EDB එකත් එක්ක එකතු වෙලා පුදුම සේවයක් කළා. විදේශ accounts දමලා ඒ accountsවල ඩොලර්වලින් foreign exchange පවා දැම්මා. මේ විධියට කටයුතු කරපු අමරසිරි මැතිතුමා මම දකින්නේ ඉතාමත් දේශප්‍රේමී උත්තමයෙක් ලෙසයි. එතුමා ඒ කටයුතු එදා ඒ විධියට කෙරුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු එම්.එස්. අමරසිරි මැතිතුමා ගැන කථා කරන්න හුඟක් දේවල් තිබුණත් කාලයේ ප්‍රශ්නයක් තිබෙන නිසාත්, මට තව රැස්වීමකට යන්න තිබෙන නිසාත් මම කෙටියෙන් විස්තර කියන්න බලාපොරොත්තු වෙනවා. ඔබතුමාගේ අවසරය ඇතිව ඊළඟ විෂයට බහින්න ප්‍රථම මම මේ අවස්ථාවේ මේකත් කියන්න ඕනෑ. එතුමා ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කළ උත්තමයෙක්. මම දිසා ඇමතිවරයෙක් විධියට කටයුතු කරපු කාලයේ ලබපු අත් දැකීම් අනුවයි මේ කියන්නේ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එක්ක මැලේසියාවට ගිය වෙලාවේ එහේ තිබෙන chief ministerial system එක පිළිබඳ සාර්ථකත්වය මම දැක්කා. මගේ අත් දැකීම් අනුව මේ බලය මධ්‍යගත කිරීම පිළිබඳ දැඩිව විරුද්ධ වුණු පුද්ගලයෙක් මම. මගේ හදවතේ තියා ගෙන ඉන්නේ නැතිව මම ඒක එළිපිටම කියනවා. බලය මධ්‍යගත කිරීම තුළින් ලෝකයේ කිසිම රටක් දියුණු වෙලා නැහැ. බලය විමධ්‍යගත වෙන්නම ඕනෑ. බලය විමධ්‍යගත කිරීම තුළ කරන ඒ ප්‍රාන්ත හෝ දිස්ත්‍රික්ක හෝ ක්‍රමයට, දිසා ඇමති කියලා එදා මොකක්ද කෙරුවේ? අපට මොකක්ද එදා දීලා තිබුණේ? දිසා ඇමතිවරයෙකුට රුපියල් ලක්ෂයක්වත් දීලා තිබුණේ නැහැ, ගරු ඇමතිතුමනි. කටින් බලයෙන් වැඩ අරගෙන අපි පෙන්නුවා. නායකත්වය කියන්නේ "නැහැ","බැහැ" කියන එක නොවෙයි. ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමන්ලා, එම්.එස්. අමරසිරි මැතිතුමන්ලා එහෙමයි වැඩ කළේ. වැඩ කරන්න යන්නේ ඉලක්කයට. ඒ ඉලක්කයට යද්දි සත්‍යය ජය ගන්නවා. මෙන්න මේකයි එතැන තිබුණේ. 1984 දී එම්.එස්. අමරසිරි මැතිතුමා වෙළෙඳ හා නාවික ඇමති වුණා. ඒ සේවය එතුමාගේ ඔළුවේ තිබෙනවා කවදාවත් මම දැක්කේ නැහැ. පාර්ලිමේන්තුවට එන්න කලින්, දිසා ඇමතිවරයාවත්, ප්‍රධාන ඇමතිවත් වෙන්න ඉස්සරවෙලා එතුමා එක්ක මම උපරිම විධියට වැඩ කළා. එතුමාගේ නිහතමානීකම අනන්තයි; අප්‍රමාණයි. කවදාවත් "බැහැ" කියලා කිව්වේ නැහැ. නිලධාරින්ට එන්න කියලා කියනවා, "මේ මන්ත්‍රීවරයා කියන එක කරන්න" කියලා. අන්න, ඇමතිවරයෙක් කියන්නේ තමා මහජන සේවකයෙක් කියන එකයි. එතුමා හරි ආදර්ශවත්ව වැඩ කරපු කෙනෙක්.

1988 දී මට මතකයි, දකුණේ භීෂණයත් එක්ක එදා ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කරද්දි සිදු වුණු දේවල්, මා ඒවා මේ ගරු සභාවේ දැන් ප්‍රකාශ කරන්නේ නැහැ. එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා පන්නල පන්සලේ උත්සවයට එද්දි අපේ යූ.බී. විජේකෝන් මැතිතුමා එක්කත් කියලා තිබෙනවා මේ බලය විමධ්‍යගත කිරීම පිළිබඳව. අමරසිරි මැතිතුමාත් තීරණය කෙරුවා දකුණු පළාත් සභාවට එන්න; මම වයඹ පළාත් සභාවට යන්න තීරණය කළා. අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු එහෙම මගෙන් ඇහුවා, "ඇයි උඹ මෝඩයා වාගේ යන්නේ?" කියලා; වරප්‍රසාද නැති වෙනවාය කිව්වා; තනතුර නැති වෙනවාය කිව්වා; ජ්‍යෙෂ්ඨත්වය නැති වෙනවාය කිව්වා. මේ වරප්‍රසාද මොනවාද? මේවා තාවකාලිකයි. ඔය පට්ටම් කියන ඒවා තාවකාලිකයි. මේවා ඔක්කොම බොරු. කවුරුත් මවා ගෙන ඉන්න ලෝකෙක ජීවත් වෙනවා. අමරසිරි මැතිතුමා ඒවා මොකවත් බැලුවේ නැහැ. එදා හිටපු තේජාන්විත, මහා පෞරුෂත්වයක් තිබුණු පර්සි සමරවීර, මහින්දසෝම වැනි මැතිතුමන්ලා ඇතුළු අපි ඔක්කොම ටික එකතු වෙලා සාකච්ඡා කරලා තීරණය කළා අපි අස් වන්නේ මේ රටට බලය විමධ්‍යගත කිරීම හරිය කියන එක තුළයි කියලා. තමන්ගේ ආදරණීය බිරිඳ ජීවිතය පූජා කරලාත් ඒ තුළ එතුමා නොසෙල්වී හිටියා. ඒ අධිෂ්ඨානය ඇති කර ගෙන එතුමා ඒ ගමන ගියා; සේවය කළා. එතුමා දකුණටත් ඒ ලෙසම ආදර්ශවත් සේවයක් කළා. එතුමා මහා ශ්‍රේෂ්ඨ උත්තමයෙක්. මෙන්න මේක කවුරුත් ආදර්ශයට ගන්න ඕනෑ. අද තිබෙන්නේ "මම" කියන එකයි; "මගේ" කියන සංකල්පයයි. නමුත් අමරසිරි මැතිතුමාට එදා සමාජයයි, රටයි කියන අදහස තමයි තිබුණේ. ඒ වාගේ උත්තමයකුට අපේ උපහාරය පුද කරන්න ඕනෑ. නමුත් මට හරි කනගාටුයි, අපේ විපක්ෂ නායකතුමා කියපු එක ඇත්ත. ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, දැන්වත් මේක වෙනස් කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේදී මේ පිළිබඳව කථා කරලා තීරණයක් ගන්න. මිය ගිහින් අවුරුදු ගණනක් ගිහිල්ලා එතුමන්ලාගේ හොඳ කියලා වැඩක් තිබෙනවාද? බොරුවක් මේ කරන්නේ.

අපි ලජ්ජා වෙන්න ඕනෑ. මේ වාගේ උත්තමයින්ට අවුරුදු ගණන් ගිහිල්ලා මේ විධියට ශෝකය පළ කරන්නේ නැතිව මේ ඔක්කෝම ඉවරයක් කරලා ඊ ළඟට එන අනු පිළිවෙළට ශෝක යෝජනා ගෙනෙන්නට පක්ෂ නායක රැස්වීමක් පවත්වලා ඔබතුමන්ලා තීරණයක් ගන්න. හරිම කණගාටුයි. මීට වඩා හොඳයි මේ ශෝක යෝජනා ඉදිරිපත් නොකර ඉන්න එක. මේවා ගැන මම හරිම කණගාටු වෙනවා. ඒ උත්තමයින්ගේ ආදරණීය බිරින්දෑවරු, දරුවෝ මේ සභාවට ඇවිල්ලා ඉන්නවා. ඒ දරුවන්ගේ දරුවනුත් මෙතැන ඉන්නවා. මම හරිම කණගාටු වෙනවා. ඒ උත්තරීතරකම අපි ආරක්ෂා කරමු. අපේ විපක්ෂ නායකතුමා කිව්වා වාගේ මමත් ඒක කියනවා. පිදිය යුත්තෙකුට පිදිය යුත්තේ අවුරුදු ගණන් ගිහිල්ලා නොවෙයි. අපේ සම්ප්‍රදායයක් තිබෙනවා නේ, මැරුණායින් පස්සෙ නේ අපි ඔහු ගැන කථා කරන්නේ. ඉන්න කල් කථා කරන්නේ නැහැ. ඉන්න කල් මඩ ගහනවා; කෙළ ගහනවා; ඒ ඔක්කෝම කරනවා. මැරුණායින් පස්සේ තමයි හැම දේම කියන්නේ. එතුමා ප්‍රධාන ඇමතිවරයා විධියට එදා මාත් එක්ක විශාල සේවයක් කළා. එතුමා එදා ඒ කළ සේවය වෙනුවෙන් එතුමාට අවසන් ගෞරව දැක්වීමට පක්ෂය වෙනුවෙන් මම එදා ගියා. එසේ ගියේ මගේ සහෝදර දේශපාලනඥයෙක්, මන්ත්‍රීවරයෙක්, සමාජ සේවකයෙක්, ප්‍රධාන ඇමතිවරයෙක්, ඇමතිවරයෙක්, ආණ්ඩුකාරවයෙක් විධියට එතුමා කළ සේවයට උපහාර කිරීමටයි. ඒ නිසා මම මේ අවස්ථාවේ එතුමාගේ පුත්‍රයන් වන නීතිඥ උපාලි අමරසිරි මැතිතුමාට, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආනන්ද අමරසිරි මැතිතුමාට, එකම දියණිය වන වෛද්‍ය ඩොරින් සුනිමාලි අමරසිරි මැතිනියට කියනවා, එතුමා ඔබලාට සතුටු විය හැකි ශ්‍රේෂ්ඨ පියෙක්; ඒ පියා කළ සේවය කුමන වෘත්තියකින් කළත්, එය අවංකව කිරීම නිසා එමඟින් ඔබලාට ශක්තිය ධෛර්යය ලැබෙව් කියා. එතුමාට පමණක් නොවෙයි එතුමාගේ ආදරණීය බිරිඳටත් අමා මහ නිවන් සුව අත්

වේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට කිව්වා වාගේ වෙනදා නම් සම්ප්‍රදාය වශයෙන් තිබුණේ මේ සියලුම ඒවා ගැන එකවර කථා කරන එකයි. මටත් සාකච්ඡාවකට යාමට තිබෙන නිසා මම අවසර ඉල්ලා සිටිනවා, මේ ක්ෂේත්‍රයේ මම ගරු කරන ඉතාමත් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් වන නිශ්ශංක විජයරත්න මැතිතුමා ගැනත් වචන ටිකක් කථා කරලා කාලය ඉතිරි කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නාලන්ද විද්‍යාලයේ හිටපු කාලයේ, -ඔබතුමාත් හිටපු ඉස්කෝලේ- 1958 මමත් ක්‍රිකට් ගහන කාලයේ මමත් මගේ පියා එක්ක අනුරාධපුරේ යනවා මට මතකයි. 1958 දී මහා ගංවතුරක් ආවා. ඒ ගංවතුර වෙලාවේ අපි අනුරාධපුරයේ හිටියේ. පියා කිව්වා, උයපු බත් මුට්ටියත් දාලා යමු කියලා. එදා එතැන එහෙම තත්ත්වයක් තිබුණා. නිශ්ශංක විජයරත්න කියන චරිතය ඉස්කෝලේ ඉන්න කොට අපි දැක්කේ අමුතුම චරිතයක් විධියටයි. මොකද, අපි එතුමාට දේශපාලකයකුට වඩා ගරු කිරීමක් කරන්න පටන් ගත්තා. අනුරාධපුරය කියන්නේ, අටමස්ථානය කියන්නේ මහා ශ්‍රේෂ්ඨ භූමියක්. ඒ ශ්‍රේෂ්ඨ භූමියේ එතුමා කළ ප්‍රතිසංස්කරණ දිහා බලන විට එතුමා කෙරෙහි මගේ ලොකු භක්තියක් තිබෙනවා. නිශ්ශංක විජයරත්න මැතිතුමාට තිබුණු අත් දැකීම් පාර්ලිමේන්තුවේ මෙතැන සිටින කාටවත් නැතුව ඇති. ඒ ගැන කථා කරන්න කාටවත් අයිතියකුත් නැහැ. ඇයි මම එහෙම කියන්නේ? හේතුව, එතුමාගේ දේශපාලන ජීවිතයට නොවෙයි මම ගරු කරන්නේ, එතුමා රටට කළ මහා සේවයටයි. සේවය කළේ මොනවායින්ද? එම්.එස්. අමරසිරි මැතිතුමා ගම්සභා මන්ත්‍රී වශයෙන් -මෙම්බර් මහත්තයා වශයෙන්- ආවා වගේ එතුමා හැම ක්ෂේත්‍රයකම විහිදෙමින් සේවය කරලා තිබෙනවා. එතුමා රාජ්‍ය සේවයේ ඉඳගෙන සිවිල් සේවකයකු ලෙසත්, හමුදා නිලධාරියෙකු හැටියට ස්වේච්ඡා හමුදා සේවයේත් ඉඳලා තිබෙනවා. අමාත්‍යාංශ ලේකම්වරයෙක් විධියට, තානාපතිවරයෙක් විධියට ඉඳලා තිබෙනවා. එතුමා ඒ සියල්ලම කරද්දී ලේකම්වරයෙක් විධියට Information and Broadcasting, Transport and Cultural යනාදී Ministriesවල සේවය කර තිබෙනවා. He has also served as the Government Agent in Anuradhapura, Mannar and Jaffna and as the Assistant Government Agent in Galle. මොස්කව් තානාපති විධියට, කැබිනට් ඇමතිවරයෙක් විධියට, මේ හැම ක්ෂේත්‍රයකම සේවය කළ මේ උත්තමයා අපට UNESCO ආධාර ඇතිව Cultural Triangle එක ගෙනාවා. මේ ශිෂ්ඨාචාරය ලෝකයේ කොහේවත් නැහැ, මතක තියා ගන්න. කාටවත් මේ බුද්ධ ධර්මය නැති කරන්නත් බැහැ. නිශ්ශංක විජයරත්න මැතිතුමා වාගේ සමහර ඇමතිවරු මෙතැන ඉන්නවා. නිශ්ශංක විජයරත්න මැතිතුමා එදා 1958 දී බුද්ධ ශාසනයට කළ ඒ මහා උදාර සේවය තරම් සේවයක් මෙවර 2600 සම්බුද්ධ ජයන්තියේදීවත් -මා විවේචනයක් නොවෙයි කරන්නේ. එහෙම හිතන්න එපා. එහෙම නැහැ- වුණේ නැහැ.

බුද්ධ ශාසනය දියුණු කිරීමට ගරු නිශ්ශංක විජයරත්න මැතිතුමා ප්‍රතිපත්තිමය වශයෙන් කරපු සේවය මම පොඩ්ඩක් මතක් කරනවා. පන්සල් 10,600ක් තිබුණ රටේ අද පන්සල් 2,300ක් වැහිලා ගරු ඇමතිවරුනි. ඒක බෞද්ධ ඔබතුමන්ලා දැන ගන්න. ගිය අවුරුද්දේ සිවුරු හැර ගිහිල්ලා තිබෙනවා හත්සිය ගණනක්. ගිය මාස තුනට තුන්සිය ගණනක් සිවුරු හැර ගිහිල්ලා තිබෙනවා. [බාධා කිරීමක්] නවීන් දිසානායක ඇමතිතුමනි, ඔබතුමාගේ පියා මට කියලා තිබෙනවා, බාධා කරන්න එපා. අපහස කරන්න එපා. [බාධා කිරීමක්] මුතියංගනය විහාරයේ මහා චෛත්‍යය උඩ දෙවියෙක් වෙලා ඉන්නවා කියලා. ඒක නිසා බාධා කරන්න එපා. මම ගරු කරනවා ඔබතුමාගේ පියාට.

එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මැතිතුමා මගේ පක්ෂයේ නොවුණාට නාලන්ද විද්‍යාලයේ ශිෂ්‍යයකු විධියට මම එතුමාට බොහොම ගරු කළේ එතුමා බුද්ධ ශාසනයට විශාල සේවයක් කළ නිසායි. ඒ ප්‍රතිපත්ති වශයෙන්, ක්‍රියාත්මක වශයෙන්. මේ නිශ්ශංක විජයරත්න මැතිතුමාත් ප්‍රතිපත්ති තුළ මහා විශාල සේවයක්, අගනා සේවයක් කළ උදාර යුග පුරුෂයෙක්. ඒකයි මම මේ කථා කරන්නේ. එතුමා එදා අටමස්ථාන, සොළොස්මස්ථාන ආරක්ෂා නොකළා නම් අද වෙද්දී අනුරාධපුරය කියන පූජනීය භූමිය නොවෙයි දකින්න ලැබෙන්නේ. දකින්න වෙන්නේ මුඩුක්කු. ඒ පින ඇති එතුමාට අමා මහ නිවන් සුව අත් වෙන්න. ඒ වාගේ මහා සේවයක් එතුමා කළා. අපි කියන්න ඕනෑ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තම දේශපාලන ජීවිතයට රත්තරන් ඔළු ටිකක් ගත්ත බව. රත්තරන් ඔළු. අපේ ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමාගේ පියා වන කපිතාන් සී.පී.ජේ.සෙනෙවිරත්න මැතිතුමන්ලා වැනි මහා යුග පුරුෂයෝ රාශියක් මම දැක්කා 1977 දී. ඒ වාගේ අය තවම බිහි වුණේ නැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේත් නැහැ. ඒ යුග පුරුෂයන්ට මහා පෞරුෂත්වයක් තිබුණා. ඒක තමයි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ දක්ෂකම වුණේ. ඒ මහා යුග පුරුෂයෝ ඔක්කෝම අරගෙන මේ රට දියුණු කළා. ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමනි, ඔබතුමාගේ පියා තමයි Employees' Provident Fund වැනි දේවල් ගෙනාවේ සේවකයාගේ අයිතිය ආරක්ෂා කරන්න. ඒ සේවය ඉතිහාස ගත වෙනවා. ඒවා කාටවත් මකන්න බැහැ. 1977 ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආණ්ඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙලා මමත් ආවා. මම හිතන හැටියට එදා ගුරුවරයාගේ වැටුප රුපියල් සියයක් වෙන්න ඇති. නිශ්ශංක විජයරත්න මැතිතුමා අධ්‍යාපනයේ මහා වෙනසක් කරමින් ගුරු වෘත්තියට අලුතින් බඳවා ගත්තා. එදා එතුමා ලංකාවේ හැම තැනම විශ්වවිද්‍යාල ඇති කරන්න කටයුතු කළා. එතුමා UNESCO ආධාර ඇතිව Cultural Triangle එක ඇති කළා.

එතුමා අධ්‍යාපනයට ඒ කරපු සේවය වාගේම අධිකරණ ඇමති විධියටත් සේවාවක් කළා. කවුද මේ ජනාධිපති අරමුදල ඇති කළේ? ජනාධිපති අරමුදලක් ඇති කිරීමේ සංකල්පය ගෙනාවේ නිශ්ශංක විජයරත්න මැතිතුමායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ සංකල්පයක් අනුව ඒ අරමුදල ඇති කරලා ඒ උත්තමයා කළ මහා සේවය නිසා අද දුප්පත් අයටත් සෞඛ්‍යය වෙනුවෙන්, අධ්‍යාපනය වෙනුවෙන් පහසුකම් සපයා ගන්න පුළුවන් වෙලා තිබෙනවා.

එතුමා අවුරුදු 10ක් ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ ලෙස වැඩ කළා. ඒ වාගේම මේ රටට දරුවන් පස් දෙනෙකු දායාද කළා. මනෝ විජයරත්න හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා දේශපාලනඥයකු හැටියට අනාගතයක් තිබෙන කෙනෙක්. අපි එතුමාටත් ගරු කරනවා. දිය වඩන නිලමේ ලෙස නෙරංජන් විජයරත්න මැතිතුමාත් මහා සේවයක් කළා. ඒ වාගේම හිටපු පළාත් සභා මන්ත්‍රිනී අනුරාධා දුල්ලෑව මැතිනියත්, නිශාංගනී හුලංගමුව හා නැසීගිය නීතිඥ ලංකේෂ් විජයරත්න ද මව වන නීටා දුල්ලෑව යන සැම දෙනාට ඒ ශ්‍රේෂ්ඨ යුග පුරුෂයා වෙනුවෙන් උපහාර පුද කරන මේ අවස්ථාවේ අපේ ශෝකය ප්‍රකාශ කරන අතර එතුමාට අමා මහ නිවන් සුව අත් වේවායි! ප්‍රාර්ථනා කරනවා.

බදුල්ල දිස්ත්‍රික්කයට ශ්‍රේෂ්ඨ සේවයක් කළ අභාවප්‍රාප්ත ගරු අමරනන්ද රත්නායක මැතිතුමා වෙනුවෙන් ඒ පවුලේ සැම දෙනාටත් අපේ ශෝකය ප්‍රකාශ කරමින් එතුමාටද අමා මහන් නිව සුව අත් වේවායි ප්‍රාර්ථනා කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමා.

[අ. භා. 4.50]

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා එම්.එස් අමරසිරි මැතිතුමාව. අපි එතුමාව දැන හඳුනා ගත්තේ මීට දශක කීපයකට ප්‍රථමයෙන්. එතුමා දේශපාලනඥයකු, සමාජ සේවකයකු වාගේම ඉතා අපූරු ගැමියෙක්. ගම් සභාපතිවරයකු, සමාජ සේවකයකු, සමුපකාරියකු, මන්ත්‍රීවරයකු, ඇමතිවරයකු, මහ ඇමතිවරයකු, ආණ්ඩුකාරවරයකු හැටියට මොන නිලයේ කටයුතු කළත් ගැමිකම අමතක නොවුණු නායකයකු හැටියටයි එතුමා ක්‍රියා කළේ.

අපි තරුණ මන්ත්‍රීවරු හැටියට මේ පාර්ලිමේන්තුවට පත් වෙනකොට ජ්‍යෙෂ්ඨ ඇමතිවරු හැටියට එතුමන්ලා හිටියා. අපි එතුමාව දැන හඳුනා ගත්තේ 1970 වර්ෂයේදී එක්සත් ජාතික පක්ෂයේ පරාජයත් සමඟ. එදා ජේ.ආර්.ජයවර්ධන මැතිතුමාත් සමඟ මේ රටේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් පිහිටුවන්න අමරසිරි මැතිතුමන්ලා ඒ ගම්වලට නායකත්වය දුන්නා; ගැමියන් සමඟ කටයුතු කළා. ඒ අනුව 1977 වර්ෂයේදී බලයට පත් වෙච්ච රජයේ වෙළෙඳ හා නාවුක කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු ආරම්භ කරලා, ඊට පසුව වෙළෙඳ ඇමතිවරයා හැටියට පත් වෙලා විශිෂ්ට සේවාවක් මේ රටේ ජනතාව වෙනුවෙන් කළා. එතුමා ළඟ දේශපාලනයක් තිබුණේ නැහැ. එතුමා ඇමතිවරයකු හැටියට පක්ෂ විපක්ෂ හැම කෙනකුගේම වුවමනාවට ඇහුම්කන් දීපු, ඇහුම්කන් දීලා ඒ වෙනුවෙන් ක්‍රියා කරපු ඍජු නායකයෙක්. තමන් සමඟ හිතවත් උදවියට, තමන්ගේ ගමේ උදවියට වාගේම රටේ උදවියට විශිෂ්ට සේවාවක් එතුමා කළා. අපට එතුමා වැඩිහිටියකු වුණා. අපට හොඳ උපදේශකයකු හැටියට හිතවත්කමින් කටයුතු කළා. යමක් දැන ගන්න ගියොත් ඒ පිළිබඳව හොඳට පැහැදිලිව අපව දැනුවත් කළා. හැම කටයුත්තකදීම බොහොම නිරවුල්ව එතුමා ඒ දෙස බැලුවා. එතුමා බලය ඇති කාලයේත් බලය නැති කාලයේත් එක වාගේ කටයුතු කරපු නායකයෙක්. ඒ වාගේම දුෂ්කර අවස්ථාවලදී බොහොම කෙළින් කටයුතු කරපු නායකයෙක්. මට අද වාගේ මතකයි, එදා ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ල ඇති වුණු යුගය. පළාත් සභා මන්ත්‍රී තරග ආරම්භ කළ යුගය, ආසනයකට තරග කරන අපේක්ෂකයන්ට තර්ජන ආපු යුගය, අපේක්ෂකයන් වෙඩි තියලා ඝාතනය කරපු යුගය, ඡන්දදායකයාට ඡන්දපොළට යන්න නොදීපු යුගය. ඒ යුගයේ එතුමා අභීත නායකයකු හැටියට ඒවාට මුහුණ දීලා කටයුතු කළා. අවසානයේ එතුමාගේ ආදරණීය බිරිඳ ජීවිතක්ෂයට පත්වුණා. ඒත් එතුමා සැලුණේ නැහැ. අපට මතකයි, එදා ඒ සිද්ධිය වෙච්ච අවස්ථාවේ එතැනට ගියාම අපට ඇති වෙච්ච හැඟීම; ඒ මළ ගෙදරට ගියාම ඇති වෙච්ච හැඟීම. එතුමා ඒ එකකින්වත් පසු බැස්සේ නැහැ. තමන්ගේ සමාජ කටයුත්ත කරන්න බොහොම එඩිතරව ඉදිරියට ගිය නායකයකු හැටියට කටයුතු කළා. එතුමා හැම දාමත් රට දිහා බැලූ නායකයකු හැටියට කටයුතු කළා.

එතුමා එදා එක්සත් ජාතික පක්ෂයත් එක්ක කටයුතු කළා. නමුත් එතුමාට පෙනුණා එක්සත් ජාතික පක්ෂය යන ගමන වැරදියි කියලා. එතුමා එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වෙලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එකතු වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුකාරවරයකු හැටියට රටට සේවය කළා. මම එක්සත් ජාතික පක්ෂයේමයි කියා ගෙන කවදාවත් හිටියේ නැහැ. එතුමා මහජන එක්සත් පෙරමුණෙන් දේශපාලන කටයුතු ආරම්භ කළා. ඊට පස්සේ ජේ.ආර්.ජයවර්ධන මැතිතුමාත් සමඟ සම්බන්ධ වුණා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ කාලයේදී එතුමාට පෙනුණා එක්සත් ජාතික පක්ෂය යන ගමන වැරදියි, ගැළපෙන පැත්තකට යන්නට ඕනෑ කියලා. එතුමා ඒ ගමන ගිහින් අවසානයේ ආණ්ඩුකාරවරයකු හැටියට කටයුතු කළා. ඒ වාගේම එතුමාගේ ආදරණීය පුත්‍ර රත්නය වන උපාලි අමරසිරි මැතිතුමා අපිත් එක්ක මේ පර්ලිමේන්තුවේ හිටියා. එතුමා දැක්කා එතුමාගේ තාත්තා කරපු දුෂ්කර කටයුතු. හොඳ රත්තරන් මන්ත්‍රීවරයකු හැටියට එතුමාත් කටයුතු කළා. නමුත් මුළු දේශපාලනයෙන්ම එතුමා විශ්‍රාම ගත්තා.

අපට ආදර්ශයට ගන්න පුළුවන් නායකයකු හැටියට, රටට නායකත්වය දීපු නායකයකු හැටියට, මේ පාර්ලිමේන්තුව තුළ විනයක් ඇතිව කටයුතු කරපු මන්ත්‍රීවරයකු, ඇමතිවරයකු හැටියට එතුමාව හඳුන්වන්න පුළුවන්. ඒ වාගේම මට අද වාගේ මතකයි එතුමා COPE එකේ සභාපතිවරයා හැටියට කටයුතු කළ ආකාරය. එතුමා විවිධ ප්‍රශ්න සම්බන්ධයෙන් මැදිහත්ව ක්‍රියා කරපු නායකයෙක් වුණා.

එදා තරුණ මන්ත්‍රීවරුන් හැටියට සිටි අපට වැඩිහිටියකු හැටියට කටයුතු කරපු අමරසිරි මැතිතුමාත් එක්ක ළඟින් ඇසුරු කරන්න හැකියාව ලැබුණා. අද පාර්ලිමේන්තුවේදී එතුමා පිළිබඳව වචන කීපයක් කථා කරලා එතුමාගේ පුත්‍ර රත්නයන් වන උපාලි අමරසිරි මැතිතුමාට, ආනන්ද අමරසිරි මැතිතුමාට, එතුමාගේ ආදරණීය දියණියට, ඒ පවුලේ උදවියට අපේ කනගාටුවත්, ශෝකයත් පළ කරන අතර එම්.එස්. අමරසිරි මැතිතුමාටත්, ඒ වාගේම අමරසිරි මැතිනියටත් නිවන් සුව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

[අ. භා. 4.56]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පළාතේ ජනතාවගේ හදවත් තුළ සුවිශේෂ මතක සටහන් තබලා දකුණු පළාතටත්, රටටත් ඉමහත් සේවයක් ඉටු කරලා අභාවප්‍රාප්ත වෙච්ච -දිවංගත- එම්.එස්. අමරසිරි මැතිතුමන් ගැන ශෝකය පළ කරන අවස්ථාවේ වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීම මගේ බලවත් යුතුකමක් ලෙස මම සලකනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නා පරිදි උගතුන්, බුද්ධිමතුන් ඒ වාගේම කලාකරුවන් ඇතුළු සම්භාවනීය පුරවැසියන් රැසක් බිහි කරපු දකුණේ රමණීය ගම් පියසක් වූ මාපලගමදී 1925 සැප්තැම්බර් 05වන දා ගම්මුලාදැනියකුගේ දරුවකු හැටියට උපත ලැබූ එම්.එස්. අමරසිරි මැතිතුමාට 2007 ජනවාරි 07වන දා මිය යන විට වයස අවුරුදු 82ක් පමණ වුණා.

මලාමුරේ ප්‍රාථමික විද්‍යාලයෙන් හයවන ශ්‍රේණිය දක්වාත්, ඊට පසුව දකුණේ කීර්තිමත් විද්‍යාලයක් වන ගාල්ල ඇලෝසියස් විද්‍යාලයට ඇතුළත්ව ඉංග්‍රීසි මාධ්‍යයෙන් වාණිජ අංශයෙන් උසස් පෙළ දක්වාත් අමරසිරි මැතිතුමා අධ්‍යාපනය ලැබුවා. කීර්තිමත් විදුහලක දීප්තිමත් සිසුවකු ලෙසත්, විදුහලේ පාපන්දු කණ්ඩායමේ සාමාජිකයකු ලෙසත් ක්‍රීඩා කටයුතුවලත් නිරත වෙමින් පාසල් වියේදීම නායකත්ව ගුණ ප්‍රදර්ශනය කරන්නට එතුමා සමත් වුණා. පනහේ දශකයේ මුල් යුගයේදී ළා බාල තරුණයකු ලෙස සමාජ සේවා කටයුතුවලට යොමු වෙමින් ගමේ ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපතිවරයා බවට එතුමා පත් වුණා. 1954 ගම් සභා නියෝජිතයකු හැටියට පත් වෙලා, නාගොඩ ගම් කාර්ය සභාවේ ගම් සභාපතිවරයා ලෙසත් පත් වෙලා එවකට ලංකාවේ හිටපු ළා

බාලම ගම් සභාපතිවරයා හැටියට ක්‍රියා කරන්න එතුමා වාසනාව ලැබුවා. එදා එම්.එස්. අමරසිරි මැතිතුමා සමස්ත ලංකාවේ ගම් සභාපතිවරුන්ගේ සංගමයේ උපසභාපති ධුරය හොබවද්දී එම සංගමයේ සභාපති ලෙස ක්‍රියා කරනු ලැබුවේ දිවංගත එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් විසින් වීමත් විශේෂ කාරණයක් හැටියට අපි දකිනවා.

වර්තමානයේ නාගොඩ ප්‍රාදේශීය සභාව පවත්වා ගෙන යන ගොඩනැඟිල්ල එදා ගම්පතිවරයකු ලෙස එම්.එස්. අමරසිරි මැතිතුමාගේ නායකත්වයෙන් ඉදි කරපු ගොඩනැගිල්ලක්ය කියන එකත් අපි අහලා තිබෙනවා. 1956 බලයට පත් වූ බණ්ඩාරනායක අගමැතිතුමා ප්‍රථම දිවුරුම් කොමසාරිස් තනතුරට අපේ එම්.එස්. අමරසිරි මහතාව දිවයිනටම බලපාන ලෙස පත් කරන්න ක්‍රියා කළා. ගම් සභාපති කාලයේ සුදු අධිරාජ්‍යවාදින්ගේ පාලනයේ තිබුණු කාබිල් වත්ත හරහා ප්‍රදේශවාසින් සමඟ එක් වෙලා මාපලගම ඉඳලා උඩුගම දක්වා පාර කැපීමට අමරසිරි මහත්මයා නායකත්වය දුන්නා. එහි ප්‍රතිඵලයක් හැටියට 84 දෙනකුට විරුද්ධව නඩු පවරන්නට එදා කටයුතු කළා. ඒ නඩුවේ පළමුවැනි විත්තිකාරයා වුණේ ඒ සඳහා නායකත්වය දීපු එම්.එස්. අමරසිරි මැතිතුමායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තරුණ වියේදීම බොහෝ දුර දිග බලලා කටයුතු කිරීමේ සහජ හැකියාවක් එතුමා සතුව තිබුණු අතර අදටත් හිනිදුම ආසනයේ මාපලගමත්, ඔබතුමාගේ ප්‍රදේශයේ බද්දේගම ආසනයේ උඩුගමත් යා කරන ප්‍රධාන මාර්ගය ලෙස ජනතාවට ඉතාම ප්‍රයෝජනවත් පාරක් ඒ කාබිල් වත්ත හරහා කපන්න අමරසිරි මැතිතුමාට පුළුවන්කම ලැබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සේවයට අමතරව අමරසිරි මහතා සමුපකාර ක්ෂේත්‍රයේත් කැපී පෙනෙන දැනුවත් පුද්ගලයකු හැටියට ක්‍රියා කළා.

එතුමා ලංකාවේ හිටපු ඉතාමත් හොඳම සමූපකාරිකයෙක්. සමූපකාර ව්‍යාපාරය ගැන පුළුල් දැනුමක් සහිත අතළොස්සක් වූ පිරිස අතර එතුමා කැපී පෙනෙන චරිතයක් වුණා. සමූපකාර ව්‍යාපාරය ගැන දැනුම වර්ධනය කර ගැනීමට ඊශ්‍රායලය, ඩෙන්මාර්කය වැනි රටවල පුහුණු වැඩසටහන්වලට පවා එතුමා සම්බන්ධ වුණා. සමාජ සේවයත්, සමූපකාර ව්‍යාපාරයෙත් යෙදී පසුව දේශපාලනයට ප්‍රවිෂ්ට වුණු එම්.එස්. අමරසිරි මැතිතුමා 1960 පාර්ලිමේන්තුවට තරග කොට ප්‍රථම වරට හිනිදුම මහජන මන්ත්‍රීවරයා බවට පත් වුණේ මහජන එක්සත් පෙරමුණෙන් තරග කරලායි. ඒ මැතිවරණයට එක්සත් ජාතික පක්ෂයෙනුත් අපේක්ෂකයකු තරග කළා; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙනුත් අපේක්ෂකයකු තරග කළා. නමුත් 1960 මැතිවරණයෙන් හිනිදුම ජයග්‍රහණය කළේ මහජන එක්සත් පෙරමුණෙන් එම්.එස්. අමරසිරි මැතිතුමායි. 1960 අප්‍රේල් 6 වැනි දා තමයි අමරසිරි මැතිතුමාට පාර්ලිමේන්තුවේ මංගල කථාව පවත්වන්නට නියමිතව තිබුණේ. ඒ හවස 2.00ට පමණ. ඒ සඳහා එතුමා සූදානම් වෙද්දී එතුමාගේ ජීවිතයේ ඉතාමත්ම ප්‍රීතිමත් ආරංචියක් එතුමාට අහන්න ලැබුණා. මංගල කථාව පාර්ලිමේන්තුවේ පටන් ගන්න සුළු මොහොතකට පෙර තම කුලුඳුල් පුතණුවන් උපත ලැබුවා කියන ප්‍රීතිමත් පණිවුඩය අමරසිරි මැතිතුමාට අහන්න ලැබුණා. එතුමාගේ ඒ වැඩිමහල් පුතා තමයි අද තම පියාගේ ශෝක ප්‍රකාශයන්ට සවන් දෙමින් කථානායක ගැලරියේ සිටින, 1988 සිට 2000 දක්වා වසර 12ක් මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ලෙස ක්‍රියා කරපු අපේ හිටපු මන්ත්‍රී අධි නීතිඥ උපාලි අමරසිරි මැතිතුමා. 1988 දකුණු පළාත් මහ ඇමතිකමට තරග කිරීමට එම්.එස් අමරසිරි මහතා තීරණය කරලා මේ පාර්ලිමේන්තුවෙන් ඉවත් වන විට හිනිදුම මන්ත්‍රී ධුරයේ පුරප්පාඩුවක් ඇති වුණා. ඒ පුරප්පාඩුව පිරවීම සඳහා එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාණන්ගේ තේරීම වුණේ එම්.එස්. අමරසිරි ඇමතිතුමාගේ වැඩිමහල් පුත්‍රයා වුණු උපාලි අමරසිරි මැතිතුමාවයි.

යුද්ධයක් පවතින වෙලාවක කැබිනට් ඇමතිවරයකු තමන්ගේ දරුවෙකු යුද හමුදාවට යැව්වාය කියන එක අපට ඒ කාලයේ කලාතුරකින්වත් අහන්න ලැබෙන දෙයක් නොවෙයි. ඒ වන විට කැබිනට් ඇමතිවරයකු ලෙස සිටි අමරසිරි මැතිතුමා තමන්ගේ පුතණුවන් ශ්‍රී ලංකා යුද හමුදාවේ නිලධාරියකු ලෙස ක්‍රියාන්විත සේවයට යොමු කළා. ඉන් පසුව විශේෂ කැබිනට් අනුමැතියකින් හමුදා සේවයෙන් ඉවත් කරලා පාර්ලිමේන්තුවට පත් කරගනු ලැබුවා. එම්.එස්. අමරසිරි මැතිතුමාගේ සහ අමරසිරි පවුලේ ජනප්‍රියත්වය කොතෙක්ද කියතොත් එතුමා පත් කළ මන්ත්‍රීවරයකු හැටියට පත් වී ඊ ළඟට එළැඹුණු පාර්ලිමේන්තු මැතිවරණයේ සිය පුතණුවන් ගාලු දිසාවේ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ ප්‍රථම ස්ථානයට මනාප ලබා ගැනීමට සමත් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම්.එස්. අමරසිරි මැතිතුමා විවාහ වුණේ මා නියෝජනය කරන බෙන්තර-ඇල්පිටිය ආසනයේ බෙන්තර සම්භාවනීය පවුලක් වන තෙවරප්පෙරුම පවුලේ දෝන එස්මි තෙවරප්පෙරුම මැතිනිය සමඟයි. පුතණුවන් දෙදෙනෙකුගේ සහ දියණියකගෙන් සෙනෙහබර පියෙකු වූ එතුමා තම දරුවන් තිදෙනාම ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයෙන් උපාධිධාරින් ලෙස පත්වනු දැක අතිශයින් සතුටට පත් වුණු පියෙකු හැටියට අපි ගෞරවයෙන් සිහිපත් කළ යුතුයි. එතුමාගේ වැඩිමහල් පුතා අපේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී උපාලි අමරසිරි මහතා අධිනීතිඥවරයෙක්. එතුමාගේ බාල පුතා ආනන්ද අමරසිරි කටුබැද්ද විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක්. එතුමාගේ එකම දියණිය සුනිමාලි අමරසිරි මහරගම පිළිකා රෝහලේ වෛද්‍යවරියක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දරුවන් තිදෙනාම උගතුන් බවට පත් කළා විතරක් නොවෙයි ඔවුන් තිදෙනාම ශ්‍රී ලංකා යුද හමුදාවේ නිලධාරින් ලෙසද ක්‍රියා කිරීමට එතුමාගේ මඟ පෙන්වීම යටතේ කටයුතු කළා. දියණිය පවා යුද හමුදාවට සම්බන්ධ වෙලා වෛද්‍යවරියක ලෙස වඩමාරච්චි සටනට දායක වුණා.

1960 මහජන එක්සත් පෙරමුණෙන් හිනිදුම මන්ත්‍රීවරයා වූ එතුමා 1965 යළි පාර්ලිමේන්තුවට යොමු වුණේ එක්සත් ජාතික පක්ෂයේ හිනිදුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙස විශිෂ්ට ජයග්‍රහණයක් ලබමිනුයි. 1970 මැතිවරණයෙන් එතුමා පරාජයට පත් වුණා. 1970-77 කාලය තුළ හිනිදුම ආසනය විශිෂ්ට ලෙස ජය ගන්නට පුළුවන් තත්ත්වයෙන් විශාල කැපවීමකින් මනාව සංවිධාන කටයුතු කරපු ආකාරය ජනතාව පක්ෂ භේදයකින් තොරව අදත් අගය කරන හැටි අපට අනන්තවත් අහන්න ලැබිලා තිබෙනවා. ගැමි ජනතාවගේ හදවතට සමීප වීමේ සහජ හැකියාවක් අමරසිරි මැතිතුමාට තිබුණා. ඉතාම නිහතමානී බොහොම නිරහංකාර, චාම් දිවියකට හුරු පුරුදු වූ අමරසිරි මහතා කුමන තනතුරක් දරද්දීත් එක විධියට ජනතාව අතර ප්‍රියමනාප, ගෞරවණීය පුද්ගලයකු හැටියට ජීවත් වුණා. තම ජනතාවගේ අවශ්‍යතා ඉවෙන් මෙන් හඳුනා ගැනීමේ සුවිශේෂ හැකියාවක් එතුමාට තිබුණා. තම ඡන්ද දායකයන්ට පහසුවෙන් ළං වීමටත්, උදවු උපකාර ලබා දීමටත්, ඕනෑම කෙනකුට නෑකම කියා අමතන්නට සහ නම කියා ලෙන්ගතුව කථා කරන්නට එතුමාට පුදුම හැකියාවක් තිබුණා.

1977 එක්සත් ජාතික පක්ෂය අති විශිෂ්ට ජයග්‍රහණයක් ලබා රජයක් පිහිටුවා ලලිත් ඇතුළත්මුදලි මැතිතුමා වෙළෙඳ හා නාවික ඇමති වී ඒ කාලයේ තිබුණු පෝලිම් යුගය පවා නිම කිරීමේ සහ විවෘත ආර්ථිකය හඳුන්වා දීමේ විශිෂ්ට වැඩ කොටස කරනකොට නියෝජ්‍ය ඇමතිවරයා හැටියට ක්‍රියා කළේ අමරසිරි මැතිතුමා යි. 1977 එතුමා ජය ගෙන, හිනිදුම ආසනයේ දහස් ගණනකට රැකියා ලබා දීමට ක්‍රියා කළා. ඉඩම් කට්ටි 4,000ක් පමණ ඉඩම් නොමැති ජනතාවට බෙදා දුන්නා. ප්‍රේමදාස මැතිතුමා සමඟ එක් වෙලා උදාගම් රැසක් හිනිදුම ආසනය තුළ ඇති කරලා, විශාල පිරිසකට නිවාස ලබා දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නා පරිදි 1977 වන විට අපේ පළාතේ කුඩා තේ වතු හිමියන්ට තම දළු ටික දෙන්න ප්‍රමාණවත් තේ කර්මාන්තශාලා නැතිව කුඩා තේ වතු හිමියෝ ගිං ගඟට දළු විසි කරපු කාලයක් තිබුණා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

අමරසිරි මැතිතුමාට පුළුවන් වුණා, හිනිදුම ආසනය තුළ පමණක් දැවැන්ත කර්මාන්තශාලා හතරක් රජයේ වියදමින් ඉදි කර පෙන්වන්නට. ඔබතුමා දන්නා කුරුපනාව, මැදගම, ඉංගල්ගොඩ, සල්විටිගල වැනි දැවැන්ත තේ කර්මාන්තශාලා ඉදි කරන්නට අමරසිරි මැතිතුමාට පුළුවන්කම ලැබුණා.

ලංකාවේ දුෂ්කරම මැතිවරණ කොට්ඨාසවලින් ප්‍රධානම එකක් තමයි හිනිදුම මැතිවරණ කොට්ඨාසය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නියාගම, නාගොඩ, තවලම, නෙළුව ආදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරකින් හිනිදුම ආසනය සමන්විතයි. 1977 වනකොට හිනිදුම ආසනයේ විදුලිය තිබුණේ ඔබතුමාත්, මමත් හොඳින් දන්නා පිටිගල නගරයට පමණයි. ආසියානු සංවර්ධන ආධාර ලබා ගෙන විදුලිය, මාර්ග, පාලම්, බෝක්කු, අලුතෙන් පාසල් ගොඩනැගිලි, දුරකථන පහසුකම් - මේවා- ලබා දුන් නිසා පළාතේ සංවර්ධනයට සුවිශාල මෙහෙවරක් අමරසිරි යුගයේ උදා වුණාය කියන එක රහසක් නොවෙයි.

ලලිත් ඇතුළත්මුදලි ඇමතිතුමා "මහපොළ" ආරම්භ කරද්දී නියෝජ්‍ය ඇමතිවරයා විධියට පළමුවන "මහපොළ" මගේ ගම වන නියාගමදී මැනවින් සංවිධානය කරන්නට අමරසිරි මැතිතුමාට පුළුවන් වුණා. පසු කාලයකදී "මහපොළ" සංවත්සර පවා තම ප්‍රදේශයට ලබා ගෙන ඒවායේ ප්‍රතිලාභ තම ජනතාවට උරුම කර දුන්නා. 1980 දශකයේ මුල් භාගයේ හිනිදුම ආසනයට මහා ගංවතුරක් ආවා. ජනාධිපති, අගමැති උඩු ගුවනින් ගෙන ගිහිල්ලා, හිනිදුමට වෙච්ච අලාභය පෙන්වලා දැවැන්ත ආධාර කන්දරාවක් තම කොට්ඨාසයට ලබා දෙන්නට එතුමාට පුළුවන් වුණා.

1983 වසරේ කැබිනට් සංශෝධනයේ දී ජේ.ආර්. ජයවර්ධන රජයේ වෙළෙඳ හා නාවික කැබිනට් අමාත්‍ය ධුරයෙන් අමරසිරි මැතිතුමා පිදුම් ලැබුවා. පාරිභෝගික කමිටු ඇති කරන්නට එතුමාට පුළුවන්කම ලැබුණා. බඩු හිඟයකින් තොරව සාධාරණ මිලකට බඩු මිල පාලනය කරන්නටත්, කාටූන් චිත්‍ර ශිල්පීන්ගෙන් බේරිලා ආදර්ශවත් වෙළෙඳ ඇමතිවරයකු හැටියට ක්‍රියා කරන හැටිත් අමරසිරි මැතිතුමා අපට පෙන්නුවා. මේ ගරු සභාවේ පක්ෂ විපක්ෂ සියලු දෙනා සමඟ ඉතාම සුහදව ඇසුරු කළා. ඒ වාගේම තමන්ගේ ප්‍රධාන දේශපාලන ප්‍රතිවාදීන් පවා, හිනිදුම ආසනයේ තමන්ගේ ප්‍රතිවාදියා වෙච්ච අධිනීතිඥ හෙන්රි දිසානායක වැනි මන්ත්‍රීවරුන් තමන්ගේ වේදිකාවට අරගෙන ඒ අයගේ නොමඳ සහයෝගය ලබා ගන්නටත් එතුමා සමත් වුණා.

1988 පැවැති භීෂණ කාලයේ පළාත් සභා ක්‍රමය ආරම්භ වෙද්දී කැබිනට් ඇමතිකමද පරිත්‍යාග කරමින් පාර්ලිමේන්තුවෙන් සමු ගෙන, දකුණු පළාත් සභාවේ ප්‍රධාන ඇමතිවරයා හැටියට තරග කරන්නට එතුමා තීරණය කළා. එදා පළාත් සභා ආරම්භ කරද්දී පළාත් සභා පනත පමණක් අතින් අරගෙන දකුණට ගිය අමරසිරි මැතිතුමා, දකුණේ ප්‍රථම මහ ඇමතිවරයා ලෙස තේරී පත් වෙලා, තම සේවය දකුණු පළාතටම විහිදුවන්නට සමත් වුණා. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන දස අවුරුදු සැලැස්ම දකුණට ගෙන ගියේ අමරසිරි මැතිතුමායි. දකුණු පළාතේ මහ ඇමති ලෙස සුවිශේෂ මෙහෙවරක් ඉටු කරන්නට එතුමා සමත් වුණා. කැබිනට් ඇමතිකම අතහැර මහ ඇමති ධුරයට පත් වූ අමරසිරි මැතිතුමාට විශාල පාඩු -අලාභ- රාශියකට මුහුණ දෙන්නට සිදු වුණා. 1988 ප්‍රේමදාස ජනාධිපතිතුමා තේරී පත් වුණු ජනාධිපතිවරණයට පෙර දවසේ තමන්ගේ උපන් නිවස ත්‍රස්තවාදීන් විසින් ගිනිබත් කරලා, අළු දූවිලි බවට පත් කරන හැටි අමරසිරි මැතිතුමා සිය දෑසින් බලා ගත්තා. 1989 ජූනි 07 වැනිදා තමන්ගේ ආදරණීය භාර්යාව තමන්ගේ පෞද්ගලික වත්තකට යමින් සිටියදී ත්‍රස්තවාදීන්ගේ ගොදුරක් බවට පත් වෙලා වෙඩි පහරින් මරණයට පත් වන හැටි එතුමාගේ ඇස් දෙකෙන් බලා ගත්තා.

ඒ සියලුම දුක්ඛ දෝමනස්සයන් විඳ ගනිමින් දකුණේ ජනතාවට අභීතව නායකත්වය දෙන්න අමරසිරි මැතිතුමා සමත් වුණා. කැබිනට් ඇමතිකම්, මහ ඇමතිකම් දැරූ එතුමා 1994 දී පළාත් සභාවෙන් තම පක්ෂය පරාජයට පත් වී, පළාත් සභාවේ විපක්ෂ නායක ධුරය බොහොම නිහතමානීව හොබවමින් පරිණත දේශපාලන නායකත්වය පෙන්නුම් කළා. තමන්ගේ පක්ෂය විපක්ෂයට යන කොටත් ගාලු දිසාවේ ජනතාව අමරසිරි නමට කොපමණ සැලකුවාද කියනවා නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මනාප ලක්ෂය ඉක්මවා ඉහළම ජනතා ප්‍රසාදය ලබා ගන්න සමත් වුණා.

ගම් සභා නියෝජිතයකු, ගම්පතිවරයකු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, නියෝජ්‍ය ඇමතිවරයකු හා කැබිනට් ඇමතිවරයකු, පළාත් ප්‍රධාන ඇමතිවරයකු හා පළාත් විපක්ෂ නායක වැනි තනතුරු දරා කීර්තිමත් දේශපාලනඥයකු වූ අමරසිරි මැතිතුමා චන්ද්‍රිකා කුමාරතුංග හිටපු ජනාධිපතිනියගේ ඇරයුමෙන් 1999 දී ඌව පළාතේ ආණ්ඩුකාර ධුරයටත් පත් වුණා. අදටත් ඕනෑම තරාතිරකම, ඕනෑම වයස් මට්ටමක කෙනකුට එම්.එස්. අමරසිරි චරිතයෙන් බොහෝ දේ ඉගෙන ගැනීමට පුළුවන්කම තිබෙනවා.

එතුමා හැම විටම ඉගෙනීමට මුල් තැන දුන්නා. එතුමා මිය යන තුරුම අධ්‍යාපනය ලබපු කෙනෙක්. මැතිවරණවලින් පැරදුණු කාලවල කළේ ඉගෙන ගන්න එකයි; අධ්‍යාපනය දියුණු කර ගන්න එකයි. වයස අවුරුදු 79දී කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ වයෝ වෘද්ධම ශිෂ්‍යයා වුණේ එම්.එස්. අමරසිරි මැතිතුමායි. අවුරුදු 79ක් වයස වුණාට පස්සේ LLB සමත් වුණා; නීතිවේදී උපාධිය ලබා ගන්න එතුමාට පුළුවන්කම ලැබුණා. ඒ ආදර්ශය සිය දරුවන් තිදෙනාම අදටත් ඉහළින් පිළිපදිනවා. දරුවන්ගේ දරුවන් පවා තම සීයාගේ ආදර්ශය ලබමින් කොළඹ රාජකීය, විශාඛා වැනි විද්‍යාලවල දීප්තිමත් සිසුන් ලෙස අදටත් අධ්‍යාපනය හදාරනවා.

සුරාවෙන්, සූදුවෙන් තොරව බෞද්ධ, දැහැමි ජීවිතයක් ගත කළ අමරසිරි මැතිතුමා එතුමාගේ පාලන කාලයේදී එතුමාගේ බල ප්‍රදේශයේ එකම තැබෑරුමක්වත් විවෘත කරන්නට ඉඩ දුන්නේ නැහැ. මහා සංඝ රත්නය ඉතාම සමීපව ඇසුරු කරමින් ප්‍රදේශයේ පන්සල් දියුණු කිරීමටත්, අලුතින් විහාරස්ථාන පවා ඇති කරන්නත් එතුමාට පුළුවන්කම ලැබුණා. අපවත් වී වදාළ මඩිහේ පඤ්ඤාසීහ නායක හාමුදුරුවෝත් එක්ක එකතු වෙලා, එතුමාගේ නායකත්වයෙන් ඒ ප්‍රදේශයේ අමද්‍යප ව්‍යාපාරය පවා දියත් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතකයි, හාමුදුරුවරුන්ට කොපමණ උදවු කළාද කියා කියනවා නම්, ඔබතුමාත් දන්න, අපවත් වුණු අපේ ගනේගම සරණංකර නායක හාමුදුරුවෝ දවසක් උත්සවයකදී කිව්වා, හාමුදුරු කෙනෙක් මහණ වෙන්න ඕනෑ, නායක උත්සවයක් ගන්න ඕනෑ, ඒ වාගේම අපවත් වන්න ඕනෑ, අමරසිරි මැතිතුමා බලයේ ඉන්න කොටයි කියලා. ඒ තරමටම එතුමා පන්සල්වලට, හාමුදුරුවරුන්ට ලෙන්ගතුව ක්‍රියා කළා.

අමරසිරි මැතිතුමාත් එක්ක මට බොහොම සම්බන්ධකම් තිබුණා. මම කොළඹ රාජකීය විද්‍යාලයේ ශිෂ්‍යයකු වශයෙන් සිටියදී මුල් වතාවට දේශපාලන වේදිකාවකට ගිහින් කථාවක් කළේ හිනිදුම ආසනයේ එම්.එස්. අමරසිරි මැතිතුමාත් සමඟයි කියන එක එතුමාට ගෞරවයක් හැටියට මා අද මතක් කරන්න කැමැතියි. ඒ වෙලාවේ සිට අපට බොහොම සෙනෙහසින් ආශීර්වාද කළා. මා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපති හැටියට ක්‍රියා කරද්දී මට විශාල සහයෝගයක් ලබා දුන්නා. මගේ බාප්පා වන රූපා කරුණාතිලක මැතිතුමා සමඟ යාබද ආසන දෙකේ මන්ත්‍රීවරුන් හැටියටත්, දිස්ත්‍රික්කයේ සමකාලීන ඇමතිවරුන් හැටියටත් අද සිටින දේශපාලනඥයන්ට ආදර්ශයක් ගන්න පුළුවන් විධියට ඉතාමත්ම ලෙන්ගතුකමින් කටයුතු කළා. එතුමා කිසිම මනාප ප්‍රශ්නයක් හෝ වෙන මොනම ප්‍රශ්නයක්වත් ඇති නොවන විධියට ක්‍රියා කරපු ආකාරය තරුණ දේශපාලනඥයන් හැටියට ඔබතුමන්ලාටත්, අපටත් ආදර්ශයට ගන්න පුළුවන්.

එතුමා අපේ ගෙවල්වලට නිතරම යන එන සිරිතක් තිබුණා. මා වැඩිදුර අධ්‍යාපනය සඳහා එංගලන්තයට ගොස් සිටින කාලයේ එතුමා ඇමතිවරයකු හැටියට එංගලන්තයට ආවා නම්, ඒ හැම වෙලාවකම අපව ළඟට ගෙන්වා ගෙන අපත් එක්ක බොහොම සුහදශීලිව ඇසුරු කරන්න එතුමා අමතක කළේ නැහැ. මා මීට වඩා දීර්ඝ කථාවක් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අමරසිරි පවුලේ අඩුව, දේශපාලන ක්ෂේත්‍රයේ නැතිකම අපේ පළාත්වල ජනතාව නිතර කථා කරනවා. අදටත් මා දන්නවා, උපාලි අමරසිරි වැනි මන්ත්‍රීවරයකු දේශපාලන ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වනවාද කියන බලාපොරොත්තුවෙන් විශාල පිරිසක් කථා බහ කරන හැටි.

එම්. එස්. අමරසිරි මැතිතුමාගේ ආදාහනය තිබුණු දවස අපට මතකයි. ඒ දැන් අවුරුදු කිහිපයකට පෙරයි. ඒ වෙලාවේ මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගණයට අතිවිශාල ජනතාවක් පැමිණ ඒ අවමංගල උත්සවයට සහභාගි වුණු හැටිත්, එතුමා වෙනුවෙන් ශෝක වුණු හැටිත් මට මතක් වනවා. එතුමාගේ දරුවන් හා පවුලේ උදවිය එකතු වෙලා හැම අවුරුද්දකම ගුණානුස්මරණ පින්කම කරන කොට, ඒ පළාතේ උදවිය හැටියට අපි ඒවාට සම්බන්ධ වනවා. ඒ හැම දවසකම කෘතවේදී ජනතාව එතුමා වෙනුවෙන් ගරු කරන්නට එක් රොක් වන හැටි අපි සියැසින් දැක තිබෙනවා. එම නිසා රුහුණේ ආදර්ශවත් දේශපාලන නායකත්වයක් ලබා දුන් එම්.එස්. අමරසිරි මැතිතුමන්ගේ අභාවය ගැන අපේ සාතිශය සංවේගය අපි හැම අවස්ථාවකදීම පුද කළා වාගේ මේ ශෝක ජනක අවස්ථාවේදීත් මේ උත්තරීතර සභාවේ එතුමාගේ ආභාසය ලබපු, එතුමාගේ ආශීර්වාදය ලබපු මන්ත්‍රීවරයකු හැටියට මම පෞද්ගලිකව මගේ සාතිශය සංවේගය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ ආදරණීය පුතුන් දෙපොළට සහ ලේලිවරුන් දෙපොළටත්, ඒ වාගේම එතුමාගේ එකම දියණියට සහ බෑණනුවන්ටත්, මුණුබුරු මිණිබිරියන් ඇතුළු පවුලේ සියලු දෙනාටත් අපගේ සංවේගය පළ කරන හැටියට මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපට පියෙක් වගේ ඇසුරු කරන්නට අවස්ථාවක් ලැබුණු, මේ පාර්ලිමේන්තුවේ හැම දෙනාටම ආදර්ශයක් ගන්න පුළුවන් චරිතයක් වුණු, දකුණට මහ මෙහෙවරක් ඉටු කරපු ආදර්ශවත් දේශපාලන චරිතයක් හැටියට අපි ගරු කරන දිවංගත එම්.එස්. අමරසිරි ශ්‍රීමතාණන්ට අමා මහ නිවන් සුව ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 5.16 ]

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දකුණු ලක අභිමානවත් ශ්‍රේෂ්ඨ දේශපාලනඥයෙක් වූ ගරු එම්.එස්. අමරසිරි මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලැබීමත් මගේ භාග්‍යයක් කොට මා සලකනවා. විශේෂයෙන් මා යාන්තම් බහ තෝරන යුගයේ දේශපාලනඥයෙක් ගැන මා දැන ගත්තා නම් ඒ දැන ගත්තේ එම්.එස්. අමරසිරි මැතිතුමා ගැනයි. අපේ පාසල් වියේදී දේශපාලනඥයෙක් හැටියට අපි එතුමා තුළ බොහොම අභිමානවත් ප්‍රතිරූපයක් දැක්කා. පාර්ලිමේන්තු ජීවිතයේ එතුමා දෙවරක් පාර්ලිමේන්තුව නියෝජනය කළාට පසුව තමයි මා උපත ලැබුවේ. ඒ වාගේම මට මතකයි 1991දී නාගොඩ ප්‍රාදේශීය සභාවට මන්ත්‍රීවරයෙක් හැටියට මා පත් වුණු අවස්ථාව. දකුණේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට එතුමා ඒ ප්‍රාදේශීය සභාවට ආවා. අපි දිවුරුම් දුන්නේ එතුමා ඉදිරිපිටදීයි. මොකද, නාගොඩ ගම්කාර්ය සභාවේ සභිකයෙක් හැටියටත්, හිටපු ගම්සභාපතිවරයා හැටියටත් එතුමා අපිත් එක්ක බොහොම ලෙන්ගතු සබඳතාවක් තිබුණා. දශක පහක එතුමාගේ දේශපාලන ජීවිතය පිළිබඳව ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු, සමීප අමාත්‍යවරු සහ සමීප දේශපාලන සගයින් කාරණා රැසක් හෙළි කළා. මා ඒ කාරණා පුන පුනා කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මා විශ්වාස කරන හැටියට එතුමා දකුණේ ජනතාවගේ සමීපතම නෑයා කිව්වොත් මා නිවැරදියි. එතුමා නිවැරදි දැක්මක් තිබිච්ච ලෙන්ගතු ඥාතිවරයෙක්. තමන්ගේ ගමේ ගැමියන්ගේ නිවෙස්වලට ගිහිල්ලා "අයියේ, මල්ලියේ, අක්කේ, නංගියේ" කියලා ආමන්ත්‍රණය කළ දකුණේ එකම දේශපාලනඥයා හැටියට එවකට එතුමා ජනප්‍රිය වුණා. මාපලගම ගමේ ඉපදිලා ගහබඩපත්තුවෙන් බිහි වෙච්ච පළමුවෙනි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වුණු එතුමා ප්‍රධාන අමාත්‍යවරයෙක් හැටියටත් පාර්ලිමේන්තු අමාත්‍යවරයෙක් හැටියටත් කටයුතු කළා. ඒ වාගේම එතුමා දකුණු පළාත් සභාවේ පළමුවෙනි ප්‍රධාන අමාත්‍යවරයා හැටියට හිටපු යුගයේ, ආණ්ඩුවේත් පළාත් සභාවේත් බලය එක්සත් ජාතික පක්ෂයට තිබුණු යුගයේ නාගොඩ ප්‍රාදේශීය සභාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ කණ්ඩායම ජයග්‍රහණය කරපු වෙලාවේ එතුමා අපට ආශීර්වාද කළා. අපට සහාය ලබා දුන්නා. "මගේ ගමේ මගේ ගම් සභාවේ නියෝජිතයෝ හැටියට වැඩ කරන්න" කියලා එතුමා නිරතුරුවම ප්‍රකාශ කළා.

එතුමාගේ ශ්‍රේෂ්ඨ දේශපාලන ගමන් මඟ තුළ හිනිදුම ආසනය කියන දුෂ්කර ආසනයේ දැවැන්ත සංවර්ධනයක් කෙරුණා. අදටත් ඒ ආසනයේ විශාල දුෂ්කරතා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ සිටින වර්තමාන ගරු මන්ත්‍රීතුමන්ලාටත් ගිහිල්ලා බලන්න තරම් වටිනා ආසනයක් හිනිදුම ආසනය.

එවකට හිනිදුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වශයෙන් පත් වුණාම මහා දුෂ්කර ක්‍රියාවක් එතුමාට කරන්න තිබුණා. ආසනයේ සියයට දෙකක් පමණ වන අත්‍යවශ්‍ය තැනකට තමයි එවකට විදුලිය තිබුණේ. එවැනි ප්‍රදේශයකට එතුමා ශ්‍රේෂ්ඨ කාර්ය භාරයක් ඉෂ්ට කළා.

මගේ කුඩා අවධියේදී මට මතකයි, ගහබඩපත්තුව ශාසනාරක්ෂක බල මණ්ඩලයේ කඨික තරගාවලියේ පහේ පන්තියේ පළමුවැනියා හැටියට පත් වුණු දවසේ පළමුවැනි වතාවට අමාත්‍යවරයෙකු ඉන්න රැස්වීමක කථා කරන්න මට සිද්ධ වුණා. දිස්ත්‍රික්කයේ ඉන්න ප්‍රධානම දේශපාලනඥයා හැටියට ගරු එම්.එස්. අමරසිරි අමාත්‍යතුමා ඒ රැස්වීමේ මූලාසනය ගන්නා විට පහේ පන්තියේ ශිෂ්‍යයෙක් හැටියට ඒ සභාව ආමන්ත්‍රණය කරන්න මට අවස්ථාව ලැබුණා.

අමරසිරි මැතිතුමා දේශපාලනඥයකු හැටියට අපට නිතර අවවාද අනුශාසනා ලබා දුන්නා. එතුමා කිව්වා, "මම ජනාධිපතිවරු හතර දෙනෙක් යටතේ බොහොම සාර්ථකව වැඩ කළා. ඒක එච්චර ලෙහෙසි කාරණයක් නොවෙයි" කියා. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා යටතේ නියෝජ්‍ය අමාත්‍යවරයෙක් සහ අමාත්‍යවරයෙක් හැටියටත්, ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා යටතේ ප්‍රධාන අමාත්‍යවරයෙක් හැටියටත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ යුගයේ ආණ්ඩුකාරවරයෙක් හැටියටත්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ උපදේශකවරයෙක් හැටියටත් ජනාධිපතිවරු හතර දෙනෙක් යටතේ ඒ කටයුතු නිවැරැදිව ඉටු කරමින් එතුමා මහජන සේවය සිදු කළා.

මම විශ්වාසයෙන් සිහිපත් කරනවා, අමරසිරි මැතිතුමා දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය ධුරය හොබවන්නට 1993 පළාත් සභා මැතිවරණයට එනකොට මම එතුමාට විරුද්ධව අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා ප්‍රධාන ඇමති පුටුවේ වාඩි කරන්න කැප වුණු බව. අමරසිරි මැතිතුමා පළාත් සභාවේ විපක්ෂ නායක ධුරයට පත් වුණා. ඊළඟ අවස්ථාව වන කොට රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා යටතේ එතුමාට නාම යෝජනා ලැබුණේ නැහැ. නමුත් එතුමා පාට වෙනස් කරලා ඡන්දය ඉල්ලන්න චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය ළඟට ගියේ නැහැ. එතුමා බොහොම ගෞරවණීය විධියට මාපලගම නිවසට ඇවිල්ලා ගමේ ඉඳගෙන ජනතාව සමඟ සහයෝගයෙන් කටයුතු කළා. නාගොඩ ප්‍රාදේශීය

[ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා]

සභාව ඉස්සරහින් යනකොට එතුමා ඒ ස්ථානයට ගොඩ වෙලා මගේ පරණ තැන කියලා බලා යන්න අමතක කළේ නැහැ. එතුමා මාපලගම සිටින දිනයක් තිබුණා. සෙනසුරාදා දිනය අනිවාර්යයෙන් එතුමා ගමේ ගත කළේ. අප ඒ නිවසට ගියාම හකුරු කැල්ලක් එක්ක කහට කෝප්පයක් දෙන්න එතුමා අමතක කළේ නැහැ. ඒ ලෙන්ගතුකම නිරතුරුව එතුමා ළඟ තිබුණා.

ඉන් අනතුරුව එතුමා ආණ්ඩුකාරවරයෙක් හැටියට කටයුතු කළා. මහින්ද රාජපක්ෂ මැතිතුමා පළමුවැනි වතාවට ජනාධිපති ධුරයට පත් වුණු ඒ මැතිවරණ සටනේදී මාපලගම මැතිවරණ වේදිකාවට එතුමා ආවේ "ජීවිතයට නොකරන වැඩක් මම මේ කරන්නේ. නමුත් මේ වෙලාවේ මගේ යුතුකම සහ වගකීම ඉටු කරන්න ඕනෑ" කියලායි. එතුමා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් දේශපාලනය කරපු කෙනෙක්. තමන්ගේ නිජභූමිය වන මාපලගම නගරයේදී එතුමා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් අපිත් එක්ක අත් වැල් බැඳ ගත්තා. මම විශ්වාස කරනවා එතුමාට බොහොම හොඳ නිවැරදි දැක්මක් තිබුණා කියලා. ඒ වාගේම එතුමා ලැබුණු තනතුරේ ගෞරවය ආරක්ෂා වන විධියට කැප වීමෙන් කටයුතු කළා. එතුමා වංචාව, දූෂණය, හොරකම ඉගෙන නොගත්, අපට ආදර්ශයට ගන්නට පුළුවන් වටිනා ශ්‍රේෂ්ඨ දේශපාලනඥයෙක්. ප්‍රධාන අමාත්‍යවරයා හැටියට කටයුතු කරද්දී ගාල්ල නගරයේදී එතුමාගේ මහජන දිනය ආරම්භ වුණේ උදේ හතරටයි. එතුමාගේ මහජන දිනයට ගාල්ල බස් නැවතුම් පොළ දක්වා දිග පෝලිමක් - පෙරහැරක්- තිබෙනවා.

සුවිශේෂී හේතු කාරණා කීපයක් නිසා ගාල්ල දිස්ත්‍රික්කයේ අපේ මන්ත්‍රීතුමන්ලාට, අපේ අමාත්‍යතුමන්ලාට, ජනතාව අතර හිටපු ජනතාවට සමීප වෙච්ච ඒ ශ්‍රේෂ්ඨ දේශපාලන නායකයාණන් වෙනුවෙන් අද මේ අවස්ථාව නියෝජනය කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ සියලු දෙනා මාව දැනුවත් කළා, අද දවස නැකැත් දිනයක් නිසා ඒ අයට ඒ කටයුතුවලට සම්බන්ධ වීමට තිබෙන නිසා ඒ සියලු දෙනාම නියෝජනය කරලා ශෝකය ප්‍රකාශ කරන ලෙසට. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මූලාසනය දරන මේ වෙලාවේදී ඔබතුමාටත් ශෝකය ප්‍රකාශ කිරීමේ අවස්ථාව ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා වෙනුවෙන් සහ සමස්ත ගාල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන්ම අපේ සංවේගය එම පවුලට හිමි කරන්න ඕනෑ.

එතුමා කළ ඒ මෙහෙවර ඉස්සරහට ගෙන යන්න කැප වෙන වග කීම, යුතුකම හෙට දවසේ අපට තිබෙනවා. එතුමාට එක වතාවක් සිර බත් කන්න සිදු වුණා. එනම්, මාපලගම සහ උඩුගම -මගේ ගම- යා කරන මාර්ගය කැපීමේදී එදා අධිරාජ්‍යවාදී වතු හිමියන් ගත් ක්‍රියා මාර්ගයක් නිසා එතුමාට සිර භාරයට පත් වෙන්න සිද්ධ වුණා. ඒ වාගේම හිනිදුම් පත්තුවේ, හිනිදුම ආසනයේ හැම ගමකම මළ ගමකට පුළුවන් හැම මොහොතකම සහභාගි වෙන්න එතුමා කැප වුණා. භීෂණ යුගයේ ඒ භීෂණයට මුහුණ දෙමින් කටයුතු කළා. එක් අවස්ථාවක මට මතකයි police uniform එක ඇඳගෙන police jeep එකක නැඟලා ගිහිල්ලා තමන්ගේ පාක්ෂිකයාගේ, හිතවතාගේ, ඥාතියාගේ මළ ගෙදරට ගොඩ වෙලා එන්න තරම් එතුමා කැප වුණු ආකාරය. ඒ යුගයේ ඒ භීෂණයට මුහුණ දෙමින් එතුමා සාර්ථක පාලනයකට උරුමකම් කිව්වා. ඒ යුගයේ එතුමාගේ ජ්‍යෙෂ්ඨ පුතණුවන් වන ගරු උපාලි අමරසිරි මැතිතුමාගේ -පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීතුමාගේ දේශපාලනයට පැමිණීම ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ මහා විශාල සතුටට කාරණයක් වුණා. එම්.එස්. අමරසිරි කියන ශ්‍රේෂ්ඨ යුග පුරුෂයා ගෙන ගිහිපු යෝධ ජනතා මෙහෙවර වාගේම නිහතමානී සහ අවංක දේශපාලන වැඩ පිළිවෙළක් ගරු උපාලි අමරසිරි මැතිතුමාගෙන් ජනතාව බලාපොරොත්තු වුණා. එතුමා ඒ වැඩ පිළිවෙළ සාර්ථකව දියත් කරලා දේශපාලනයෙන් සමු ගත්තා.

ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා කිව්වා වාගේ, ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න අමාත්‍යතුමා කිව්වා වාගේ එතුමන්ලා දැකපු දේ ඊට වසර 10කට කලින් දැකපු ශ්‍රේෂ්ඨ දේශපාලනඥයා ගරු එම්.එස්. අමරසිරි මැතිතුමාය කියන එකයි මගේ විශ්වාසය. ඒ අඩි පාරේ යන පුතකු හැටියට එදා තිබුණු අඩු පාඩු දැකලා ගරු උපාලි අමරසිරි මැතිතුමා 1994දීම තරග නොකර දේශපාලනයෙන් සමු ගත්තා. මා විශ්වාස කරනවා හෙට දවසේත් ගරු එම්.එස්. අමරසිරි මැතිතුමා නැති පාළුව, තනිකම ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට තිබෙනවා කියා. ඒ ශ්‍රේෂ්ඨ වැඩ පිළිවෙළ, කැප වීම අඩු පාඩුවක් විධියට අද මෙන්ම හෙට දවසේත් තිබෙනවා. ඒ සඳහා ඒ පවුලෙන් අයෙකු දේශපාලනයට ඒවිය කියන බලාපොරොත්තුව අහිංසක ජනතා හදවත් තුළ අදත් තිබෙනවා. ඒ ජනතාව සියලු දෙනා එය බලාපොරොත්තු වන බව එතුමාට කරන ගෞරවයක් හැටියට මා මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. එතුමා අපට ආදර්ශවත් දේශපාලන ගමනකට හොඳ චරිතාපදානයක් වන, අපට ආදර්ශවත් වැඩ කොටසකට හොඳ චරිතාපදානයක් වන දේශපාලනඥයකු වන අතර එතුමා පටන් ගත්ත දේශපාලන මෙහෙවර ජීවිතයේ අවසාන මොහොත දක්වා නොපිරිහෙළා ඉටු කරන්න කැප වුණු බව මා මතක් කරන්න ඕනෑ. එතුමා බලයේ ඉන්න විට අමාත්‍යවරයෙක් හැටියට ඉටු කරපු මෙහෙවර වාගේම එතුමා බලයේ නැති වෙලාවේත් අපට "මෙන්න මේ ආකාරයෙන් ඉටු කරන්න කැප වෙන්න" කියන අවවාද අනුශාසනා දීපු ශ්‍රේෂ්ඨ දේශපාලනඥයකු ලෙස හඳුන්වන්න පුළුවන්. දකුණු ලක හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයෙක්, කැබිනට් අමාත්‍යවරයෙක්, ප්‍රධාන අමාත්‍යවරයෙක්, ආණ්ඩුකාරවරයෙක් වාගේම ජනාධිපති උපදේශකවරයෙක් වුණු, ගහබඩ පත්තුවෙන් බිහි වුණු එතරම් නිර්මල දේශපාලනයකට උරුමකම් කියන, එතරම් දීර්ඝ දේශපාලනයක් කරපු තවත් නායකයෙක් තවමත් බිහි වෙලා නැහැ. අන්න ඒ සුවිශේෂී ගුණාංග සහ කැපවීම මා මේ මොහොතේ සිහිපත් කරමින් ගරු එම්.එස්. අමරසිරි මැතිතුමාට අපි අදහන ආගම අනුව සසර කෙළවර අමා මහ නිවන් මඟ ලබා ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මී ළඟට ගරු අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා. ඔබතුමා ඉතාම කෙටියෙන් කථා කරයි කියා බලාපොරොත්තු වනවා.

[අ. භා. 5.31]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කෙටියෙන් කථා කරන්නම්. කෙටියෙන් කථා කරලා වැඩිය පුරුද්දක් නැහැ. ගාලු ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා එතුමා පිළිබඳව, එතුමාගේ ක්‍රියාකාරකම්, සේවාවන්, පරිත්‍යාගයන් සහ නායකත්වයන් පිළිබඳව දීර්ඝ ලෙස කථා කරන්නට යෙදුණා. මොකද, එතුමන්ලා තමයි ඒ උපන් ප්‍රදේශයේ තත්ත්වය හොඳට දැකලා වටහා ගෙන තිබෙන්නේ.

මම අමරසිරි මැතිතුමාව ආශ්‍රය කරන්න පටන් ගත්තේ මම බොහොම තරුණ කාලයේයි. එතුමා ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කරමින්, දකුණු පළාතේ ලංකා වතු කම්කරු සමිතියේ මෙහෙයුම්කරු හැටියට වැඩ කරන්නට යෙදුණා. එතුමා නීල් ද අල්විස් කියන දේශපාලනඥයා සමඟ -එතුමා බද්දේගම නියෝජනය කළා- බොහොම කිට්ටුවෙන් කම්කරු සමිති ව්‍යාපාරය, වෘත්තීය සමිති ව්‍යාපාරය සහ පීඩිත ජනතාව, වැඩ

කරන ජනතාව සහ දුප්පත් ජනතාව වෙනුවෙන් හැඟීමකින්, ආදරයකින් ඒ සේවාව කරන්නට යෙදුණා. එසේ සිටින විට එතුමා සමසමාජ පක්ෂයෙන් තරග කරන්න නාම යෝජනා ඉල්ලුවා. මත භේදයන් නිසා ඒ අවස්ථාවේ ලැබුණේ නැහැ. ඒ නිසා ඒ අවස්ථාවේදී එතුමා මහජන එක්සත් පෙරමුණෙන් තරග කරන්නට යෙදුණා. ඒ අනුව එතුමා ඒ දේශපාලන ගමන ඉදිරියට ගිහිල්ලා සාර්ථක ලෙස ජනතාවත් සමඟ, ජනතාව විසින් කරන වැඩවලට නායකත්වය දෙමින් මහා සේවාවක් ඉෂ්ට කරන්නට යෙදුණා. බොහොම නිරහංකාර, නිහතමානී, ඉවසන සුළු, ජනතාව වෙනුවෙන් කැපවීමෙන් සේවය කළ නායකයෙකු හැටියට අපි එතුමා අගය කරනවා. එතුමා ජනතාවාදී නායකයෙක් වූ නිසා, ජනතාව සමඟ සිටිය කෙනෙක් නිසා, තමන්ගේ ජනතාව තමන්ට නැතුවම බැරි ලෙස ආශ්‍රය කළ නිසා එතුමා දේශපාලන වෙනස්කම් ඇතිව පක්ෂ මාරු කළත්, ඒවා නොවෙයි ජනතාව බැලුවේ. පක්ෂයට වඩා මේ පුද්ගලයා -අමරසිරි මැතිතුමා- ගැන පෞද්ගලිකව සලකන පිළිගැනීමක් එතුමා වටා ගොනු කර ගෙන තිබුණා. ඒ අනුව එතුමා ඒ සෑම තැනකින්ම ඉදිරි ගමන සාර්ථක කර ගන්න යෙදුණා. අවසානයේ එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වෙලා එතුමාගේ දේශපාලන ගමන ගෙන ගියා. එතුමා ප්‍රාදේශීය සභාව, ගම් සභාව, පළාත් සභාව සහ ඊ ළඟට පාර්ලිමේන්තුව වාගේ සෑම තැනකම කළ යුතු සෑම දේශපාලනයකම අත් දැකීම් ලබා ගත්ත පරිණත දේශපාලනඥයෙක්. ඒ සෑම තැනකම තමන්ට පැවරුණ කාර්යය බොහොම සාර්ථක ලෙස කරන්න එතුමාට මහා හැකියාවක් ඒ පරිණතභාවය නිසා ලැබුණා. අපි මේ අවස්ථාවේදී එතුමාගේ පවුලේ අය වෙත අපේ කනගාටුව, ශෝකය පළ කරමින් එතුමාට අජරාමර නිවන් සැප අත් වේවායි ප්‍රාර්ථනා කරමින් මාගේ කථාව මින් අවසාන කරනවා.

[අ. භා. 5.35 ]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම්.එස්. අමරසිරි මැතිතුමාත්, ඒ වාගේම නිශ්ශංක විජයරත්න මැතිතුමාත් කියන්නේ මේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසයේ දැවැන්ත දේශපාලන චරිත දෙකක්.

**නියෝජ්‍ය කථානායකතුමා**

(பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Deputy Speaker)

ශෝක යෝජනා දෙක ගැනම එක වර කථා කරන්නේ නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

මේ පාර්ලිමේන්තුවටත්, රටටත් විශාල සේවාවක් කළ ආදර්ශවත් චරිත දෙකක් ගැන අපි කථා කළ යුතුයි. නමුත් මම විශ්වාස කරන්නේ නැහැ, ඒ ශෝක යෝජනා දෙක ගැනම එකට කථා කළ යුතුයි කියලා. ඒ වරද අද පාර්ලිමේන්තුවේදී සිද්ධ වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෙසේ නමුත් අමරසිරි මැතිතුමාගේ චරිතය මට ළඟින් ඇසුරු කරන්නට ලැබුණේ ඌව පළාතේ ආණ්ඩුකාරයා හැටියටයි.

නමුත් ඊට කලින් 1989 දී පාර්ලිමේන්තුවට ආ කෙනකු හැටියට මට එතුමාගේ දයාබර පුතණුවන් වන උපාලි අමරසිරි මැතිතුමා ආශ්‍රය කරන්න අවස්ථාව ලැබුණා. බොහොම නිරහංකාර ඉතා ගුණ යහපත් තරුණයකු හැටියට එදා අපි එතුමා ඇසුරු කළා. ඒ අතීත මතකය අපේ හදවත්වල දැනටත් රැඳී තිබෙනවා.

මෙතැනදී ගරු එම්.එස්. අමරසිරි මැතිතුමා ගැන දීර්ඝ විස්තර කථා කළා. එහෙම කථා කළ හැකි අවස්ථාවක් මට නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, මම හෙට උදේ දහය වන විට ඉඟිනියාගල සිටිය යුතුයි. මෙතෙක් වෙලා බලා සිටියේ මේ යුතුකම ඉටු කිරීම සඳහායි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහජන නියෝජිතයකු හැටියට 2001 වර්ෂයේ මා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන අවස්ථාවේ රටේ ජනාධිපති ධුරය පොදු ජන එක්සත් පෙරමුණටත්, පාර්ලිමේන්තුවේ බලය එක්සත් ජාතික පක්ෂයටත් තිබුණේ. එවැනි යුගයක එම්.එස්. අමරසිරි මැතිතුමා ආණ්ඩුකාරවරයා හැටියට ඌව පළාතේ කටයුතු කළා. එදා මට වග කීමක් පැවරුණා, මේ රටේ ජනාධිපතිනියගේ රැස්වීමක් බිබිල ආසනයේ පවත්වන්න. එහිදී එල්ල වෙච්ච අභියෝගවලදී අමරසිරි මැතිතුමා බිබිලේ මගේ නිවසට, මගේ කාර්යාලයට ඇවිල්ලා මගේ පුටුවේ වාඩි වෙලා මා මෙහෙයවපු හැටි සිහිපත් කළ යුතුයි. දේශපාලන තීක්ෂණ බුද්ධිය ගැන මා එතුමාගෙන් ගුණාංග රාශියක් ඉගෙන ගත්තා. ඉන් පසුව ඌව පළාතේ ප්‍රධාන ඇමතිවරයා හැටියට කටයුතු කරන්න මට අවස්ථාව ලැබුණා. මම විශ්වාස කරනවා, එම්.එස්. අමරසිරි මැතිතුමාගෙන් ලැබුණු ඒ අවවාද අනුශාසනා අනුව කටයුතු කරපු නිසා තමයි මට ඒ ගමන එන්න පුළුවන්කම ලැබුණේ කියලා.

අපි දකිනවා එතුමාගේ දේශපාලන චරිතය. එතුමා මේ රටේ සටන්කාමී වාමාංශික ව්‍යාපාරයෙන් දේශපාලනය ආරම්භ කරලා, ඉන් පසුව එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වෙලා, එතැනින් නොනැවතී ජනතාවගේ ජනමතයට ගරු කරමින් එවකට පැවැති පොදුජන එක්සත් පෙරමුණු රජය සමඟ එකතු වෙලා ඌව පළාතේ ආණ්ඩුකාර ධුරයටත්, ජනාධිපති උපදේශක ධුරයටත් පත් වුණා. ඒ එතුමා ගම් සභාවේ ඉඳලා ආපු ගමන. එතුමා විශාල සේවාවක් මේ රටට කළා. ඒ වාගේම එතුමා ලොකු ආදර්ශයක් දුන්නා. ඒ ආදර්ශය තමයි, තමන්ගේ ජීවිත කාලයේ අවසාන භාගයේදී වුණත් අධ්‍යාපනයෙන්, ඉගෙනීමෙන් සමත්කම් දක්වන්න පුළුවන් කියන වටිනා අවවාදය හා අනුශාසනාව මේ රටේ සිසු පරපුරේ සෑම දරුවෙකුටම, සෑම දේශපාලනඥයකුටම භාවිතයෙන් ලබා දීලා තිබෙන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මීට වඩා දීර්ඝ කාලයක් ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. එතුමාට ස්තුති කළ යුතු තවත් කාරණාවක් තිබෙනවා. බලය බෙදීම සම්බන්ධයෙන් එතුමාගේ මතවාදය මේ රටේ පතුරුවන්න, පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන්න භීෂණ සමයේදී වුවත් එතුමා කරපු කැප කිරීම අපි අගය කළ යුතුයි කියා මා විශ්වාස කරනවා. එසේ විශ්වාස කරමින් එතුමාටත් එතුමාගේ පවුලේ සියලු දෙනාටත් අප පක්ෂයේ ශෝකයත්, අප පවුලේ ශෝකයත් ප්‍රකාශ කරන අතර, එතුමාට අමා මහ නිවන් සුව අත් වේවායි ප්‍රාර්ථනා කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**

(பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Deputy Speaker)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.එස්. අමරසිරි මැතිතුමාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනා අනුමත කරමින් මමද ඒ සමඟ එකතු වීමට කැමැත්තෙමි.

එතුමාගේ අවවාද අනුශාසනා ලබමින් දේශපාලනයට පිවිසි කෙනකු හැටියට, එතුමාගේ පවුලේ ඥාතිවරයකු හැටියට, එම

[ගරු නියෝජ්‍ය කථානායකතුමා]

පවුලේ අය ඉතා ළඟින් ආශ්‍රය කරන කෙනකු හැටියට මගේ පෞද්ගලික ශෝකයත් එතුමා වෙනුවෙන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපත් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට මම නියෝග කරමි.

Order, please! Mr. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR ] *took the Chair.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Dinesh Gunawardena, you may now move the next Vote of Condolence.

## ශෝක ප්‍රකාශය : ගරු ආචාර්ය නිශ්ශංක විජයරත්න මහතා
## அனுதாபத் தீர்மானம்: மாண்புமிகு கலாநிதி நிஸ்ஸங்க விஜயரத்ன
## VOTE OF CONDOLENCE : HON. (DR.) NISSANKA WIJEYERATNE

[අ. භා. 5.41 ]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැදිගම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආචාර්ය නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව මම ඉදිරිපත් කරමි.

වසර ගණනාවක් කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් දැදිගම මැතිවරණ කොට්ඨාසයේ පොදු මහජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන්ද, අමාත්‍යවරයකු වශයෙන්ද මෙම උත්තරීතර සභාව ශෝභාමත් කළා වාගේම, සිවිල් නිලධාරියකු මෙන්ම මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ තනතුරද හෙබ වූ ආචාර්ය නිශ්ශංක පරාක්‍රම විජයරත්න මැතිතුමා පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීමටයි මා මෙම අවස්ථාවේ දී නැඟී සිටින්නේ.

නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ධුරය ඉසිලූ ඩී.ඇස්. සේනානායක මැතිතුමාගේ දෙවැනි කැබිනට් මණ්ඩලයේ ස්වදේශ කටයුතු අමාත්‍ය තනතුරත්, බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් තනතුරත් හෙබ වූ ශ්‍රීමත් එඩ්වින් විජයරත්න මැතිතුමාගේත්, ලීලාවතී පෙතියාගොඩ මැතිනියගේත් ජ්‍යෙෂ්ඨ පුත්‍ර රත්නය ලෙස 1924 වසරේ ජුනි මස 14 වැනි දින නිශ්ශංක විජයරත්න මැතිඳා මොලොව එළිය දුටුවේය. හිටපු තානාපතිවරයකු වූ අධිනීතිඥ තිස්ස විජයරත්න සහ දොස්තර කුඩා විජයරත්න එතුමාගේ දයාබර සහෝදරයන් දෙදෙනා විය.

කොළඹ රාජකීය විද්‍යාලයෙන් හා ඇලෙක්සැන්ඩ්‍රා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද විජයරත්න මහතා එහි දී ශිෂ්‍යයකු වශයෙන් තමන් තුළ පැවති සුවිශේෂ දක්ෂතාවන් ඉතා හොඳින් පෙන්නුම් කළේ ය. කොළඹ විශ්වවිද්‍යාලයෙන් වැඩිදුර අධ්‍යාපනය ලද එතුමා ගෞරව උපාධියක් ලබා ගනිමින් සිය අධ්‍යාපන කටයුතු නිමාවට පත් කළේ ය. 1954 වර්ෂයේ දී නීටා දුල්ලෑව මෙනෙවිය සමග අතිනත ගත් විජයරත්න මහතා එම විවාහයෙන් දරුවන් පස් දෙනෙකු මෙලොවට දායාද කළේය. හිටපු දියවඩන නිලමේ නෙරංජන් විජයරත්න, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හා අමාත්‍ය මනෝද විජයරත්න, හිටපු පළාත් සභා මන්ත්‍රිනී අනුරාධා දුල්ලෑව, නිශාංගනී හුලංගමුව සහ නැසී ගිය නීතිඥ ලංකේෂ් විජයරත්න එම දූ දරුවන් ය. ඒ ගෞරවණීය ආඩම්බර පියාට, ඒ හා සමාන ආඩම්බර දරුවන් අපේ රටට ඇති කරලීමේ භාග්‍යය ද හිමි විය. තමාගේ ජීවිත කාලය තුළ තම දරුවන් දියවඩන නිලමේ තනතුරටත්, මන්ත්‍රීවරු, අමාත්‍යවරු බවටත් පත් වීමේ සතුට දැක බලා ගැනීමට එතුමාට හැකි විය.

1954 දී සිවිල් සේවා විභාගය සමත් වූ එතුමා නියෝජ්‍ය ආගමන හා විගමන පාලක වශයෙන් තම රාජකාරි ජීවිතය ආරම්භ කළේ ය. ඉන් අනතුරුව 1956 වසරේදී ගාල්ලේ සහකාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් කටයුතු භාර ගත් විජයරත්න මහතා 1958 දී අනුරාධපුරයේ මහ දිසාපති වශයෙන් ක්‍රියා කරමින් අනුරාධපුර පූජා නගරය පිහිටුවාලීමෙහි ලා සුවිශේෂ කාර්ය භාරයක් ඉටු කළේ ය. නගරයේ ඓතිහාසික වැදගත්කම සුරක්ෂිත වන අන්දමින් මාර්ග වැඩි දියුණු කරමින් යටිතල පහසුකම් නංවාලීමට ක්‍රියා කළ එතුමා අනුරාධපුර ගුවන් තොටුපොළ ඉදි කරවීමේ දී ද, සුවිශේෂ දායකත්වයක් සැපයුවේය. පූජා නගරය තුළ ආගමික සහජීවනය වඩා වර්ධනය වන අයුරින් කටයුතු කළ එතුමා වන්දනාකරුවන් සඳහා විශ්‍රාම ශාලා ගණනාවක්ම ඇති කරවීමටද පියවර ගත් අතර, අද ද ඒවා ජීවමානව මුළු රටම භුක්ති විඳියි. අනුරාධපුර කෞතුකාගාරය ඇරඹීමට ද, සංස්කෘතිකමය වටිනාකමක් ඇති ආයතන රැසක් පිහිටුවාලීමට ද එතුමා කටයුතු කළේ ය. මහ දිසාපතිවරයකු හැටියට එතුමා අතින් සිදු වූ සුවිශේෂ සේවාව ලක් ඉතිහාසයේ අමතක කළ නොහැකි ලෙස සටහන් වනවා ඇත. අනුරාධපුරය අපේ රටේ අභිමානයයි. සිතියම් නොමැති කලක ඒ අභිමානය යළිත් ගොඩ නැඟීමට මහ දිසාපතිවරයා හැටියට ඉදිරිපත් වූ ඔහු ඉටු කළ මෙහෙය අප රටට අභිමානයක්. එය ඉටු කළ ඒ දිසාපතිතුමා සැබවින්ම සැලකිය යුත්තේ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යකු හැටියටයි. එදා එතුමා එයට මැදිහත් නොවන්නට සමහරවිට එය ඉටු වන්නට කල් යනවාට කිසිදු සැකයක් නැති බව සටහන් කරමි.

අනතුරුව 1962 දක්වා යාපනයේ මහ දිසාපති ධුරය දරමින් සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා අතර ඉතා ජනප්‍රියත්වයට පත් වූයේ, කවරකුට වුවද එකසේ සාධාරණත්වය ඉටු කළ බැවිනි. 1965 වර්ෂයේ ප්‍රවෘත්ති හා ගුවන්විදුලි අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙසත්, 1970 දී සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙසත් කටයුතු කළ විජයරත්න මහතා විදේශීය සංචාරකයන්ගේ හා ආයතනවල දායකත්වය ලබමින් මධ්‍යම සංස්කෘතික අරමුදලක් ඇති කර එම මුදල් පුණ්‍ය කටයුතු සඳහා යෙදවීමට පියවර ගත්තේය. 1974 වර්ෂයේදී ආයුර්වේද සංස්ථාවේ සභාපති වශයෙන්ද ක්‍රියා කළ එතුමා සිවිල් සේවකයකු වශයෙන් රජයේ සේවයෙන් විශ්‍රාම ලබනා තෙක් විවිධ තනතුරු ගණනාවක් හොබවමින් මහජන සේවාවේ නියැලීමේ භාග්‍යය උදා කර ගෙන තිබිණි.

1975 වර්ෂයේදී සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ බඳු වූ ශ්‍රී දළ දා මාළිගාවේ දියවඩන නිළමේ වශයෙන් තෝරා පත් කර ගැනීමෙන් අනතුරුව, එම ධුරයේ වගකීම් සියතට ගනිමින් ශ්‍රී දළ දා වහන්සේ උදෙසා පැවැත්වෙන සියලු වතාවත් නොපිරිහෙලා ඉටු කළ අතර, ඓතිහාසික කන්ද උඩරට වාර්ෂිකව පැවැත්වෙන ඇසළ පෙරහැර, සංස්කෘතික දායාදයන් වැඩි කරමින් නව අංග රැසක් එක්කරමින් අත්‍යාලංකාර අයුරින් පැවැත්වීමට ඉමහත් කැපවීමකින් යුතුව දුන් නායකත්වය අපට කිසි දිනක අමතක කළ නොහැක. එතුමා 1985 දී එම තනතුරෙන් විශ්‍රාම ලැබුවේය.

එම කාලසීමාව ඇතුළත දළ දා මාළිගාවේ තත්ත්වය උසස් අන්දමින් පවත්වා ගෙන ගිය එතුමා මාළිගය ඇතුළත ප්‍රතිසංස්කරණ කරවීමටද පියවර ගත්තේය. පෙරහැරේ සුරක්ෂිතභාවය උදෙසා අරමුදලක් ඇති කරලීමට මුල් වූ විජයරත්න මැතිඳා එතෙක් සාම්ප්‍රදායික තනතුරක්ව පැවැති දියවඩන නිළමේ තනතුර අතීතයේ සිට පැවත ආ වත් පිළිවෙත් ආරක්ෂා කරමින් යුගයට ගැළපෙන අයුරින් පෝෂණය කොට ප්‍රතිනිර්මාණය කළේ ජාත්‍යන්තර වශයෙන්ද පිළිගැනෙනා අයුරිනි.

පිය ආභාෂයෙන් දේශපාලන ක්ෂේත්‍රයටද පිවිසුණු විජයරත්න මහතා 1976 වර්ෂයේදී දැදිගම එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන සංවිධායක වශයෙන් පත් කරනු ලැබිණි. 1977 වසරේ පැවැති පාර්ලිමේන්තු මහ මැතිවරණයට එක්සත් ජාතික පක්ෂය යටතේ තරග කොට ජයග්‍රහණය ලබා දැදිගම ආසනයේ මහජන නියෝජිතයා වශයෙන් මෙම උත්තරීතර සභාවට පැමිණීමේ භාග්‍යය උදාකර ගත්තේය. සිවිල් සේවකයකු වශයෙන් සුවිශේෂී අත් දැකීමක් ලබා සිටි විජයරත්න මහතාගේ දක්ෂතාව තේරුම් ගත් එවකට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තම අමාත්‍ය මණ්ඩලයේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය තනතුරට එතුමාව පත් කරන ලදී. ඒ වන විට අධ්‍යාපන ක්ෂ්ත්‍රයේ මතු වී තිබුණු ගැටලු රාශියක් නිරාකරණය කරලීමට එතුමා විසින් පත් කරන ලද බෝගොඩ ප්‍රේමරත්න කමිටුව සමත් විණි. තවද එම කාල වකවානුව තුළ අධ්‍යාපන අමාත්‍යාංශයේ නවීකරණ කටයුතු රැසක් ඉටු කළ විජයරත්න මහතා අධ්‍යාපන දිස්ත්‍රික්ක 30ක් ඇති කොට අධ්‍යාපන පරිපාලනය ශක්තිමත් කිරීම, අධ්‍යාපන පරිපාලන අභ්‍යාස ආයතනය, අධ්‍යාපන ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය, විද්‍යාගාර උපකරණ නිෂ්පාදනය ආදි විවිධ මං පෙත් ඔස්සේ සුවිශාල කාර්ය භාරයක් ඉටු කළේය. එපමණක් නොව ජනාධිපති විද්‍යාලය, ඩඩ්ලි සේනානායක විද්‍යාලය ආදී පාසල් ගණනාවක් අලුතින් බිහි කරලීමට එතුමා මුල් වුණා. එතුමා පාසල් දරුවන් වෙත නොමිලයේ පොත් බෙදා දීමේ වැඩ පිළිවෙළ සඳහාද විශේෂ කාර්ය භාරයක් ඉටු කළේය.

ජාතීන් අතර මනා සම්බන්ධතාවක් ඇති කරලීම සඳහා සෑම පාසල් සිසුවකුම සිංහල හා දමිළ යන භාෂා දෙකම දැන සිටීමේ වැදගත්කම පෙන්වා දෙමින් එම විෂයයන් සඳහා පිළිගැනීමක් ඇති කිරීමට කටයුතු කිරීමට එතුමා පුරෝගාමියෙක් වුණා. වැඩිදුර අධ්‍යාපනය හදාරන දූ දරුවන්ට වැඩි අවස්ථාවක් ලබා දීම උදෙසා රුහුණු විශ්වවිද්‍යාලය ආරම්භ කිරීමටත්, විවෘත විශ්වවිද්‍යාලය ආරම්භ කිරීමටත් එතුමා දුන් නායකත්වය හා මඟ පෙන්වීම ප්‍රශංසනීයයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉන් අනතුරුව 1981දී අධිකරණ අමාත්‍ය ධුරය භාරගත් නිශ්ශංක විජයරත්න මැතිඳා අධිකරණ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් 1989 දක්වා විශාල කාර්ය භාරයක් ඉටු කළා. පිරිවෙන් පනත, සංසාධිකරණ පනත වැනි ඉතා වැදගත් පනත් කීපයක් පාර්ලිමේන්තුව තුළින් සම්මත කරවා ගැනීමටද එතුමා දැක් වූ දායකත්වය ඉතා ඉහළ මට්ටමක පවතියි.

ඒ හැරුණු විට අලුත්කඩේ නව උපරිමාධිකරණ සංකීර්ණය චීන රජයේ උපකාර මත පිහිටුවාලීමටද එම කාලය තුළ එතුමාට හැකියාව ලැබුණි. යුනෙස්කෝ සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතයා වශයෙන්ද ක්‍රියා කරමින් මෙරට පමණක් නොව ජාත්‍යන්තර වශයෙන්ද කීර්ති නාමයක් දිනා සිටි විද්වතෙකු ලෙසද හැඳින්විය හැකිය. එතුමාගේ කැපවීම මත එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානයේ කාර්යාලයක් අප රට තුළ ආරම්භ කිරීමට හැකි වූ බවද විශේෂයෙන්ම සඳහන් කළ යුතුය.

කිසිදු අවස්ථාවක දේශපාලනය ආභරණයක් කර නොගත් විජයරත්න මැතිඳා නිරතුරුවම හිතට එකඟව තීරණ ගත්තේය. සිවිල් සේවකයෙක් වශයෙන් අපේ රටේ ජාතික ප්‍රබෝධය, සංස්කෘතික ප්‍රබෝධය අවබෝධ කර ගත් ක්‍රියාවලිය තුළ එතුමා මහා දායාදයක් එක් කළා. අප රටේ ඇති විය යුතු කේන්ද්‍රීය සංවර්ධනය නිර්මාණය කිරීමට නිශ්ශංක විජයරත්න මැතිඳා ඉටු කළ මෙහෙය අපට අමතක කළ නොහැකියි. 1989 දී දේශපාලන ජීවිතයෙන් සමුගත් එතුමා රුසියාවේ ශ්‍රී ලංකා තානාපති වශයෙන් පත් කරන ලද අතර, නීතිය සහ සමාජ භාරකාර මණ්ඩලයේ සභාපති වශයෙන් අවසන් මොහොත තෙක්ම කටයුතු කළ කීර්තිමත් දේශපාලනඥයෙක් වුණා. ශ්‍රී ලංකාවාසී ජනතාවට පමණක් නොව සමස්ත බෞද්ධ ජනතාවටම වේදනාවක් ගෙන දෙමින් හිටපු සිවිල් සේවකයකු, කෘත හස්ත දේශපාලනඥයෙකු, අමාත්‍යවරයකු හා දියවඩන නිලමේ වැනි අතිඋදාර තනතුරු රැසක් හෙබවූ නිශ්ශංක විජයරත්න මැතිඳා ඒ කාල පරිච්ඡේදයන් තුළ සෑම ජන කොට්ඨාසයකම මානව හිතවාදියෙක් බවට කටයුතු කළා. එය එතුමා අපට දුන්නු, රටට දුන්නු නිහතමානී ආදර්ශයයි. ධනය අතින් පොහොසත් වූ උරුමයක් ඇති එතුමා සාමාන්‍ය ජනයාගේ මිත්‍රයෙක් වුණා. දැනුම අතින් අතිපොහොසත් වූ එතුමා අසමසම බුද්ධිමතෙක් හැටියට අප සැලකිය යුතුයි. මේ පාර්ලිමේන්තුවට මා තරුණ මන්ත්‍රීවරයෙක් හැටියට පැමිණෙන කාලයේ එතුමාගේ කථාවක් අහන්න ලැබීම විරල වූ අවස්ථාවක් හැටියට අපි සැලකුවා.

අපි නව දෙනෙකු විපක්ෂයේ ඉන්න කාලයේ බුද්ධිමතෙක් හැටියට, මහා පොහොසත් අදහස්වලින් පිරුණු දේශපාලනඥයෙකු හැටියට එතුමා මේ සභාවට දායාද කළ දේ අදත් හැන්සාඩ් වාර්තාව කියා පානවා. එවැනි දැනුමක්, බුද්ධියක්, ආදර්ශවත් චරිතයක් එතුමාට තිබුණු බව මා ඉතාම ගෞරවයෙන් සිහිපත් කරන්න කැමැතියි. ඒ වාගේම එතුමාගේ සහෝදරයා විදේශ සේවාවට නව පණක් දුන්නු තිස්ස විජයරත්න මැතිතුමායි. එතුමාගේ දරුවන් වන නෙරංජන් විජයරත්න සහ මනෝ විජයරත්නයන් අපේ රටේ දේශපාලනයට, අපේ මාතෘ භූමිය ආරක්ෂා කර ගැනීමේ ජාතික, ආගමික කර්තව්‍යයන්වලට ශක්තිය ලබා දී තිබෙනවා. අපට අහිමි වූ නිශ්ශංක විජයරත්න මැතිතුමා යුග දෙක, තුනක් පෝෂණය කරන්න කැප වුණු කෙනෙක් ලෙස සඳහන් කිරීම මේ යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේ මගේ යුතුකමක් වනවා. මා නැවතත් එය සිහිපත් කරනවා.

පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු හැටියට අපට යමක් ඉගෙන ගන්නට පුළුවන් වූ, අපට කැඳවා යමක් අවබෝධ කර දෙන්නට පුළුවන් වූ කෙනෙකු සිටියා නම් ඒ අතින් ගණන් කළ හැකි විරල වූ පුද්ගලයන් කීප දෙනෙකි. එවැනි අයකු වූ නිශ්ශංක විජයරත්න මැතිඳාගෙන් මා ඉගෙන ගත්ත දේ බොහොමයක් මේ පාර්ලිමේන්තුව තුළ සටහන් වුණාය කියන ටික අද දින මා කෘතවේදීත්වයෙන් සඳහන් කරනවා. එපමණක් නොව, රටේ විවිධ ක්ෂේත්‍රවල තව බොහෝ දෙනා එතුමාගෙන් ලබා ගත්ත දැනුම, මඟ පෙන්වීම, ආදර්ශයක් හැටියට අපි යළි යළි සිහිපත් කරමින් "මරණය පරාජය කිරීමට කිසිවෙකුටත් නොහැකිය" යන බුදු දහමේ හරය පසක් කරමින් අපේ රටේ උතුම් ලංකා පුත්‍රයෙකු වූ මේ මානව හිතවාදියා අවුරුදු 83ක් ආයු වින්දනය කොට 2007 ජනවාරි මස 07 වැනි දින අප අතරින් සදහටම සමු ගත්තේය.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඓතිහාසික කන්ද උඩරට පරම පූජනීය වූ දළදා සමිඳුන්ගේ ආරක්ෂාව උදෙසාත්, පොදු මහජනතාවගේ හිත සුව පිණිසත්, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම පිණිසත්, අපේ උරුමයන් ආරක්ෂා කොට සුවිශේෂී මෙහෙවරක් ඉටු කළ දැදිගම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මෙන්ම, විවිධ අමාත්‍යාංශ ගණනාවක් හෙබවූ ආචාර්ය නිශ්ශංක පරාක්‍රම විජයරත්න මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර මෙම පාර්ලිමේන්තුවේ ශෝකය, එතුමාගේ ජීවිත කාලය තුළ හැම කටයුත්තකදීම ශක්තියක් වූ එතුමාගේ දයාබර බිරිඳ සහ දරු දැරියන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙස යෝජනා කර සිටිමි. ස්තුතියි.

[අ. භා. 5.57]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දේශපාලනයට ආභරණයක් වූ කෘතහස්ත දේශපාලනඥයෙක් වූ දේශමාන්‍ය ආචාර්ය නිශ්ශංක පරාක්‍රම විජයරත්න මැතිතුමා 1924 ජූනි 14 වන දින කෑගල්ල බුද්දෙනිපොළ වලව්වේදී උපත ලැබුවා. එතුමාගේ පියා ශ්‍රීමත් එඩ්වින් විජයරත්න මැතිතුමා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයෙක්, සෙනෙට් සභිකයෙක්, බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයකු හා ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයකු ලෙසද කටයුතු කළා. නිශ්ශංක විජයරත්න මැතිතුමා කොළඹ රාජකීය විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා, 1947 දී ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයෙන් ඉතිහාසය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ගෙන 1948 දී ශ්‍රී ලංකා සිවිල් පරිපාලන විභාගයෙන් ඉතා ඉහළින් සමත් වී පරිපාලන ක්ෂේත්‍රයට එකතු වුණා.

නියෝජ්‍ය ආගමන හා විගමන පාලක, ග්‍රාමීය සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ, කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ වශයෙන්ද, අනුරාධපුර දිසාපති වශයෙන්ද, රක්ෂණ සංස්ථාවේ සාමාන්‍යාධිකාරි වශයෙන්ද, ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්ද යනාදී වශයෙන් රාජ්‍ය තන්ත්‍රයේ ඉහළ තනතුරු විශාල ප්‍රමාණයක් ඔහු විසින් දරනු ලැබුවා. එතුමා අනුරාධපුර දිසාපති වශයෙන් කටයුතු කරන අවස්ථාවේදී අනුරාධපුරය පූජා නගරයක් කිරීම සඳහා එතුමා කළ සේවාව අපට මේ අවස්ථාවේදී අමතක කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1958 වසරේදී උතුරේ ජාති භේද, කෝලාහල පැවති සමයේදී නිශ්ශංක විජයරත්න මැතිතුමා යාපනයේ දිසාපති හැටියට පත් කෙරුණා. සියලුම ජාතීන් තමාගේ ජාතිය ලෙස සලකා, තමන් උපන් බිමේ ගෞරවය රකිමින්, නිලධාරියෙකු ලෙස සියලුම රටවැසියන්ට සම සේ සේවය කළා. ඒ නිසා අපි දන්නවා, අදත් යාපනයේ වැසියන් නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ නමට ගෞරව කරනවා, ආදරය කරනවා, සෙනෙහස දක්වනවා කියලා. 1970 දී අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් ධුරයට නිශ්ශංක විජයරත්න මැතිතුමා පත් කරනු ලැබුවා. ඒ කාලය තුළ යුනෙස්කෝව හා එක්ව කරන ලද සේවාව ගැන මීට කලින් කතා කළ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත්, විපක්ෂ නායකතුමාත් සඳහන් කළ නිසාත්, කාලයේ අවශ්‍යතාව නිසාත් යුනෙස්කෝව ගැනත් ඒවායින් ඉටු වූ විශිෂ්ට සේවය ගැනත් කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මොන තනතුරු දැරුවත් නිශ්ශංක විජයරත්න මැතිතුමාගේ අනන්‍යතාව ගොඩ නැඟුණේ මහනුවර ශ්‍රී දළදා මාළිගාව හරහායි. එතුමා 1975 දී ශ්‍රී දළදා මාළිගාවේ බස්නායක නිළමේ තනතුරට පත් වුණා. 1985 දක්වා එම තනතුර දරමින් ශ්‍රී දළදා මාළිගාවේ බස්නායක නිළමේ තනතුර සඳහා අභිමානවත් පෞරුෂත්වයක් එක් කළා.

හුදු සම්ප්‍රදායික තනතුරක් ලෙස සැලකූ මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිළමේ තනතුර එම සම්ප්‍රදායික රටාව ආරක්ෂා කරමින් විවිධ දිශාවන්ට විහිදිය හැකි, යුගයට ගැළපෙන නවීන තනතුරක් බවට ප්‍රතිනිර්මාණය කළා. බුදුදහම ජාත්‍යන්තර හා දේශීය වශයෙන් ප්‍රචලිත කිරීම සඳහා සුවිශේෂී සේවයක් එතුමා විසින් ඉටු කරනු ලැබුවා.

කලක් ප්‍රංශයේ ලංකා තානාපති ධුරය ද හෙබ වූ ආචාර්ය නිශ්ශංක විජයරත්න මහතා සරල ජීවිතයට -සාමාන්‍ය ජීවිතයට- නිතරම ඇලුම් කළා. ඉහළ තනතුරු දරන නිලධාරින් තමන්ගේ දරුවන් කොළඹ උසස් විදුහලකින් ඉගෙන ගත් පසු වැඩිදුර ඉගෙනීම සඳහා යුරෝපා රටවලට ඇරීම වෙනුවට, නිශ්ශංක විජයරත්න මැතිතුමා තමන්ගේ දරුවන් ලංකාවේ දේශීය පාසල්වලට යවමින් පිරිවෙන් සමඟ කිට්ටු සම්බන්ධතාවක් ඇති කරමින් ඉතාමත්ම වැදගත් දූ පුතුන් මේ රටට හඳුන්වා දීමට ක්‍රියා කළා. එය එතුමාගේ සරල ජීවිතයේ එක් පැතිකඩක් වශයෙන් අප දකිනවා.

ගමේ හැදුණු වැඩුණු, ගමට ආදරය කළ, ගමේ සංස්කෘතියට මනා ලෙස ඇලුම් කළ ආචාර්ය නිශ්ශංක විජයරත්න මැතිතුමා තම අභිමානවත් පරම්පරාව ඉදිරියට ගෙන යෑම සඳහා රටට වටිනා දරුවන් මෙලොවට බිහි කළා. ඉන් නෙරන්ජන් විජයරත්න මැතිතුමා පියාගේ ආත්මය ලෙස සැලකූ මහනුවර ශ්‍රී දළ දා මාළිගාවේ දියවඩන නිලමේ ලෙස අවුරුදු දහයක පමණ කාලයක් තිස්සේ සුවිශේෂ සේවාවක් කළා. ඒ වාගේම එතුමාගේ තවත් පුත්‍ර රත්නයක් වන මනෝ විජයරත්න මැතිතුමා කලක් තම පියා අධ්‍යාපන ඇමති ලෙස කටයුතු කරපු යුගයේ පෞද්ගලික ලේකම්වරයකු ලෙස කටයුතු කර පසුව මන්ත්‍රීවරයකු ලෙසත්, ඇමතිවරයකු ලෙසත් කටයුතු කර තිබෙනවා. පියාගේ අඩි පාරේ යමින්, මහත්මා දේශපාලනයේ නියැළෙමින් රටට මහත් සේවාවක් ඉටු කරන්න එතුමාට හැකි වුණා. ඒ වාගේම මනෝ විජයරත්න මැතිතුමා අමාත්‍යවරයෙක් වශයෙන්, මන්ත්‍රීවරයෙක් වශයෙන් දැන පිරිසිදු දේශපාලනයේ නියුතු වුණා වාගේම, ජාතික වැදගත්කමින් යුත් කරුණු සම්බන්ධයෙන් අදත් සිය කාලය මිඩංගු කරමින් එතුමාගේ බිරිඳ භාරතී විජයරත්න, අපේ තුර්කි Consulate General මැතිනියත් සමඟ ඒ කටයුත්තේ නියැළී සිටීම මම විශේෂයෙන් මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම අනික් දරුවන් වන අනුරාධා විජයරත්න මැතිනිය සහ එම පවුලේ අයත්, ඒ වාගේම දිවංගත නීතිඥ ලංකේෂ් පුත්‍ර රත්නය සහ එතුමාගේ පවුලේ අයත්, ඒ වාගේම දියණිය නිශාංගනී හුලංගමුව මැතිනිය ඇතුළු පවුලේ සියලු දෙනාත් -ඒ අය දේශපාලනයට නොපැමිණියත්- තමන්ගේ පියාගේ ඒ ගෞරවය රකිමින් කටයුතු කළ බව මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

1997 දී පැවැත්වූ මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයෙන් තරග කරමින් දැදිගම අසුන දිනා පාර්ලිමේන්තුවට පිවිසි විජයරත්න මහතා 1977 සිට 1981 දක්වා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ඇමති ධුරයද, 1981 සිට 1989 දක්වා අධිකරණ අමාත්‍ය ධුරයද දැරූ අතර, 1990 සිට 1994 දක්වා රුසියාවේ ශ්‍රී ලංකා තානාපති ලෙසත් කටයුතු කළා. 1977 සිට 1981 දක්වා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ඇමතිවරයා ලෙස කටයුතු කරද්දි අධ්‍යාපන ගැටලු පිළිබඳව බෝගොඩ ප්‍රේමරත්න කමිටුව පත් කළේ එතුමා විසිනුයි. එපමණක් නොව, අධ්‍යාපන අමාත්‍යාංශයේ නවීකරණ කටයුතු රැසක්ද ඒ කාලයේදී සිදු වුණා. අධ්‍යාපන දිස්ත්‍රික්ක 30ක් ඇති කර අධ්‍යාපන පරිපාලනය ශක්තිමත් කිරීම, අධ්‍යාපන

පරිපාලන අභ්‍යාස ආයතනය, අධ්‍යාපන ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය, විද්‍යාගාර උපකරණ නිෂ්පාදනය, ග්‍රහලෝකාගාර නිර්මාණ වැනි කටයුතුවලින් අධ්‍යාපනයට විශාල සේවාවක් එතුමා විසින් ඉටු කරනු ලැබුවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දේශීය වශයෙන් කප්පාදුවකට හා ජාත්‍යන්තර වශයෙන් හුදකලාවකට ලක් වී තිබූ අපේ අධ්‍යාපන ක්‍රමය යළි යථා තත්ත්වයට පත් කිරීමේ අභියෝගය ඉතා ඉහළින් ජය ගන්නට එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ පාලන කාලයේදී එතුමාට හැකියාව ලැබුණා. දේශපාලනයට පිවිස ඇමතිකම් දැරුවත්, නිතර හිතට එකඟව, අවංකව කටයුතු කරමින් අනික් දේශපාලනඥයන්ට ආදර්ශයක් වෙමින් සරල වාම් ජීවිතයක් ගත කිරීමට එතුමා කටයුතු කළා. එතුමාට අප අදත් ගරු කරන්නේ මෙන්න මේ දුර්ලභ ගුණාංග නිසායි.

2007 ජනවාරි මාසයේදී එතුමා මිය යන යන විට එතුමාට අවුරුදු 83ක් වුවත් එතුමා මිය යාමෙන් මේ ලක් දෙරණටත්, ජනතාවටත් සිදු වූ පාඩුව මෙතෙකැයි කියා නිම කරන්න බැහැ. මා ගරු කළ, කීර්තිමත් පුද්ගලයකු වශයෙන් එතුමාගේ අභාවය ගැන අපටත් දැඩි වේදනාවක් තිබෙනවා. බොහෝ අවස්ථාවල එතුමා හමු වෙන්න, එතුමාට කථා කරන්න, එතුමාගේ අදහස් ලබා ගන්න, එතුමාගේ උපදෙස් ලබා ගන්න අපට අවස්ථාව ලැබුණා. ඒ වාගේම දිවංගත නිශ්ශංක විජයරත්න මැතිතුමා සිය දෙමව්පියන්ට හොඳ දරුවෙක් වුණා. සිය සහෝදර සහෝදරියන්ට හොඳ සහෝදරයෙක් වුණා. එතුමාගේ බිරිඳට හොඳ ස්වාමිපුරුෂයෙක් වුණා. එතුමාගේ දරුවන්ට හොඳ පියෙක් වුණා. ඒ නිසා එතුමාගේ පවුල් ජීවිතයේදී එතුමා ඉතාමත්ම ආදර්ශවත් අන්දමින් කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2007 ජනවාරි මාසයේ බදාදා දවසක රඹුක්කන මීදුම වලව්වේ  පවුලේ සුසාන භූමියේදී එතුමාගේ සිරුර මිහිදන් කළ ආකාරය මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. එතුමාගේ නාමය අපේ රටේ ජනතාව තුළ ගෞරව අභිමානයෙන් යුතුව සදා කල් පවතින බව මා මේ අවස්ථාවේදී පවසනවා. ඒ වාගේම මට කලින් කථා කළ අපේ කථිකයින් සඳහන් කළ පරිදි එතුමා අවංක, කීර්තිමත්, දැත පිරිසිදු දේශපාලනඥයකු මෙන්ම ඉතාමත්ම දුර්ලභ ගණයේ පුද්ගලයකු බවත් මා මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

කාලානුරූපව මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. එතුමා ගැන කථා කරනවා නම් බොහෝ වේලාවක් කථා කරන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,  මේ අවස්ථාවේදී ඒ කීර්ති නාමය ගෞරවයෙන් සිහිපත් කරමින් එතුමාගේ අභාවය සම්බන්ධයෙන් නීටා දූල්ලෑව විජයරත්න මැතිනියටත්, ඒ වාගේම නෙරන්ජන් විජයරත්න මැතිතුමා සහ එම මැතිනියටත්, මනෝ විජයරත්න මැතිතුමා සහ භාරතී විජයරත්න මැතිනියටත්, අනුරාධා දූල්ලෑව මැතිනිය සහ එම පවුලේ අයටත්, නිශාංගනී හුලංගමුව මැතිනියගේ පවුලේ අයටත්, ඒ වාගේම ලංකේෂ් විජයරත්න මැතිතුමාගේ පවුලේ අයටත්, අනෙකුත් සියලු ඥාතීන්ටත් එක්සත් ජාතික පක්ෂයේ මෙන්ම අප සියලු දෙනාගේම ශෝකය පුද කරමින් එතුමාට නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Dinesh Gunawardena.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு  தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, we will continue with this Motion on the next day.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay.  We will continue with this Motion on the next day.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon.  John Amaratunga)
I would like to state that we apologize to the members of the family of the Hon. Nissanka Wijeyeratne who have come here because we are unable to finish this Vote of Condolence today, and to bear with us because there are a large number of Members of Parliament, both from the Opposition as well as Members of the other parties who want to speak. Therefore, I think it is better to have another separate day in order to proceed with the Vote of Condolence.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay. We will continue with this Vote of condolence on another day.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு  தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Now,  we will move to the next item.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. John Amaratunga.

## වරප්‍රසාද : පාර්ලිමේන්තුවේ කටයුතු නිසි පරිදි විකාශනය නොවීම
## சிறப்புரிமை: பாராளுமன்ற நடவடிக்கைகளை இருட்டடிப்புச்செய்தமை
## PRIVILEGE : BLACKOUT OF PARLIAMENTARY PROCEEDINGS

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon.  John Amaratunga)
I have to raise a Matter of Privilege, Sir.  I wish to bring to your notice about a serious breach of privilege that has occurred in respect of the proceedings of Parliament on the 25th of May, 2011; that is yesterday.  I requested a digital recording of yesterday's  proceedings - 25.05.2011 - and on an examination I found that the whole segment of the proceedings have been blacked out. - [*Interruption.*]  This is what I was told. I do not recall the Hon. Speaker making a ruling to expunge any portion of yesterday's proceedings. In the circumstances, it appears that some unknown person has taken upon himself to censor the proceedings. This is a serious violation of my privilege as a Member of Parliament. I seek your indulgence to raise this matter in this House. Sir, in the past –

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Will you please sit down? This is relating to a matter of my Privilege.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Azwer, please sit down.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Hon. Member, do not try to poke your finger into each and everything and disturb me. Please sit down. I will not give way, Sir. - [*Interruption.*] In the past, even when there were incidents, still for all, these digital proceedings were given but yesterday - [*Interruption.]* I did not commit any mischief in this House. I only read out my Motion that I had given. Maybe there were others who disturbed. But, why should I be penalized? My question is, Sir, the privileges that I enjoyed have been violated and where is it stated in the Standing Orders that certain things have to be blacked out or erased. [*Interruption.*] Not even in the Committee on Parliamentary Business have we taken up a situation like that. This is a gross violation. Therefore, Sir, what I am requesting is -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! When such a situation occurs in the House, the normal practice is to expunge -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

No, no. Where is that practice? I have never heard of that practice. In the past - [*Interruption.*]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

No, that was the practice.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

It is the right of the Chair to expunge anything that is unparliamentary. That is how it is done.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

The Hansard is - [*Interruption.*] How can you say that? The Speaker did not make any ruling.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

The Chair does not have to announce that. That is accepted.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please!

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

My argument is, the Speaker did not make an order to black it out or to erase it.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

No, when there is trouble, the practice is to expunge anything that is unparliamentary. So, that was the ruling given by the Hon. Speaker.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

No. If the Speaker had made such a ruling, I would accept it; I would not have any argument. But, there was no ruling like that.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

The office is talking of a practice. There is no practice like that.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! There is a point of Order being raised by the Hon. Azwer.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

I would like to raise a relevant point of Order because all proceedings that are recorded are in the possession of the Speaker. How did this Member have access to that? - [*Interruption.*] How did he have access to those proceedings which are in the custody of the Speaker? How did he have? Yesterday, Sir, they made this House look like a mad House. They completely acted against the Standing Orders. They were making

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

even the

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

standing for hours and went away.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Azwer, please sit down. - [*Interruption.*] Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Sir, on this issue, what happened yesterday was, I did not commit any offence in this House. I only presented a Motion with regard to the university students' problem; that they have been taken to Army Camps and put on forcible training. As a result, there were other Members who disturbed. What can I do for that? [*Interruption.*] I am talking only about my privileges; I am not talking about anyone else's. Therefore, Sir, I vehemently object to the digital proceedings being blacked out. - [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Member, you have raised it but the practice is that when there is a commotion in this House, the recordings are not released. That has been the practice of the House of Commons also. That has been the practice for a long time. Therefore, there is no breach of privilege or breach of the Standing Orders.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Sir, there has been umpteen number of cases in this House.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Even in the House of Commons when there is a commotion, though a live telecast is given it goes blind.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

This is the Parliament of Sri Lanka, not the House of Commons. We have enjoyed this privilege. Why are you depriving us?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

That is the ruling given by the Speaker over and over again. There is no breach of the Standing Orders and no breach of privilege of you, as an Hon. Member.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Our privileges are being violated and you, the Chair, must safeguard our privileges. That is why we appeal to you.[*Interruption.]*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

There is no breach of privilege. That is very firm.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

That is very unfair.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම. ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා - පැමිණ නැත. ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### ආචාර්ය මාලිනී ෆොන්සේකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### கலாநிதி மாலினி பொன்சேகா மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### (DR.) MALANI FONSEKA FOUNDATION (INCORPORATION) BILL

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ආචාර්ය මාලිනී ෆොන්සේකා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*

*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி கலாசார, கலை அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Culture and the Arts for report.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,"පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! මේ අවස්ථාවේ ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,"ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

## මැණික් ගැරීම සඳහා යොදා ගන්නා බැකෝ හා සකර් යන්ත්‍ර භාවිතය නතර කිරීම
## இரத்தினக்கல் அகழ்வில் பெகோ மற்றும் சக்கர் இயந்திரங்கள் பாவிப்பதை உடனடியாக நிறுத்துதல்
## STOPPAGE OF BACKHOES AND SUCKER MACHINES FOR GEM MINING

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

01. රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන වශයෙනුත් මැණික් ලැබෙන අනෙකුත් දිස්ත්‍රික්කවලත් බැකෝ යන්ත්‍ර හා සකර් යන්ත්‍ර යොදා ගනිමින් මැණික් ගැරීම අද මහා ව්‍යවසනයක් බවට පත් වී ඇත. බැකෝ යන්ත්‍ර දමා ඉඩම්වල විශාල පතල් හාරා ඇති අතර එයින් ගොඩ ගැසෙන පස්, වර්ෂා කාලයට සෝදා යෑම නිසා අවට කුඹුරු යට වීම නිරන්තරයෙන් සිදු වන බැවින් වගා කිරීමට අපහසු වී ඇත.

02. එමෙන්ම සකර් යන්ත්‍ර යොදා පතල් හෑරීම සිදු කිරීම නිසා වැලි, පස් හා ජලය ඇදීම සිදු වීම හේතුවෙන් ප්‍රදේශයේ ගෙවල් ගිලා බැසීම, ජලය සිඳී යාම ආදී වශයෙන් පරිසරයට අහිතකර තත්ත්වයක් උදාවී ඇත.

03. මෙම ප්‍රදේශවල සාම්ප්‍රදායික මැණික් ගැරීම විනාශ වී පවතින අතර යන්ත්‍රානුසාරයෙන් මැණික් පතල් කිරීමෙන් අතළොස්සක් දෙනෙකුට මුදල් ඉපයීමට අවස්ථාව උදාවී ඇති අතර අනෙකුත් සියලු දෙනාට එමඟින් ලැබෙන ආර්ථික හා සමාජයීය ප්‍රයෝජනයන් අහිමි වී ඇත.

එම නිසා විශාල වශයෙන් පරිසර හානි හා සමාජ විපර්යාසයන් ඇති කර ගනිමින් කෙරෙන බැකෝ යන්ත්‍ර හා සකර් යන්ත්‍ර භාවිතය වහාම නතර කරන ලෙස මා මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය අවුරුදු ගණනාවක් තිස්සේ මේ බැකෝ යන්ත්‍ර හා සකර් යන්ත්‍ර යොදා ගනිමින් පතල් කැපීම නිසා විශාල පරිසර හානියක් වෙලා තිබෙනවා. මම දවස් දෙක තුනකට ඉස්සර වෙලා දැක්කා, අයගම ප්‍රදේශයේ ගල්කරාකන්ද කියන ගමේ ගලතුර ගඟට මායිම්ව බැකෝ යන්ත්‍ර යොදලා පතලක් කැපුවා. අද හම්බන්තොට වරාය හදලා තිබෙන්නේ රට මැද්දේ වාගේ, මුහුද අයිනෙන් ඇතුළේ වාගේ, මේ ගඟේ අඩි සියයක් පමණ දුරට ඉවුරක් නැහැ. ඒ ඉවුරත් එක්කම මුළු ගහ ගිහිල්ලා තිබෙනවා වත්තක් අස්සෙන්. මේ ගරු සභාවට වඩා ලොකු ජලාශයක් තිබෙනවා. අද උදේ මට එක් කෙනෙක් කථා කරලා කිව්වා, "ඒක ඇතුළට බෝට්ටු ඇවිල්ලා ඒ ඉඩමේ තිබෙන ගරපු වැලි ටික අරගෙන යනවා" කියලා. එතකොට මේ වාගේ ලොකු විනාශ මේ ගංඟා ආශ්‍රිතව කෙරෙනවා. ඒ වාගේම මේවා කරන අය නීත්‍යනුකූලව බලපත්‍රයක් ගත්තත් නීත්‍යනුකූලව මේ කටයුත්ත කරන්නේ නැහැ. නීත්‍යනුකූලව නොකරන නිසා තමයි මේ හානිය දිගින් දිගටම වෙලා තිබෙන්නේ. මේ පිළිබඳව රත්නපුර ප්‍රදේශයේ අහිංසක මිනිස්සු අපට හැම දාම කියන්නේ, "මේක කොහොම හරි නතර කරලා දෙන්න" කියලායි. මම දන්නවා, අපේ ගරු ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමාත් දන්නවා අපේ ප්‍රදේශයේ ඇලපාත, හල්දොළ කියන ගමේ අක්කර 50ක, 60ක වෙල්යායක් තිබෙන බව. පසු ගිය කාලයේ හැම දාම මේකේ දවසට සියයක් විතර පස් ගරනවා. අද එක මනුස්සයෙක් පස් ගරන්න ඒ ප්‍රදේශයට යන්නේ නැහැ. යන්නේ නැත්තේ, ඒක බැකෝ යන්ත්‍ර ගහලා ඉවරම කළ

නිසා; අර වළක් ඉහ ගෙන කනවා වාගේ වැඩක් කරපු නිසා. ඒ ගමේ අහිංසක මිනිස්සු හිටියේ. ඒ මිනිස්සු හැම දාම ගැරුම් වට්ටියයි, උදැල්ලයි අරගෙන ගිහිල්ලා පස් ගරලා රුපියල් හාර, පන්සියයක් හවසට හොයා ගත්තා. එහෙම ජීවත් වුණු අයට අද ඒ කර්මාන්තයේ යෙදෙන්න පුළුවන්කමක් නැහැ. බයිසිකලයකින් ගිහිල්ලා මැණික් ගලක් විකුණා මේ කර්මාන්තයේ යෙදෙන අය තමයි ගොඩක් හිටියේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් මැණික් ව්‍යාපාරය අවුරුදු 10කට 15කට පෙර කරපු කෙනෙක්. අපි එදා බයිසිකලයෙන් පාරේ යන කොට මිනිස්සු මැණික් ගල් අතේ තියා ගෙන පාර දිගේ ඉන්නවා විකුණන්න.

අද රත්නපුර ප්‍රදේශයේ කොහේ ගියත් එහෙම මිනිහෙක් නැහැ. ඇයි? පුංචි අය ගොඩක් දෙනෙක් අද මේකෙන් ඈත් වෙලා. ඈත් වන්නට හේතු රාශියක් තිබුණා. අද මේ කර්මාන්තය ගැන බලන විට පුංචි මනුෂ්‍යයා අතට මැණික් ගලක් ආවොත් තමයි හත්, අට දෙනෙක් මේකෙන් රැකෙන්නේ. ඔහු ඒක අර ගෙන ගමේ ඉන්න වෙළෙන්දාට වික්කාම, ඒ වෙළෙන්දා නගරයේ පොළට ඇවිත් ඒක විකුණනවා. ඔහුත් ඒක තව කෙනෙකුට විකුණුවාම අවසානයේදී මේ ඉන්න ලොකු ව්‍යාපාරිකයෝ අතට තමයි කොහොමත් මේක යන්නේ. හැබැයි ඒ අය මේ කර්මාන්තය පටන් ගත්තාට පස්සේ පොඩි මනුෂ්‍යයාට තිබුණු තැන අද නැති වෙලා තිබෙනවා.

මා ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. පසු ගිය කාලයේ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් 123/1 කියන චක්‍රලේඛයක් නිකුත් කර තිබුණා. ඒ චක්‍රලේඛය යටතේ සාම්ප්‍රදායික ක්‍රමයට මැණික් කර්මාන්තය කළ අයට ලොකු ප්‍රශ්නයක් තිබුණා. තමන්ගේ ඉඩමට බලපත්‍රයක් ගන්න ගියොත් රුපියල් තිස්පන්දාහකට වඩා වියදම් කරන්න සිද්ධ වුණා. ඒ වාගේම තුනෙන් දෙකක අයිතියක් තිබෙන කෙනකු ලයිසන් එකක් ගන්න ගියාම රුපියල් එක් ලක්ෂ විසි දෙදාහක් වියදම් කරන්න සිද්ධ වුණා. අප ඒ ගැන ඇමතිතුමාට කිව්වාට පස්සේ එතුමා පසු ගිය අවුරුද්දේ දෙසැම්බර් 31 වන දා මෙම චක්‍රලේඛය අහෝසි කළා. ඉස්සෙල්ලා ඒ චක්‍රලේඛයේ තිබුණ තත්ත්වය අනුව රුපියල් පණස් දාහකට වඩා සංස්ථාවෙනුත් දඩය ගහනවා. ඒක අහෝසි කළා. මේ මැණික් කර්මාන්තයේ යෙදෙන අපේ ප්‍රදේශයේ සියලු දෙනා වෙනුවෙන්ම මා ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. දැන් 121/3 දරන අලුත් චක්‍රලේඛය යටතේ අද සාම්ප්‍රදායික මැණික් කර්මාන්තයේ යෙදෙන කෙනකුට රුපියල් නව දහස් පණහකට මේ බලපත්‍රය ගන්න ඔබතුමා අවස්ථාව සපයා තිබෙනවා. ඒ ගැන අප සියලු දෙනාම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඔබතුමා මේක තේරුම් ගත්තා. මේක සාම්ප්‍රදායික ක්‍රමයට කරන අයට තමයි උදව් කරන්න ඕනෑ. පැරණි චක්‍රලේඛයත් එක්ක මැණික් කර්මාන්තයේ යෙදුණු අය සාම්ප්‍රදායික ක්‍රමයෙන් ඈත් වෙන්න පටන් ගත්තා. ඒක කවුරු හරි හිතා මතා කළා ද දන්නේ නැහැ. ඒකෙන් තමයි වැඩි හරියක් දෙනා මේ කර්මාන්තයෙන් අයින් වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ගේ වත්තේ මැණික් ගරනකොට අල්ලා ගෙන ගියොත් රුපියල් පණස්දාහක් දඩ ගහනවා. දැන් මෙතුමාගේ අලුත් චක්‍රලේඛය අනුව දඩ ගහන්නේ තමන්ගේ ඉඩමට නම් රුපියල් පන්දාහයි. ගඟක එහෙම නම් රුපියල් හත්දහස් පන්සියයි. ගරු ඇමතිතුමනි, ඒ, මැණික් සංස්ථාවේ වැටලීම් අංශයෙන් ගිහින් ඒ කර්මාන්තය ඇල්ලුවොත් විතරයි. පොලීසියෙන් ගිහින් ඇල්ලුවොත් ඒ වැඩයම කරන එක්කෙනාට රුපියල් පණස්දාහේ සිට ලක්ෂ දහය දක්වා දඩයක් ගහනවා. මේක පුදුම වැඩක්. එකම වැරැද්දට තැන් දෙකකින් දඩ දෙකක් ගහනවා. මැණික් සංස්ථාවෙන් රුපියල් පන්දාහයි. පොලීසියෙන් ගිහින්, 1999 අංක 66 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය සංශෝධන පනතේ 30(2) වගන්තිය යටතේ අධිකරණයේ නඩු දැම්මාම, තමන්ගේ ඉඩමේ පතල කැපුවත් රුපියල් පණස්දාහක දඩයක් ගහනවා. පණස් දාහේ සිට ලක්ෂ දහය දක්වා දඩ ගහලා ඕනෑ නම් අවුරුදු පහක් හිරේ යවන්නත් පුළුවන්. මේ පනතත් එක්ක තිබුණොත් මේ මැණික් කර්මාන්තය කෙරෙන්නේ නැහැ. මොකද, මැණික් සංස්ථාවෙන් විතරක් නොවෙයි, මේ වැටලීම් කරන්නේ. පරිසර පොලීසිය කියා එකකිනුත් මේ වැටලීම් කරනවා. එම නිසා මේ කාරණය කෙරෙහි අවධානය යොමු කරන ලෙස මා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා.

ඔබතුමා පත් වන්නට ඉස්සෙල්ලා 1999 වර්ෂයේදී මේ පනතට සංශෝධනයක් ගෙනැවිත් තිබෙනවා, සාම්ප්‍රදායික ක්‍රමයට මැණික් කර්මාන්තයේ යෙදෙන අයට රුපියල් පන් දාහේ සිට පණස් දාහ දක්වා දඩ ගහන්න. සාම්ප්‍රදායික ක්‍රමයට මේ කර්මාන්තයේ යෙදෙන අයට, අනවසරයෙන් මැණික් ගරනවා නම් දඩ ගැසුවාට ප්‍රශ්නයක් නැහැ. ලයිසන් ගත් පතලක අහිංසක මනුෂ්‍යයෙකුට සියයට දෙකහමාරයි ලැබෙන්නේ. රුපියල් ලක්ෂයක මැණික් ගලක් වික්කොත් රුපියල් දෙදහස් පන්සියයයි මිනිහෙකුට ලැබෙන්නේ. රුපියල් පනස් දාහක් දඩයක් ගැහුවොත් අන්තිමට මේ මනුෂ්‍යයාට වෙන්නේ හිරේ යන්නයි. ඊට එහා පිළිසරණක් නැහැ. එම නිසා හුඟක් මිනිස්සු උසාවි මඟහරිනවා. ඒකයි කරන්නේ. උසාවියට යන්නේ නැහැ. උසාවියට ගිහින් ඒ මනුෂ්‍යයාට මේ දඩය ගෙවන්නට කිසි කෙනකු ඉදිරිපත් වන්නේ නැහැ. එම නිසා මේ පනතත් ඔබතුමා සංශෝධනය කළොත් ඒ තුළින් මේ කර්මාන්තයේ යෙදී සිටි අය බොහෝ දෙනෙක් මේ කර්මාන්තයේ නැවතත් යෙදේවි.

අද හුඟක් දෙනෙක් කියනවා, කැකිල්ල නැහැ, මේ කර්මාන්තයට අවශ්‍ය පුවක් ගස්, මේ ආදී ඒවා නැහැ කියා. ඉස්සර ගොඩනැඟිලි හදන කොට කොන්ක්‍රීට් එකට උණ බම්බු තමයි තිබුණේ. නැත්නම් රබර් ලෑලි. අද නවීන ක්‍රමය අනුව යකඩ පයිප්පවලින් ඒ කර්මාන්තය කරනවා. අද ගෙහේ පාලමක් හදන කොට අලුතින් යකඩ පයිප්ප දමා ගඟ මැද යසට අඩි 80ක් අඩි 100ක් වුණත් බස්සනවා. සාම්ප්‍රදායික ක්‍රමයට මේ කර්මාන්තයේ යෙදෙන අයටත් මේක කර ගෙන යන්න අමාරු නම්, මේ වාගේ අලුත් තාක්ෂණය හඳුන්වා දෙන්න ඕනෑ. එතකොට ඒ අයට පුළුවන් අලුත් තාක්ෂණයත් එක්ක මේ කර්මාන්තය පැරණි ක්‍රමයට කර ගෙන යන්න. මේ බැකෝ ගහන සියලු දෙනාම නවත්වන්නටය කියා අප කියන්නේ නැහැ. ලයිසන් පණහ, හැට ගත් පෙළක් ඉඩම් තිබෙනවා. ඒවායේ තිබෙන්නේ නත්තිරම්. ඒවා ගත්තාට කමක් නැහැ, කාටවත් හානියක් වන්නේ නැත්නම්.

අද තමන්ගේ ඉඩම කියලා පර්චස් 25ක්, 30ක් තිබෙන එකකට පතලක් හාරන්න licence එකක් ගත්තාම අල්ලපු වත්තේ මිනිහාගේ ගේ තමයි නැති වෙන්නේ. අල්ලපු වත්තේ මනුස්සයාගේ ඉඩම තමයි ඒකට ගොදුරු වන්නේ. ඒ මනුස්සයාට කිසිම පිළිසරණක් නැහැ. ඇයි, අරයා කියනවා නේ "මම මේකට licence එකක් ගත්තා" කියලා. Licence එකක් ගත්තා වුණාට අල්ලපු වත්තේ ඉන්න කෙනාට අසාධාරණයක් සිද්ධ වෙනවා. ගරු ඇමතිතුමනි, පසු ගිය දවස්වල මට ඒක වුණා. බලපත්‍රයක් අර ගෙන මගේ ඉඩමට අල්ලපු ඉඩමේ අවුරුදු දෙකක් තිස්සේ පතල් කපනවා. මගේ හිතවත් කෙනකු නිසා මම සද්ද නැතිව හිටියා. ඊට පස්සේ මම බැලුවා මෙයා කොහෙන්ද මෙච්චර ඉල්ලම් ගන්නේ කියලා. මම මැණික් සංස්ථාවට කිව්වා, දෝනා ගහලා මගේ ඉඩමෙන් ගන්නවාද කියලා පොඩ්ඩක් බලන්න කියලා. මැණික් කර්මාන්තයේ යෙදෙන අයට හිතවත්කම්, මනුස්සකම් එහෙම නැහැ. මැණික් තිබෙනවා නම් ඒවා සොයා ගෙන යනවා. ඔබතුමාට මැණික් සංස්ථාවෙන් මේ ගැන අහලා බලන්න පුළුවන්. අන්තිමේදී මගේ හිතවත් කට්ටිය මගේ ඉඩමෙන් තමයි අවුරුද්දක් විතර ඉල්ලම් අර ගෙන තිබෙන්නේ. යටින් ගිහිල්ලා මගේ ඉඩමේ තිබුණු ඉල්ලම් ටික අර ගෙන ඒ ගොල්ලෝ මැණික් ගරා ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉල්ලමක් තිබෙනවා නම්, මැණික් හම්බ වෙනවා නම් බැකෝ පාවිච්චි කරන්න එපා කිව්වත්, මොනවා කළත් කර්මාන්තයේ යෙදෙන අය කොහොම හරි ඒ

[ගරු ජානක වක්කුඹුර මහතා]

මැණික් ගන්නවා. ඒක නවත්වන්න ටිකක් අමාරුයි. දඬය පොඩ්ඩක් අඩු වුණාම දඬ කාගෙන හරි ඒ වැඩේ කරනවා. බැකෝවලින් පතල් හාරන කොට දඬයක් ගහනවා. දඬය ගැහුවාට ආපසු ඒ වැඩේම කරනවා. "හැල" කියලා ඉඩම් ජාතියක් තිබෙනවා. ඒවායේ පතල් කපන්න අමාරුයි. අන්න ඒ වාගේ ඉඩම්වලට මේ යන්ත්‍ර සූත්‍ර භාවිත කරන්න දුන්නාට ප්‍රශ්නයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දිස්ත්‍රික්කයේ licences දීපු 197දෙනෙක් ඉන්නවා. මේ 197 දෙනාට මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් අවසර පත්‍රයක් දීලා තිබෙනවා. ඒ අවසර පත්‍ර ගත්ත අය හරියාකාරව වැඩ කරලා තිබෙනවාද කියලා ඔබතුමන්ලා කණ්ඩායමක් යවලා බලන්න. දීපු කොන්දේසි කඩ නොකර, නීත්‍යානුකූලව කටයුතු කරලා නම් ඒ අවුරුද්දක කාලය තුළ ඒ අයට අවස්ථාව දුන්නාට ප්‍රශ්නයක් නැහැ. ඒ ගොල්ලන්ගෙන් පෙළක් අය රුපියල් ලක්ෂ හත අට වැය කරලා තිබෙනවා. තවම මොකවත් ආදායමක් ගන්න බැරි වෙච්ච කර්මාන්තය ගැන දන්නේ නැති අයත් ඉන්නවා. මට doctor කෙනෙක් කථා කරලා කිව්වා, "මම නම් කර්මාන්තය ගැන දන්නේ නැහැ. මම සල්ලි වියදම් කළා" කියලා. ලක්ෂ හතක් අටක් වියදම් කරලා. ඒ නිසා අප එක පාරටම මේ කටයුතු නතර කළ ගමන් එහෙම අයට ප්‍රශ්නයක් මතු වෙනවා. අපි ඒක පිළිගන්නවා. කාලය දීලා, ඒ ගොල්ලන් එයින් ඈත් කරන්න අප කොහොම හරි කටයුතු කරන්න ඕනෑ. පතල් කපන්න අමාරුම තැනක එහෙම යන්ත්‍ර සූත්‍ර පාවිච්චි කරන්න දුන්නාට ප්‍රශ්නයක් නැහැ. මොකද පෞද්ගලික ඉඩමකින් එහෙම ගත්තාය කියලා අපට කිසි ප්‍රශ්නයක් නැති නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලපත්‍ර දීලා තිබෙන්නේ තුන්සිය ගණනයි. එයින් 197ක් අපේ දිස්ත්‍රික්කයේ. ගරු ඇමතිතුමනි, ඒ වාගේම භාරදහස් ගණනක් licences අර ගෙන අද සාම්ප්‍රදායික ක්‍රමයට පතල් කපනවා. එහෙම නම් ඒ ගොල්ලන්ටත් ප්‍රශ්න ඇති. මේ ප්‍රශ්න නිසා රත්නපුරයේ හිටපු සුළු මැණික් වෙළඳාම කරපු විශාල පිරිසක් අද මේ ක්ෂේත්‍රයෙන් ඈත් වෙලා. ඒ අයට මැණික් ගලක් එන්න කිසිම ක්‍රමයක් නැහැ. මොකද මහා පරිමාණයෙන් කරන කොට වෙළෙඳ පොළේ පුංචි මනුස්සයා අතට මැණික් එන්නේ නැහැ. ඒ නිසා සුළු මැණික් ව්‍යාපාරිකයා කියන අය හුඟ දෙනෙක් අද ව්‍යාපාරයෙන් ඈත් වෙලා. ඒ ගොල්ලෝ වෙනත් කර්මාන්තවල යෙදිලා. ඉස්සර සුළු මැණික් වෙළෙඳ ව්‍යාපාරිකයා තමයි ලොකු ව්‍යාපාරිකයාට මැණික් ගල් ගිහින් දුන්නේ. ඒ නිසා ඒ අය ආරක්ෂා කරන්න ඕනෑ. රත්නපුර දිස්ත්‍රික්කයේ කාලයක් තිස්සේ මේ ව්‍යාපාරය කර ගෙන ආපු පිරිසට අද කරන්න වෙනත් කර්මාන්තයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හැම දෙයකටම රජයෙන් දෙනවා ආධාර. තේ කර්මාන්තයට පොහොර දෙනවා. පොල් කර්මාන්තයටත් සහනාධාර දෙනවා. ඒ හැම එකකටම සහනාධාර දෙනවා. ඒ වාගේම තව වෙනත් සහනාධාරත් දෙනවා. හැබැයි මැණික් කර්මාන්තයේ යෙදෙන අයට සහනාධාර ක්‍රමයක් නැහැ. ඒ නිසා අඩු ආදායම්ලාභී සමෘද්ධිලාභියකු තමන්ගේ ඉඩමේ පතලක් හාරන්න licence එකක් අරගෙන ඒක අනුන්ට දෙනවා. රුපියල් 9,000ක් දීලා licence එක ගත්තු කෙනාට දහයෙන් පංගුවක් හිමියි. ඒ නිසා ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලනවා පුළුවන් නම් අඩු ආදායම් ලාභී පවුල්වල අයට බලපත්‍ර ගාස්තුවකින් තොරව ඇප මුදලක් විතරක් අර ගෙන බලපත්‍ර දෙන්න කියලා. තවත් පුළුවන් නම් ඒ මනුස්සයාට ආයුධ කට්ටලයක් හරි රජය මඟින් ලබා දෙන්න ඕනෑ මේ කර්මාන්තය කරන්න. මොකද, තමන්ගේ ඉඩමේ තිබෙන වස්තුව ගොඩට ගන්න ඔහුට පුළුවන්කමක් නැති නිසා. මා හිතන හැටියට එහෙම යමක් කළොත් ඒ මඟින් මේ කර්මාන්තයේ ඉන්න විශාල පිරිසක් ආපසු ඉස්සරහට ගන්න පුළුවන් වෙයි.

මා හිතන විධියට තිබෙන මැණික්වලින් සියයට 20ක්වත් තවම ගොඩට අර ගෙන නැහැ. අද නැඟෙනහිර පළාත, උතුර පළාත ආදී මේ හැම තැනම මැණික් තිබෙනවා. වැඩි හරියක් මේ කර්මාන්තයේ යෙදෙන්නේ රත්නපුරයේ අය. ගරු ඇමතිතුමනි, ඔබතුමා මීට ඉස්සර වෙලා ගත්තු ක්‍රියාමාර්ග ගැන අපි ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇළ දොළ ගංගාවල වැලි ගොඩ දාලා ඒ වැලි පටවා ගෙන කොළඹ ලොරි ඕනෑ තරම් එනවා. අපේ ගම්වල ඉස්සර හිටපු මිනිස්සු බාල්දියයි ගැරුම් වට්ටියයි අර ගෙන ගිහිල්ලා ගඟේ ගරලා කීයක් හරි හොයා ගත්තා. ඒකෙන් පරිසරයට කිසිම හානියක් වෙන්නේ නැහැ. ගැරුම් වට්ටියක් අර ගෙන ගිහිල්ලා ගඟේ ගරන මනුස්සයා මැණික් ගල විතරයි ගොඩට අර ගෙන එන්නේ. පරිසරයට හානියක් වෙන්නේ නැහැ. මහා පරිමාණයෙන් වැලි ගොඩ දමන කොට වාගේ පරිසරයට කිසිම හානියක් වෙන්නේ නැහැ, අහිංසක මිනිසුන්ට ගඟක වැලි ගොඩ දා ගන්න බල පත්‍රයක් දෙන්න පුළුවන් නම්. අන්න එහෙම කළොත් මේ අහිංසක මිනිස්සු ගඟෙන් ගන්න ඒ මැණික් කැටේ-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, තව මිනිත්තුවකින් අවසන් කරන්න.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ඒ මැණික් කැටේ වෙළෙඳ ව්‍යාපාරිකයන් අතරට යනවා. ඔබතුමා ඒ ගැනත් කල්පනා කරලා බැකෝ යන්ත්‍ර, සකර් යන්ත්‍ර පාවිච්චි කරන්නේ නැතුව බාල්දියකුයි, කුඩයකුයි අරන් ගිහිල්ලා ගංගාවල තිබෙන මැණික් ගරා ගන්න ක්‍රමයක් හදලා දුන්නොත් විශාල පිරිසක් නැවත වරක් මේ කර්මාන්තයේ යෙදෙයි. එහෙම වුණොත් අපේ රටට විදේශ විනිමය ගෙන්වා ගන්න පුළුවන්කමක් ලැබෙයි.

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා විසින් මැණික් කර්මාන්තය සඳහා යන්ත්‍ර යොදා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කරපු යෝජනාව මම ස්ථිර කරනවා.

ඇත්ත වශයෙන්ම මේ රටේ මැණික් කර්මාන්තය දීර්ඝ කාලයක් තිස්සේ -අවුරුදු සිය ගණනක්- පැවැති කර්මාන්තයක්. විශේෂයෙන්ම මම නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කය මැණික් සඳහා ප්‍රසිද්ධයි. ඒ වාගේම පරම්පරා ගණනාවක් සාම්ප්‍රදායිකව මැණික් කර්මාන්තය කර ගෙන යමින් සිය දහස් ගණනක් ජීවත් වෙච්ච දිස්ත්‍රික්කයක්. අදත් මේ දිස්ත්‍රික්කයේ විශාල පිරිසක් ජීවත් වන්නේ මැණික් කර්මාන්තය නිසායි. පතල් කැපීම පමණක් නොවෙයි, මැණික් අලෙවිය, මැණික් කැපීම වාගේ අතුරු කර්මාන්ත මඟින්ද අද රත්නපුර දිස්ත්‍රික්කයේ විශාල පිරිසක් ජීවත් වනවා. ඒ වාගේම අපි දන්නා දෙයක් තමයි මැණික් කර්මාන්තය නිසා මේ රටට විශාල විදේශ සම්පත් ප්‍රමාණයකුත් ලැබෙන බව. එහෙම නම් අපි කල්පනා කරන්න ඕනෑ මේ කර්මාන්තය කොහොමද ආරක්ෂා කර ගන්නේ කියලා. අද මේ

යෝජනාවෙන් කියන බැකෝ යන්ත්‍ර ඒ වාගේම සකර් යන්ත්‍ර පාවිච්චි කිරීම මීට අවුරුදු 10කට ඉස්සෙල්ලා ආරම්භ වුණා නම් මේ වන විට අපට මැණික් ගලක් දකින්න ලැබෙන්නේ නැහැ. බැකෝ යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය අනුව විශාල පරාසයක පස් ඉවත් කරලා එතැන තිබෙන සියලුම සම්පත් ටික උඩට අර ගෙන ඒ මැණික් ලබා ගත්තාට පස්සේ විශාල හානියක් ඒ බිමටත්, ඒ ප්‍රදේශයටත් ඒ වාගේම පරිසරයටත් සිද්ධ වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රත්නපුර දිස්ත්‍රික්කයේ මැණික් කර්මාන්තය විශාල පරිහානියකට, ව්‍යසනයකට පත් වෙලා තිබෙන්නේ මැණික් කර්මාන්තයේදී බැකෝ හා සකර් යන්ත්‍ර පාවිච්චි කිරීම නිසාය කියන එක කියන්නට ඕනෑ. අන්න ඒ නිසා තමයි මේ යෝජනාව මා ස්ථිර කරන්නේ. මේ වැඩ පිළිවෙළ ගැන විවේචනාත්මක සාකච්ඡා කීපයක් පසු ගිය දවස්වල සිද්ධ වුණා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුනුත් සහභාගි වෙච්ච අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටුවේදී මේ කාරණය සාකච්ඡා කරලා, බැකෝ යන්ත්‍ර, සකර් යන්ත්‍ර මැණික් ගැරීම සඳහා යොදා ගැනීම තහනම් කරන්න කියලා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ඉල්ලීමක් කරන යෝජනාවක් මම ගෙනාවා. ඒ වෙලාවේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුත් සහභාගි වෙලා හිටියා. පළාත් සභාවේ විපක්ෂ නායකතුමා, පළාත් සභාවේ තව මන්ත්‍රීවරු ඒකට එකඟ වුණා. ඒ වාගේම එයට පක්ෂපාතීත්වය ඒ ගොල්ලන් පළ කළා. එහෙම වුණේ මේක පක්ෂ භේදයක් තිබෙන දෙයක් නොවන නිසායි. මේක පුද්ගලයන් අතර තිබෙන ප්‍රශ්නයකුත් නොවෙයි. මැණික් කර්මාන්තයට අපි ආදරෙයි. මම කිව්වා වාගේ අපේ ප්‍රදේශවල ජනතාවගෙන් විශාල පිරිසක් ජීවත් වන්නේ මේ මැණික් කර්මාන්තය පදනම් කර ගෙනයි. ඒ නිසා මේක ආරක්ෂා කරන්න ඕනෑ.

අපි මැණික් කර්මාන්තය ගැන කථා කරලා තිබෙනවා. අපේ රටේ මැණික් ගලක් පිට රට යවන කොට සියයට 15ක බද්දක් අය කිරීමේ ප්‍රතිපත්තියක් තිබුණා. අපි පසු ගිය දවස්වල අතිගරු ජනාධිපතිතුමාට ඒ ගැන මතක් කරලා ඒක ඉවත් කළා. ඒ නිසා අද සියයට 2.5ක බද්දක් විතරයි අය කරන්නේ. මේ ආකාරයට මැණික් කර්මාන්තයේ යෙදෙන අයට ඒ කර්මාන්තය ඉදිරියට ගෙන යන්න, එයින් ලාභ ලබන්න, එයින් ආදායම් ලබන්න අවශ්‍ය පරිසරය ගොඩ නඟන්න අපි හැම දාම කටයුතු කළා. නමුත් ඒ නිසා පරිසරය හානි වෙනවා නම්, ඒ නිසා ජන ජීවිතයට හානි වෙනවා නම් අපි ඒකට එකඟතාව පළ කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මතක් කරන්න ඕනෑ බැකෝ යන්ත්‍ර පාවිච්චි කිරීම නිසා කුරුවිට පැරඩයිස් කියන ගම්මානයේ නව ජනපදය කියන ප්‍රදේශයේ ගෙවල් 34ක් අද හානියට පත් වෙලා තිබෙන බව. මම එතැනට ගිහිල්ලා බැලුවා. ඇත්ත වශයෙන්ම මට දැක ගන්නට පුළුවන්කම ලැබුණා. ඒ ගෙවල්වල බිත්ති පුපුරලා තිබුණා. පොළව බැහැලා තිබුණා. ඒ වාගේම ඒ ප්‍රදේශයේ ළිංවල වතුර සම්පූර්ණයෙන්ම හිඳිලා තිබුණා. ඒ ගෙවල්වල ළමයි උදේට බාල්දි, කලගෙඩි අර ගෙන කිලෝමීටර් දෙකක්, තුනක් ඈතට ගිහිල්ලා වතුර අර ගෙන ඇවිල්ලා තමයි මුහුණ සෝදා ගෙන, ඇඟ සෝදා ගෙන පාසල් යන්නේ. එවැනි ඉතාම අසීරු තත්ත්වයක් මේ බැකෝ යන්ත්‍ර, මේ සකර් යන්ත්‍ර පාවිච්චි කිරීම නිසා ඇති වෙලා තිබෙනවා. තමුන්නාන්සේ රත්නපුර දිස්ත්‍රික්කයේ සංචාරය කළොත් දැක ගන්නට පුළුවන් වෙයි පසු ගිය අවුරුදු පහ, හය, හත ඇතුළත බැකෝ යන්ත්‍ර පාවිච්චි කරලා කපාපු විශාල පතල්වල වැව්වල වාගේ වතුර පිරිලා තිබෙන ආකාරය. අද ඒවා අත් හැරලා දාලා තිබෙනවා. ඒවා වහලා නැහැ. අද ඒවායේ මැස්සෝ, මදුරුවෝ, බෝ වෙලා, ඒවා බෝවන රෝග ඇති කරන නිජබිම් බවට පත් වෙලා තිබෙනවා. ඒවා අවට සිටින මිනිසුන්ට ජීවත් වන්නට බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම මෙම යෝජනාව ගෙනාපු ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ විශාල පස් කඳු ඇති වෙලා, වැහි කාලයට ඒ පස් හේදිලා ගිහිල්ලා අවට වෙල් යායවල් යටවෙලා තිබෙනවා. අද කුඹුරු වැඩ කරන්නට බැහැ. සමහර ගංගාවල් වැව් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ව්‍යසනකාරී තත්ත්වය නතර කරන්නය කියන එක තමයි අපි හැමදාමත් ඉල්ලුවේ.

ගරු ඇමතිතුමාට මම බොහොම ස්තුතිවන්ත වනවා, මේ කරුණු ඉදිරිපත් කළාම එතුමා ඉතාමත්ම ඉක්මන් පියවර ගැනීම ගැන. ඒ වාගේම තාවකාලිකව එම පියවර ගෙන, එතුමා දැනට ඒ සම්බන්ධව ගවේෂණ කර ගෙන යන බවත් මා දන්නවා, කොයි ආකාරයෙන්ද මේ බැකෝ යන්ත්‍ර පාවිච්චි කරනවා නම් කළ යුත්තේ, ඒ වාගේම ජන ජීවිතයට, පරිසරයට හානියක් නොවන ආකාරයට මෙය කළ යුත්තේ කොහොමද කියන එක ගැන. අද බැකෝ යන්ත්‍ර පාවිච්චි කරන්නට බලපත්‍ර 197ක් දීලා තිබෙනවා. ඒ බලපත්‍ර 197ම ලබා ගෙන තිබෙන්නේ මැණික් ගරන්නට බැකෝ යන්ත්‍ර පාවිච්චි කරන්නට අවශ්‍ය උදවිය නොවෙයි. ඒක අපි පැහැදිලිව කියන්නට ඕනෑ. ඒක කරලා තිබෙන්නේ පහසුවට. ඒ වාගේම ලාභයට. මොකද, මේ සාම්ප්‍රදායික මැණික් ගැරීමේ ක්‍රමය තමයි පතලක් කණිනකොට ඒකෙ වැඩ කරන කම්කරුවන් සියලු දෙනාම ඒ පතලේ අයිතිකාරයෝ වීම. ඒ අයට කියන්නේ හවුල් අයිතිකාරයෝ කියලා; හවුල්කාරයෝ කියලා.පතලක මැණික් ගලක් හම්බ වුණාම ඒකේ ලාභය බෙදන ක්‍රමයක් තිබෙනවා. හවුල්කාරයන් වශයෙන් ඒ පතලේ වැඩ කරන අයටත් කොටසක් ලැබෙනවා. එතකොට ඒ සියලු දෙනාම ගමේ තමන්ගේ ගෙදරට හුණු ටිකක් ගා ගන්නවා. ගෙදර යම් කිසි අලුත්වැඩියාවක් කර ගන්නවා. බයිසිකලයක්, කාර් එකක් ගන්නවා. සමහරවිට ඉඩමක් කඩමක් මිලයට ගන්නවා. ගෙයක් හදනවා. තමන්ගේ දුවට කසාද බන්දලා දෙනවා. කොල්ලෙක් නම් සමහරවිට කෙල්ලෙක් ගෙනෙනවා. මේ වාගේ තත්ත්වයක් තිබෙනවා. මැණිකක් හම්බවුණාම ඒ පතලට සම්බන්ධ වුණු අය මේ වාගේ ප්‍රයෝජන ලබනවා. අද ඒවා නැති වෙලා තිබෙනවා.

අද බැකෝ යන්ත්‍රයක් ගෙනාපුවාම බැකෝ යන්ත්‍රයට කුලීකරුවන් යොදවනවා. උදේ ඉඳලා සවස් වෙනකන් වැඩ කළාම රුපියල් 500ක්, 600ක් දීලා ඒ මිනිහා ගෙදරට යවනවා. එතකොට ඒ මිනිහා කුලී කාරයෙක්. දවසේ වැටුප අරගෙන ඔහු යනවා. පස් දෙනෙක්, හය දෙනෙක් සිටියාම බැකෝ යන්ත්‍රයකින් වැඩ කරන්න පුළුවන්. මැණික් ගල කෝටියකට වික්කත් අර මනුෂ්‍යයාට සන්තෝෂයෙන් කීයක් හරි දුන්නොත් මිසක් කිසිම දෙයක් ලැබෙන්නේ නැහැ. ඔහුට කිසිම දෙයක අයිතියක් නැහැ. එතකොට මේක අර සාම්ප්‍රදායික මැණික් කර්මාන්තය විනාශ කිරීමක්. රත්නපුර දිස්ත්‍රික්කය ඇතුළු ප්‍රදේශවල තිබුණු මැණික් කර්මාන්තය, ජනතාවට පුළුල් ප්‍රයෝජනයක් ලැබෙන කර්මාන්තයක් බවට පත් වෙලා තිබුණු ඒ කර්මාන්තය විනාශ කිරීමක් අද සිදු වනවා. අන්න ඒ නිසා මේ ක්‍රමය නැති කරන්නට ඕනෑ කියලා මම හිතනවා. මේ ක්‍රමය නැති කරන්නට ඕනෑ; මේක නවත්වන්නට ඕනෑ; මේක සීමා කරන්නට ඕනෑ. බැකෝ යන්ත්‍ර අත්‍යවශ්‍යම නම් ඒ සඳහා කොන්දේසි පනවා එය ලබා දෙන්නට ඕනෑ. හැබැයි කොන්දේසි හරියට ක්‍රියාත්මක කරනවාද කියන එක බලන්නට ඕනෑ; ඒක අධීක්ෂණය කරන්නට ඕනෑ. එහෙම නැතිව අපි කොන්දේසි ඇතුළත් කරලා බලපත්‍රය ලියලා බලපත්‍රය නිකුත් කළාට ඒක අනුව කටයුතු කෙරෙන්නේ නැහැ නේ. ඒ අනුව කටයුතු කෙරෙනවාද කියා අධීක්ෂණය කරන්නට ඕනෑ. ඒ වාගේම බැකෝ යන්ත්‍රය පාවිච්චි කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමේ දී ඒ බැකෝ යන්ත්‍රය පාවිච්චි කිරීමෙන් ඇති වන වළවල් වසා දැමීම සම්බන්ධයෙනුත් අවශ්‍ය කරන ඇප මුදලක් තබා ගන්නට ඕනෑ. නමුත් හැකි තරම් බැකෝ යන්ත්‍ර තහනම් කරන සාම්ප්‍රදායික ක්‍රමයකට යන්නට ඕනෑ.

එදා රත්නපුර නගරය, කහවත්ත නගරය, නිවිතිගල නගරය, ඒ වාගේම පැල්මඩුල්ල, ඇහැළියගොඩ වැනි නගරවල හැමදාම උදේට 2,000ක්, 3,000ක් දෙනා එකතු වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ආවේ මොකටද? මැණික් ජාවාරමට; මැණික් බිස්නස් එකට. එක්කෙනෙකුගේ අතට ලැබෙන ගල තවත්

[ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා]

කෙනෙකුට දෙනවා රුපියල් 500ක ලාභයක් තබා ගෙන. ඔහු තවත් කෙනෙකුට දෙනවා රුපියල් 1,000ක ලාභයක් තබා ගෙන. ඒ විධියට හතර පස් දෙනෙකු අතට ඒක මාරු වනවා. ඒ හතර පස් දෙනාටම ලාභයක් ලැබෙනවා. මේ විධියට තමයි ඒ ප්‍රදේශවල ආර්ථිකය මැණික් වෙළෙඳාම උඩ රඳා පැවතුණේ. නමුත් අද ඒක නැහැ. අද ඒ නගරවල තිබෙන කුඩා වෙළෙඳ පොළට මැණික් ගල් එන්නේ නැහැ; එදා වට්ටියෙන් ගරලා මැණික් ලබා ගත්තාම ඉතිරි වන දෙවැනි නාම්බුව කියලා අඩු වටිනාකමක් ඇති මැණික් ඒ පතලේ වැඩ කරන අයට දුන්නා, "මෙන්න තමුසෙලා ගිහිල්ලා මේක විකුණා ගන්නවා" කියලා. ඒ අය නගරයට ගිහිල්ලා එදාම ඒවා විකුණනවා. අද ඒක නැහැ. මොකද හේතුව, මේ මැෂින්වලින් මැණික් ගැරීම නිසා සියලුම මැණික්, පතල අයිතිකාරයාගේ පසුම්බියටයි වැටෙන්නේ. ඔහු කරන්නේ මොකක්ද? කෙළින්ම කොළඹට ඇවිල්ලා විකුණනවා. අර අතරමැද හිටපු කුඩා මැණික් වෙළෙන්දෝ අද සම්පූර්ණයෙන් ඉවත් වෙලා; ඔවුන් විසි වෙලා. අද ඒ අය පවතින්නේ නැහැ. අද රත්නපුර නගරයට ගියොත් එදා 2,000ක්, 3,000ක් දෙනා හිටපු රත්නපුරයේ අඹ ගහ යට අද 500ක් වත් නැහැ. එදා නිවිතිගල 2,000ක්, 3,000ක් සිටියා. අද 1,000ක් වත් නැහැ. ඒ වාගේ හැම නගරයකම උදේට ඇවිල්ලා මැණික් වෙළෙඳාමේ යෙදුණු උදවියට අද මැණික් නැහැ. ඇයි? මැණික් සියල්ලම ඒ ගොල්ලන්ට වඩා උඩින්, ඒ ගොල්ලන්ගේ හිසට උඩින් කොළඹට එනවා. ඉතින් මේ නිසා රටේ ආර්ථිකයට, ප්‍රදේශයේ ආර්ථිකයට, ඒ වාගේම පරිසරයට විශාල විධියට බලපාන තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒක නිසයි අපි මේ කියන්නේ. කාටවත් විරුද්ධව, කා එක්කවත් තරහකට නොවෙයි. කා එක්කවත් ඊර්ෂ්‍යාවකට නොවෙයි. අපි කැමැතියි මේ මැණික් කර්මාන්තය දියුණු වෙලා, මැණික් කර්මාන්තකරුවන් දියුණු වෙලා, මැණික් පතල් හිමියන් දියුණු වෙලා, මැණික් පතල් කම්කරුවන් දියුණු වෙලා හොඳ ජීවිතයක්, හොඳ ආර්ථිකයක් ප්‍රදේශයේ තිබෙනවා දකින්නට.

ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කරන්නට ඕනෑ. පසු ගිය කාලයේ පරිසර පනත සංශෝධනය කළා. ඒ අනුව අද කවුරුන් හෝ පස් ටිකක් සේදුවොත් අධිකරණය මඟින් රුපියල් 50,000ක දඩයක් නියම කරනවා. රත්නපුරයේ පස් ටිකක් සෝදා, මැණික් ගලක් සොයා ගෙන මැණික් කර්මාන්තය කරනවා හැර මාළු අල්ලන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වෙනත් කර්මාන්තයක් නැහැ. හැම කෙනකුටම පහසුවෙන් කරන්න තිබෙන කර්මාන්තය තමයි, පස් ටිකක් සෝදා, වැලි ටිකක් සෝදා, පොඩි මැණික් ගලක් සොයා ගෙන නගරයට ගෙන ගොස්, ඒක විකුණා රුපියල් 2,000ක, රුපියල් 3,000ක ලාභයක් ගන්න එක. අද ඒක කරන්න අමාරු වෙලා තිබෙනවා. මොකද, යම් විධියකින් වට්ටියක් අරගෙන, පස් ටිකක් සේදුවොත් රුපියල් 50,000ක දඩයක් නියම කරනවා. මේ දඩය කිව්වාම ඒ පුද්ගලයාට තරු පෙනෙනවා. රුපියල් පණස්දහසේ දඩය ප්‍රකාශ කරන කොට එක කාන්තාවක් බලංගොඩ උසාවියේදී කලන්තය හැදිලා වැටුණා. ඉතින් අද මේ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබෙන නිසා පසු ගිය කාලයේ සාකච්ඡාවකදී ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලුවා, මේක නතර කරන්න; මේක වෙනස් කරන්න; මේක සංශෝධනය කරන්න කියලා. මේ නීතිය ගෙනාවේ එතුමා නොවෙයි. නමුත් එතුමා එකඟ වුණා, ඒක සංශෝධනය කරන්න. අපි එතුමාට ස්තුතිවන්ත වනවා. එම සංශෝධනය ඉතා ඉක්මනට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර, එය පාර්ලිමේන්තුවේ නීතිගත කරන්නය කියන ඉල්ලීම මේ අවස්ථාවේදී කරනවා. ඒ වාගේම මෙතෙක් කළ ව්‍යසනකාරි බැකෝ යන්ත්‍ර පාවිච්චි කිරීම නැවැත්වීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ගත් පියවර ගැන එතුමාට ස්තුතිවන්ත වෙමින්, මේ තත්ත්වය පවත්වා ගෙන, මේ සියලු පරිසරයන් ආරක්ෂා කර ගෙන, ජන ජීවිතය ආරක්ෂා කර ගෙන, ආර්ථිකය ආරක්ෂා කර ගන්න වැඩ පිළිවෙළක් අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරන්නය කියන ඉල්ලීම කරමින් මගේ වචන කිහිපය මා අවසාන කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. ඊ ළඟට ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මගේ දිස්ත්‍රික්කයට, මා නියෝජනය කරන ප්‍රදේශයට බලපාන කරුණක් නිසා මමත් ඒ ගැන පොඩි අදහසක් ප්‍රකාශ කරන්න කැමැතියි. අපේ ගරු ඇමතිතුමා සාමාන්‍යයෙන් යමක් කිව්වාම ඒ ගැන හොඳට හිතා බලා කරන නිසා මා හිතනවා, ගරු ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමාගේත්, අප සියලු දෙනාගේත් අදහස්වලින් මේකට යම් කිසි සුබදායක ප්‍රතිඵලයක් අපට දෙයි කියලා. ගරු ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා වාගේම මේ යෝජනාව ගෙනා මන්ත්‍රීතුමාත් මැණික් කර්මාන්තය ගැන කථා කරපු නිසා මා දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ.

අද බැකෝ යන්ත්‍ර යොදා ගෙන මැණික් ගැරීම නිසා තවත් කාලයක් යන කොට මෙය සීමිත පිරිසකට සීමා වුණු ව්‍යාපාරයක් බවට පත් වන්න පුළුවන්. ගරු ඇමතිතුමා කිව්වා වාගේ, ඒ වාගේම ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මැණික් කර්මාන්තයේ යෙදෙන සහ ඒ කර්මාන්තයෙන් ජීවත් වන ලක්ෂ ගණනක ජනතාවක් රත්නපුර දිස්ත්‍රික්කයේ විතරක් ඉන්නවා. පතල් කම්කරුවන් පමණක් නොවෙයි, පතල් ව්‍යාපාරය තුළ පතලකට අවශ්‍ය දේවල් සපයා, එනම් ලී ටික සපයා, කැකිල්ල කපලා, වට්ටි හදලා, එහෙම නැත්නම් අවශ්‍ය යන්ත්‍රෝපකරණ ලබා දීලා, මේ හැම විධියකටම මේ ව්‍යාපාරයත් එක්ක බද්ධ වුණු පිරිසක් මේ ව්‍යාපාරය තුළ ඉන්නවා. මේ හැම කෙනකුටම අද මෙය පුංචි විධියට නොවෙයි, බරපතළ විධියට බලපාන ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඉතින් එක පැත්තකින් බලන කොට බැකෝ යන්ත්‍ර මඟින් කරන මැණික් ගැරීම එක වරටම තහනම් කරන්නය කියා අපට ඉල්ලීමක් කරන්න බැහැ. මොකද, ඒක කාලයක් තුළ දැන් සිද්ධ වෙලා තිබෙනවා. ඇමතිතුමා කිව්වා වාගේම, මමත් කියනවා, මේ විධියට තවත් කාලයක් කළොත් මෙය සීමිත පිරිසකගේ ව්‍යාපාරයක් බවට පත් වේවිය කියා. මොකද, එතැනට ශ්‍රමය අවශ්‍ය වන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් කරු හවුලකින් හෝ එහෙම නැත්නම් අර කියපු විධියට මැණික් ගලක් විකුණා හෝ ලබන ආදායමක් බෙදෙන්නේ නැති තත්ත්වයකට පත් වනවා. ඒ වාගේම බැකෝ යන්ත්‍ර යොදා ගෙන කරන මැණික් කර්මාන්තය අඩුම තරමේ යම් කිසි සීමාවන්වලට හෝ යටත්ව කරන්න ඔබතුමන්ලාගේ අවධානය යොමු කරනවා නම් වඩා හොඳයි.

පුංචි උදාහරණයක් කියන්නම්. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ඒ ඉඩම් වෙන්දේසි කරනවා. වෙන්දේසියකදී සාමාන්‍යයෙන් පර්චස් විස්සේ හෝ පර්චස් පණහේ හෝ කැලි වෙන්දේසි කරනවා. වෙන්දේසි කළාට පස්සේ එක පුද්ගලයෙක් එක්එක් නම්වලින් ඉඩම් කැලි ටික අරගෙන, තනි ඉඩමක් හැටියට පර්චස් විස්සේ කැලි 10ක් විතර බැකෝ යන්ත්‍ර යොදා ගෙන හාරනවා. ඒක බැකෝ යන්ත්‍ර ව්‍යාපාරයක් බවට පත් කරනවා.

අන්න ඒ නිසා ඉඩම් වෙන්දේසි කිරීමේ දී ඒ ගැන අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, බැකෝ යන්ත්‍ර පාවිච්චියට ඉඩ දෙනවා නම් අඩුම තරමේ ඒකට සීමා සහිත ඉඩම් ප්‍රමාණයක් යොදවන විධියට යම්කිසි රෙගුලාසියක් ගේනවා නම් වැඩිය හොඳයි. මොකද, මැණික් ඉල්ලම කියන එක හැම තැනකම නැහැ. සමහර වෙලාවට flat land එකේ විතරක් නොවෙයි, කඳු

අස්සේ ගල් අස්සේ තියෙන්න පුළුවන්. සමහර වෙලාවට බිම් මට්ටමේ ඉඳලා මීටර් සිය දහස් ගණනක් යට තියෙන්න පුළුවන්. ඉතින් යම්කිසි ප්‍රමිතියක් ඇතිව ඒ වාගේ තැන් හොඳින් තෝරා බේරා ගෙන ඒ අවශ්‍ය කරන බලපත්‍රය නිකුත් කරන්න කටයුතු කරනවා නම් වැඩිය හොඳයි. විශේෂයෙන්ම බැකෝ යන්ත්‍රයකින් කළ යුතු මැණික් ගැරීම මොකක්ද කියන එක පිළිබඳව සංස්ථාව විසින් නිවැරදි තක්සේරුවක් කළ යුතුයි. ඒ වාගේම මේ කටයුත්ත සීමා සහිත පිරිසකට සීමා වන විට අර අපි කියන පතල් කම්කරුවන්ගේ ජීවන රටාවට මහා පහරක් වදිනවා. ඒ වාගේම අනෙක් පැත්තෙන් පුංචි ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. මේ බැකෝ යන්ත්‍ර ගෙනාපු මහා ව්‍යාපාරිකයෝ වාගේම සමහර අය ණයතුරුස් වෙලා තමයි ඒවා ගෙනැල්ලා තිබෙන්නේ. ඉතින් ඒවා ගැනත් දිගින් දිගටම අධ්‍යයනයක් කළ යුතු වෙනවා. මොකද, සංස්ථාව කාලයක් මේකට ඉඩ හැරලා තිබෙනවා. මේ හැම එකක්ම අවධානයට ලක් වෙන්න ඕනෑ. ඒ වාගේම සමහර කඳු හෙල්වල මහා විශාල ඉඩම් ප්‍රමාණවල් බැකෝ යන්ත්‍ර මගින් පෙරළලා තිබෙනවා. ඒ, අර අයගම ප්‍රදේශයේ වාගේ. මහා ලොකු වැව් වාගේ නොවෙයි. ඇත්තටම සතියක් විතර එක දිගට වැස්සා නම් කියන්න බැරි විධියට නාය යන තත්ත්වයකට වුණත් පත්වන පැති තියෙනවා. විශේෂයෙන්ම sucker යන්ත්‍රය යොදා ගැනීම තුළින් භූමියේ යට තියෙන හැම එකක්ම ඒකෙන් කඩලා ගන්නවා; ඇදලා ගන්නවා. Sucker කියන්නේ ඇදලා ගැනීමක්. එතකොට ඒ හැම දෙයක්ම එළියට ඇදිලා එනකොට පොඩි වැස්සකට වුණත් භූමිය පහත් වෙනවා; කඩා ගෙන යෑම් සිද්ධ වෙනවා; නාය යෑම් සිද්ධ වෙනවා. මේ හැම කරුණක් ගැනම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නය කියලා මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ පිළිබඳව යම්කිසි අවබෝධයක් තිබෙන නිලධාරින් මේ ක්ෂේත්‍රයට පත් කළොත් මීටත් වැඩිය හොඳට මේ කරුණු කාරණා තේරුම් අරගෙන කටයුතු කරයි කියන අදහසත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**

(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)

(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා, විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ දේශපාලනයේ යෙදෙන සියලු දෙනාම මේ කාරණාව ගැන අවබෝධයකින් යුතුව අපට කරුණු ඉදිරිපත් කිරීම ගැන. විශේෂයෙන්ම පසු ගිය කාලය තුළ මේ පිළිබඳව කරුණු දැක්වූවාට පස්සේ අපි සම්පූර්ණයෙන්ම sucker යන්ත්‍ර පාවිච්චිය තහනම් කරලායි තියෙන්නේ. එතකොට ඒ දක්වා බැකෝ යන්ත්‍ර පාවිච්චි කර පතල් කැණීමේ යෙදුණු අයගේ බැකෝ යන්ත්‍ර licence එක පමණයි අපි ආපසු දුන්නේ. අපි දන්නවා, මේ සඳහා ඍජු කොන්දේසි රැසක් අවශ්‍යයි කියලා. තමුන්නාන්සේලා අපි ඔක්කොම ප්‍රායෝගිකව මේ ප්‍රශ්නය දිහා බලන්න ඕනෑ. ප්‍රායෝගික නොවන විධියට මේ ප්‍රශ්නය දිහා බැලුවොත් පතල් කර්මාන්තයේ යෙදෙන බොහෝ දෙනෙකුට අපි අසාධාරණයක් කරනවාය කියලාත් මට හිතෙනවා. විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ සමහර තැන් පතල් රාශියක් කපපු තැන්. දෝනාවල්, පරණ පතල් බොහොම තිබෙනවා. ඒ වායේ තවත් යටට පතලක් කපන්න, අර පරණ ක්‍රමය අනුව අසීරු වෙලා තිබෙනවා. ඉතින් ඒ නිසා අපි තීන්දු කරලා තිබෙනවා, මේ පිළිබඳව ඔබතුමන්ලාත් එක්ක දීර්ඝ සාකච්ඡාවක යෙදෙන්න. ඒ අනුව දැනට අපි පතල් කැපීම නතර කෙරුවත් ඒ කපපු පතල්වල බැකෝ යන්ත්‍ර දාලා උඩට ගත්තු ඉල්ලම් සෝදා ගැනීම සඳහා අපි ඉඩ දීලා තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී යාන්ත්‍රික පතල් කැණීමට අපි අවසර දෙනවා නම් ඒ දෙන්නේ මොන කොන්දේසි උඩද කියලා අපි දැන් වෙනම කොන්දේසි මාලාවක් හදලා තිබෙනවා. ඒකේ ප්‍රධානම කොන්දේසිය තමයි මේ පතල් වළ වහන එක. එහෙම වහනවා නම් වහන්නේ කොහොමද කියන එක පිළිබඳවත් අප කල්පනා කරනවා. ඒ පතල කපලා අවසන් වුණාට පස්සේ, ඒ ලබා ගත්ත ඇප මුදල් එක සැනින්ම ආපසු දෙන්න අපි කල්පනා කරන්නේ නැහැ. අපි ඔවුන් සමඟ මේ සම්බන්ධයෙන් එකඟතාවකට එනවා. ගස් හිටවනවා නම්, එහෙම නැත්නම් ඒවා යථා තත්ත්වයට පත් කරන ආකාරය දිහා බලා තමයි ක්‍රමානුකූලව ඒ මුදල් වෙන් කරන්න අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ පිළිබඳව දැනට අපි තාවකාලික තහනමක් දමා තිබුණත්, ඉදිරියේදී අපේ කමිටුවේ එහෙම නැත්නම් අපේ පාර්ලිමේන්තු කමිටුවේදී සාකච්ඡා කරලා ඔබ සියලු දෙනාගේම අදහස් අරගෙන මේ පිළිබඳ ඍජු ක්‍රියා මාර්ගයකට යන්න අපි කල්පනා කරනවා. අපි පිළිගන්නවා, මේක කුඩා අයගේ ව්‍යාපාරයක් කියලා. මේ ව්‍යාපාරය අපි පොඩි මිනිස්සුන්ට ආරක්ෂා කරන්න ඕනෑ. ඉදිරියේදී පතලක් ලබා දෙනවා නම්, ඒ ලබා දීමේදීත් ඒ පැරණි ක්‍රමවේදය අනුව ඒ ගාස්තු එහෙම නැත්නම් ඒ ලබා ගන්නා අයට කොටස් බෙදීමේ ක්‍රමයක් වෙනුවෙනුත් අපි නිශ්චිත සඳහනක් කරලා අපේ මේ වැඩ කටයුතු කරන්න කල්පනා කරනවා. විශේෂයෙන්ම දෙවනුව මේ පිළිබඳව අපට තිබෙන තාක්ෂණික උපදෙස් බලන්න. විශේෂයෙන් ඔබතුමන්ලා දන්නවා රත්නපුර ප්‍රදේශයේ වසර සිය ගණනක් එහෙම නැත්නම් දහස් ගණනක් තිස්සේ මැණික් පතල් කපලා ඉවරයි කියලා. ඒ නිසා ප්‍රධාන වශයෙන් පොළොව උඩ මට්ටමේ මැණික් හම්බ වනවා අඩුයි. එහෙමනම් අපි ඊට වඩා පහළට ගමන් කරන්න ඕනෑ නම් කොයි විධියටද ගමන් කරන්නේ කියන එකත් මම ජාතික මැණික් සංස්ථාවට කියලා තිබෙනවා. අපේ භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයට මේ සඳහා අවශ්‍ය කරන තාක්ෂණය තිබෙනවා. ඒ අනුව ගෙඩි මැණික් ගන්න පුළුවන් නම්, එහෙම නැත්නම් වෙනත් මැණික් වර්ග ගන්න සාමාන්‍යයෙන් අඩි 50ට, 70ට පහළින් අපි ගමන් කරනවා නම් කොහොමද අපි ඒක කරන්නේ කියලා කල්පනා කරන්න ඕනෑ.

ඇත්ත වශයෙන්ම කුරුවිට, පැරඩයිස් කියන තැන සිදු වුණු තත්ත්වයක් නිසා තමයි හුඟක්ම මේක ප්‍රශ්නයක් වුණේ. මොකද කුරුවිට, පැරඩයිස් වත්තේ තමයි ලංකාවේ විශාලතම මැණික් ඉල්ලමක් අදටත් තිබෙන්නේ. මට ලැබෙන තොරතුරු අනුව පහළ මට්ටමේ ගල දක්වා තවමත් එතැන මැණික් තිබෙනවා. ප්‍රශ්නය වෙලා තිබෙන්නේ පසු ගිය කාලය තුළ මැණික් ගරපු පතල් උඩ පදිංචි වීමක් සිදු වෙලා තිබීමයි. පසුව නියමිත පරිදි ඒ ඉඩම් සඳහා ඔප්පු ලබා දීලා තිබෙනවා. ඉතින් එවැනි අවස්ථාවකදී අර ගෙවල්වලට හානියක් සිදු වන කොට එක පැත්තකින් බැකෝ දැමීම හරහාත්, ඒ වාගේම ඔවුන් ඉඳලා තිබෙන්නේ කලින් පතල් කරපු තැනක් උඩ නිසාත් මේ කාරණය ඒ අංශ දෙකෙන්ම සිදු වෙන්න පුළුවන් කියන එක තමයි මට ලැබුණු තාක්ෂණික උපදෙස. නමුත් අපි පිළිගන්න ඕනෑ, මේ මැණික් කර්මාන්තය දියුණු කරනවා නම් මේ මැණික් කර්මාන්තයේ මැණික් ලබා ගන්නා මාර්ග අපි වැඩි කරන්න ඕනෑ කියලා. මොකද එහෙම නැත්නම් අපට මේ මැණික් කර්මාන්තයෙන් ලාභ ලබා ගන්න බැහැ. පොළොව යට විතරක් මැණික් තියා ගෙන අපට ඕනෑ කරන දේවල් ලබා ගන්න බැහැ. ඒ නිසා මේ පිළිබඳව යම් වැඩ පිළිවෙළක් අපි සකස් කරනවා. එතැනදී අපි ඔබතුමන්ලාට පොරොන්දු වෙනවා, ඇමතිවරයා හැටියටත්, රජය හැටියටත් විශේෂයෙන්ම මේ පළාතේ ඉන්න ඔබතුමන්ලාගේ අදහස් විමසා සාධාරණ තීන්දුවක් ගන්න අපි කටයුතු කරනවා කියලා.

ඇත්ත වශයෙන්ම පසු ගිය කාලයේ අපේ යාන්ත්‍රික පතල් කැනීමේදී අය කරන බලපත්‍ර ගාස්තු වැඩි වුණාම මේ ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු ඇමතිතුමන්ලා අපට එම තත්ත්වය පෙන්වා දුන්නාම අපි වහාම ඒක අඩු කළා. ඒ වාගේම සකර් යන්ත්‍ර පාවිච්චි කිරීම වැරැදියි කියලා එතුමන්ලා කිව්වාම අපි ඒ ගැන ඍජු තීන්දුවක් ගත්තා. මේ සඳහා බැකෝ යන්ත්‍ර පාවිච්චි කිරීම වැරැදියි කියලා ඔබතුමන්ලා කිව්වාම ඒකටත් අපි තීන්දුවක් ගත්තා. නමුත් දැනට විශාල මුදලක් වියදම් කරලා යම් කෙනෙක් අසරණ වෙලා ඉන්නවා නම් කොන්දේසි සහිතව ඒ සඳහා අවසර දෙන්නත් අනාගතයේදී අපි කටයුතු කරනවා. මොකද නැත්නම් ඒ අයට අපි

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

ලොකු අසාධාරණයක් කරනවා. මොකද අපි එක පැත්තකින් බලපත්‍රයක් ලබා දීලා තිබෙනවා. ඒ ලබා දීපු එක සම්බන්ධයෙන් අපි ක්‍රියා කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් අපෙත් වග කීමක් තිබෙනවා. ඒ වග කීමත් දරා ගෙන තමයි අපි මේ අලුත් වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙන්නේ.

ජාතික ක්‍රියාත්මක හා මෙහෙයුම් අංශය පසු ගිය කාලයේ අපි නවත්වා දමා තිබුණේ. මම වහාම දැන් ජාතික ක්‍රියාත්මක හා මෙහෙයුම් අංශය නැවත ඇති කරලා ඇහැලියගොඩ ප්‍රදේශයේ අපි ඒක ස්ථාපනය කෙරුවා. ඒ සඳහා අවශ්‍ය නිලධාරින් පත් කෙරුවා, අවශ්‍ය පහසුකම් ලබා දුන්නා. ඒ සියලු දෙනාටම අපි මේ කටයුතු කරලා තිබෙනවා.

ඊ ළඟට අපි තව කොන්දේසියක් දමන්න කල්පනා කරනවා. මෙවැනි අවස්ථාවක මැණික් ගල් හම්බ වුණාම තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි ඒ පළාතේ මේක වෙන්දේසියේ දමන්නේ නැහැ, කෙළින්ම කොළඹට ගෙන ඒම. ඒ නිසා අවම වශයෙන් මාස තුනකට වරක්, අවුරුද්දකට හතර සැරයක්වත් ඒ පතලෙන් හම්බ වුණු මැණික් ගල් වෙන්දේසි කරන්නේ නැත්නම් ඒ නියමිත කාලය පැමිණුනාට පස්සේ අපි ඒ පතල යාන්ත්‍රික ක්‍රමයට කරන්න අවසර ලබා දෙන්නේ නැහැ. මෙන්න මේ විධියට තමයි අපි වැඩ පිළිවෙළ හදලා තිබෙන්නේ. නමුත් අපි බලාපොරොත්තු වෙනවා, මේ වැඩ පිළිවෙළ ගැනත් ඔබතුමන්ලා එක්ක සාකච්ඡා කරන්න. මොනවා කෙරුවත් අපි අපේ පරිසරය ආරක්ෂා කරන්න ඕනෑ කියලා අපි කවුරුත් අද පිළිගන්නවා. අපේ තිබෙන පස්, එහෙම නැත්නම් ලොකු වළවල් හැදිලා විශාල ජලාශ හැදුනොත්, එහෙම නැත්නම් උඩට ගන්නා පස් ටික සෝදා ගෙන ගිහිල්ලා ගංගාධාර යට වුණොත්, කුඹුරු කරන ගොවීන්ට කුඹුරු ටික කර ගන්න බැරි වුණොත්, පොළොවේ යට තිබෙන ළිංවල ජල මට්ටම් අඩු වුණොත් ඒක විශාල පිරිසකට බලපානවා. සමහර විට ලක්ෂයක් ඉන්නා තැනක මැණික් ගරන්නේ 1,000ක් වෙන්න පුළුවන්. 2,000ක් වෙන්න පුළුවන්. නමුත් අනෙක් සියලු පිරිසට මේක බලපානවා. ඒ නිසා අප සතුව තිබෙන සියලුම ආයතන සම්බන්ධ කරලා මේ පිළිබඳව ජාතික වැඩ පිළිවෙළක් සකස් කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. මම පැහැදිලිව කියනවා පසු ගිය කාලය තුළ 192කට අවසර දුන්නේත් කලින් අවසර දීපු ඒවාටමයි කියන එක. අපි අලුතෙන් එවැනි පතල් කැණීම්වලට අවසර දුන්නේ නැහැ. මා ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමියගේ අදහස පිළිගන්නවා. දැනට අලුතෙන් වෙන්දේසි කරන ඉඩමක් කලින් පතල් කරලා නැත්නම් ඒක අලුත් ඉඩමක් නම් සාම්ප්‍රදායික ක්‍රමයට මැණික් ගරනවා හැරෙන්න කිසිම අවස්ථාවක බැකෝ යන්ත්‍රයක් පාවිච්චි කරන්න ඉඩ දෙන්නේ නැහැ කියලා අපි තීන්දුවක් ගන්න කල්පනා කරනවා අපට ඒක ඔබතුමිය මතක් කරපු නිසා.

මේ සියලු දෙනාගේම සම්බන්ධතාවෙන් අපේ මැණික් අංශයට අතිගරු ජනාධිපතිතුමා විශාල සහන රාශියක් දීලා තිබෙනවා. මා බොහොම සන්තෝෂයෙන් කියන්න කැමැතියි අපේ මැණික් කර්මාන්තය විශාල වශයෙන් දියුණු මට්ටමක තිබෙන බව. දැන් අපනයන අංශය වාගේම ස්වර්ණාභරණ අංශය, මැණික් ගල් කැපීමේ, ඔප දැමීමේ අංශය විශාල දියුණු මට්ටමක තිබෙනවා. ඒ වාගේම මැණික් ගල් ඔබ්බවලා හදාපු ස්වර්ණාභරණවලට අපේ රටේ ඉතාමත්ම හොඳ ඉල්ලුමක් තිබෙනවා. අද තිබෙන තත්ත්වය එදාට වඩා හුඟාක් වෙනස්. මැණික් ක්ෂේත්‍රය ගැන අපි කල්පනා කරන කොට ප්‍රධානවම අපි කල්පනා කරන්න ඕනෑ මැණික් ගල් ලැබෙන ප්‍රදේශවල සුරක්ෂිතභාවය ගැන. ඒ මැණික් ගල් කොළඹට ගෙනාවාට පස්සේ ඒවා ගල් හැටියට අපනයනය කරන්නේ නැතිව ස්වර්ණාභරණවල ඔබ්බවලා අගය එකතු කරලා අපනයනය කරන්න පුළුවන් නම් ලංකාව වාගේ රටවලට විශාල ආදායමක් ගන්න පුළුවන් කියායි මා හිතන්නේ. ඒ සඳහා අපි පසු ගිය කාලයේ ප්‍රදර්ශන කිහිපයක් පැවැත්වුවා. අපි සෑම වෙළෙඳ පොළක් ආශ්‍රිතවම සාකච්ඡා පැවැත්වුවා. ඒ සඳහා ඉතාම හොඳ ප්‍රතිචාර ලැබී තිබෙනවා. මා හිතන විධියට විශාල වශයෙන් මැණික් ගල් වෙනත් රටවලින් අරගෙන ඇවිල්ලා ඒවා නැවත කපලා, ඔප දමලා අගය එකතු කිරීමකුත් ලංකාවේ අය මැඩගස්කරය වාගේ රටවල්වලට ගිහිල්ලා කරනවා. ඒ පිළිබඳ තිබුණු බොහෝ සීමාවන් අතිගරු ජනාධිපතිතුමා අපට ඉවත් කරලා දුන්නා. ඒ නිසා මැණික් කර්මාන්තයට බොහොම දීප්තිමත් අනාගතයක් තිබෙනවා. ඒ අනාගතයේදී අපේ ගම් පළාත්වල - රත්නපුරයේ වෙන්න පුළුවන්, වෙනත් ප්‍රදේශයක වෙන්න පුළුවන් - පතලක් කපලා ගලක් අරගෙන ඒ ගල විකුණන කෙනෙකුට අවශ්‍ය කරන සාධාරණත්වය ඉටු කිරීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අවශ්‍ය නායකත්වය දෙන්න එහෙම නැත්නම් ඔවුන්ට මඟ පෙන්වන්න අපි හැම වෙලාවේම සූදානම් වෙලා ඉන්නවා. ඒ නිසා මා හිතනවා අපි ඒ සියලු අදහස් අරගෙන වඩා හොඳ පිළිතුරක්, සාධාරණ මධ්‍යස්ථ පිළිතුරක් වෙනුවෙන් අපට ඔබතුමන්ලාගේ සහාය ඉදිරියටත් අවශ්‍ය වෙනවා කියලා. එසේ කියමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.55 ට, 2011 ජූනි 07 වන අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி.ப. 6.55 மணிக்கு பாராளுமன்றம், 2011யூன் 07, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 6.55 p.m. until 1.00 p.m. on Tuesday, 07th June, 2011.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්: වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
காணி சீர்திருத்த ஆணைக்குழுவுக்கு சொந்தமான காணிகள்: வெலிமட பிரதேச செயலாளர் பிரிவு
LAND BELONGING TO LAND REFORMS COMMISSION : WELIMADA DIVISIONAL SECRETARY'S DIVISION

0211/'10

1. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(இ) (i) 20 ஏக்கர் - 0 ரூட் - 0 பர்சஸ்

(ii) தம்பவின்ன கிராம உத்தியோகத்தர் பிரிவு

(iii) வெலிமட

(ஈ) எழமாட்டா.

*ඇමුණුම :*

ඇමුණුම (I)

| අනු අංකය | ඉඩමේ නම | බදු ගැනුම්කරු | ප්‍රමාණය අක්. රූ. පර්. | ලබාදුන් දිනය | බදු මුදල | අවසන් වන කාලය |
|---|---|---|---|---|---|---|
| 01 | වැලිමඩ වත්ත | කළ: අධ්‍යක්ෂ කියැත්ග් හැමි පුද් සමාගම | 23 3 18.6 | 2009 සිට | 3,131,311/- | 2012 වසර දක්වා |
| 02 | වැලිමඩ වත්ත | ඌව පරණගම ප්‍රා.ලේ. භාරයේ පවති | 05 1 06 | 2003.12.30 | 132,000/- | 2033.12.30 |
| 03 | වැලිමඩ වත්ත | ජේ.ජුනයිදීන් මයා. 76, හද්දවුල. වැලිමඩ. | 00 0 37 | 2011.02.03 | 25,000/- | 2041.02.03 |
| 04 | වැලිමඩ වත්ත | ජ්.එම්.යාසීම් මයා. පල්ලිය අසල. හද්දවුල.වැලිමඩ. | 00 3 00 | 2010.09.07 | 7,700/- | තේ අස්වැන්න ලබා ගැනීමට වාර්ෂික මුදල් ගෙවා ඇත. |
| 05 | වැලිමඩ වත්ත | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය. බණ්ඩාරවෙල. | 01 0 00 | | | මැනුම් කිරීමට යොමු කර ඇත. |
| 06 | වැලිමඩ වත්ත | ඌව පලාත් සේවා මුක්තගාම සංගමය. වැලිමඩ. | 00 0 30 | | | ඉඩම මැනුම් කිරීමට යොමු කර ඇත. |
| | | | 31-0-14.43 | | | |

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්: ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

## காணி சீர்திருத்த ஆணைக்குழுவுக்கு சொந்தமான காணிகள்: எல்ல பிரதேச செயலாளர் பிரிவு

## LAND BELONGING TO LAND REFORMS COMMISSION : ELLA DIVISIONAL SECRETARY'S DIVISION

0212/'10

**2. ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබා දුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබා දුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව, අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) எல்ல பிரதேச செயலாளர் பிரிவில், காணி மறுசீரமைப்பு ஆணைக்குழுச் சட்டத்திற்கமைய ஆரம்பத்தில் ஆணைக்குழு கொண்டிருந்த மொத்தக் காணிகளின் அளவு எவ்வளவென்பதையும்;

(ii) அவற்றில் இதுவரை விற்கப்பட்டுள்ள காணிகளின் அளவு எவ்வள வென்பதையும்;

(iii) அதில் 5 ஏக்கருக்குக் கூடுதலான விற்பனைகளில் காணியின் பெயர், காணியின் அளவு, விற்கப்பட்ட திகதி, கொள்வனவாளர், விற்கப்பட்ட தொகை யாதென்பதையும்

இச்சபையில் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்கூறப்பட்ட பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள காணி சீர்திருத்த ஆணைக்குழுவுக்கு சொந்தமான காணிகள் நீண்டகால குத்தகை அடிப்படையில் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறெனின், வழங்கப்பட்ட காணியின் பெயர், குத்தகைக் கொள்வனவாளர், வழங்கப்பட்ட திகதி, பெற்றுக்கொண்ட குத்தகைப் பணம், குத்தகை முடிவுத் திகதி யாதென்பதையும்

அவர் இச்சபையில் சமர்ப்பிப்பாரா?

(இ) (i) மேற்கூறப்பட்ட பிரிவில் எஞ்சியுள்ள காணி சீர்திருத்த ஆணைக்குழுவுக்கு சொந்தமான காணியின் அளவு எவ்வளவென்பதையும்;

(ii) அவை கிராம அலுவலர் பிரிவினடிப்படையில் எவ்வளவு ஏக்கர்களென்பதையும்;

(iii) அவை அமைந்துள்ள இடங்கள் யாவையென்பதையும்

அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House of-

(i) the total extent of land held by the Land Reforms Commission initially in Ella Divisional Secretary's Division, according to the Land Reforms Commission Act;

(ii) the extent of land that has been sold by now, out of the extent of land mentioned above; and

(iii) the name, the extent, the date of sale, the name of the buyer and the selling price of the sales over five acres out of the lands sold?

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම,බදු ගැනුම්කරු හා ලබා දුන් දිනය,ලබා ගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව, අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) வெலிமட பிரதேச செயலாளர் பிரிவில், காணி மறுசீரமைப்பு ஆணைக்குழுச் சட்டத்திற்கமைய ஆரம்பத்தில் ஆணைக்குழு கொண்டிருந்த மொத்தக் காணிகளின் அளவு எவ்வளவென்பதையும்;

(ii) அவற்றில் இதுவரை விற்கப்பட்டுள்ள காணிகளினளவு எவ்வளவென்பதையும்;

(iii) அதில் 5 ஏக்கருக்குக் கூடுதலான விற்பனைகளில் காணியின் பெயர், காணியின் அளவு, விற்கப்பட்ட திகதி, கொள்வனவாளர், விற்கப்பட்ட தொகை யாதென்பதையும்

இச்சபையில் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்கூறப்பட்ட பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள காணி சீர்திருத்த ஆணைக்குழுவுக்கு சொந்தமான காணிகள் நீண்டகால குத்தகை அடிப்படையில் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறெனின், வழங்கப்பட்ட காணியின் பெயர், குத்தகைக் கொள்வனவாளர், வழங்கப்பட்ட திகதி, பெற்றுக்கொண்ட குத்தகைப் பணம், குத்தகை முடிவுத் திகதி யாதென்பதையும்

அவர் இச்சபையில் சமர்ப்பிப்பாரா?

(இ) (i) மேற்கூறப்பட்ட பிரிவில் எஞ்சியுள்ள காணி சீர்திருத்த ஆணைக்குழுவுக்கு சொந்தமான காணியின் அளவு எவ்வளவென்பதையும்;

(ii) அவை கிராம அலுவலர் பிரிவினடிப்படையில் எவ்வளவு ஏக்கர்களென்பதையும்;

(iii) அவை அமைந்துள்ள இடங்கள் யாவையென்பதையும்

அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House of -

(i) the total extent of land held by the Land Reforms Commission initially in Welimada Divisional Secretary's Division, according to the Land Reforms Commission Act;

(ii) the extent of land that has been sold by now, out of the extent of land mentioned above; and

(iii) the name, the extent, the date of sale, the name of the buyer and the selling price of the sales over five acres out of the lands sold?

(b) Will he submit to this House-

(i) whether the lands belonging to the Land Reforms Commission that are situated in the above Divisional Secretary's Division have been given on the basis of long-term lease; and

(ii) if so, the name of the land so given, name of the lease holder, the date of the lease, the amount of money received for the lease and the date on which the lease agreement terminates?

(c) Will he state-

(i) the extent of the remaining lands owned by the Land Reforms Commission in the above Division;

(ii) the acreage of those lands on the basis of each Grama Niladhari Division; and

(iii) the location of such lands?

(d) If not, why?

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு டீ.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)

(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

(අ) (i) අක්කර 4,385 රූඩ් 0 පර්චස් 29

(ii) අක්කර 65 රූඩ් 05 පර්චස් 33.37

(iii) අක්කර 05ට වැඩි ඉඩම් විකුණා නොමැත.

(ආ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇත.

(ii) ඇමුණුම බලන්න.

(ඇ) (i) අක්කර 20 රූඩ් 0 පර්චස් 0

(ii) දඹවින්න ග්‍රාම නිලධාරි වසම

(iii) වැලිමඩ

(ඈ) පැන නොනඟී.

(அ) (i) 4,385 ஏக்கர் - 0 ரூட் - 29 பர்சஸ்

(ii) 65 ஏக்கர் - 05 ரூட் - 33.37 பர்சஸ்

(iii) 05 ஏக்கர்களுக்கு மேற்பட்ட காணிகள் விற்கப்படவில்லை.

(ஆ) (i) காணி மறுசீரமைப்பு ஆணைக்குழுவால் வழங்கப்பட்டுள்ளது.

(ii) பின்னிணைப்பு

(b) Will he submit to this House-

(i) whether the lands belonging to the Land Reforms Commission that are situated in the above Divisional Secretary's Division have been given on the basis of long-term lease; and

(ii) if so, the name of the land so given, name of the lease holder, the date of the lease, the amount of money received for the lease and the date on which the lease agreement terminates?

(c) Will he state-

(i) the extent of the remaining lands owned by the Land Reforms Commission in the above Division;

(ii) the acreage of those lands on the basis of each Grama Niladhari Division; and

(iii) the location of such lands?

(d) If not, why?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

(අ) (i) අක්කර 11,479 රූඩ් 0 පර්චස් 36

(ii) අක්කර 1,048 රූඩ් 03 පර්චස් 1.22

(iii) අක්කර 05ට වැඩි ඉඩම් විකුණා නොමැත.

(ආ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇත.

(ii) ඇමුණුම බලන්න.

(ඇ) (i) අක්කර 129 රූඩ් 03 පර්චස් 30

(ii) අක්කර 62 පමණ වන පාරුත් ලැන්ඩ් ඉඩම හා අක්කර 67 පමණ වන ස්ට්‍රැතඩන් වත්ත - දොඩම් ගොල්ල ග්‍රාම නිලධාරී වසම.

(iii) දොඩම් ගොල්ල

(ඈ) පැන නොනඟී.

(அ) (i) 11,479 ஏக்கர் - 0 ரூட் - 36 பர்சஸ்

(ii) 1,048 ஏக்கர் - 03 ரூட் - 1.22 பர்சஸ்

(iii) 05 ஏக்கர்களுக்கு மேற்பட்ட காணிகள் விற்கப்படவில்லை.

(ஆ) (i) காணி மறுசீரமைப்பு ஆணைக்குழுவால் வழங்கப்பட்டுள்ளது.

(ii) பின்னிணைப்பு (1)

(இ) (i) 129 ஏக்கர் - 03 ரூட் - 30 பர்சஸ்

(ii) அண்ணளவாக 62 ஏக்கர் விஸ்தீரணமுள்ள பாருத் லேன்ட் காணி மற்றும் அண்ணளவாக 67 ஏக்கர் விஸ்தீரணமுள்ள ஸ்ரெதடன் வத்த - தொடம்கொல்ல கிராம உத்தியோகத்தர் பிரிவு

(iii) தொடம் கொல்ல

(ஈ) எழமாட்டா.

ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය — ඇමුණුම (01)

| ඉඩමේ නම | බදුකරුගේ නම හා ලිපිනය | ප්‍රමාණය | | | ලබා දුන් දිනය | ලබා ගත් මුදල | අවසන් වන කාලය |
|---|---|---|---|---|---|---|---|
| | | අක් | රූ | පර් | | | |
| 1. කළුගල වත්ත | විහාරාධිපති. ගල්ලෙන් විහාර. දොඩම්ගොල්ල. | 2 | 0 | 00 | 1977.1.11 | වාර්ෂිකව රු.400/- බැගින් | මුල් බදු කාලය 2007.1.11 අවසන් වේ. ii කාලය 2007 වසරේ සිට ඇරඹේ. |
| 2. ස්ට්‍රැතඩන් වත්ත. | සභාපති. බෝධි ඥාන සභාව. කුඹල්වෙල. ඇල්ල. | 14 | 3 | 19 | 2005.7.5 | රු.300000/- | 2035.7.5 |
| | පේෂකර්ම දෙපාර්තමේන්තුව. ඌව පළාත් සභාව බදුල්ල. | 00 | 1 | 30 | 1979.1.22 | මාසික රු.500/- බැගින් | 2009.1.22 |
| 3. දෙමෝදර වත්ත. | ආර්.ඩී.මර්තේනිස් මයා. බැල්ලකොටුව. | 00 | 2 | 00 | භුක්තිය භාර දී නැත. | රු.25000/- | කළුගල් සහිත ඉඩමකි. |
| 4. ටොහකොම්බි වත්ත. | විහාරාධිපති. පුරාණ විහාරය. බැල්ලකොටුව. | 01 | 0 | 00 | 1977.7.12 | වාර්ෂිකව රු.300/- බැගින් | මුල් කාල සීමාව 2007.7.12 අවසන් වේ. ii කාලය එදින සිට ඇරඹේ. |
| 5. පාරුත් ලෑනඩ් වත්ත. | ජේ.ඩී.ප්‍රේමචන්ද්‍ර මහතා. පස්සර පාර. බැල්ලකොටුව. | 12 | 0 | 04 | 2010.6.18 | රු.72000/- | 2040.6.18. |

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්: ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
## காணி சீர்திருத்த ஆணைக்குழுவுக்கு சொந்தமான காணிகள்: ஊவா பரணகம பிரதேச செயலாளர் பிரிவு
## LAND BELONGING TO LAND REFORMS COMMISSION : UVA PARANAGAMA DIVISIONAL SECRETARY'S DIVISION

0213/’10

3. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබා දුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබා දුන් දිනය, ලබා ගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව, අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) ஊவா பரணகம பிரதேச செயலாளர் பிரிவில், காணி மறுசீரமைப்பு ஆணைக்குழுச் சட்டத்திற்கமைய ஆரம்பத்தில் ஆணைக்குழு கொண்டிருந்த மொத்தக் காணிகளின் அளவு எவ்வளவென்பதையும்;

(ii) அவற்றில் இதுவரை விற்கப்பட்டுள்ள காணிகளின் அளவு எவ்வள வென்பதையும்;

(iii) அதில் 5 ஏக்கருக்குக் கூடுதலான விற்பனைகளில் காணியின் பெயர், காணியின் அளவு, விற்கப்பட்ட திகதி, கொள்வனவாளர், விற்கப்பட்ட தொகை யாதென்பதையும்

இச்சபையில் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்கூறப்பட்ட பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள காணி சீர்திருத்த ஆணைக்குழுவுக்கு சொந்தமான காணிகள் நீண்டகால குத்தகை அடிப்படையில் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறெனின், வழங்கப்பட்ட காணியின் பெயர், குத்தகைக் கொள்வனவாளர், வழங்கப்பட்ட திகதி, பெற்றுக்கொண்ட குத்தகைப் பணம், குத்தகை முடிவுத் திகதி யாதென்பதையும்

அவர் இச்சபையில் சமர்ப்பிப்பாரா?

(இ) (i) மேற்கூறப்பட்ட பிரிவில் எஞ்சியுள்ள காணி சீர்திருத்த ஆணைக்குழுவுக்கு சொந்தமான காணியின் அளவு எவ்வளவென்பதையும்;

(ii) அவை கிராம அலுவலர் பிரிவின் அடிப்படையில் எவ்வளவு ஏக்கர்கள் என்பதையும்;

(iii) அவை அமைந்துள்ள இடங்கள் யாவையென்பதையும்

அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House of-

(i) the total extent of land held by the Land Reforms Commission initially in Uva Paranagama Divisional Secretary's Division, according to the Land Reforms Commission Act;

(ii) the extent of land that has been sold by now, out of the extent of land mentioned above; and

(iii) the name, the extent, the date of sale, the name of the buyer and the selling price of the sales over five acres out of the lands sold?

(b) Will he submit to this House-

(i) whether the lands belonging to the Land Reforms Commission that are situated in the above Divisional Secretary's Division have been given on the basis of long-term lease; and

(ii) if so, the name of the land so given, name of the lease holder, the date of the lease, the amount of money received for the lease and the date on which the lease agreement terminates?

(c) Will he state-

(i) the extent of the remaining lands owned by the Land Reforms Commission in the above Division;

(ii) the acreage of those lands on the basis of each Grama Niladhari Division; and

(iii) the location of such lands?

(d) If not, why?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

(අ) (i) අක්කර 2,791 රූඩ් 1 පර්චස් 25

(ii) අක්කර 127 රූඩ් 02 පර්චස් 19.07

(iii) අක්කර 05ට වැඩි ඉඩම් විකුණා නොමැත.

(ආ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇත.

(ii) ඇමුණුම බලන්න.

(ඇ) (i) අක්කර 07 රූඩ් 01 පර්චස් 26

(ii) ඩවුන්සයිඩ් ග්‍රාම නිලධාරි වසම.

(iii) උඩ කොටවෙර.

(ඈ) පැන නොනඟී.

(அ) (i) 2,791 ஏக்கர் - 1 ரூட் - 25 பர்சஸ்

(ii) 127 ஏக்கர் - 02 ரூட் - 19.07 பர்சஸ்

(iii) 05 ஏக்கர்களுக்கு மேற்பட்ட காணிகள் விற்கப்படவில்லை.

(ஆ) (i) காணி மறுசீரமைப்பு ஆணைக்குழுவால் வழங்கப்பட்டுள்ளது.

(ii) பின்னிணைப்பு (1)

(இ) (i) 07 ஏக்கர் - 01 ரூட் - 26 பர்சஸ்

(ii) டவுன்சைட் கிராம உத்தியோகத்தர் பிரிவு

(iii) உட கொட்டவெர.

(ஈ) எழமாட்டா.

***ඇමුණුම :***

| ඉඩමේ නම | බදු ගැණුම්කරු | ලබාදුන් දිනය | ප්‍රමාණය අ. රූ. පර්. | ලබාගත් මුදල | බදු අවසන් දිනය |
|---|---|---|---|---|---|
| බොපිත් වත්ත | පී/ස. ග්‍රීන්ෆීල්ඩ් ප්ලාන්ටේෂන් පුද්. සමාගම | 2003.07.21 | 47 2 26 | | 30 අවුරුදු |

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.